# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2025 අංක 5 දරන අපරාධයකින් උත්පාදිත දේ
## පිළිබඳ පනත

**[සහතිකය සටහන් කළේ 2025 අප්‍රේල් මස 30 වන දින]**

---

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2025 මැයි 02 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ
II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

**මිල : රු. 480.00** තැපැල් ගාස්තුව : **රු. 200.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# 2025 අංක 5 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත

**[සහතිකය සටහන් කළේ 2025 අප්‍රේල් මස 30 වන දින]**

**එල්.ඩී.ඕ. 78/2024**

**අපරාධයකින් උත්පාදිත දේ ආපසු ලබා ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීමට ද; අපරාධයකින් උත්පාදිත දේ විමර්ශනය කිරීම, තහනම් කිරීම, රජය සතු කිරීම සහ බැහැර කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; තහනමට ගන්නා ලද අපරාධයකින් උත්පාදිත දේ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා ද; අපරාධයකින් උත්පාදිත දේ කළමනාකරණය කිරීමේ අධිකාරිය පිහිටුවීම සඳහා ද; අපරාධයකින් උත්පාදිත දේ අය කර ගැනීමට අදාළව අන්තර් නියෝජ්‍යායතන සහයෝගීතාව සහ ජාත්‍යන්තර සහයෝගීතාව සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද; සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

පූර්විකාව

නීතිවිරෝධී ක්‍රියාකාරකම් සිදු කිරීම මගින් බරපතළ ප්‍රතිවිපාක සහ ඇතැම් අවස්ථාවල දී මූල්‍යමය සහ වෙනත් අලාභ සහ එම නීතිවිරෝධී ක්‍රියාකාරකම්වල වින්දිතයන්ට, මහජනතාවට සහ රජයට දේපළ අයිතිවාසිකම් භුක්ති විඳීම අහිමි වීම සිදුවන හෙයින් ද:

නීතිවිරෝධී ක්‍රියාකාරකම් සිදු කරන තැනැත්තන්ට එම නීතිවිරෝධී ක්‍රියාකාරකම්වලින් උත්පාදිත දේ භුක්ති විඳීම සහ එයින් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා කිසිදු නෛතික අයිතියක් හෝ වෙනත් කිසිදු හිමිකමක් හිමි නොවන හෙයින් ද සහ එවැනි නීතිවිරෝධී ක්‍රියාකාරකම් මගින් උත්පාදිත දේ සඳහා හිමිකාරිත්ව අයිතිවාසිකම් ලැබෙන හෝ උපචිත වන තැනැත්තන් වෙත ද එවැනි දේපළ සඳහා කිසිදු නෛතික අයිතියක් නොලැබෙන හෙයින් ද:

එම නීතිවිරෝධී ක්‍රියාකාරකම් සිදු කරන්නන් විසින් ඒ නීතිවිරෝධී ක්‍රියාකාරකම් මගින් උත්පාදිත දෙයින් ප්‍රතිලාභ ලබා ගැනීම වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සහ එසේ අපරාධයක් මගින් උත්පාදිත දෙයින් ප්‍රතිලාභ ලැබීමට අන්‍යාකාරයෙන් හිමිකම් ලබන තැනැත්තන් වෙත ඒ දේ ආපසු ලබා දීම රජයේ වගකීම වන හෙයින් ද:

අපරාධයකින් උත්පාදිත දේ සඵලදායීව හඳුනා ගැනීම, සොයා ගැනීම, අනාවරණය කර ගැනීම, විමර්ශනය කිරීම, තහනම් කිරීම, තහනමට ගැනීම, සංරක්ෂණය කිරීම, ආරක්ෂා කිරීම, කළමනාකරණය කිරීම, අධිකරණමය ක්‍රියා විරහිත කිරීම, රජය සතු කිරීම සහ එම දේපළ නීත්‍යානුකූලව හිමිකම් ලබන තැනැත්තන් වෙත අපරාධයකින් උත්පාදිත දේ ආපසු භාර දීම සඳහා සාර්ථක නෛතික රාමුවක් ඉදිරිපත් කිරීමේ කාර්ය සඳහා දණ්ඩ නීති සංග්‍රහය, අපරාධ නඩු විධාන සංග්‍රහය, පොදු දේපළ විෂයයෙහි ලා සිදු කරනු ලබන වැරදි පිළිබඳ පනත, ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත, මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත සහ දූෂණ විරෝධී පනත ඇතුළු දැනට බලපවත්නා නීති, නව නීති පැනවීම මගින් ඌනපූරණය කිරීමක් අවශ්‍ය වන හෙයින් ද:

මේ පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්යය සඳහා, නීතිය බලාත්මක කිරීමේ ඇතැම් නිලධරයන් වෙත කාර්ය සහ වගකීම් පැවරීම සහ එම කාර්ය සහ වගකීම් ඉටු කිරීම සඳහා ඔවුන්ට යෝග්‍ය ලෙස බලය පැවරීම මෙන්ම අපරාධයකින් උත්පාදිත දේ කළමනාකරණය කිරීමේ අධිකාරිය ඇතුළු ඇතැම් ව්‍යවස්ථාපිත ආයතන පිහිටුවීම සඳහා අවශ්‍යව ඇති හෙයින් ද:

ශ්‍රී ලංකාව ඇතුළත සහ ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටා ඇති අපරාධයකින් උත්පාදිත දේ සම්බන්ධව ශ්‍රී ලංකාවේ නීතිය බලාත්මක කිරීමේ අධිකාරීන්ට, වෙනත් රටවල නීතිය බලාත්මක කිරීමේ, පරිපාලන සහ අධිකරණමය අධිකාරීන් සමඟ සහයෝගීව ක්‍රියා කිරීම සඳහා හැකියාව ලබා දීම සඳහා සහ එම අපරාධයකින් උත්පාදිත දේ හෝ ඒවායෙහි වටිනාකම එම දේපළ සඳහා නීත්‍යානුකූලව හිමිකම් ලබන තැනැත්තන් වෙත ආපසු භාර දීම සඳහා එම අපරාධයකින් උත්පාදිත දේ ශ්‍රී ලංකාව වෙත හෝ ශ්‍රී ලංකාවේ සිට විදේශ රටක් වෙත ආපසු යැවීමට කටයුතු සැලැස්වීම පිණිස නෛතික යාන්ත්‍රණයක් සඳහා විධිවිධාන සැලැස්වීම අවශ්‍යව පවතින හෙයින් ද:

නීතිවිරෝධී ක්‍රියාකාරකම් මගින් බලපෑමට ලක්ව ඇති අපරාධ වින්දිතයන් සහ ප්‍රජාව හෝ පොදු මහජනතාව ප්‍රතිෂ්ඨාපනය

සහ හානිපූරණය කිරීම සඳහා සහ එම කාර්ය සඳහා අපරාධ වින්දිතයන් ප්‍රතිෂ්ඨාපන සහ හානිපූරණ භාර අරමුදලක් නිර්මාණය කිරීම සහ පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීමට අවශ්‍යව පවතින හෙයින් ද:

දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය, ජාත්‍යන්තර සංවිධානාත්මක අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය සහ මාදක ඖෂධ සහ මනෝ වර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය යටතේ වූ ශ්‍රී ලංකාවේ බැඳීම් පූර්ණ ලෙස බලාත්මක කිරීමට සහ සමකාලීන ජාත්‍යන්තර ප්‍රමිති සහ යහපත් පරිචයන්ට අනුකූල වන පරිදි අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳව නීති පැනවීමට අවශ්‍යව පවතින හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** (1) මේ පනත 2025 අංක 5 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

(2) මේ වගන්තිය හැර, මේ පනතේ සෙසු විධිවිධාන, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලැබිය හැකි දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය:

කෙසේ වුව ද, මේ පනතේ සෙසු විධිවිධාන, මේ වගන්තිය ක්‍රියාත්මක වන දිනයේ සිට මාස දොළහකට නොවැඩි කාලයක දී ක්‍රියාත්මක විය යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධාන පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත් වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

පනතේ අරමුණු

**2.** මේ පනතේ අරමුණු පහත දැක්වෙන පරිදි විය යුතු ය:-

(අ) නීතිවිරෝධී ක්‍රියාකාරකම් මගින් උත්පාදිත දෙයින් ප්‍රතිලාභ ලබා ගැනීමේ කාර්යය සඳහා නීති විරෝධී ක්‍රියාකාරකම් සිදු කිරීම අධෛර්යමත් කිරීම;

(ආ) යම් තැනැත්තකු විසින් හෝ වෙනත් යම් තැනැත්තකු විසින් සිදු කරන ලද නීතිවිරෝධී ක්‍රියාකාරකම් මගින් උත්පාදිත දෙයින් ප්‍රතිලාභ ලැබීමෙන් යම් තැනැත්තකු වැළැක්වීම සහ එසේ ප්‍රතිලාභ ලැබීම අහිමි කිරීම;

(ඇ) අල්ලස් හා දූෂණ, මත්ද්‍රව්‍ය ජාවාරම් කිරීම, ත්‍රස්තවාදය සඳහා මුදල් සැපයීම සහ වෙනත් සංවිධානාත්මක සහ මූල්‍ය අපරාධ ඇතුළු නීතිවිරෝධී ක්‍රියාකාරකම් සිදු කිරීම සම්බන්ධ විමර්ශන සඳහා පහසුකම් සැලැස්වීම;

(ඈ) අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ විමර්ශන සිදු කිරීමේ දී විශේෂ විමර්ශන ක්‍රමවේද පිළිගැනීම, යොදා ගැනීම සහ බලාත්මක කිරීම සහ දේශීය නීතිය බලාත්මක කිරීමේ හා පරිපාලන අධිකාරීන් අතර සහයෝගීතාව, සඳහා විධිවිධාන සැලැස්වීම;

(ඉ) අපරාධයකින් උත්පාදිත දේ සොයා ගැනීම, හඳුනා ගැනීම සහ අය කර ගැනීම සඳහා පහසුකම් සැලැස්වීම සහ ඒ සඳහා විධිවිධාන සැලැස්වීම;

(ඊ) අපරාධයකින් උත්පාදිත දේ තහනම් කිරීම සහ තහනමට ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම;

(උ) අපරාධයකින් උත්පාදිත දේ අධිකරණමය ක්‍රියා විරහිත කිරීම් සඳහා අධිකරණ ආඥා නිකුත් කිරීම සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම;

(ඍ) රජය සතු කිරීම සඳහා වන නඩු කටයුතු ආරම්භ කිරීම, සිදු කිරීම සහ සම්පූර්ණ කිරීම අවසන් නොවී පැවතිය ද ඇතැම් අවස්ථානුගත කරුණු යටතේ අපරාධයකින් උත්පාදිත දේ බැහැර කිරීම ඇතුළු අපරාධයකින් උත්පාදිත දේ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම;

(එ) අපරාධයකින් උත්පාදිත දේ උත්පාදනය කරන්නා වූ නීතිවිරෝධී ක්‍රියාකාරකම් සිදු කිරීම වැළැක්වීම;

(ඒ) (i) (මෙහි මින් මතු "වරදකරු කිරීමෙන් පසුව රජය සතු කිරීමේ නඩු කටයුතු" යනුවෙන් සඳහන් කරනු ලබන) අපරාධයකින් උත්පාදිත දේ උත්පාදනය කරන ලද නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කිරීම සම්බන්ධයෙන් යම් තැනැත්තකු වරදකරු වීම අනුව; සහ

(ii) (මෙහි මින් මතු "වරදකරු නොකිරීම මත පදනම් වූ රජය සතු කිරීමේ නඩු කටයුතු" යනුවෙන් සඳහන් කරනු ලබන) අපරාධයකින් උත්පාදිත දේ උත්පාදනය කරන ලද නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කිරීම සම්බන්ධයෙන් යම් තැනැත්තකුට එරෙහිව නඩු පැවරීමට ස්වාධීනව,

අධිකරණ නඩු කටයුතු පැවැත්වීම සඳහා සහ අපරාධයකින් උත්පාදිත දේ රජය සතු කිරීම සඳහා අධිකරණ ආඥා නිකුත් කිරීම සඳහා වන ව්‍යවස්ථාපිත යාන්ත්‍රණ සඳහා විධිවිධාන සැලැස්වීම;

(ඔ) අපරාධ වින්දිතයන් විසින් තමාට සිදු වූ අලාභය හෝ හානිය සිවිල් නඩුකර මගින් අය කර ගැනීම සඳහා සිවිල් නීතියෙන් නඩු නිමිත්තක් පිළිගැනීම සහ ඒ සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම;

(ඕ) තහනම් කරන ලද, තහනමට ගන්නා ලද හෝ ක්‍රියා විරහිත කරන ලද අපරාධයකින් උත්පාදිත දේ ආරක්ෂා කිරීම, සංරක්ෂණය, කළමනාකරණය සහ බැහැර කිරීම සඳහා ව්‍යවස්ථාපිත අධිකාරියක් පිහිටුවීම;

(ක) රජය සතු කරන ලද අපරාධයකින් උත්පාදිත දෙයින් නිෂ්කාශනය කළ වටිනාකම් කළමනාකරණය කිරීම සහ භාවිත කිරීම සම්බන්ධයෙන් වූ යාන්ත්‍රණයක් සම්බන්ධයෙන් විධිවිධාන සැලසීම;

(ග) අපරාධ වින්දිතයන් ප්‍රතිෂ්ඨාපනය කිරීම සහ හානිපූරණය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස භාර අරමුදලක් පිහිටුවීම;

(ච) විදේශයන්හි පිහිටා ඇති අපරාධයකින් උත්පාදිත දේ හෝ ඒවායේ වටිනාකම අය කර ගැනීමට අදාළව සහ ශ්‍රී ලංකාවේ පිහිටි අපරාධයකින් උත්පාදිත දේවල වටිනාකම අදාළ විදේශ රටවල් වෙත ආපසු යැවීම සඳහා වෙනත් රටවල අධිකරණමය, නීතිය බලාත්මක කිරීමේ සහ පරිපාලන අධිකාරීන් සමඟ සහයෝගීතාවය සහ අන්තර් හුවමාරුව සහ සුහදත්වය සහිතව ක්‍රියා කිරීම සඳහා යාන්ත්‍රණයක් සැකසීම; සහ

(ජ) දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය, ජාත්‍යන්තර සංවිධානාත්මක අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය සහ මුදල්

විශුද්ධිකරණයට එරෙහි සහ ත්‍රස්තවාදී ක්‍රියාවන් සඳහා මුදල් සැපයීමට එරෙහි ජාත්‍යන්තර ප්‍රමිති සහ යහපත් පරිචයන් යටතේ වූ ශ්‍රී ලංකාවේ බැඳීම් බලාත්මක කිරීම.

**3.** (1) මේ පනත - පනත අදාළ වීම

(අ) යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සිදු කරන ලද අවස්ථාවේ දී එය වරදක් වන්නා වූ මේ පනත ක්‍රියාත්මක වීමට පෙරාතුව සිදු කරන ලද එවැනි යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමක් ද ඇතුළුව, ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරය, ගුවන් තීරය, ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද හෝ ශ්‍රී ලංකාව තුළ යම් තැනැත්තකු විසින් කුලියට ගන්නා ලද යම් ගුවන් යානයක හෝ යාත්‍රාවක ඇතුළුව ශ්‍රී ලංකාව තුළ යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමක් හෝ එහි යම් කොටසක් සිදු කරනු ලබන යම් තැනැත්තකු;

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත දී යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමක් හෝ එහි යම් කොටසක් සිදු කරනු ලබන ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නා වූ හෝ ශ්‍රී ලංකාවේ නේවාසිකයකු වන්නා වූ යම් තැනැත්තකු;

(ඇ) 1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ විධිවිධානවල හෝ යම් විදේශීය රාජ්‍යයක් විසින් එම නිලධරයා වෙත පවරා ඇති වෙනත් යම් මුක්තියක කුමක් සඳහන් වුව ද, ශ්‍රී ලංකාවේ යම් තානාපති හෝ කොන්සියුලර් නිලධරයකු;

(ඇ) නීතිවිරෝධී ක්‍රියාකාරකමෙන් උත්පාදිත දේ ශ්‍රී ලංකාව තුළ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත තිබුණ ද, ශ්‍රී ලංකාවේ පොදු දේපළක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් පිටත දී යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමක් හෝ එහි යම් කොටසක් සිදු කරන යම් තැනැත්තකු;

(ඉ) නීතිවිරෝධී ක්‍රියාකාරකමෙන් උත්පාදිත දේ ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත තිබුණ ද ශ්‍රී ලංකාවේ පුරවැසියකු සම්බන්ධයෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකුට අදාළව ශ්‍රී ලංකාව තුළ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමක් හෝ එහි යම් කොටසක් සිදු කරන යම් තැනැත්තකු;

(ඊ) යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමක් මගින් උත්පාදිත දේ ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත තිබුණ ද ශ්‍රී ලංකාවේ පුරවැසියකුගේ නීත්‍යානුකූල අයිතිවාසිකම්වලට අහිතකර බලපෑමක් ඇති කරනු ලබන හෝ එවැනි අහිතකර බලපෑමක් ඇති කරනු ලැබීමට හැකියාවක් ඇති යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමක් හෝ එහි කොටසක් ශ්‍රී ලංකාව ඇතුළත හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරනු ලබන යම් තැනැත්තකු;

(උ) ශ්‍රී ලංකාවේ රාජ්‍යතාන්ත්‍රික හෝ කොන්සල් දූත මණ්ඩලයක පරිශ්‍රයක් ඇතුළත සිට හෝ පදිංචි ස්ථානය ශ්‍රී ලංකාවේ මහජන මුදල් භාවිත කරමින් සපයා ගනු ලැබ තිබුණේ ද නැත ද යන්න නොසලකා ශ්‍රී ලංකාවේ රාජ්‍යතාන්ත්‍රික හෝ කන්සියුලර් නිලධරයකු පදිංචි ස්ථානය තුළ සිට හෝ යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමක් හෝ එහි යම් කොටසක් සිදු කරන යම් තැනැත්තකු;

(ඌ) ශ්‍රී ලංකා රජය හෝ ශ්‍රී ලංකාවේ යම් නීතියක් මගින් පිහිටුවන ලද යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වෙනුවෙන් හෝ පාලනය යටතේ පවතින පරිශ්‍රයක් තුළ සිට හෝ ශ්‍රී ලංකාවේ යම් නීතියක් මගින් පිහිටුවන ලද යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක යම් සේවානියුක්තයකුගේ ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටා ඇති පදිංචි ස්ථානයක් තුළ සිට හෝ

යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමක් හෝ එහි යම් කොටසක් සිදු කරනු ලබන යම් තැනැත්තකු;

(එ) ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරය, ගුවන් සීමාව, ශ්‍රී ලංකාවේ ලියාපදිංචි හෝ ශ්‍රී ලංකාවේ යම් තැනැත්තකු විසින් කුලියට ලබා ගන්නා ලද හෝ අන්‍යාකාරයකින් භාවිත කරනු ලබන යම් ගුවන් යානයක හෝ යාත්‍රාවක දී ඇතුළුව ශ්‍රී ලංකාව ඇතුළත හෝ ඉන් පිටත දී මේ පනත යටතේ යම් වරදක් සිදු කරන යම් තැනැත්තකු;

(ඒ) ශ්‍රී ලංකාවේ දී හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගුවන් යානයක හෝ යාත්‍රාවක දී හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකු හෝ නේවාසිකයකු විසින් කුලියට ලබා ගන්නා ලද ගුවන් යානයක හෝ යාත්‍රාවක තිබෙන යම් අපරාධයකින් උත්පාදිත දේ;

(ඔ) ශ්‍රී ලංකාවේ දී සිදු කරන ලද යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමක් මගින් උත්පාදිත ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත තිබෙන අපරාධයකින් උත්පාදිත දේ;

(ඕ) ශ්‍රී ලංකාවෙන් පිටත තිබෙන, ශ්‍රී ලංකාවේ පුරවැසියකු හෝ නේවාසිකයකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත දී සිදු කරන ලද යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමක් මගින් උත්පාදිත, අපරාධයකින් උත්පාදිත දේ; සහ

(ක) ශ්‍රී ලංකාවට ගෙනෙනු ලබන, ශ්‍රී ලංකාවට සංක්‍රාන්ත වන, ශ්‍රී ලංකාව බලා එන, ශ්‍රී ලංකාව පසු කරන හෝ ශ්‍රී ලංකාවෙන් පිටතට ගෙන යනු ලබන අපරාධයකින් උත්පාදිත දේ,

සඳහා අදාළ වන්නේ ය.

(2) යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමක් මගින් උත්පාදිත දේ මේ පනත ක්‍රියාත්මක වීමට පෙරාතුව අදාළ නීතිය ප්‍රකාරව රජය සතු කර ඇති අවස්ථාවක දී හෝ එම රජය සතු කිරීමට විකල්ප වශයෙන් අදාළ නීතිය ප්‍රකාරව යම් දණ්ඩනයක් හෝ වෙනත් තහනමක් පනවා එයට අනුකූලව ක්‍රියා කර ඇති අවස්ථාවක දී, මේ පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

පනතේ කාලීන අදාළ වීම

**4.** (1) 3 වන වගන්තියේ සඳහන් විධිවිධානවලට යටත්ව, අදාළ අපරාධයකින් උත්පාදිත දේ උපයා දෙන ලද අනුරූප නීතිවිරෝධී ක්‍රියාකාරකම මෙම පනත ක්‍රියාත්මක වීමට පෙරාතුව සිදු කරන ලද්දක් වුව ද, ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටා තිබෙන අපරාධයකින් උත්පාදිත දේ සඳහා මේ පනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) වරද මේ පනත ක්‍රියාත්මක වීමෙන් පසුව සිදු කරන ලද්දේ නම් මිස, මේ පනත යටතේ යම් වරදක් සිදු කරනු ලබන කිසිදු තැනැත්තකුට දඬුවම් කරනු නොලැබිය යුතු ය:

එසේ වුව ද, මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ දී, මේ පනත යටතේ වූ වරදක් සංයුක්ත වන ක්‍රියාවක් අඛණ්ඩව සිදු කරන අවස්ථාවක දී, මේ පනත යටතේ අදාළ වරද සිදු කර ඇති ලෙස එම වරදකරු සම්බන්ධයෙන් කටයුතු කිරීම සිදු කළ යුතු වේ.

දූෂණ විරෝධී පනතේ සඳහන් වැරදි සිදු කිරීමෙන් උපචිත වන අපරාධයකින් උත්පාදිත දේ සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන අදාළ වීම

**5.** දූෂණ විරෝධී පනත යටතේ සිදු කරන ලද යම් වරදක් සිදු කිරීම තුළින් ලබාගෙන ඇති, ව්‍යුත්පන්න වූ හෝ උපලබ්ධ වූ අපරාධයකින් උත්පාදිත දේ සම්බන්ධ දූෂණ විරෝධී පනතේ විධිවිධාන අභිබවා මේ පනතේ විධිවිධාන බලාත්මක විය යුතු අතර, අපරාධයකින් උත්පාදිත දේ විමර්ශනය, සොයා ගැනීම්, හඳුනා ගැනීම, අනාවරණය කිරීම, තහනම් කිරීම, තහනමට ගැනීම, අධිකරණමය ක්‍රියාවිරහිත කිරීම, දඬුවම් පැමිණවීම, ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම, කළමනාකරණය කිරීම, රජය සතු කිරීම හෝ මුදාහැරීම අවසන් නොවී පැවතිය දී බැහැර කිරීම, මුදාහැරීම සහ වියදම් කිරීම මේ පනතේ විධිවිධාන ප්‍රකාරව සිදු කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, දූෂණ විරෝධී පනතේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට එම පනත යටතේ වැරදි පිළිබඳ විමර්ශනය මේ පනතේ සඳහන් කිසිවක් මගින් කිසිදු ආකාරයකින් වැළැක්වීම හෝ බැහැර කිරීමක් සිදු නොවිය යුතු ය.

## I වන කොටස

## පොදු විධිවිධාන සහ වැරදි

අපරාධයකින් උත්පාදිත දේ ආදිය සැඟවීම හෝ ස්වරූපය වෙනස් කිරීම ආදිය වරදක් වන බව

**6.** යම් දේපළක් අපරාධයකින් උත්පාදිත දෙයක් බවට දැනුම්වත්ව හෝ විශ්වාස කිරීම සඳහා සාධාරණ හේතු පැවතිය දී -

(අ) එම දේපළෙහි හෝ එහි කොටසක සම්භවය, සත්‍ය ස්වභාවය, ප්‍රභවය, ස්ථානය, බැහැර කිරීම, සංචලනය, අයිතිය, අත්කර ගැනීම, සන්තකය, භාවිතය හෝ වටිනාකම;

(ආ) එම දේපළ උත්පාදනය වීමට හේතු වන නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කර තිබිය හැකි තැනැත්තන්ගේ අනන්‍යතාවන්; හෝ

(ඇ) එම දේපළ සම්බන්ධයෙන් අර්ථලාභී සම්බන්ධතා සහිත තැනැත්තන්ගේ අනන්‍යතා,

පරිවර්තනය කිරීමේ, මාරු කිරීමේ, සැඟවීමේ හෝ ස්වරූපය වෙනස් කිරීමේ කාර්යය සඳහා යම් ගනුදෙනුවක් සිදු කිරීම හෝ යම් ක්‍රියාවකට අදාළව උපදෙස් ලබා දීම හෝ ඇතුළු යම් ක්‍රියාවක් සෘජුව හෝ වක්‍රව තමා විසින් හෝ වෙනත් තැනැත්තන්ගේ සහභාගීත්වය සහිතව සිදු කරන්නා වූ යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබයි.

අපරාධයකින් උත්පාදිත දේ අත්කර ගැනීම, සන්තකයේ තබා ගැනීම ආදිය වරදක් වන බව

**7.** යම් දේපළක් අපරාධයකින් උත්පාදිත දේ බවට දැනුම්වත්ව හෝ විශ්වාස කිරීමට සාධාරණ හේතු පැවතිය දී එම දේපළ අත්කර ගන්නා, සන්තකයේ තබා ගන්නා, භාවිත කරන, භාරයේ තබා ගන්නා, පාලන බලය ක්‍රියාත්මක කරන, පාලනය කරන හෝ රඳවාගන්නා යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබයි.

අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ සාක්ෂි විනාශ කිරීම වරදක් බව

**8.** අපරාධයකින් උත්පාදිත දෙයක් වන යම් දේපළකට අදාළ සාක්ෂි දැන දැනම විනාශ කරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබයි.

ආඥා බලාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කිරීම උල්ලංඝනය හෝ ඒ සඳහා බාධා කිරීම වරදක් වන බව

**9.** (අ) තහනම් කිරීමේ නියෝගයක්, තහනමට ගැනීමේ, අධිකරණමය ක්‍රියා විරහිත කිරීමේ ආඥාවක්;

(ආ) මේ පනත යටතේ නීතිය බලාත්මක කිරීමේ නිලධරයකු විසින් නිකුත් කරන ලද යම් දැන්වීමක් හෝ නියෝගයක්;

(ඇ) අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ විමර්ශනයකට අදාළව නිකුත් කරන ලද යම් අධිකරණ ආඥාවක්; හෝ

(ඇ) අපරාධයකින් උත්පාදිත දේ සම්බන්ධයෙන් මේ පනත යටතේ නිකුත් කරන ලද යම් අධිකරණ ආඥාවක්,

බලාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කිරීම උල්ලංඝනය කරනු ලබන හෝ ඒ සඳහා බාධා කරනු ලබන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබයි.

දැන්වීමක් භාර ගැනීම පැහැර හැරීම හෝ දැන්වීමක් සඳහා සාවද්‍ය පිළිතුරක් ලබා දීම වරදක් වන බව

**10.** මේ පනතේ 68 වන වගන්තිය යටතේ වූ දැන්වීමක් භාර දී ඇති සහ -

(අ) එම දැන්වීම භාර ගැනීම ප්‍රතික්ෂේප කරනු ලබන;

(ආ) එම දැන්වීම සඳහා සත්‍යවාදී ලෙස පිළිතුරු ලබා දීමට අපොහොසත් වනු ලබන; හෝ

(ඇ) එම දැන්වීම සඳහා දැන දැනම සාවද්‍ය, හෝ අසත්‍ය පිළිතුරක් ලබා දෙනු ලබන හෝ හිතාමතා කරුණු වැරදි ලෙස ඉදිරිපත් කරනු ලබන හෝ වංචනිකව ක්‍රියා කරනු ලබන,

යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබයි.

**11.** 68 වන වගන්තිය යටතේ දැන්වීමක් භාර දෙනු ලැබ ඇති යම් තැනැත්තකු වෙත එම නිවේදනය සඳහා සාවද්‍ය හෝ නොමඟ යවන සුලු හෝ වංචාකාරී පිළිතුරක් ලබා දීමට යම් තැනැත්තකුට චේතනාන්විතව අනුබල ලබා දෙනු ලබන, උපදෙස් ලබා දෙනු ලබන, පොළඹවනු ලබන, බලපෑම් කරනු ලබන හෝ තර්ජනය කරනු ලබන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබයි.

දැන්වීමකට සාවද්‍ය පිළිතුරු සැපයීම සඳහා අනුබල දීම වරදක් බව

**12.** යම් දේපළක් අධිකරණමය ක්‍රියා විරහිත කිරීමක්, නිදහස් කිරීමක්, වැළැක්වීමේ කාර්ය සඳහා හෝ අධිකරණමය ක්‍රියා විරහිත කිරීමේ ආඥාවක් වෙනස් කිරීමේ හෝ අවලංගු කිරීමේ කාර්ය සඳහා මහාධිකරණය වෙත සාවද්‍ය හෝ නොමඟ යවන සුලු හිමිකම්පෑමක්, විස්තරයක් හෝ නියෝජනයක් ඉදිරිපත් කරනු ලබන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබයි.

අධිකරණමය ක්‍රියා විරහිත කිරීමක් වැළැක්වීම සඳහා සාවද්‍ය හෝ නොමඟ යවන සුලු හිමිකම්පෑමක් ඉදිරිපත් කිරීම වරදක් වන බව

**13.** යම් දේපළක් රජය සතු වීම හෝ නිදහස් කිරීම වැළැක්වීමේ කාර්ය සඳහා මහාධිකරණය වෙත නොමඟ යවන සුලු හිමිකම්පෑමක්, විස්තරයක්, නියෝජනයක් හෝ සාවද්‍ය හෝ නොමඟ යවන සුලු විස්තරක් හෝ සාවද්‍ය ලේඛනයක් අන්තර්ගත සාවද්‍ය දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබයි.

රජය සතු කිරීමක් වැළැක්වීම සඳහා සාවද්‍ය හෝ නොමග යවන සුලු හිමිකම්පෑමක් ඉදිරිපත් කිරීම වරදක් වන බව

6 වන, 7 වන, 8 වන, 9 වන, 10 වන, 11 වන, 12 වන හෝ 13 වන වගන්තිය යටතේ යම් වරදක් සිදු කිරීම සඳහා ආධාර කිරීම සහ අනුබල දීම වරදක් බව

**14.** (1) 6 වන, 7 වන, 8 වන, 9 වන, 10 වන, 11 වන, 12 වන හෝ 13 වන වගන්තිය යටතේ වරදක් සිදු කිරීමට තැත් කරන හෝ කුමන්ත්‍රණය කරන හෝ එවැනි වරදක් සිදු කිරීමට ආධාර හෝ අනුබල දෙන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබයි.

(2) මේ වගන්තියේ "අනුබල දීම", "ආධාර දීම" සහ "කුමන්ත්‍රණය කිරීම" යන්නට, දණ්ඩ නීති සංග්‍රහයේ 100 වන, 111 වන සහ 113 වන වගන්තිවල දී ඇති අර්ථයම ඇත්තේ ය.

6 වන, 7 වන, 8 වන, 9 වන, 10 වන, 11 වන, 12 වන, 13 වන හෝ 14 වන වගන්තිය යටතේ වන වැරදි මහාධිකරණය විසින් විභාග කරනු ලැබිය යුතු බව සහ එම වැරදි සඳහා දණ්ඩන

**15.** (1) 6 වන, 7 වන, 8 වන, 9 වන, 10 වන, 11 වන, 12 වන, 13 වන හෝ 14 වන වගන්තිය යටතේ යම් වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් නීතිපතිවරයා විසින් අධිචෝදනා ගොනු කිරීමෙන් නඩු විභාග කර යම් තැනැත්තකු වෙත දඬුවම් කිරීම සඳහා මහාධිකරණය වෙත අධිකරණ බලය තිබිය යුතු ය:

එසේ වුව ද, එම වරද දූෂණ විරෝධී පනතේ අන්තර්ගත යම් වරදක් සිදු කිරීම තුළින් ව්‍යුත්පන්න වී ඇති අපරාධයකින් උත්පාදිත දේ සම්බන්ධයෙන් සිදු කර ඇති අවස්ථාවක දී, අධිචෝදනා ඉදිරිපත් කර චූදිතයාට එරෙහිව නඩු පැවරීමේ අධිකාරී බලය කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන විධානයක් මත ක්‍රියා කරනු ලබන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත තිබිය යුතු ය.

(2) 6 වන, 7 වන, 8 වන, 9 වන, 10 වන 11 වන, 12 වන, 13 වන හෝ 14 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් වරදක් සිදු කරනු ලබන යම් තැනැත්තකු මහාධිකරණය ඉදිරියේ දී පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන දහයක් නොඉක්මවන දඩ මුදලකට සහ වසර පහළොවක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට යටත් විය යුතු ය. එකී බන්ධනාගාරගත කිරීම සම්බන්ධයෙන් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 303 වන සහ 306 වන වගන්තිවල සඳහන් විධිවිධාන අදාළ නොවිය යුතු ය.

දැනීම හෝ තොරතුරු හෙළිදරව් කිරීම පැහැර හැරීම වරදක් වන බව

**16.** (1) (අ) අපරාධයකින් උත්පාදිත දෙයෙහි ස්ථානය සහ ස්වභාවය ඇතුළු අපරාධයකින් උත්පාදිත දෙයට;

(ආ) අපරාධයකින් උත්පාදිත දේ සැඟවීමට හෝ ස්වරූපය වෙනස් කිරීමට;

(ඇ) අපරාධයකින් උත්පාදිත දේ සම්බන්ධ යම් ගනුදෙනුවකට; හෝ

(ඈ) මේ පනතේ අන්තර්ගත යම් වරදක් සිදු කිරීමට,

අදාළව සත්‍ය බවට තමා විශ්වාස කරනු ලබන යම් දැනුමක් හෝ තොරතුරක් සතු සහ එම දැනුම හෝ තොරතුරු පොලීසියේ නම් කරන ලද නිලධරයා වෙත හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නම් කරන ලද නිලධරයා වෙත හෙළිදරව් කිරීමට අපොහොසත් වන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබයි:

එසේ වුව ද, ස්වකීය වෘත්තීය කටයුතු ඉටු කිරීමේ දී අපරාධයකින් උත්පාදිත දේ පැවතීම පිළිබඳ හෝ අපරාධයකින් උත්පාදිත දේ සම්බන්ධව යම් තොරතුරක් ලැබෙන යම් නීතිඥවරයකුට, එම තොරතුරුවලට අදාළව රහස්‍යභාවය පවත්වා ගැනීම, වෘත්තීය ආචාර ධර්ම ප්‍රකාරව ඔහුට නියමිත වන්නේ නම්, එම තොරතුරු පොලිසියේ නම් කරන ලද නිලධරයා වෙත හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නම් කරන ලද නිලධරයා වෙත එම තොරතුරු ලබා දීම අවශ්‍ය නොවිය යුතු ය:

එසේ ම තවදුරටත්, ස්වකීය සේවා නියුක්තිය තුළ දී හෝ වෘත්තීය සේවා සැපයීමේ දී හෝ අපරාධයකින් උත්පාදිත දේ සම්බන්ධව තොරතුරු ලැබෙන හෝ ඒ පිළිබඳ දැනුවත් වන සහ එම තොරතුරු මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව පත් කර ඇති අනුකූලතා නිලධරයා වෙත හෝ අනුකූලතා නිලධරයකු නොමැති අවස්ථාවක දී, මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ කාර්ය සඳහා පිළිගත් අධීක්ෂණ අධිකාරියට සහ එවැනි අධීක්ෂණ අධිකාරියක් නොමැති අවස්ථාවක දී ස්වකීය සේවා යෝජකයාගේ ප්‍රධාන විධායක නිලධරයා වෙත ලබා දෙන යම් තැනැත්තකු හෙළිදරව් කිරීමට අනුකූලව ක්‍රියා කිරීම අවශ්‍ය නොවිය යුතු ය:

එසේ ම තවදුරටත්, මේ වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි තොරතුරු හෙළි කිරීමට යම් තැනැත්තකු අපොහොසත් වන අවස්ථාවක දී, ඒ තැනැත්තා විසින් එසේ තොරතුරු හෙළි කිරීමට අපොහොසත් වූයේ සද්භාවයෙන් සහ මේ පනතේ අරමුණු සාක්ෂාත් කිරීමට පහසුකම් සැලසීමේ කාර්යය සඳහා වන බව පෙනී යන්නේ නම් එසේ තොරතුරු හෙළි කිරීමට අපොහොසත් වූ තැනැත්තා වරදක් සිදු නොකළ යුතු බවට සැලකිය යුතු වේ.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ යම් දැනුමක් හෝ තොරතුර දූෂණ විරෝධී පනතේ අන්තර්ගත යම් වරදකට අදාළ අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳව වන අවස්ථාවක දී, එම දැනුම හෝ තොරතුර අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නම් කරන ලද නිලධරයා වෙත හෙළිදරව් කරනු ලැබිය යුතු ය. වෙනත් සියලු අපරාධයකින් උත්පාදිත දේ හා සම්බන්ධ එවැනි දැනුම හෝ තොරතුරු පොලිසියේ නම් කරන ලද නිලධරයා වෙත හෙළිදරව් කරනු ලැබිය යුතු ය.

අපරාධයකින් උත්පාදිත දේ සම්බන්ධ තොරතුරු හෙළිදරව් කිරීම අධෛර්යමත් කිරීම හෝ වැළැක්වීම වරදක් වන බව

**17.** අපරාධයකින් උත්පාදිත දේ සම්බන්ධයෙන් තොරතුරු නම් කරන ලද නිලධරයකු වෙත හෝ විමර්ශන නිලධරයකු වෙත හෙළිදරව් කිරීම අධෛර්යමත් කරන, වළක්වන, බාධා කරන හෝ හෙළිදරව් කිරීම අධෛර්යමත් කරන, වළක්වන හෝ බාධා කරන පරිද්දෙන් උපදෙස් ලබා දෙන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබයි:

එසේ වුව ද, වෘත්තීය ආචාර ධර්ම ප්‍රකාරව ස්වකීය වෘත්තීය සේවා සපයන යම් නීතිඥවරයකු මෙම වරද සිදු කිරීම සම්බන්ධයෙන් චෝදනාවට ලක් කරනු නොලැබිය යුතු ය.

මේ පනත යටතේ බලය ලබා දී ඇති තැනැත්තන්ට බාධා කිරීම වරදක් වන බව

**18.** මේ පනත යටතේ යම් කර්තව්‍යයක් ඉටු කිරීම සඳහා බලය ලබා දී ඇත්තා වූ යම් තැනැත්තකුට ඒ කාර්යය ඉටු කිරීමේ දී චේතනාන්විතව මැදිහත් වන, උපදෙස් දෙන, අවවාද ලබාදෙන, බාධා කරන, වළක්වන, අධෛර්යමත් කරන හෝ එම තැනැත්තාව වැළැක්වීම, ඔහුට අධෛර්යමත් කිරීම හෝ බාධා කිරීම සඳහා වෙනත් යම් පියවරක් ගනු ලබන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබයි:

එසේ වුව ද, මේ පනත යටතේ යථා පරිදි බලය ලබා දී ඇති හෝ බලය පවරා ඇති යම් තැනැත්තකු විසින් සද්භාවයෙන් පනතේ අරමුණු සමඟ අනනුකූල නොවන අරමුණු සඳහා මේ පනත මගින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට උපදෙස් නිකුත් කිරීම හෝ අවවාද ලබා දීම වරදක් නොවිය යුතු ය.

මේ පනත යටතේ බලය ලබා දී ඇති යම් තැනැත්තකුට අගතිගාමී බලපෑමක් ඇති කිරීමේ අරමුණින් යුතුව නීතිය මගින් විධිවිධාන සලස්වා නොමැති යම් ක්‍රියාවක් සිදු කිරීම වරදක් වන බව

**19.** වෙනත් යම් තැනැත්තකු වෙත මේ පනත යටතේ ඉටු කිරීමට බලය පවරා ඇති යම් ක්‍රියාවක් එම වෙනත් යම් තැනැත්තා විසින් සද්භාවයෙන් සහ නීත්‍යානුකූල ආකාරයෙන් ඉටු කිරීම සම්බන්ධයෙන් එම වෙනත් යම් තැනැත්තා වෙත අගතිගාමී බලපෑමක් හෝ මානසික වේදනාවක් ඇති කිරීමේ අරමුණින් යුතු ව-

(අ) සේවා නියුක්තයේ යම් තත්ත්වයක්, හිමිකමක් හෝ වරප්‍රසාදයක් සඳහා අහිතකර වෙනස්කමක්;

(ආ) පළිගැනීමක්;

(ඇ) බලකිරීමක්;

(ඈ) බිය වැද්දීමක්;

(ඉ) ප්‍රති ප්‍රහාරයක්;

(ඊ) පීඩාවක්;හෝ

(උ) යම් හිමිකමක් අහිමි කිරීමක්,

සිදුවීමට හේතු වන පරිදි නීතිය මගින්, පරිපාලන නියෝග මගින් හෝ රීති මගින් විධිවිධාන සලස්වා නොමැති යම් තීරණයක් හෝ ක්‍රියාවක් ස්වකීය නිල තත්ත්වයෙන් හෝ අන්‍යාකාරයෙන් ගනු ලබන හෝ සිදු කරනු ලබන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබයි.

මේ පනතේ අරමුණු යටපත් කිරීමේ අරමුණින් යුතුව අනවසරයෙන් විධාන ආදිය නිකුත් කිරීම වරදක් වන බව

**20.** නම් කරන ලද නිලධරයකුට හෝ විමර්ශන නිලධරයකුට මේ පනත යටතේ යම් කර්තව්‍යයක් ඉටු කිරීමට හෝ බලතල ක්‍රියාත්මක කිරීමට උපදෙස් නිකුත් කිරීමට හෝ අවවාද ලබා දීමට මේ පනත යටතේ හෝ වෙනත් යම් නීතියක් මගින් බලය ලබා දී නැති හෝ බලය පවරා දී නොමැති යම් තැනැත්තකු මේ පනතේ අරමුණු යටපත් කිරීමේ අදහසින් යුතුව යම් විධානයක් නිකුත් කිරීම, උපදෙස් දීම, යම් කර්තව්‍යක් ඉටු කිරීමට හෝ යම් බලතලයක් ක්‍රියාත්මක කිරීමට බලපෑම් කිරීම, යම් තොරතුරක් හෝ යම් දෙයක් ඉල්ලා සිටීම හෝ ලබා ගැනීම සිදු කරනු ලබයි නම් ඔහු වරදක් සිදු කරනු ලබයි.

අනවසරයෙන් තොරතුරු හෙළිදරව් කිරීම වරදක් වන බව

**21.** (අ) නම් කරන ලද නිලධරයකු විසින් හෝ විමර්ශන නිලධරයකු විසින් තොරතුරු, ලේඛන හෝ වෙනත් දෙයක් කැඳවා ඇත්තා වූ ද;

(ආ) යම් කර්තව්‍යයක් ඉටු කරන ලෙස හෝ යම් තොරතුරු හෝ දෙයක් සපයන ලෙස මේ පනත යටතේ යථා පරිදි බලය පවරන ලද යම් තැනැත්තකු විසින් නියම කර ඇත්තා වූ ද; හෝ

(ඇ) යම් තොරතුරක්, ලේඛනයක් හෝ වෙනත් යම් දෙයක් සපයන ලෙස හෝ යම් සේවයක් ලබා දෙන ලෙස හෝ යම් ක්‍රියාවක් සිදු කරන ලෙස යම් අධිකරණ ආඥාවක් මගින් විධාන ලැබ ඇත්තා වූ ද,

මේ පනතේ අරමුණු බලාත්මක කිරීම සඳහා අවශ්‍ය වේ නම් මිස, එම තොරතුරු ලබා ගැනීම සඳහා මේ පනත යටතේ බලය පවරා නොමැති වෙනත් යම් තැනැත්තකු වෙත එම කාරණය සම්බන්ධයෙන් තොරතුරු සපයනු ලබන්නා වූ ද යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබයි.

*පැහැදිලි කිරීම:*

යම් නිශ්චිත බැංකු ගිණුමක් පිළිබඳ තොරතුරු සපයන ලෙස සහ එම ගිණුමට අදාළ ඇතැම් ලේඛන ඉදිරිපත් කරන ලෙස එම බැංකුව වෙත නියම කරමින් යම් විමර්ශන නිලධරයකු විසින් බැංකුවක් වෙත සෘජුව ම හෝ මහෙස්ත්‍රාත්වරයකු විසින් නිකුත් කරනු ලබන ආඥාවක් හරහා දැන්වීමක් නිකුත් කර ඇති අවස්ථාවක දී, බැංකුව වෙත පනවා ඇති එම නියම කිරීම ගිණුම්හිමියා වෙත හෝ තුන්වන පාර්ශ්වයක් වෙත අනාවරණය කරනු ලබන බැංකුවේ යම් සේවානියුක්තයකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබයි.

බලය නොපවරන ලද තැනැත්තකු විසින් තොරතුරු හෙළිදරව් කරන ලෙස විධාන කිරීම වරදක් වන බව

**22.** නම් කරන ලද නිලධරයකු හෝ විමර්ශන නිලධරයකු සම්බන්ධයෙන් කළමනාකරණමය, අධීක්ෂණමය හෝ පරිපාලනමය අධිකාරී බලයක් සතුව පැවතිය හැකි තැනැත්තකු ඇතුළු නම් කරන ලද නිලධරයකු, විමර්ශන නිලධරයකු හෝ නම් කරන ලද නිලධරයකු හෝ විමර්ශන නිලධරයකුට ජ්‍යෙෂ්ඨ වන්නා වූ, සමාන්තර වන්නා වූ හෝ පහළ මට්ටමක වන්නා වූ වෙනත් යම් තැනැත්තකු-

(අ) මේ පනත යටතේ යම් තැනැත්තකු විමර්ශනය කිරීමට ලක් කර ඇති බවට;

(ආ) අපරාධයකින් උත්පාදිත දේ බවට සැක කිරීම මත යම් දේපළක් විමර්ශනය කිරීමට ලක් කර ඇති බවට;

(ඇ) නම් කර ඇති හෝ අන්‍යාකාරයකින් විස්තර කර ඇති තැනැත්තකු මේ පනත යටතේ විමර්ශනයක් පවත්වමින් සිටින බවට හෝ මේ පනත යටතේ විමර්ශනයක් පැවැත්වීමේ දී උපදෙස් ලබාදෙමින් සිටින බවට හෝ අන්‍යාකාරයකින් විමර්ශනයක් පැවැත්වීම සඳහා සහාය ලබාදෙමින් සිටින බවට;

(ඈ) අධිකරණයක් වෙත මේ පනත යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කරමින් සිටින බවට; හෝ

(ඉ) යම් දේපළක් සම්බන්ධයෙන් තහනම් කිරීමේ, තහනමට ගැනීමේ, අධිකරණමය ක්‍රියා විරහිත කිරීමේ හෝ රජය සතු කිරීමේ ආඥාවක් නිකුත් කිරීමට නියමිත බවට,

තොරතුරු හෙළිදරව් කරනු ලබන්නා වූ, තොරතුරු මුදා හැරීමට කටයුතු සලස්වනු ලබන්නා වූ ද, එසේ තොරතුරු හෙළිදරව් කරන ලෙස හෝ මුදාහරින ලෙස විධාන කරනු ලබන්නා වූ ද යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබයි:

එසේ වුව ද-

(අ) මේ පනත මගින් හෝ වෙනත් යම් නීතියක් මගින් එම තැනැත්තා වෙත නියමකර හෝ බලය පවරා තිබීම හේතුවෙන්;

(ආ) මේ පනතේ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්ය සඳහා තමා විසින් ක්‍රියා කිරීම හේතුවෙන්; හෝ

(ඇ) අධිකරණයක් විසින් නිකුත් කරනු ලබන ආඥාවකට ප්‍රතිචාර වශයෙන් ඔහු විසින් එසේ ක්‍රියා කිරීම හේතුවෙන්,

එම තොරතුරු සපයා තිබීම වරදක් නොවිය යුතු ය.

වගකීමක් ඉටු කිරීම පැහැර හැරීම වරදක් වන බව

**23.** මේ පනත යටතේ තමා වෙත පවරා ඇති යම් වගකීමකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබයි:

එසේ වුව ද, ඔහු විසින් අදාළ වගකීම සපුරාලීම සඳහා සද්භාවයෙන් උත්සාහ කර ඇති බවට සහ එම වගකීම ඉටු කිරීමට අපොහොසත් වීම ඔහුගේ පාලනයෙන් පරිබාහිරව පැවති හේතු නිසා සිදු වූ බවට තහවුරු කිරීමට එම තැනැත්තාට හැකි වේ නම්, ඔහු නඩු පැවරීමකට හෝ වරදකරු වීම සඳහා යටත් නොවිය යුතු ය.

**24.** (1) 16 වන, 17 වන, 18 වන, 19 වන, 20 වන, 21 වන, 22 වන හෝ 23 වන වගන්තිය යටතේ යම් වරදක් සිදු කිරීමට තැත් කරන හෝ කුමන්ත්‍රණය කරන හෝ එවැනි වරදක් සිදු කිරීමට ආධාර හෝ අනුබල ලබාදෙන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබයි.

16 වන, 17 වන, 18 වන, 19 වන, 20 වන, 21 වන, 22 වන හෝ 23 වන වගන්තිය යටතේ වරදකට ආධාර දීම සහ අනුබල දීම වරදක් වන බව

(2) මේ වගන්තියේ "අනුබල දීම", "ආධාර දීම" සහ "කුමන්ත්‍රණය කිරීම" යන්නට, දණ්ඩ නීති සංග්‍රහයේ 100 වන, 111 වන සහ 113 වන වගන්තිවල දී ඇති අර්ථය ම ඇත්තේ ය.

**25.** (1) අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, නීතිපතිවරයාගේ අනුමතය සහිතව 16 වන, 17 වන, 18 වන, 19 වන, 20 වන, 21 වන, 22 වන, 23 වන හෝ 24 වන වගන්තියේ අන්තර්ගත වැරදි සිදු කිරීම සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණයේ අපරාධ නඩු කටයුතු පවරා ඇත්තේ යම් තැනැත්තකුට එරෙහිව ද එවැනි තැනැත්තකු සම්බන්ධයෙන් නඩු විභාග කිරීම සඳහා සහ එවැනි තැනැත්තකුට මේ පනත ප්‍රකාරව දඬුවම් කිරීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණයට අධිකරණ බලය තිබිය යුතු ය.

16 වන, 17 වන, 18 වන, 19 වන, 20 වන, 21 වන, 22 වන, 23 වන හෝ 24 වන වගන්තිය යටතේ වූ වැරදි මහෙස්ත්‍රාත් අධිකරණය විසින් විභාග කරනු ලැබිය යුතු බව සහ එම වැරදි සඳහා වූ දණ්ඩන

(2) 16 වන, 17 වන, 18 වන, 19 වන, 20 වන, 21 වන, 22 වන, 23 වන හෝ 24 වන වගන්තියේ අන්තර්ගත යම් වරදක් දූෂණ විරෝධී පනත යටතේ වූ වරදක් සිදු කිරීම තුළින් ලබාගෙන ඇති, ව්‍යුත්පන්න වූ හෝ උපලබ්ධි වූ දේපළක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, එම වරද සිදු කිරීම විභාග කිරීම සඳහා අපරාධ නඩු කටයුතු පැවරීම සඳහා සහ චූදිතයාට එරෙහිව චෝදනාව මෙහෙයවීම සඳහා කොමිෂන් සභාවේ විධානයක් මත ක්‍රියා කරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත හිමිකමක් තිබිය යුතු ය.

(3) 16 වන, 17 වන, 18 වන, 19 වන, 20 වන, 21 වන, 22 වන, 23 වන හෝ 24 වන වගන්තිය යටතේ යම් වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් වරදකරු වී ඇති තැනැත්තකුට වසර පහක් නොඉක්මවන කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමේ සහ රුපියල් මිලියන එකක් නොඉක්මවන දඩ මුදලකින් දඬුවම් කරනු ලැබිය යුතු ය. එම බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනය

සම්බන්ධයෙන් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 306 වන වගන්තියේ සඳහන් විධිවිධාන අදාළ නොවිය යුතු ය.

සංස්ථාගත මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන වැරදි

**26.** (1) මේ පනත යටතේ වූ යම් වරදක් සංස්ථාගත පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන අවස්ථාවක දී, එම සංස්ථාගත පුද්ගල මණ්ඩලයට අතිරේකව, එම වරද සිදු කරන අවස්ථාවේ සිටි එම සංස්ථාගත මණ්ඩලයේ සියලු අධ්‍යක්ෂවරුන්, එම අදාළ වරද සංයුක්ත වන ක්‍රියාව සිදු කිරීම සම්බන්ධයෙන් එම එක් එක් අධ්‍යක්ෂවරයා වගකිව යුතු නොවූව ද, එම වරද සිදු කිරීම සම්බන්ධයෙන් තනි තනිව වගකියනු ලැබිය යුතු ය:

එසේ වුව ද, එම වරද තමාගේ අනුදැනුම නොමැතිව සිදු කරන ලද බව හෝ ඒ වරද කිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය සියලු නිසි උද්යෝගයෙන් ක්‍රියා කරනු ලැබූ බවට යම් අධ්‍යක්ෂවරයකු-

(අ) විමර්ශනය පවත්වන විමර්ශන නිලධරයා සෑහීමට පත් වන පරිදි කරුණු ඉදිරිපත් කරන්නේ නම්, එම අධ්‍යක්ෂවරයාට එරෙහිව නඩු පවරනු ලැබීම; හෝ

(ආ) අධිකරණය ඉදිරියේ ශක්‍යතා වැඩි බර මත ඔප්පු කරන්නේ නම් ඔහු වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් වරදකරු වන බවට සැලකීම,

සිදු නොකළ යුතු ය.

(2) සංස්ථාගත පුද්ගල මණ්ඩලයක අධ්‍යක්ෂවරුන්ට එරෙහිව අපරාධ නඩු කටයුතු පැවරීමේ කාර්ය සඳහා, අනුරූප සංස්ථාගත පුද්ගල මණ්ඩලයට එරෙහිව පළමුව නඩු පවරා වරදකරු කිරීමේ ආඥාවක් ලබා ගැනීම අවශ්‍ය නොවිය යුතු ය.

සංස්ථාගත නොකළ මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන වැරදි

**27.** (1) මේ පනත යටතේ වූ යම් වරදක් සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන අවස්ථාවක දී, එම සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයට අතිරේකව, එම වරද සිදු කරන අවස්ථාවේ සිටි එම මණ්ඩලයේ සියලු ධුර දරන්නන්,

එම අදාළ වරද සංයුක්ත වන ක්‍රියාව සිදු කිරීම සම්බන්ධයෙන් එම එක් එක් ධුර දරන්නන් වගකිව යුතු නොවූව ද, එම වරද සිදු කිරීම සම්බන්ධයෙන් තනි තනිව වගකියනු ලැබිය යුතු ය:

එසේ වුව ද, එම වරද තමාගේ අනුදැනුම නොමැතිව සිදු කරන ලද බව හෝ ඒ වරද කිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය සියලු නිසි උද්යෝගයෙන් ක්‍රියා කරනු ලැබූ බවට යම් ධුර දරන්නකු-

(අ) විමර්ශනය පවත්වන විමර්ශන නිලධරයා සෑහීමට පත් වන පරිදි කරුණු ඉදිරිපත් කරන්නේ නම්, එම ධුර දරන්නාට එරෙහිව නඩු පවරනු ලැබීම; හෝ

(ආ) අධිකරණය ඉදිරියේ ශක්‍යතා වැඩි බර මත ඔප්පු කරන්නේ නම්, ඔහු වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් වරදකරු වන බවට සැලකීම,

සිදු නොකළ යුතු ය.

(2) සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක ධුර දරන්නන්ට එරෙහිව අපරාධ නඩු කටයුතු පැවරීමේ කාර්ය සඳහා, අනුරූප සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයට එරෙහිව පළමුව නඩු පවරා වරදකරු කිරීමේ ආඥාවක් ලබා ගැනීම අවශ්‍ය නොවිය යුතු ය.

හවුල් ව්‍යාපාරයක් විසින් සිදු කරනු ලබන වැරදි

**28.** මේ පනත යටතේ වූ යම් වරදක් හවුල් ව්‍යාපාරයක නාමය සහ අභිධානය යටතේ සිදු කරනු ලබන අවස්ථාවක දී, එම වරද සිදු කරන අවස්ථාවේ සිටි එම හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවන්, එම වරද සංයුක්ත වන ක්‍රියාව සිදු කිරීම සම්බන්ධයෙන් එම එක් එක් හවුල්කරුවන් වගකිව යුතු නොවූව ද එම වරද සිදු කිරීම සම්බන්ධයෙන් තනි තනිව වගකියනු ලැබිය යුතු ය:

එසේ වුව ද, එම වරද තමාගේ අනුදැනුම නොමැතිව සිදු කරන ලද බව හෝ ඒ වරද කිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය සියලු නිසි උද්යෝගයෙන් ක්‍රියා කරනු ලැබූ බවට යම් හවුල්කරුවකු-

(අ) විමර්ශනය පවත්වන විමර්ශන නිලධරයා සෑහීමට පත් වන පරිදි කරුණු ඉදිරිපත් කරන්නේ නම්, එම හවුල්කරුට එරෙහිව නඩු පවරනු ලැබීම; හෝ

(ආ) අධිකරණය ඉදිරියේ ශක්‍යතා වැඩි බර මත ඔප්පු කරන්නේ නම්, ඔහු වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් වරදකරු වන බවට සැලකීම,

සිදු නොකළ යුතු ය.

මේ පනත යටතේ වූ සියලු වැරදි සංඥෙය වැරදි විය යුතු බව

**29.** අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ කාර්ය සඳහා මේ පනත යටතේ වන සියලු වැරදි සංඥෙය වැරදි විය යුතු ය.

මේ පනත යටතේ වන වැරදි, අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන යටතේ විමර්ශනය කළ යුතු බව

**30.** මේ පනතේ විධිවිධානවලට යටත්ව, මේ පනත යටතේ වන වැරදි සිදු කිරීම පිළිබඳව විමර්ශනය කිරීම අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ නියම කරනු ලබන ආකාරයට සහ අදාළ වන අවස්ථාවල දී වෙනත් යම් ලිඛිත නීතියක් ප්‍රකාරව සිදු කරනු ලැබිය යුතු ය.

තොරතුරු හෙළිදරව් කිරීමේ වගකීම

**31.** ස්වකීය සේවා නියුක්තිය, වෘත්තීය, වෙළෙඳාම, ව්‍යාපාර, රැකියාව තුළ දී හෝ ස්වකීය ගිවිසුම්ගත කාර්ය ඉටු කිරීමේ දී -

(අ) අපරාධයකින් උත්පාදිත දේ හි ස්ථානය, ස්වභාවය, වටිනාකම, එම අපරාධයකින් උත්පාදිත දේ හි සන්තකය, භාරය, පාලනය සතුව පවතින තැනැත්තාගේ අනන්‍යතාවය, අපරාධයකින් උත්පාදිත දේ සැඟවීම හෝ ස්වරූපය වෙනස් කිරීම හෝ අපරාධයකින් උත්පාදිත දේ හා සම්බන්ධ යම් ගනුදෙනු ඇතුළත්ව අපරාධයකින් උත්පාදිත දේට අදාළ; හෝ

(ආ) මේ පනත යටතේ යම් වරදක් සිදු කිරීමට අදාළ,

තොරතුරු පිළිබඳව දැනුම්වත් වේ නම් හෝ දැනුමක් ලැබේ නම් හෝ තොරතුරු ලැබේ නම්, ඒ තොරතුරු, තොරතුරු ලබා දීම තහවුරු කිරීමක් ඒ තොරතුරු සැපයූ තැනැත්තා වෙත ලබා දිය යුතු පොලිසියේ නම් කරන ලද නිලධරයා වෙත හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නම් කරන ලද නිලධරයා වෙත හෙළිදරව් කළ යුතු ය:

එසේ වුව ද, එම තොරතුරු සපයනු ලබන තැනැත්තා විසින් මේ පනත යටතේ විධිවිධාන සලසා ඇති පරිදි තොරතුරු හෙළිදරව් කිරීමට කැමැත්ත ලබා දී ඇත්නම් මිස, යම් නීතිඥවරයකු වෙත ලැබී ඇති තොරතුරක රහස්‍යභාවය පවත්වාගෙන යෑම සඳහා වෘත්තීයමය ආචාර ධර්ම ප්‍රකාරව ඔහුට නියමිත වන්නේ නම්, ස්වකීය වෘත්තීය කාර්යවල දී එවැනි දැනීමක් හෝ තොරතුරු ලැබෙන්නා වූ යම් නීතිඥවරයකු මෙම ව්‍යවස්ථාපිත වගකීම ඉටු කිරීම සඳහා වූ වගකීමෙන් බැඳී නොසිටිය යුතු ය:

එසේ ම තවදුරටත්, ස්වකීය සේවා නියුක්තිය තුළ දී හෝ වෘත්තීය සේවා සැපයීමේ දී හෝ අපරාධයකින් උත්පාදිත දේ සම්බන්ධව තොරතුරු ලැබෙන හෝ ඒ පිළිබඳ දැනුම්වත් වන සහ එම තොරතුරු මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව පත් කර ඇති අනුකූලතා නිලධරයා වෙත හෝ අනුකූලතා නිලධරයකු නොමැති අවස්ථාවක දී මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ කාර්යය සඳහා පිළිගත් අධීක්ෂණ අධිකාරිය සහ එවැනි අධීක්ෂණ අධිකාරියක් නොමැති අවස්ථාවක දී, ස්වකීය සේවා යෝජකයාගේ ප්‍රධාන විධායක නිලධරයා වෙත ලබා දෙන යම් තැනැත්තකු හෙළිදරව් කිරීමට අනුකූලව ක්‍රියා කිරීම අවශ්‍ය නොවිය යුතුය:

එසේ ම තවදුරටත්, මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි තොරතුරු හෙළිදරව් කිරීමට යම් තැනැත්තකු අපොහොසත් වන අවස්ථාවක දී, ඒ තැනැත්තා විසින් එසේ තොරතුරු හෙළිදරව් කිරීමට අපොහොසත් වූයේ සද්භාවයෙන් සහ මේ පනතේ අරමුණු සාක්ෂාත් කිරීමට පහසුකම් සැලසීමේ කාර්යය සඳහා වන විට, එසේ තොරතුරු හෙළිදරව් කිරීමට අපොහොසත් වූ තැනැත්තා වරදක් සිදු කර නොමැති බවට සැලකිය යුතු ය.

තොරතුරු සපයන්නන් සහ අකටයුතුකම් දැනුම් දෙන්නන් ආරක්ෂා කිරීම

**32.** (1) 31 වන වගන්තිය යටතේ සහ එය ප්‍රකාරව ස්වකීය ව්‍යවස්ථාපිත කාර්ය ඉටු කර ඇත්තා වූ යම් තැනැත්තකු විසින් හෝ අකටයුතුකම් දැනුම් දෙන්නකු විසින් තමාගේ අනන්‍යතාවය හෙළිදරව් නොකරන ලෙස තොරතුරු සපයා ඇත්තා වූ පොලිසියේ නම් කරන ලද නිලධරයාගෙන් හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නම් කරන ලද නිලධරයාගෙන් ඉල්ලා සිටීමට හිමිකමක් තිබිය යුතු ය.

(2) 31 වන වගන්තිය ප්‍රකාරව ස්වකීය ව්‍යවස්ථාපිත කාර්ය ඉටු කර ඇත්තා වූ යම් තැනැත්තකුට හෝ අකටයුතුකම් දැනුම් දෙන්නකු තමාට, තම පවුලේ සාමාජිකයන්ට, දේපළවලට යම් තර්ජනයක් හෝ හානියක් හෝ ඔහුගේ කීර්තිනාමයට හානියක් සිදුවේ නම් හෝ ලැබේ නම් ඔහුට අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ සහ එය ප්‍රකාරව ආරක්ෂාවක් ලබා ගැනීමට හිමිකම් තිබිය යුතු ය.

(3) 31 වන වගන්තිය ප්‍රකාරව ස්වකීය කාර්යය ඉටු කර ඇත්තා වූ කිසිදු තැනැත්තකු හෝ අකටයුතුකම් දැනුම් දෙන්නකු, එම ව්‍යවස්ථාපිත කාර්යය ඉටු කිරීම හෝ අකටයුතුකම් දැනුම් දෙන්නකු ලෙස කටයුතු කිරීම ප්‍රකාරව, කිසිදු විනයානුකූල ක්‍රියාමාර්ගයකට හෝ ඔහුගේ සේවා නියුක්ත නියම සහ කොන්දේසිවල යම් අහිතකර වෙනස්කමක් සිදුවීමට යටත් නොවිය යුතු ය.

(4) තොරතුරු හෙළිදරව් කිරීමක් සම්බන්ධයෙන් වෙනත් යම් නීතියක්, ගිවිසුමක්, දිවුරුම් දීමක් හෝ ව්‍යවහාරයක් යටතේ වූ යම් තහනම් කිරීමක් හෝ සීමා කිරීමක් නොසලකා හරිමින්, 31 වන වගන්තිය යටතේ තොරතුරු සපයා ඇති යම් තැනැත්තකු හෝ අකටයුතුකම් දැනුම් දෙන්නකු යම් තොරතුරක් සැපයීම හේතුවෙන් අගතිදායක ක්‍රියාවකට යටත් කරනු නොලැබිය යුතු ය.

(5) 31 වන වගන්තිය යටතේ තොරතුරු සැපයීම හෝ අකටයුතුකම් දැනුම් දෙන්නකු ලෙස තොරතුරු සැපයීම හේතුවෙන් කිසිදු තැනැත්තකු සිවිල් හෝ අපරාධ වගකීමකට යටත් කරනු නොලැබිය යුතු ය.

(6) 31 වන වගන්තිය ප්‍රකාරව ස්වකීය ව්‍යවස්ථාපිත වගකීම ඉටු කර ඇති යම් තැනැත්තකුගේ හෝ අකටයුතුකම් දැනුම් දෙන්නකුගේ අනන්‍යතාවය හෙළිදරව් කරන ලෙස යම් අධිකරණමය නඩු කටයුත්තක දී සාක්ෂි දීම සඳහා කැඳවන ලද යම් විමර්ශන නිලධරයකු හෝ වෙනත් තැනැත්තකු වෙත බලකරනු නොලැබිය යුතු ය.

(7) සේවානියුක්තයකු වෙත නිකුත් කරන ලද යම් පත්වීමේ ලිපියක ඇති යම් ප්‍රතිපාදනයක් හෝ සේවානියුක්තයකු වෙත නිකුත් කරන ලද යම් විධානයක් සහ සේවායෝජකයකු, සේවානියුක්තයකු, ස්වාධීන කොන්ත්‍රාත්කරුවකු හෝ වෙනත් යම් සේවා සපයන්නකු අතර වූ යම් සේවා ගිවිසුමක හෝ සේවා සඳහා වන ගිවිසුමක හෝ වෙනත් යම් ගිවිසුමක ඇති යම් වගන්තියක් එම ප්‍රතිපාදනය, විධානය සහ වගන්තිය -

(අ) මේ පනතේ යම් විධිවිධානයක් බැහැර කිරීමට හෝ බැහැර කරනු ලබන බවට සලකන තාක් දුරට;

(ආ) මේ පනත යටතේ යම් වගකීමක් ඉෂ්ට කිරීමට තහනම් කරන, වළක්වන හෝ බාධා කරන තාක් දුරට; හෝ

(ඇ) මේ පනත යටතේ නියම කර ඇති ප්‍රමාණයට යම් ක්‍රියාවක් කිරීම වළක්වනු ලබන බවට හෝ අධෛර්යමත් කරනු ලබන බවට සලකන තාක් දුරට,

බලරහිත වන්නේ ය.

(8) මේ වගන්තියේ (3) වන සහ (4) වන උපවගන්තිවල සඳහන් ප්‍රතිපාදනවලට පටහැනිව හිතාමතාම ක්‍රියා කරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට වසර පහක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට සහ රුපියල් මිලියනයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය. එකී බන්ධනාගාරගත කිරීම සඳහා අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 306 වන වගන්තියේ සඳහන් විධිවිධාන අදාළ නොවන්නේ ය.

අපරාධයකින් උත්පාදිත දේවලට අදාළ තොරතුරු සැපයීම සඳහා වූ ඇතැම් නිලධරයන්ගේ ව්‍යවස්ථාපිත වගකීම

**33.** (1) ඇතැම් තොරතුරුවල රහස්‍යභාවය පවත්වාගෙන යන ලෙස යම් තැනැත්තකු හෝ ආයතනයක් වෙත නියම කරනු ලබන යම් නීතියක සඳහන් විධිවිධානයක කුමක් සඳහන් වුව ද, (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති නිලධරයන් විසින්, පහත දැක්වෙන කරුණු එකක් හෝ වැඩිගණනකට අදාළ තොරතුරු තමා වෙත ලැබීමෙන් පසුව, එම තොරතුරු ලිඛිතව මේ පනත මගින් අදාළ අපරාධයකින් උත්පාදිත දේ හෝ වරද පවරා ඇත්තේ යම් නම් කරන ලද නිලධරයකු යටතේ ද, එම නම් කරන ලද නිලධරයා වෙත සපයනු ලැබිය යුතු ය:-

(අ) අපරාධයකින් උත්පාදිත දේ පැවතීමේ හැකියාව;

(ආ) අපරාධයකින් උත්පාදිත දේ සන්තකයේ තබා ගනු ලැබිය හැකි, භාරයේ තබාගන්නා, ඒ සම්බන්ධයෙන් පාලන බලය ක්‍රියාත්මක කරන හෝ පාලනය කරන තැනැත්තාගේ අනන්‍යතාවය;

(ඇ) නීති විරෝධී ක්‍රියාකාරකමක් සිදු කිරීමේ හැකියාව සහ එම වරද සිදු කර ඇති බවට ගම්‍ය වන තැනැත්තා; හෝ

(ඈ) මේ පනත යටතේ වරදක් සිදු කිරීම.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා-

(අ) මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත ප්‍රකාරව පත් කරන ලද මූල්‍ය බුද්ධි ඒකකයේ අධ්‍යක්ෂවරයා;

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 වන ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද විගණකාධිපතිවරයා;

(ඇ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 97 වන වගන්තිය යටතේ පත් කරන ලද දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා;

(ඈ) තොරතුරු පොලිසියේ නම් කරන ලද නිලධරයාගේ විෂය පථය තුළට ගැනෙන යම් වරදකට හෝ අපරාධයකින් උත්පාදිත දේ සම්බන්ධව විය හැකි තාක් දුරට දූෂණ විරෝධී පනතේ 17 වන වගන්තිය යටතේ පත් කරන ලද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා;

(ඉ) තොරතුරු අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විෂය පථය තුළට ගැනෙන යම් වරදකට හෝ අපරාධයකින් උත්පාදිත දෙයකට සම්බන්ධව විය හැකි තාක් දුරට පොලිසියේ නම් කරන ලද නිලධරයා;

(ඊ) (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 7 වන වගන්තිය යටතේ පත් කරන ලද සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා;

(උ) (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ පත් කරන ලද රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(ඌ) (357 වන අධිකාරය වූ) යුධ හමුදා පනත යටතේ පිහිටුවා පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා යුධ හමුදාවේ හමුදාපතිවරයා;

(එ) (358 වන අධිකාරය වූ) නාවික හමුදා පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවා පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා නාවික හමුදාවේ නාවික හමුදාපතිවරයා;

(ඒ) (359 වන අධිකාරය වූ) ගුවන් හමුදා පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවා පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් හමුදාපතිවරයා;

(ඔ) යම් රජයේ දෙපාර්තමේන්තුවක ප්‍රධානියා;

(ඕ) 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 19 වන වගන්තිය යටතේ පත් කරන ලද ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(ක) ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ සංස්ථාපිත මණ්ඩලයක ප්‍රධාන විධායක නිලධරයා;

(ග) (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 204 වන වගන්තිය යටතේ පත් කරන ලද මෝටර් වාහන කොමසාරිස් ජනරාල්වරයා;

(ච) (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ පත් කරන ලද ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා;

(ජ) 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 3 වන වගන්තිය යටතේ පත් කරනු ලබන හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා හෝ හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයකු;

(ට) මහනගර සභාවක, නගර සභාවක හෝ ප්‍රදේශීය සභාවක නගරාධිපති හෝ සභාපති;

(ඩ) පළාත් පාලන ආයතනයක ලේකම්වරයකු, විශේෂ කොමසාරිස්වරයකු හෝ ප්‍රධාන පරිපාලකයකු;

(ණ) දිස්ත්‍රික් ලේකම්වරයකු, ප්‍රාදේශීය ලේකම්වරයකු හෝ ග්‍රාම නිලධරයකු;

(ත) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද යම් අමාත්‍යවරයකුගේ අමාත්‍යාංශයක ලේකම්වරයකු;

(ද) පළාත් සභාවක අමාත්‍යාංශයක ලේකම්වරයකු;

(න) 2007 අංක 07 දරන සමාගම් පනතේ 47 වන වගන්තිය යටතේ පත් කරන ලද සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා;

(ප) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ කාර්යයන් සඳහා එම පනතේ 3 වන වගන්තිය යටතේ සඳහන් කර ඇති විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස නම් කරනු ලැබ ඇති නිලධරයා;

(බ) 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත යටතේ පිහිටුවන ලද රාජ්‍ය නොවන සංවිධාන සඳහා වන මහලේකම් කාර්යාලය;

(ම) 1968 අංක 32 දරන පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනතේ 3 වන වගන්තිය යටතේ පත් කරන ලද පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා;

(ය) මැතිවරණ කොමිෂන් සභාව;

(අඅ) බහුතර කොටස් හිමිකම සෘජුව හෝ අනායාකාරයකින් භාණ්ඩාගාර ලේකම් විසින් දරනු ලබන යම් බැංකුවක ප්‍රධාන විධායක නිලධරයා හෝ සාමාන්‍යාධිකාරිවරයා;

(ආආ) මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ කාර්ය සඳහා මූල්‍ය ව්‍යාපාරයක් හෝ නම් කරන ලද මූල්‍යමය නොවන ව්‍යාපාරයක් ලෙස සලකනු ලබන යම් ආයතනයක ප්‍රධාන විධායක නිලධරයා හෝ සාමාන්‍යාධිකාරිවරයා;

(ඇඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 65 වන ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා;

(ඈඈ) 1990 අංක 18 දරන ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශ පනතේ 5 වන වගන්තිය යටතේ පත් කරන ලද ණය තොරතුරු කාර්යාංශයේ සභාපතිවරයා;

(ඉඉ) (351 වන අධිකාරය වූ) ආගමන විගමන පනතේ 4 වන වගන්තිය යටතේ පත් කරන ලද ආගමන හා විගමන පාලකවරයා;

(ඊඊ) 1969 අංක 1 දරන ආනයන සහ අපනයන (පාලන) පනතේ 2 වන වගන්තිය යටතේ පත් කරන ලද ආනයන සහ අපනයන පාලකවරයා;

(උඋ) (464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ පත් කරන ලද ඉඩම් කොමසාරිස්වරයා;

(ඍඍ) කොළඹ කොටස් වෙළෙඳපළෙහි ප්‍රධාන විධායක නිලධරයා;

(එඑ) 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 8 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය;

(ඒඒ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ආයෝජන මණ්ඩලයේ සභාපති;

(ඔඔ) 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ 2 වන වගන්තිය යටතේ පත් කරන ලද බුද්ධිමය දේපළ පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(ඕඕ) කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 3 වන වගන්තිය යටතේ පිහිටුවන ලද කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ සභාපතිවරයා;

(කක) පොලිසියේ නම් කරන ලද නිලධරයා සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නම් කරන ලද නිලධරයා විමසා අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබිය හැකි වෙනත් මහජන නිලයක් හොබවන වෙනත් යම් තැනැත්තකු,

මේ පනත මගින් තොරතුරු සැපයීමට නියමිත නිලධරයන් විය යුතු ය.

(3) තමා ප්‍රධාන විධායක නිලධරයා වන ආයතනය වෙත (1) වන උපවගන්තියේ සඳහන් තොරතුරු ලැබෙන්නේ නම්, එම තොරතුරු වහාම ඔහුගේ අවධානයට යොමු කරනු ලැබිය

යුතු බවට තහවුරු කිරීම සඳහා මේ පනත ක්‍රියාත්මක වීමේ දින සිට අවුරුදු එකක කාල සීමාවක් ඇතුළත අභ්‍යන්තර පරිපාලන යාන්ත්‍රණ ස්ථානගත කිරීම (2) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති සියලු නිලධරයන්ගේ වගකීම විය යුතු ය.

(4) නම් කරන ලද නිලධරයකු විසින්, මේ වගන්තිය යටතේ සපයනු ලබන තොරතුරු ලැබීමෙන් පසුව තොරතුරු ලැබුණු බවට ලිඛිතව දැනුම් දීමක් නිකුත් කළ යුතු අතර, මේ පනත අනුව ක්‍රියා කිරීම සඳහා වහාම අදාළ නිලධරයන් වෙත ලබා දිය යුතු ය.

පූර්ව නිගමනය

**34.** (1) යම් තැනැත්තකු විසින් අත්කර ගන්නා ලද, ලබා ගන්නා ලද, සන්තකයේ තබා ගන්නා ලද, පාලන බලය ක්‍රියාත්මක කරන ලද හෝ පාලනය කරන ලද යම් චංචල හෝ නිශ්චල දේපළක් -

(අ) ඒ දේපළ හෝ ඉන් කොටසක් මුදල් නම් එය -

(i) ඒ තැනැත්තාගේ නීත්‍යානුකූල ප්‍රකට ආදායමේ, ලැබීම්වල හෝ පැවරීම්වල කොටසක් නොවන්නේ නම් හෝ කොටසක් විය නොහැකි නම්; හෝ

(ii) ඒ තැනැත්තාගේ නීත්‍යානුකූල ප්‍රකට ආදායමෙ, ලැබීම් හෝ පැවරීම් පරිවර්තනය කර තිබෙන මුදල් හෝ පරිවර්තනය කරනු ලැබූ මුදල් නොවන්නේ නම් හෝ විය නොහැකි නම්; හෝ

(ආ) ඒ දේපළ හෝ ඉන් කොටසක් මුදල් නොවන්නේ නම්, එය-

(i) ඔහුගේ නීත්‍යානුකූල ප්‍රකට ආදායමේ, ලැබීම්වල හෝ පැවරීම්වල යම් කොටසකින් අත්කරගන්නා ලද දේපළක් නොවන්නේ නම් හෝ විය නොහැකි නම්; හෝ

(ii) ඔහුගේ නීත්‍යානුකූල ප්‍රකට ආදායමේ,

ලැබීම්වල හෝ පැවරීම්වල කොටසක් නොවන්නේ නම් හෝ කොටසක් විය හැකි දේපළක් නොවන්නේ නම්; හෝ

(iii) ඔහුගේ නීත්‍යානුකූල ප්‍රකට ආදායම්, ලැබීම්වල හෝ පැවරීම්වල යම් කොටසක් පරිවර්තනය කර තිබෙන හෝ පරිවර්තනය කරනු ලැබූ දේපළක් නොවන්නේ නම් හෝ විය නොහැකි නම්,

මීට ප්‍රතිවිරුද්ධ තත්ත්වය ඔප්පු කරන තෙක්, ඒ දේපළ සෘජුව ම හෝ වක්‍රව යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමකින් උත්පාදිත දෙයක් හෝ යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමකින් උත්පාදිත දෙයක් භාවිත කරමින් සපයා ගන්නා ලද හෝ යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමකින් ව්‍යුත්පන්න වී හෝ උපලබ්ධ වී ඇති බවට (2) වන උපවගන්තියේ කාර්ය සඳහා පූර්ව නිගමනය කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කාර්යයන් වනුයේ, මේ පනත යටතේ-

(අ) අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ භාවිත කිරීම තහනම් කරනු ලබන නියෝගයක් නිකුත් කිරීම;

(ආ) අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ සංරක්ෂණය කිරීම සඳහා නියෝගයක් නිකුත් කිරීම;

(ඇ) අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ තහනමට ගැනීම;

(ඈ) අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ අධිකරණමය වශයෙන් ක්‍රියා විරහිත කිරීම; සහ

(ඉ) අපරාධයකින් උත්පාදිත දේ රජය සතු කිරීම;

වේ.

(3) යම් නිශ්චිත දේපළක්, ප්‍රකාශ කරන තැනැත්තා මත, එම දේපළ තමාගේ නීත්‍යානුකූල ආදායමක්, ලැබීම් හෝ දේපළ තුළින් ව්‍යුත්පන්න වී ඇති දේපළක් බවට ශක්‍යතා වැඩි බර මත ඔප්පු කිරීමේ භාරය පවතියි.

(4) පූර්ව නිගමනය අදාළ කර ගත හැකි අවස්ථාවන්හි දී කිසිදු තැනැත්තකු විසින් ප්‍රශ්නගත දේපළ අපරාධයකින් උත්පාදිත දේ නොවන බවට යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමක් මගින් උත්පාදිත දෙයක් භාවිත කරමින් සපයා ගත් දේපළක් නොවන බවට හෝ නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සිදු කිරීමෙන් සෘජුව හෝ වක්‍රව ව්‍යුත්පන්න හෝ උපලබ්ධි වී නොමැති බවට, කිසිදු තැනැත්තකු විසින් ශක්‍යතා වැඩි බර මත ඔප්පු නොකරන අවස්ථාවක දී, එවැනි ප්‍රශ්නගත දේපළ නීතිවිරෝධී ක්‍රියාකාරකමකින් උත්පාදිත දේ වන බවට, නීතිවිරෝධී ක්‍රියාකාරකමක් මගින් උත්පාදිත දේ භාවිත කරමින් සපයා ගෙන ඇති දේපළක් බවට හෝ යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සිදු කිරීම මගින් සෘජුව හෝ වක්‍රව ව්‍යුත්පන්න වී ඇති හෝ උපලබ්ධි වී ඇති දේපළක් බවට බැලූබැල්මට පෙනෙන සාක්ෂි පවතින බවට තීරණය කිරීම සඳහා මෙම පූර්ව නිගමනය මහාධිකරණය විසින් භාවිත කරනු ලැබිය හැකි ය.

පැහැදිලි කිරීම කැඳවීමේ දැන්වීමකට ප්‍රතිචාර දැක්වීම ආවේශාා කර ගැනීම

**35.** (1) සාක්ෂි ආඥාපනතේ 25 වන වගන්තියේ අන්තර්ගත තහනම් කිරීම්වලට යටත්ව සහ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනතේ 68 වන වගන්තිය යටතේ යම් තැනැත්තකු වෙත භාර දෙන ලද දැන්වීමකට ප්‍රතිචාර දැක්වීමේ දී යම් විමර්ශන නිලධරයකු වෙත ලබා දෙන දිවුරුම් ප්‍රකාශයක් හෝ ලිඛිත හෝ වාචික ප්‍රකාශයක් ආකාරයෙන් ලබා දෙනු ලබන ප්‍රකාශයක් හෝ පිළිතුරක්-

(අ) අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ තහනම් කිරීම හෝ තහනමට ගැනීම සිදු කළ යුතු ද යන්න තීරණය කිරීමේ දී;

(ආ) මේ පනත යටතේ පවරන ලද, අපරාධයකින් උත්පාදිත දේ අධිකරණමය වශයෙන් ක්‍රියා විරහිත කිරීමේ හෝ රජය සතු කිරීමේ නඩු කටයුතුවල දී; හෝ

(ඇ) අපරාධයකින් උත්පාදිත දේ හෝ එහි යම් කොටසක් තහනම් කිරීම, තහනමට ගැනීම හෝ ක්‍රියා විරහිත කිරීම සඳහා වූ ඉල්ලීම් සම්බන්ධයෙන් වන විට දී,

එම දිවුරුම් ප්‍රකාශය හෝ ප්‍රකාශය සිදු කරන්නාට එරෙහිව හෝ යම් තුන්වන පාර්ශ්වයකට එරෙහිව ආවේශ්‍ය කර ගනු ලැබිය යුතු ය.

(2) එවැනි දිවුරුමක හෝ ප්‍රකාශයක අන්තර්ගතය භාවිත කිරීමෙන් හෝ ඔප්පු කිරීමෙන් ස්වකීය සම්බන්ධතාවලට බලපෑමක් විය හැකි යම් පාර්ශ්වයකට, ප්‍රතිවිරෝධී තත්ත්වය තහවුරු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීමට හිමිකම් තිබිය යුතු ය.

(3) මේ පනතේ 68 වන වගන්තිය යටතේ යම් තැනැත්තකු වෙත භාර දී ඇති දැන්වීමකට ප්‍රතිචාර වශයෙන් එවැනි තැනැත්තකු විසින් දිවුරුම් ප්‍රකාශයක් හෝ ලිඛිත හෝ වාචික ප්‍රකාශයක් ආකාරයෙන් ප්‍රකාශයක් සිදු කර හෝ පිළිතුරක් ලබා දී, ඇති අවස්ථාවක දී, සහ නීති විරෝධී ක්‍රියාකාරකමක් සිදු කර ඇති බවට එවැනි තැනැත්තකුට එරෙහිව නඩු පවරා ඇති අවස්ථාවක දී, එම ප්‍රකාශයේ හෝ පිළිතුරේ අන්තර්ගත කරුණු එම තැනැත්තාට එරෙහිව හරයාත්මක සාක්ෂි ලෙස ආවේශ්‍ය කර ගනු නොලැබිය යුතු ය:

එසේ වුව ද, එවැනි තැනැත්තකු ස්වකීය විත්ති වාචකයේ දී තමා වෙනුවෙන් සාක්ෂි ලබා දීමට හෝ සාක්ෂි ඉදිරිපත් කිරීමට තීරණය කරන අවස්ථාවක දී -

(අ) ඔහු විසින් වෙනත් අවස්ථාවක දී, වෙනත් ප්‍රකාශයක් සිදු කළ බවට ඔප්පු කිරීම සඳහා සහ ඒ අනුව එම තැනැත්තාගේ විශ්වසනීයත්වය තක්සේරු කිරීමේ කාර්යය සඳහා; සහ

(ආ) චූදිතයකු වෙනුවෙන් ඉදිරිපත් කළ සාක්ෂි බිඳ හෙළීම සඳහා,

එම ප්‍රකාශයේ හෝ පිළිතුරේ අන්තර්ගත කරුණු ආවේශ්‍ය කර ගනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ පොලිස් නිලධරයකු වෙත ලබා දෙන ප්‍රකාශයක් ආවේශ්‍ය කර ගැනීම

**36.** යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කර ප්‍රකාශයක් වාර්තා කිරීම සඳහා මේ පනත යටතේ වූ කර්තව්‍යයක් ක්‍රියත්මක කර ඇති පොලිස් නිලධරයකු වෙත එම තැනැත්තා විසින් ලබා දෙන ප්‍රකාශයක්, එම තැනැත්තා වෙනත් අවස්ථාවක දී වෙනත් ප්‍රකාශයක් ලබා දී ඇති බවට කරුණු ඔප්පු කිරීමේ කාර්යය සඳහා එම ප්‍රකාශයේ අන්තර්ගත කරුණු සාක්ෂි ආඥාපනතේ 25 වන වගන්තියට යටත් ව භාවිත කරන්නේ නම් මිස, එම ප්‍රකාශය සිදු කරන ලද තැනැත්තාට එරෙහිව කිසිදු අපරාධ නඩු කටයුත්තක දී, එම තැනැත්තාට එරෙහිව භාවිත කරනු නොලැබිය යුතු ය:

එසේ වුව ද, අපරාධයකින් උත්පාදිත දේ සොයා ගැනීමට හේතු වූ යම් ප්‍රකාශයක අන්තර්ගත කරුණු ඔප්පු කිරීම සඳහා සහ අධිකරණමය ක්‍රියා විරහිත කිරීමේ සහ රජය සතු කිරීමේ නඩු කටයුතුවල දී නඩු කටයුතු පවත්වාගෙන යනු ලබන්නේ යම් දේපළක් සම්බන්ධයෙන් ද ඒ දේපළ අපරාධයකින් උත්පාදිත දේ බව තහවුරු කිරීම සඳහා එවැනි ප්‍රකාශයක් භාවිත කරනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ පොලිස් නිලධරයකු නොවන තැනැත්තකු වෙත ලබා දෙන ප්‍රකාශයක් ආවේශ්‍ය කර ගැනීම

**37.** මේ පනත යටතේ යම් කර්තව්‍යයක් ඉටු කරන ලෙස යථා පරිදි බලය පවරා ඇත්තා වූ පොලිස් නිලධරයකු නොවන තැනැත්තකු වෙත යම් තැනැත්තකු විසින් ලබා දෙන ප්‍රකාශයක්, සාක්ෂි ආඥාපනතේ 17 වන, 18 වන, 19 වන, 20 වන, 21 වන, 22 වන, 23 වන සහ 24 වන වගන්තිවල සඳහන් විධිවිධානවලට යටත්ව, එම ප්‍රකාශය ලබා දෙන තැනැත්තාට එරෙහිව ආවේශ්‍ය කර ගනු ලැබිය යුතු ය.

ඉලෙක්ට්‍රොනික වාර්තාවල හෝ වෙනත් යම් ඉලෙක්ට්‍රොනික ලේඛනවල පවතින සාක්ෂි ආවේශ්‍ය කර ගැනීම

**38.** මේ පනත යටතේ වූ අපරාධ නඩු පැවරීම්වල දී සහ නඩු කටයුතුවල දී, ඉලෙක්ට්‍රොනික වාර්තා හෝ වෙනත් ඉලෙක්ට්‍රොනික ලේඛනවල පවතින සාක්ෂි ආවේශ්‍ය කර ගැනීම සඳහා සහ ඒ හා සම්බන්ධයෙන් 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ සඳහන් විධිවිධාන අදාළ විය යුතු ය.

**39.** සාක්ෂි ආඥාපනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, යම් දේපළක්, අපරාධයකින් උත්පාදිත දේ බව සහතික කරමින් එසේ තහවුරු කිරීමේ උපකාරක ලේඛනමය සාක්ෂි ද සමඟ එම නිසි බලධරයාගේ රටෙහි පිහිටා ඇති දේපළක් සම්බන්ධයෙන් විදේශීය නිසි බලධරයකුගෙන් ලැබෙන සහතිකයක් බවට නීතිපතිවරයා විසින් සහතික කරනු ලබන විදේශීය නිසි බලධරයකුගෙන් ලැබෙන සහතිකයක්, එම විදේශීය නිසි බලධරයා සාක්ෂි දීමට කැඳවීමෙන් තොරව, එම අදාළ දේපළ අපරාධයකින් උත්පාදිත දේ වන්නා වූ බවට බැලූබැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය. විදේශීය නිසි බලධරයකුගෙන් ලැබෙන සහතිකයක් ආවේශ්‍යා කර ගැනීම

**40.** (1) යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමක් මගින් අපරාධයකින් උත්පාදිත දේ ව්‍යුත්පන්න වී හෝ උපලබ්ධි වී ඇති බවට සාක්ෂියක් ලෙස යම් තැනැත්තකු විසින් නිශ්චිත නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සිදු කිරීම සම්බන්ධයෙන් වරදකරු කිරීමක්, අවශ්‍යා නොවන බව සැක දුරු කිරීමේ කාර්ය සඳහා මෙයින් ප්‍රකාශ කරනු ලැබේ. සැක දුරු කිරීම

(2) ‘අපරාධයකින් උත්පාදිත දේ සැඟවීම හෝ ස්වරූපය වෙනස් කිරීම ආදිය’ පිළිබඳ චෝදනාවක් ඔප්පු කිරීමේ කාර්ය සඳහා, පහත දැක්වෙන එක් කරුණක් හෝ වැඩි ගණනක් සම්බන්ධව සාක්ෂි ඔප්පු කිරීම හෝ ඉදිරිපත් කිරීම අවශ්‍යා නොවිය යුතු ය:-

(අ) අපරාධ නඩු පවරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකුට එරෙහිව ද ඒ තැනැත්තා අනුරූප නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කර ඇති බව;

(ආ) අපරාධ නඩු පවරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකුට එරෙහිව ද ඒ තැනැත්තා අදාළ අපරාධයකින් උත්පාදිත දේවලින් හෝ අනුරූප නීතිවිරෝධී ක්‍රියාකාරකමෙන් ප්‍රතිලාභ අත්කරගෙන ඇති බව;

(ඇ) අනුරූප නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කිරීමේ දිනය හෝ ස්ථානය; හෝ

(ඈ) අනුරූප නීතිවිරෝධී ක්‍රියාකාරකම ශ්‍රී ලංකාව ඇතුළත සිදු කර ඇති බව.

මහෙස්ත්‍රාත් අධිකරණයේ අධිකරණ බලය සහ බලතල

**41.** (1) අධිකරණ සංවිධාන පනත සහ අපරාධ නඩු විධාන සංග්‍රහය පනත මගින් පැවරී ඇති අධිකරණ බලය සහ බලතලවලට අමතරව, මහෙස්ත්‍රාත් අධිකරණයට -

(අ) විමර්ශන නිලධරයන්ට විමර්ශන පැවැත්වීම, තොරතුරු රැස්කිරීම, විමර්ශන කාර්ය සඳහා අවශ්‍ය ලේඛන සහ ද්‍රව්‍ය රැස්කිරීම සහ පරිශ්‍ර, වෙනත් ස්ථාන සහ උපාංග සෝදිසි කිරීම සඳහා හැකියාව ලබා දීම පිණිස මේ පනතේ විධිවිධාන සලස්වා ඇති යම් ආඥා නිකුත් කිරීම;

(ආ) විශේෂ විමර්ශන ක්‍රමවේද පවත්වාගෙන යෑම සඳහා බලය පවරනු ලබමින් මේ පනතේ විධිවිධාන සලස්වා ඇති පරිදි ආඥා නිකුත් කිරීම;

(ඇ) විමර්ශන නිලධරයන් විසින් නිකුත් කරනු ලබන තහනම් නියෝග සහ දේපළ තහනමට ගැනීම පිළිබඳ සැලකිල්ලට ගැනීම;

(ඈ) අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ මහාධිකරණය විසින් අධිකරණමය ක්‍රියා විරහිත කිරීම පිළිබඳ සැලකිල්ලට ගැනීම;

(ඉ) විමර්ශන නිලධරයකුගේ ඉල්ලීමකට අනුව යම් තැනැත්තකුගේ ප්‍රකාශයක් සටහන් කර ගැනීම; එම ඉල්ලීම, අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ පිළිබඳ විමර්ශනයක් අතරතුර සිදු කළ යුතු අතර, එම තැනැත්තාගෙන් විමර්ශන නිලධරයා විසින් පළමුව ප්‍රකාශයක් සටහන් කර ගැනීමෙන් පසු සිදු කළ යුතු ය;

(ඊ) මේ පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සඳහා අවශ්‍ය වෙනත් යම් ආඥා නිකුත් කිරීම; සහ

(ඌ) මේ පනතේ සඳහන් විධිවිධානවලට යටත්ව, මේ පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සඳහා නඩු කටයුතු පැවැත්වීම පිණිස සාධාරණ ස්වාධිකාරී කාර්යපටිපාටියක් අනුගමනය කිරීම,

සඳහා බලය තිබිය යුතු ය.

(2) මේ පනතේ මහෙස්ත්‍රාත්වරයකු සඳහා සිදු කරන ලද යම් සඳහනක් අපරාධයකින් උත්පාදිත දේ ලෙස විශ්වාස කරනු ලබන දේපළ පිහිටා ඇත්තේ යම් මහෙස්ත්‍රාත්වරයකුගේ අධිකරණ බල සීමාවක ද එම මහෙස්ත්‍රාත් අධිකරණයේ මහෙස්ත්‍රාත්වරයා සහ -

(අ) දේපළ පිහිටි ස්ථානය සොයා ගත නොහැකි වන්නා වූ අවස්ථාවක දී;

(ආ) දේපළ කොටස් වශයෙන් එක් මහෙස්ත්‍රාත් අධිකරණයකට වඩා වැඩි අධිකරණ බල සීමාවක් තුළ පිහිටා ඇති අවස්ථාවක දී;

(ඇ) දේපළ, අතථ්‍ය ලෙස හෝ සයිබර් අවකාශයෙහි පවතින අවස්ථාවක දී;

(ඈ) දේපළ අස්පර්ශනීය වන අවස්ථාවක දී; හෝ

(ඉ) දේපළ විදේශයන්හි පිහිටා ඇති අවස්ථාවක දී,

කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණය අදහස් වන්නේ ය.

**42.** අධිකරණ සංවිධාන පනත සහ අපරාධ නඩු විධාන සංග්‍රහය පනත මගින් පැවරී ඇති බලතලවලට අමතරව, මහාධිකරණය වෙත- මහාධිකරණයේ අධිකරණ බලය සහ බලතල

(අ) අධිකරණමය ක්‍රියාවිරහිත කිරීමේ ආඥා නිකුත් කිරීම, දීර්ඝ කිරීම, වෙනස් කිරීම සහ අහෝසි කිරීම මෙන්ම ඒ සම්බන්ධයෙන් අවශ්‍ය නඩු කටයුතු භාර ගැනීම සහ පවත්වාගෙන යාම;

(ආ) අපරාධයකින් උත්පාදිත දේ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම පිළිබඳ ආඥා නිකුත් කිරීම;

(ඇ) මේ පනතේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට නඩු කටයුතු පැවැත්වීම සහ අපරාධයකින් උත්පාදිත දේ රජය සතු කිරීමේ ආඥා, ආදේශ කළ දේපළ රජය සතු කිරීමේ ආඥා සහ ආදේශ කළ මුදල් රජය සතු කිරීමේ ආඥා ඇතුළු අපරාධයකින් උත්පාදිත දේ රජය සතු කිරීම සඳහා වූ ආඥා නිකුත් කිරීම;

(ඈ) අපරාධයකින් උත්පාදිත දේ බැහැර කිරීම සහ නිදහස් කිරීම සම්බන්ධයෙන් ආඥා නිකුත් කිරීම;

(ඉ) පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය වෙනත් යම් ආඥා නිකුත් කිරීම; සහ

(ඊ) මේ පනතේ සඳහන් විධිවිධානවලට යටත්ව, මේ පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සඳහා නඩු කටයුතු පැවැත්වීම සම්බන්ධයෙන් සාධාරණ ස්වාධිකාරී කාර්යපටිපාටියක් අනුගමනය කිරීම,

සඳහා බලය පැවතිය යුතු ය.

මේ පනත යටතේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ බලතල

**43.** (1) මේ පනතේ කාර්ය සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නම් කරන ලද නිලධරයා වශයෙන් කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පැවරී ඇති කාර්ය ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා පොදුවේ හෝ ඒ ඒ අවස්ථාව අනුව බලය පැවරීමට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත බලය තිබිය යුතුය.

(2) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත පහත සඳහන් බලතල තිබිය යුතු ය:-

(අ) අපරාධයකින් උත්පාදිත දේ අධිකරණමය ක්‍රියා විරහිත කිරීම සඳහා ආඥා ලබා ගැනීම සඳහා මහාධිකරණය වෙත ඉල්ලීම් ඉදිරිපත් කිරීමට බලය ලබා දීම;

(ආ) මේ පනත යටතේ වැරදි සිදු කිරීම සම්බන්ධයෙන් අපරාධ නඩු පැවරීමට විධාන කිරීම;

(ඇ) අපරාධයකින් උත්පාදිත දේ රජය සතු කිරීම සම්බන්ධයෙන් ඉල්ලීම් ඉදිරිපත් කිරීම සඳහා බලය පැවරීම;

(ඈ) අධිකරණයේ දී මේ පනත ප්‍රකාරව ඉල්ලීම් ඉදිරිපත් කිරීම සඳහා සහ එයට ආනුෂංගික යම් ඉල්ලීම් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම;

(ඉ) මේ උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) ඡේදවල සඳහන් කර ඇති කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙනුවෙන් පෙනී සිටීම සහ කොමිෂන් සභාව නියෝජනය කිරීම සඳහා කොමිෂන් සභාවේ නීතිඥවරයකු වෙත උපදෙස් ලබා දීම, නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥවරයකු පත් කරන ලෙස නීතිපතිවරයාගෙන් ඉල්ලා සිටීම හෝ යම් නීතිඥවරයකුගේ සේවය ලබා ගැනීම; සහ

(ඊ) මේ පනත යටතේ කොමිෂන් සභාවේ කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් සහ කොමිෂන් සභාවේ නම් කරන ලද නිලධරයාගේ සහ විමර්ශන නිලධරයන්ගේ කර්තව්‍ය සම්බන්ධයෙන් නීතිපතිවරයාගෙන් නීති උපදෙස් ලබා ගැනීම සහ එම නීති උපදෙස් මත ක්‍රියා කිරීම.

(3) මේ පනතේ කාර්ය සඳහා, විමර්ශන නිලධරයකු වශයෙන් කොමිෂන් සභාවේ යම් නිලධරයකු නම් කිරීම සඳහා කොමිෂන් සභාවට බලය තිබිය යුතු අතර, එසේ නම් කිරීමෙන් පසු එම නිලධරයා මේ පනත යටතේ විමර්ශන නිලධරයකු වෙත පැවරී ඇති කාර්ය ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම කරනු ලැබිය යුතු ය.

(4) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නම් කරන ලද නිලධරයාගේ සහ කොමිෂන් සභාවේ විමර්ශන නිලධරයන්ගේ නිසි කාර්යසාධනය ඇතුළු මේ පනතේ අරමුණු ඉටු

කර ගැනීමේ කාර්ය සඳහා, කොමිෂන් සභාව විසින්, නම් කරන ලද නිලධරයා විමසා, නම් කරන ලද නිලධරයාට සහ විමර්ශන නිලධරයන්ට උපදෙස් දීම සහ සහාය වීම පිණිස කොමිෂන් සභාවේ වෙනත් යම් නිලධරයන් පත් කරනු ලැබිය යුතු ය.

(5) මේ පනතේ කාර්ය සඳහා විමර්ශන නිලධරයා වශයෙන් කොමිෂන් සභාවේ යම් නිලධරයකු නම් කිරීම මගින්, දූෂණ විරෝධී පනත මගින් හෝ කොමිෂන් සභාව විසින් පරිපාලනමය වශයෙන් ඔහු වෙත පවරා ඇති යම් කර්තව්‍ය සහ බලතල ඉටු කිරීමෙන් එම නිලධරයා වළක්වාලනු නොලැබිය යුතු ය.

(6) යම් කාරණාවක් නීතිපතිවරයා වෙත යොමු කිරීම සඳහා කොමිෂන් සභාවට බලය ඇති අතර, එවැනි අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන සාමාන්‍ය හෝ ඒ ඒ අවස්ථාව අනුව විශේෂ උපදෙස්වලට යටත්ව, මේ පනත මගින් සහ අපරාධ නඩු විධාන සංග්‍රහය පනත මගින් ඔහු වෙත පැවරී ඇති බලතල නීතිපතිවරයා විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(7) අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ විමර්ශනයක් පවත්වන කාලය තුළ දී හෝ එවැනි අපරාධයකින් උත්පාදිත දේවලට අදාළව මේ පනත යටතේ යම් පියවර ගනු ලබන අවස්ථාවක දී, දූෂණ විරෝධී පනතේ අන්තර්ගත නොවන වරදක් හෙළිදරව් වේ නම්, එම උද්දේශිත වරද සිදු කිරීම පිළිබඳ නීතිය ප්‍රකාරව පියවර ගැනීම පිණිස කොමිෂන් සභාව විසින් පොලිස්පතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ පනත යටතේ යම් වරදක් සිදු කිරීම හෙළිදරව් වුවහොත්, කොමිෂන් සභාව විසින් මේ පනත ප්‍රකාරව අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු ය.

(8) මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහා වූ කොමිෂන් සභාවේ ගණපූරණය සාමාජිකයන් දෙදෙනකු විය යුතු අතර, ඔවුන්ගෙන් එක් අයකු නීතිඥයකු වන්නා වූ කොමසාරිස්වරයකු විය යුතු ය.

(9) මේ පනතේ නීතිපතිවරයාගේ කර්තව්‍ය සහ බලතල සඳහා කරනු ලබන සෑම සඳහන් කිරීමක් ම, එම කර්තව්‍ය සහ

බලතල අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශනාත්මක සහ නඩු පැවරීමේ බලය තුළට ගැනෙන්නා වූ නීතිවිරෝධී ක්‍රියාකාරකම් තුළින් උපචිත වන අපරාධයකින් උත්පාදිත දේ සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සම්බන්ධයෙන් කරන සඳහන් කිරීමක් ලෙස කියවා තේරුම් ගනු ලැබිය යුතු ය. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කොමිෂන් සභාවේ සාමාන්‍ය හෝ ඒ ඒ අවස්ථාව මත පදනම් වූ විධාන මත එම කර්තව්‍ය ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතු ය.

(10) මේ පනතේ නම් කරන ලද නිලධරයකුගේ කර්තව්‍ය සහ බලතල සඳහා කරනු ලබන සෑම සඳහන් කිරීමක් ම, එම කර්තව්‍ය සහ බලතල අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශනාත්මක සහ නඩු පැවරීමේ බලය තුළට ගැනෙන්නා වූ නීතිවිරෝධී ක්‍රියාකාරකම් තුළින් උපචිත වන අපරාධයකින් උත්පාදිත දේ සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සම්බන්ධයෙන් කරනු ලබන සඳහන් කිරීමක් ලෙස කියවා තේරුම්ගනු ලැබිය යුතු ය.

(11) මේ පනතේ විමර්ශන නිලධරයකුගේ කර්තව්‍ය සහ බලතල සඳහා කරනු ලබන සෑම සඳහන් කිරීමක් ම, එම කර්තව්‍ය සහ බලතල අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශනාත්මක සහ නඩු පැවරීමේ බලය තුළට ගැනෙන්නා වූ නීතිවිරෝධී ක්‍රියාකාරකම් තුළින් උපචිත වන අපරාධයකින් උත්පාදිත දේ සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ බලයලත් නිලධරයකු සම්බන්ධයෙන් කරනු ලබන සඳහන් කිරීමක් ලෙස කියවා තේරුම් ගනු ලැබිය යුතු ය.

**44.** (1) (අ) උපදෙස් අපේක්ෂා කරන අවස්ථාවක දී, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත සහ එහි නිලධරයන් වෙත; මේ පනත යටතේ නීතිපතිවරයාගේ බලතල

(ආ) විමර්ශන පැවැත්වීම සහ මේ පනත මගින් නිලධරයන් වෙත පැවරී ඇති කාර්ය සහ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පොලිසියේ නම් කරන ලද නිලධරයා සහ පොලිස් විමර්ශන නිලධරයන් වෙත නීතිපතිවරයාගේ අවශ්‍යතාව හෝ උපදෙස් අපේක්ෂා කරන ලද අවස්ථාවක දී; සහ

(ඇ) මේ පනත යටතේ වූ ස්වකීය කාර්ය සහ කර්තව්‍ය සම්බන්ධයෙන් අධිකාරිය වෙත,

උපදෙස් ලබා දීමේ බලය නීතිපතිවරයා වෙත ඇත්තේ ය.

(2) නීතිපතිවරයා වෙත පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් බලය ඇත්තේ ය:-

(අ) මහාධිකරණය වෙත අධිචෝදනා ඉදිරිපත් කිරීම සඳහා සහ මේ පනත යටතේ වැරදි සිදු කිරීම සම්බන්ධයෙන් නඩු විභාග පැවැත්වීම සම්බන්ධයෙන්;

(ආ) මේ පනතේ අන්තර්ගත වැරදි සිදු කිරීම සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණයේ අපරාධ නඩු කටයුතු පැවරීමට අවසර දීම, නඩු කටයුතු පැවරීම භාර ගැනීම, සිදු කිරීම සහ පවත්වාගෙන යාම;

(ඇ) පොලීසියේ නම් කරන ලද නිලධරයා හෝ විමර්ශන නිලධරයා වෙනුවෙන් මහෙස්ත්‍රාත් අධිකරණය වෙත යම් ඉල්ලීම් ඉදිරිපත් කිරීම;

(ඈ) අපරාධයකින් උත්පාදිත දේ අධිකරණමය ක්‍රියා විරහිත කිරීම් සහ රජය සතු කිරීමේ ඇතුළු අපරාධයකින් උත්පාදිත දේ සහ ඒ හා සම්බන්ධ ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් මේ පනතේ සඳහන් කරනු ලබන ඉල්ලීම් මහාධිකරණය වෙත ඉදිරිපත් කිරීම; සහ

(ඉ) පොලීසියේ හෝ අධිකාරියේ යම් වාර්තාවක්, ගොනුවක් හෝ ලේඛනයක් කැඳවීම සහ පරීක්ෂා කිරීම.

(3) නීතිපතිවරයාට-

(අ) මහාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබ ඇති අධිකරණමය ක්‍රියා විරහිත කිරීමක් සඳහා වන ඉල්ලීමක් අපරාධයකින් උත්පාදිත දේ ආරක්ෂා කිරීම, කළමනාකරණය සහ සංරක්ෂණයට අදාළව හෝ මහාධිකරණය විසින් අධිකරණමය ක්‍රියා විරහිත කිරීමේ ආඥාවක් කරනු ලැබ ඇති;

(ආ) විමර්ශන නිලධරයකු විසින් සිදු කරනු ලැබ ඇති තහනම් කිරීමේ හෝ සංරක්ෂණය කිරීමේ නියෝගයක්; හෝ

(ඇ) විමර්ශන නිලධරයකු විසින් තහනමට ගනු ලැබ ඇති අපරාධයකින් උත්පාදිත දේ යයි සැක කරනු ලබන දේපළක්,

සම්බන්ධයෙන් මහාධිකරණය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමට බලතල තිබිය යුතු ය.

(4) නීතිපතිවරයා විසින් ම හෝ නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධරයකු විසින් හෝ නීතිපතිවරයා විසින් බලය දෙන ලද නීතිඥවරයකු විසින් මේ පනත යටතේ යම් අධිකරණයක පවරන ලද යම් නඩු කටයුත්තක දී රජය වෙනුවෙන් මැදිහත් වීමට, පෙනී සිටීමට සහ නියෝජනයන් සිදු කිරීමට හිමිකම තිබිය යුතු ය.

(5) මේ පනත මගින් නීතිපතිවරයා වෙත පවරා ඇති බලතල සහ කාර්යයන් නීතිපතිවරයා විසින් ම හෝ නීතිපතිවරයා විසින් ඒ සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය දෙනු ලබන නිලධරයකු විසින් ඉටු කරනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකා පොලිසියේ අපරාධයකින් උත්පාදිත දේ විමර්ශන කොට්ඨාසය

**45.** (1) මේ පනතේ කාර්යයන් සඳහා (මෙහි මින් මතු "පී.සී.අයි.ඩී." යනුවෙන් සඳහන් කරනු ලබන) අපරාධයකින් උත්පාදිත දේ විමර්ශන කොට්ඨාසය ලෙස හඳුන්වනු ලැබිය යුතු එහි ප්‍රධානියා විය යුතු අධ්‍යක්ෂ ජනරාල්වරයා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ යම් නිලධරයන් සංඛ්‍යාවකින් සමන්විත වන ශ්‍රී ලංකා පොලිසියේ කොට්ඨාසයක් පැවතිය යුතු ය.

(2) මේ පනතේ සඳහන් පොලිසියේ නම් කරන ලද නිලධරයා පී.සී.අයි.ඩී. හි අධ්‍යක්ෂ ජනරාල්වරයා විය යුතු ය.

(3) මේ පනතේ සඳහන් පොලිසියේ නියෝජ්‍ය නම් කරන ලද නිලධරයා පී.සී.අයි.ඩී. හි නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විය යුතු ය.

(4) මේ පනතේ සඳහන් පොලිස් විමර්ශන නිලධරයන් පී.සී.අයි.ඩී වෙත අනුයුක්ත කර ඇති නිලධරයන් විය යුතු ය. ඔවුන් විසින් පී.සී.අයි.ඩී. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ විධානය යටතේ මේ පනත අනුව ඔවුන්ගේ කර්තව්‍යයන් ඉටු කළ යුතු ය. ඔවුන් මේ පනත යටතේ ඔවුන්ගේ කාර්යයන් සහ කර්තව්‍යයන් ඵලදායී ලෙස කරගෙන යාමේ කාර්ය සඳහා වෙනත් කොට්ඨාසයකට, කාර්යාංශයකට, ඒකකයකට හෝ පොලිස් ස්ථානයකට යොමු කරනු ලැබිය හැකි ය.

(5) පොලිසියේ නම් කරන ලද නිලධරයාට සහ පොලිස් විමර්ශන නිලධරයන්ට සහාය වීම පිණිස පී. සී. අයි. ඩී. වෙත සුදුසු පොලිස් නිලධරයන් සංඛ්‍යාවක් පොලිස්පතිවරයාගේ නිර්දේශය මත පත් කිරීමට ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත බලය පවරනු ලැබිය යුතු ය.

(6) පොලිස්පතිවරයා සහ පී. සී. අයි. ඩී. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන පරිපාලන නියමයන්ට යටත්ව පී. සී. අයි. ඩී.ට අනුයුක්ත කර ඇති යම් පොලිස් නිලධරයකුට ඒ නිලධරයා විසින් විමර්ශනය සිදු කරමින් පවතින අපරාධයකින්

උත්පාදිත දේ හා අදාළ යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට බලය හිමිවිය යුතු ය. එසේ වුව ද, පොලිස් ආඥාපනතේ, අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ සහ වෙනත් යම් අදාළ නීතියක නියමයන්ට අනුව විමර්ශනයක් පැවැත්වීමට ඔහුට බලය තිබිය යුතු ය.

(7) පොලිස් පරීක්ෂකවරයකුගේ නිලයට පහළින් නොවන නිලයක යම් පොලිස් නිලධරයකු, පී. සී. අයි. ඩී. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ ඒ අවස්ථාව පදනම් කරගෙන ලබාදෙන අනුමතයන්ට යටත්ව මේ පනත මගින් පොලිස් විමර්ශන නිලධරයකු වෙත පවරන ලද බලතල සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමට සහ විමර්ශන පැවැත්වීමට සහ අපරාධයකින් උත්පාදිත දේ හා සම්බන්ධව මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි ක්‍රියාමාර්ග ගැනීමට හිමිකම් ලැබිය යුතු ය.

(8) මේ පනතේ පරමාර්ථ ඉටු කිරීමට පහසුකම් සැලැස්වීමේ සහ අවශ්‍ය විශේෂඥතාවය සැලසීමේ කාර්යය සඳහා සහ පොලිසියේ නම් කරන නිලධරයාගේ සහ පොලිස් විමර්ශන නිලධරයන්ගේ කාර්යයන් සහ කර්තව්‍යයන් නිසි ලෙස ඉටු කිරීමේ කාර්ය සඳහා පොලිස්පතිවරයාගේ නිර්දේශයක් මත පූර්ණ කාලීන හෝ අර්ධ කාලීන පදනම හෝ පැවරීමේ පදනම මත යන ආකාරයකට පී. සී. අයි. ඩී. වෙත අවශ්‍ය දැනුම, සුදුසුකම්, පළපුරුද්ද සහ විශේෂඥතාවය දරන විශේෂඥයන් පත් කිරීමට ජාතික පොලිස් කොමිෂන් සභාවට බලය පවරනු ලැබිය යුතු ය.

(9) අදාළ විශේෂඥයන්ගේ සුදුසුකම්, පළපුරුද්ද සහ විශේෂඥතාවය සහ ඒ විශේෂඥයන්ට පැවරිය යුතු පැවරුම් සලකා බැලීමකින් පසුව ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ඒ ඒ විශේෂඥයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික තීරණය කරනු ලැබිය යුතු ය.

(10) පී.සී.අයි.ඩී.හි අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මතයට අනුව අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ සම්බන්ධ විමර්ශනයක් සංකීර්ණ, අසාමාන්‍ය, කල්ගත වුණ හෝ බහුබලඅධිකාරි වන අවස්ථාවක සහ පී.සී.අයි.ඩී. වෙත පවරන

ලද අරමුදල් විමර්ශනය නිසි ලෙස කරගෙන යෑමට ප්‍රමාණවත් නොවන අවස්ථාවක, පී. සී. අයි. ඩී. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එවැනි විමර්ශනයක් කාර්යක්ෂමව පැවැත්වීමට අවශ්‍ය කරන මූල්‍ය සම්පත් වෙන් කරවා ගැනීම සඳහා අධිකාරිය වෙත හේතු සහිතව ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

පොලිසියේ නම් කරන ලද නිලධරයා සහ පොලිසියේ නියෝජ්‍ය නම් කරන ලද නිලධරයා

**46.** (1) මේ පනතේ කාර්යයන් සඳහා පොලිසියේ නම් කරන ලද නිලධරයකු සහ පොලිසියේ නියෝජ්‍ය නම් කරන ලද නිලධරයකු සිටිය යුතු ය.

(2) පොලිසියේ නම් කරන ලද නිලධරයා නියෝජ්‍ය පොලිස්පතිවරයකුගේ නිලයට පහළින් නොවන නිලයක් දරන පොලිස් නිලධරයකු විය යුතු අතර, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයකු ද විය හැකි ය. පොලිසියේ නියෝජ්‍ය නම් කරන ලද නිලධරයා, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයකුගේ නිලයට පහළින් නොවන නිලයක් දරන පොලිස් නිලධරයකු විය යුතු ය.

(3) පොලිසියේ නම් කරන ලද නිලධරයා විසින් සාමාන්‍ය හෝ ඒ ඒ විමර්ශනය පදනම් කරගෙන පොලිසියේ නියෝජ්‍ය නම් කරන ලද නිලධරයා වෙත පවරනු ලැබ ඇති යම් කාර්යයන්, කර්තව්‍යයන් සහ බලතලවලට යටත්ව පොලිසියේ නම් කරන ලද නිලධරයා වෙත මේ පනත මඟින් පවරනු ලැබ ඇති යම් කාර්යයන් කර්තව්‍යයන් සහ බලතල සියල්ලම ඉටු කිරීමට පොලිසියේ නියෝජ්‍ය නම් කරන ලද නිලධරයාට හිමිකම තිබිය යුතු ය:

එසේ වුව ද, මේ වගන්තියේ විධිවිධානවලට යටත්ව, පොලිසියේ නම් කරන ලද නිලධරයාට මේ පනත යටතේ ඔහුගේ කාර්යයන්, කර්තව්‍යයන් සහ බලතල යම් රෝගී තත්ත්වයක්, අශක්නුතාවක් හෝ වෙනත් යම් හේතුවක් නිසා ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක, සාමාන්‍ය හෝ නිශ්චිත බලතල පැවරීමක් නොමැති වුව ද දින හතකට නොවැඩි කාලසීමාවක් සඳහා පොලිසියේ නම් කරන ලද නිලධරයාගේ කාර්යයන්, කර්තව්‍යයන් සහ බලතල ඉටු කිරීමට පොලිසියේ නියෝජ්‍ය නම් කරන ලද නිලධරයාට හිමිකම තිබිය යුතු ය.

(4) පොලිසියේ නම් කරන ලද නිලධරයා සහ පොලිසියේ නියෝජ්‍ය නම් කරන ලද නිලධරයා, පොලිස්පතිවරයා විසින් ඒ එක් එක් තනතුරක් සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන නාමයෝජනා තුනක් මත පදනම්ව ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය.

(5) පොලිසියේ නම් කරන ලද නිලධරයා සහ පොලිසියේ නියෝජ්‍ය නම් කරන ලද නිලධරයා වසර තුනක කාලසීමාවක් සඳහා පත් කරනු ලැබිය යුතු අතර, තවත් වසර තුනක කාලසීමාවක් සඳහා පමණක් නැවත පත් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, පොලිසියේ නියෝජ්‍ය නම් කරන ලද පළමුවන නිලධරයාට වසර හතරකට නොවැඩි කාලසීමාවක් සඳහා ධුරය දැරීමට හිමිකම ලැබිය යුතු ය.

(6) ජාතික පොලිස් කොමිෂන් සභාව පොලිසියේ නම් කරන ලද නිලධරයකු, ඒ ධුරයේ පුරප්පාඩුවක් පැන නැගීමෙන් පැය හැත්තෑ දෙකක් ඇතුළත පත් කිරීමට අපොහොසත් වන අවස්ථාවක, වාර්තා ගත කරනු ලැබිය යුතු හේතු මත ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පොලිසියේ නම් කරන ලද නිලධරයාගේ ධුරයේ වැඩ බැලීමට මාස තුනක් නොඉක්මවන කාලසීමාවක් සඳහා පොලිසියේ නියෝජ්‍ය නම් කරන ලද නිලධරයා පත් කරනු ලැබිය යුතු ය. පොලිසියේ නම් කරන ලද නිලධරයාගේ ධුරයේ වැඩ බැලීමේ කාලසීමාව දීර්ඝ කරනු නොලැබිය යුතු ය.

(7) රෝගී තත්ත්වයක්, අශක්නුතාවක් හෝ වෙනත් අවස්ථානුගත කාරණයක් හේතුවෙන් පොලිසියේ නම් කරන ලද නිලධරයා විසින් දින හතකට වැඩි කාලසීමාවක් සඳහා ඔහුගේ කාර්යයන් සහ කර්තව්‍යයන් ඉටු කිරීමට අපොහොසත් වන අවස්ථාවක, ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් මාස තුනකට නොවැඩි කාලසීමාවක් සඳහා පොලිසියේ නම් කරන ලද නිලධරයාගේ ධුරයේ වැඩ බැලීමට පොලිසියේ නියෝජ්‍ය නම් කරන ලද නිලධරයා පත් කරනු ලැබිය යුතු ය. පොලිසියේ නම් කරන ලද නිලධරයාගේ ධුරයේ වැඩ බැලීමේ කාලසීමාව දීර්ඝ

කරනු නොලැබිය යුතු ය.

(8) පොලිසියේ නම් කරන ලද නිලධරයා මේ පනත යටතේ ඔහුගේ බලතල ක්‍රියාත්මක කිරීමට සහ කර්තව්‍යයන් සහ කාර්යයන් ඉටු කිරීමට අදාළව පොලිස්පතිවරයාගේ සහ ජාතික පොලිස් කොමිෂන් සභාවේ අධීක්ෂණයට යටත් විය යුතු ය:

එසේ වුව ද, මේ පනතේ කාර්යයන් සඳහා පොලිස්පතිවරයා සහ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පොලිසියේ නම් කරන ලද නිලධරයා වෙත ඒ ඒ විමර්ශනය පදනම් කරගෙන නියෝග නිකුත් කිරීමට බලය හිමි නොවිය යුතු ය.

(9) පොලිසියේ නම් කරන ලද නිලධරයාව -

(අ) මේ පනතේ හෝ වෙනත් යම් නීතියක විධිවිධානවලට පටහැනිව ක්‍රියා කරනු ලැබීම;

(ආ) මේ පනත අනුව ඔහු වෙත පවරනු ලැබ ඇති යම් දේපළක් හෝ ඒ දේපළේ යම් කොටසක් සම්බන්ධයෙන් වරදක් සිදු කරනු ලැබීම;

(ඇ) මේ පනත යටතේ සිදු කරන ලද අධිකරණ ආඥාවකට පටහැනිව ක්‍රියා කරනු ලැබීම;

(ඈ) බලතල අයුතු ලෙස භාවිත කිරීමක් සිදු වන ආකාරයෙන් ක්‍රියා කරනු ලැබීම;

(ඉ) අසද්භාවයෙන් කටයුතු කිරීම හෝ අපකීර්තිමත්, වංචනික හෝ ප්‍රශ්නකාරී අවංකත්වයකට හෝ අයථා හැසිරීමකට තුඩු දිය හැකි වන වෙනත් යම් ආකාරයකින් කටයුතු කිරීම;

(ඊ) මේ පනතේ අරමුණු යටපත් වන ආකාරයෙන් ක්‍රියා කිරීමේ හෝ පරමාර්ථ කාර්යක්ෂම ආකාරයකින් ඉෂ්ට කර ගැනීමට අපොහොසත් වනු ලැබීම,

යන හේතු මත පොලිස්පතිවරයා විමසා ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ඉවත් කරනු ලැබිය හැකි ය.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නම් කරන ලද නිලධරයා සහ නියෝජ්‍ය නම් කරන ලද නිලධරයා

**47.** (1) මේ පනතේ කාර්යයන් සඳහා, කොමිෂන් සභාවේ අනුමතය ඇතිව මේ පනත මගින් ඔවුන් වෙත පවරන ලද කාර්යයන්, කර්තව්‍යයන් ඉටු කිරීමට සහ බලතල ක්‍රියාත්මක කිරීම කළ යුතු අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන සභාවේ නම් කරන ලද නිලධරයකු සහ නියෝජ්‍ය නම් කරන ලද නිලධරයකු සිටිය යුතු ය.

(2) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නම් කරන ලද නිලධරයා විය යුතු ය.

(3) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින්, දූෂණ විරෝධී පනත යටතේ විමර්ශනයක් පැවැත්වීමට බලය දෙන ලද කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධරයන් අතරින් යම් නිලධරයකු මේ පනතේ කාර්යයන් සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නියෝජ්‍ය නම් කරන ලද නිලධරයා ලෙස කටයුතු කිරීමට පත් කරනු ලැබිය යුතු ය.

(4) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නම් කරන ලද නිලධරයා සහ නියෝජ්‍ය නම් කරන ලද නිලධරයා මේ පනත මගින් ඔහු වෙත පවරන ලද ඔහුගේ කාර්යයන්, කර්තව්‍යයන් ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කොමිෂන් සභාවට වගකිව යුතු ය.

(5) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නම් කරන ලද නිලධරයා විසින් සාමාන්‍ය හෝ ඒ ඒ විමර්ශනය පදනම් කරගෙන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නම් කරන ලද නියෝජ්‍ය නිලධරයා වෙත පවරනු ලැබ ඇති යම් කාර්යයන්, කර්තව්‍යයන් සහ බලතලවලට යටත්ව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නම් කරන ලද නිලධරයා වෙත මේ පනත මගින් පවරනු ලැබ ඇති යම් කාර්යයන්, කර්තව්‍යයන් සහ බලතල සියල්ල ඉටු කිරීමට එම නියෝජ්‍ය නම් කරන ලද නිලධරයාට හිමිකම තිබිය යුතු ය.

(6) රෝගී තත්ත්වයක්, අශක්නුතාවක් හෝ වෙනත් යම් හේතුවක් මත අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නම් කරන ලද නිලධරයා විසින් ඔහුගේ කාර්යයන් සහ බලතල ඉටු කිරීමට අපොහොසත් වන අවස්ථාවක, ඒ සම්බන්ධයෙන් වන සාමාන්‍ය හෝ විශේෂ බලය පැවරීමක් නොමැතිව වුව ද, නම් කරන ලද නිලධරයාගේ කාර්යයන්, කර්තව්‍යයන් සහ බලතල ඉටු කිරීමට දින හතකට නොවැඩි කාලසීමාවක් සඳහා එම කොමිෂන් සභාවේ නියෝජ්‍ය නම් කරන ලද නිලධරයාට හිමිකමක් තිබිය යුතු ය.

(7) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ධුරයේ යම් පුරප්පාඩුවක් පවතින අවස්ථාවක දී සහ දූෂණ විරෝධී පනතේ 25 වන වගන්තියේ (2) වන උපවගන්තිය ප්‍රකාරව ක්‍රියාකරමින් ජනාධිපතිවරයා විසින්, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහා කොමිෂන් සභාවේ වෙනත් යම් නිලධරයකු වෙත බලය පවරා ඇති අවස්ථාවක දී, එම බලය පැවරීමේ කාලසීමාව තුළ දී මේ පනතේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට නම් කරන නිලධරයාගේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා එම වෙනත් නිලධරයාට හිමිකමක් තිබිය යුතු ය.

නම් කරන ලද නිලධරයන් විසින් එක්ව ඉටු කළ යුතු කර්තව්‍යයන්

**48.** පොලිසියේ නම් කරන ලද නිලධරයා සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නම් කරන ලද නිලධරයා-

(අ) මේ පනතේ පරමාර්ථ ඵලදායී ලෙස ළඟා කර ගැනීම උදෙසා ස්වකීය ආයතන අතර අන්‍යෝන්‍ය සහයෝගය ව්‍යාප්ත කළ හැකි ආකාරයක් පිළිබඳව නිතිපතා සාකච්ඡා පවත්වා එකඟ විය යුතු ය;

(ආ) මේ පනතේ විධිවිධාන ඵලදායීව බලාත්මක කිරීම උදෙසා සහ මේ පනතේ පරමාර්ථ සහ කාර්යයන් ළඟා කර ගත හැකි ආකාර සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වා එකඟ වීමට විමර්ශන නිලධරයන්ගේ රැස්වීමක් අවම වශයෙන් මාස දෙකකට වතාවක්වත් එක්ව පැවැත්විය යුතු ය;

(ඈ) මේ පනතේ නිශ්චිතව සඳහන් කර ඇති තොරතුරු ලැබීම තහවුරු කිරීම සඳහා මේ පනත අනුව අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ පිළිබඳ තොරතුරු සැපයිය යුතු රාජ්‍ය සහ ව්‍යවස්ථාපිත ආයතනවල ප්‍රධාන විධායක නිලධරයන්ගේ රැස්වීමක් අවම වශයෙන් මාස හයකට වරක්වත් එක්ව කැඳවිය යුතු ය;

(ඈ) (i) අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ තහනම් කිරීමට සහ තහනමට ගැනීමට පෙරාතුව විමර්ශන නිලධරයන් විසින් අදාළ කර ගත යුතු පූර්ව-තහනම් සහ පූර්ව තහනමට ගැනීමේ ප්‍රොටොකෝල; සහ

(ii) අපරාධයකින් උත්පාදිත දේ යයි සැක කරනු ලබන දේ තහනමට ගැනීමෙන් පසු මහාධිකරණය වෙතින් ආරක්ෂාව, සංරක්ෂණය සහ කළමනාකරණය සඳහා වන ආඥාවක් ලබා ගන්නා තුරු ආරක්ෂා කිරීමේ, සංරක්ෂණය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ ප්‍රොටොකෝල,

වැඩි දියුණු කර බලාත්මක කළ යුතු ය;

(ඉ) මේ පනතේ විධිවිධාන ඵලදායී ලෙස බලාත්මක කිරීම සම්බන්ධයෙන් අධිකාරිය සමඟ අවම වශයෙන් මාස හයකට වරක්වත් රැස්වීමක් පැවැත්විය යුතු ය; සහ

(ඊ) මේ පනතේ විධිවිධාන බලාත්මක කිරීමට සහ මේ පනතේ පරමාර්ථ ළඟා කර ගැනීම ආයතන දෙක විසින් සිදු කර ඇති ආකාරය විදහා දක්වමින් වාර්ෂික වාර්තාවක් සකස් කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු අතර, එම වාර්ෂික වාර්තාව ස්වකීය වෙබ් අඩවිවල පළ කළ යුතු ය.

නම් කරන ලද නිලධරයකුගේ කාර්යයන්, කර්තව්‍යයන් සහ බලතල

**49.** (1) මේ පනත යටතේ නම් කරන ලද නිලධරයකුගේ කාර්යයන්, කර්තව්‍යයන් සහ බලතල පහත පරිදි විය යුතු ය:-

(අ) අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ පිළිබඳ විමර්ශන පැවැත්වීම අධීක්ෂණය කිරීම;

(ආ) මේ පනත යටතේ වරදක් සිදු කිරීම පිළිබඳ විමර්ශන පැවැත්වීම අධීක්ෂණය කිරීම;

(ඇ) එවැනි විමර්ශන පවත්වන විමර්ශන නිලධරයන්ට අවශ්‍ය විධාන ලබා දීම සහ එවැනි විමර්ශන සඳහා අවශ්‍ය සම්පත් වෙන් කිරීම;

(ඈ) මේ පනතේ සඳහන් කරන ලද ආයතන විසින් භාර දෙනු ලබන අපරාධයකින් උත්පාදිත දේවලට අදාළ වන තොරතුරු භාර ගැනීම;

(ඉ) තහනමට ගැනීමේ නියෝග නිකුත් කිරීම සඳහා බලය දීම;

(ඊ) අධිකරණමය ක්‍රියා විරහිත කිරීමේ ආඥා ලබා ගැනීම සඳහා මහාධිකරණයේ නඩු පැවරීම;

(උ) මේ පනතේ පරමාර්ථ, විමර්ශන නිලධරයන්ගේ කාර්යයන් සහ බලතල සහ විශේෂ විමර්ශන ක්‍රමවේද ඇතුළුව විමර්ශන පැවැත්වීමේ දී යොදාගත යුතු ක්‍රමවේද සම්බන්ධයෙන් විමර්ශන නිලධරයන්ට පුහුණුව සැපයීම;

(ඌ) මේ පනත යටතේ කාර්ය සහ කර්තව්‍යයන් ඉටු කිරීමට බලතල ක්‍රියාත්මක කිරීම සහ වෙනත් යම් කාරණා සම්බන්ධව නීතිපතිවරයාගේ උපදෙස් ලබා ගැනීම;

(එ) අධිකරණමය ක්‍රියාවිරහිත කිරීම සහ අපරාධයකින් උත්පාදිත දේ රජය සතු කිරීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කිරීම ඇතුළුව මේ පනත යටතේ අධිකරණ නඩු කටයුතු සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ සහාය ලබා ගැනීම;

(ඒ) වෙනත් අධිකරණ බල සීමාවල නිසි බලධරයන්ගෙන් අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ විමර්ශනවලට අදාළව අන්‍යෝන්‍ය සහාය ලබා ගැනීම සඳහා වන ඉල්ලීම් ඉදිරිපත් කිරීම සඳහා සහ විදේශීය අධිකරණ, පරිපාලන සහ නීතිය බලාත්මක කිරීමේ බලධරයන් ඉදිරියේ නම් කරන ලද නිලධරයා නියෝජනය කිරීම පිණිස නීතිපතිවරයාගේ සහාය ලබා ගැනීම;

(ඔ) අපරාධයකින් උත්පාදිත දේ යයි සැක කරන ලද දේ හෝ අපරාධයකින් උත්පාදිත දේ අන්තර්ගත දේපළක් සම්බන්ධයෙන් සොයා ගැනීම, හඳුනා ගැනීම, සෝදිසි කිරීම සහ පරීක්ෂා කිරීමට අදාළව මුදල් සංසරණ විමර්ශන, මූල්‍ය විශ්ලේෂණ, ව්‍යෝහාරික ගිණුම්කරණය, ව්‍යෝහාරික විගණනය, වාණිජ දත්ත සමුදායන් ප්‍රවේශය පිළිබඳව නිසි දක්ෂතා ඇති දේශීය හෝ විදේශීය තැනැත්තකුගෙන්, ආයතනයකින් හෝ සංවිධානයකින් වෘත්තීයමය සේවාවන් ලබා ගැනීම හෝ සපයා ගැනීම;

(ඕ) ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති අපරාධයකින් උත්පාදිත දේ යයි සැක කරනු ලබන දෙයට අදාළ වන විදේශීය නිසි බලඅධිකාරීන්ගේ ඉල්ලීම භාර ගැනීම සහ සකස් කිරීම;

(ක) විදේශයක පිහිටා තිබේ යයි විශ්වාස කරනු ලබන ශ්‍රී ලංකාව තුළ දී සිදු කළ නීතිවිරෝධී ක්‍රියාකාරකම්වලින් උත්පාදිත දේ සම්බන්ධයෙන් විදේශීය නිසි අධිකාරීන්ට ඉල්ලීම් මගින් යොමු කිරීම;

(ග) මේ පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මේ පනත අනුව සිදු කර ඇති ක්‍රියා පිළිබඳව තොරතුරු සහ සංඛ්‍යා ලේඛන අන්තර්ගත දත්ත සමුදායක් තනිව හෝ අනෙක් නම් කරන ලද නිලධරයා සමඟ සහයෝගීතාවයෙන් පවත්වාගත යුතු අතර, විමර්ශනයට යටත් දේපළ, පරිශ්‍ර සෝදිසි කිරීම, අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ

සොයා ගැනීම, සංරක්ෂණය කිරීමේ නියෝග පැනවීම, තහනමට ගැනීම්, අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ අධිකරණමය ක්‍රියා විරහිත කිරීම්, වරදකරු කිරීමෙන් පසු රජය සතු කිරීමේ හෝ වරදකරු නොකිරීම මත පදනම් වූ රජය සතු කිරීමේ නඩු කටයුතු පැවරීම, ඒවායේ ප්‍රතිඵල, අත්අඩංගුවට ගැනීම්, රක්ෂිත බන්ධනාගාරගත කිරීම, ඇප සහ චූදිතයන්ට එරෙහිව අපරාධ නඩු ගොනු කිරීම ආදිය ඒ තොරතුරුවලට ඇතුළත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති මේ පනත යටතේ නම් කරන ලද නිලධරයකු ලෙස කටයුතු කරන පොලිස් නිලධරයකු වෙත ඇති නම් කරන ලද නිලධරයකුගේ කාර්යයන්, කර්තව්‍යයන් සහ බලතල පොලිස් ආඥාපනත සහ අපරාධ නඩු විධාන සංග්‍රහය පනත මගින් පොලිස් නිලධරයකු වෙත පවරා ඇති පරිදි කාර්යයන්, බලතල සහ කර්තව්‍යයන්වලට හානියක් සිදු කරනු නොලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති නම් කරන ලද නිලධරයකුගේ කාර්යයන්, කර්තව්‍යයන් සහ බලතල මේ පනත යටතේ නම් කරන ලද නිලධරයකු ලෙස කටයුතු කරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට දූෂණ විරෝධී පනත යටතේ ඔහුගේ කාර්යය, කර්තව්‍ය සහ බලතල කෙරෙහි හානියක් සිදු කරනු නොලැබිය යුතු ය.

විමර්ශන නිලධරයන්

**50.** (1) පොලිසියේ විමර්ශන නිලධරයකු පොලිස් පරීක්ෂවරයකුගේ නිලයට පහළින් නොවන නිලයක් දරන මේ පනත මගින් ඔහු වෙත පවරා ඇති කාර්යයන්, බලතල සහ කර්තව්‍යයන් පොලිසියේ නම් කරන ලද නිලධරයාගේ සාමාන්‍ය අධීක්ෂණය යටතේ ඉටු කළ යුතු පොලිස් නිලධරයකු විය යුතු ය.

(2) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විමසා එම කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන එම කොමිෂන් සභාවේ නිලධරයකු, මේ පනතේ

කාර්යය සඳහා විමර්ශන නිලධරයකු විය යුතු අතර ඔහු විසින් මේ පනත මගින් ඔහු වෙත පවරන ලද ඔහුගේ කාර්යයන්, කර්තව්‍යයන් සහ බලතල නම් කරන ලද නිලධරයාගේ අනුමතය ඇතිව ඉටු කළ යුතු ය.

විමර්ශන නිලධරයකුගේ කාර්යයන් සහ බලතල

**51.** (1) විමර්ශන නිලධරයකුට පහත දැක්වෙන දේ පිළිබඳ විමර්ශන සිදු කිරීමට කාර්යයන් සහ බලතල පැවතිය යුතු ය:-

(අ) අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ;

(ආ) අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ පිළිබඳ විමර්ශන ක්‍රියාවලියක දී අපරාධයකින් උත්පාදිත දේ උපචිත වූ නීති විරෝධී ක්‍රියාකාරකම සම්බන්ධව තොරතුරු හෙළි වන්නේ නම්, ඒ නීතිවිරෝධි ක්‍රියාකාරකම පිළිබඳ විමර්ශන පැවැත්වීම;

(ඇ) මේ පනතේ ඇතුළත් වරදක් සිදු කිරීම.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් කිසිවක් නීති විරෝධී ක්‍රියාකාරකමක් සිදු කිරීම පිළිබඳ විමර්ශනය කිරීමට නීතිය මගින් නිසි පරිදි බලයලත් නීතිය බලාත්මක කිරීමේ නිලධරයකු වැළැක්වීම සිදු කරනු නොලැබිය යුතු ය.

(3) දූෂණ විරෝධී පනත යටතේ වැරදි සංස්ථාපනය වන්නා වූ නීතිවිරෝධී ක්‍රියාකාරකම් පිළිබඳ වන යම් විමර්ශනයක්, එවැනි නීතිවිරෝධී ක්‍රියාකාරකම් පොලිසියේ විමර්ශන විෂය පථයට අයත් වන්නේ නම් මිස, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ බලයලත් නිලධරයන් විසින් පමණක් සිදු කරනු ලැබිය යුතු ය.

(4) පොලිසියේ විමර්ශන නිලධරයකු විසින් අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ පිළිබඳ විමර්ශනය සිදු කරන අතරතුර දී දූෂණ විරෝධී පනත යටතේ වරදක් සිදු කිරීමට අදාළව තොරතුරු හෙළි වුවහොත් ඒ තොරතුරු නොපමාව පොලිසියේ නම් කරන ලද නිලධරයා මාර්ගයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත සම්ප්‍රේෂණය කිරීම ඒ පොලිස් විමර්ශන නිලධරයාගේ කාර්යය විය යුතු ය.

(5) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධරයකු විසින් අපරාධයකින් උත්පාදිත දේ බවට සැක කරන දේ පිළිබඳව විමර්ශනයක් සිදු කරන අතරතුර දී පොලිස් විමර්ශන විෂය පථය තුළට ගැනෙන වරදක් සිදු කිරීමට අදාළව තොරතුරු හෙළිවුවහොත් ඒ තොරතුරු නොපමාව අල්ලස් හෝ දූෂණ චෝදනා කොමිෂන් සභාවේ නම් කරන ලද නිලධරයා හරහා පොලිසියේ නම් කරන ලද නිලධරයා වෙත සම්ප්‍රේෂණය කිරීම එම විමර්ශන නිලධරයාගේ කාර්යය විය යුතු ය.

(6) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් පොලිසියේ නම්කරන ලද නිලධරයා වෙත කාරණයක් යොමු කරන අවස්ථාවක, ඒ සිදු කරන ලදැයි කියන වැරදි පිළිබඳ විමර්ශනයක් සිදු කිරීමට සැලැස්වීම සහ මේ පනත අනුව වැඩිදුරටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම පොලිසියේ නම් කරන ලද නිලධරයාගේ කාර්ය විය යුතු ය.

(7) පොලිසියේ නම් කරන ලද නිලධරයා විසින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත කාරණයක් යොමු කරන අවස්ථාවක, ඒ සිදු කරන ලදැයි කියන වැරදි පිළිබඳ විමර්ශනයක් සිදු කිරීමට සැලැස්වීම සහ මේ පනත අනුව වැඩිදුරටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නම් කරන ලද නිලධරයාගේ කාර්යය විය යුතු ය.

(8) නීති විරෝධී ක්‍රියාකාරකම් සිදු කිරීම සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කිරීමේ කාර්ය සඳහා, අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ සහ අවස්ථාවෝචිත පරිදි, පොලිස් ආඥාපනතේ හෝ දූෂණ විරෝධී පනතේ ඇතුළත් ඒ විමර්ශන නිලධරයා වෙත සාමාන්‍යයෙන් පවරා ඇති විමර්ශන බලතලවලට අමතරව ඒ විමර්ශන නිලධරයා විසින් මේ පනතේ ඇතුළත් විමර්ශන බලතල භාවිත කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

(9) මේ වගන්තියේ නිශ්චිතව සඳහන් කාර්ය, කර්තව්‍ය සහ බලතල, පොලිසියේ විමර්ශන නිලධරයකු වෙත පොලිස් ආඥාපනත මගින් සහ අපරාධ නඩු විධාන සංග්‍රහය පනත මගින් පවරා ඇති කාර්ය, බලතල සහ කර්තව්‍යයන් කෙරෙහි හානියක් සිදු කරනු නොලැබිය යුතු ය.

(10) මේ වගන්තියේ නිශ්චිතව සඳහන් කාර්ය, කර්තව්‍ය සහ බලතල අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධරයකු වෙත දූෂණ විරෝධී පනත මගින් පවරා ඇති කාර්ය, බලතල සහ කර්තව්‍ය කෙරෙහි හානියක් සිදු කරනු නොලැබිය යුතු ය.

## II වන කොටස

## අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ විමර්ශන පැවැත්වීම, තහනම් කිරීම සහ තහනමට ගැනීම

අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ පිළිබඳ විමර්ශනයක් ආරම්භ කළ හැකි ආකාරය

**52.** නම් කරන ලද නිලධරයකු විසින් දෙනු ලැබිය හැකි පරිපාලන විධානවලට යටත්ව, විමර්ශන නිලධරයකු පහත දැක්වෙන ආකාරවලින් එක් ආකාරයකට අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ පිළිබඳව මේ පනත යටතේ විමර්ශනයක් ආරම්භ කරනු ලැබිය හැකි ය:-

(අ) තමා විසින් සිදු කරනු ලබන විමර්ශනයක දී හෝ නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සිදු කිරීම සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කිරීමට නීතියෙන් බලය දෙන ලද වෙනත් යම් තැනැත්තකු විසින් සිදු කරනු ලබන විමර්ශනයක දී යම් දේපළක් එවැනි නීතිවිරෝධී ක්‍රියාකාරකමකින් උත්පාදිත අපරාධයකින් උත්පාදිත දේ බවට සැකයක් උපදින අවස්ථාවක;

(ආ) අපරාධයකින් උත්පාදිත දේ යයි සැක කරන ලද දේ සම්බන්ධව බුද්ධි අංශයකින් වාර්තාවක් ලැබුණු පසුව;

(ඇ) අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳව තොරතුරු සැපයීමට මේ පනත අනුව තමාගේ ව්‍යවස්ථාපිත කාර්යභාරය ඉටු කර ඇති තැනැත්තකු විසින් සපයන තොරතුරු ලැබුණු පසුව;

(ඈ) අපරාධයකින් උත්පාදිත දේ හා අදාළව යම් තැනැත්තකුගේ පැමිණිල්ලක් හෝ පෙත්සමක් ලැබුණු පසුව;

(ඉ) අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේට අදාළව විමර්ශනයක් සිදු කිරීමට අධිකරණ ආඥාවක් ලැබුණු පසුව;

(ඊ) මේ පනත අනුව විමර්ශනයක් සිදු කරනු ලැබිය යුතු බවට නීතිපතිවරයාගේ උපදෙස් අනුව;

(උ) පවත්නා තොරතුරු හෝ දේ පදනම්ව හඳුනාගත් දේපළක් අපරාධයකින් උත්පාදිත දේ වන බවට ඔහුගේ මතය අනුව සැකයක් පවතින බවට යම් විමර්ශන නිලධරයකු හෝ නම් කරන ලද නිලධරයකු අදහස් කරන අවස්ථාවක;

(ඌ) දූෂණ විරෝධී පනත අනුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විෂය පථයට නොවැටෙන නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සිදු කිරීමෙන් උපයනු ලැබ ඇති බවට විශ්වාස කරන අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ පිළිබඳව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පොලිසියේ නම් කරන ලද නිලධරයා වෙත භාර දී ඇති වාර්තාවක් මත පදනම්ව;

(එ) දූෂණ විරෝධී පනත අනුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන විෂය පථයට ගැනෙන යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සිදු කිරීමෙන් උපයනු ලැබ ඇති බවට විශ්වාස කරන අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ පොලිසියේ නම් කරන ලද නිලධරයා විසින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත භාර දෙන ලද වාර්තාවක් අනුව;

(ඒ) අවස්ථාවෝචිත පරිදි, පොලිසියේ හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විෂය පථයට ගැනෙන යම් නීති විරෝධී ක්‍රියාකාරකමක්

සිදු කිරීමෙන් උපයන ලද අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ පිළිබඳව වෙනත් යම් නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් විසින් පොලිසියේ නම් කරන ලද නිලධරයා හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නම් කරන ලද නිලධරයා වෙත භාර දෙන ලද වාර්තාවක් මත පදනම්ව;

(ඔ) (i) විදේශීය රටක ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ, නියාමන, අධීක්ෂණ හෝ පරිපාලන අධිකාරියක්;

(ii) විදේශ රටක නීතිය බලාත්මක කිරීමේ හෝ බුද්ධි අංශ අධිකාරියක්;

(iii) ජාත්‍යන්තර, කලාපීය හෝ බහුපාර්ශ්වීය සංවිධානයක් හෝ නියෝජ්‍යායතනයක් මගින්;

(iv) ශ්‍රී ලංකාව පාර්ශ්වකරුවකු වන ජාත්‍යන්තර හෝ කලාපීය වැඩපිළිවෙළක් යටතේ පිහිටුවන ලද යාන්ත්‍රණයක් හෝ සංවිධානයක්,

විසින් පොලිසියේ නම් කරන ලද නිලධරයා හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නම් කරන ලද නිලධරයා යන දෙදෙනාගෙන් එක් අයකු වෙත භාර දෙන ලද වාර්තාවක් හෝ තොරතුරුවලින් පසුව;

(ඕ) සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත යටතේ ඉල්ලීමක් ඇතුළුව විදේශීය නීතිය බලාත්මක කිරීමේ නියෝජ්‍යායතනයකින් ලැබෙන ඉල්ලීමක් අනුව යමින්;

(ක) ජාත්‍යන්තර අපරාධ පිළිබඳ පොලිස් සංවිධානය (ඉන්ටර්පෝල්) වෙතින් ලැබුණු වාර්තාවක් මත පදනම්ව;

(ග) මූල්‍ය බුද්ධි ඒකකයෙන් ලැබුණු සැක කටයුතු ගණුදෙනු වාර්තාවක හෝ වෙනත් වාර්තාවක හෝ සන්නිවේදන අනුගමනය කරමින්;

(ච) (393 වන අධිකාරය වූ) පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද යම් පරීක්ෂණ කොමිෂන් සභාවක හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද යම් කොමිෂන් සභාවක අතුරු වාර්තාවක් ඇතුළු වාර්තාවක් මත;

(ජ) තොරතුරු සැපයීමේ කාර්ය පවරනු ලැබ ඇති තැනැත්තකු විසින් මේ පනතේ නියමයන්ට අනුව සපයන ලද තොරතුරු මත;

(ට) යම් දේපළක් අපරාධයකින් උත්පාදිත දේ බවට විශ්වාස කිරීම සඳහා සාධාරණ හේතු හෙළිදරව් කරන පාර්ලිමේන්තුවේ හෝ එහි කමිටුවකින් වාර්තාවක් හෝ සන්නිවේදනයක් ලැබුණු පසුව;

(ඩ) රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ලැබුණු වාර්තාවක් මත;

(ණ) ජාතික පොලිස් කොමිෂන් සභාවෙන් ලැබුණු වාර්තාවක් මත;

(ත) විගණකාධිපතිවරයාගෙන් ලැබුණු වාර්තාවක් හෝ නිවේදනයක් පදනම්ව;

(ද) නීත්‍යානුකූලව පිහිටුවන ලද විනය මණ්ඩලයක් විසින් නිකුත් කළ වාර්තාවක් මත;

(න) 1988 අංක 30 දරන බැංකු පනත යටතේ (බැංකු අධීක්ෂණ) අධ්‍යක්ෂවරයාගේ වාර්තාවක් මත;

(ප) 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ (බැංකු නොවන මූල්‍ය අධීක්ෂණ) අධ්‍යක්ෂවරයාගේ වාර්තාවක් මත;

(බ) 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ වාර්තාවක් අනුව;

(ම) අපරාධයකින් උත්පාදිත දේ සම්බන්ධව තොරතුරු සැපයීමට මේ පනත යටතේ කාර්යයක් පවරනු ලැබ ඇති වෙනත් යම් තැනැත්තකු විසින් භාර දෙන ලද වාර්තාවක් හෝ තොරතුරු මත;

(ය) 2019 අංක 24 දරන ක්‍රීඩාවලට සම්බන්ධ වැරදි වැළැක්වීමේ පනත යටතේ වන වැරැද්දක් සම්බන්ධයෙන් සම්පූර්ණ විමර්ශනයක් හෝ කොටසක් සිදු කරනු ලැබ ඇති ප්‍රධාන විමර්ශන නිලධරයා විසින් සපයනු ලබන වාර්තාවක් හෝ තොරතුරු මත;

(අඅ) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත අනුව ජාතික ක්‍රීඩා සංගමයක් ලෙස පිළිගනු ලැබ ඇති යම් සංවිධානයකින් ඉදිරිපත් කරනු ලැබ ඇති යම් වාර්තාවක් හෝ තොරතුරක් මත;

(ආආ) යම් පළාත් පාලන ආයතනයක්, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද නාගරික සංවර්ධන අධිකාරිය හෝ 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ පිහිටුවන ලද ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ද නිවාස අයිතිවාසිකම් පනත යටතේ පිහිටුවා ඇති සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය විසින් ලබා දෙන වාර්තාවක් මත;

(ඇඇ) අපරාධයකින් උත්පාදිත දේ පැවතීම පිළිබඳව නම් කරන ලද නිලධරයකුගේ හෝ විමර්ශන නිලධරයකුගේ යම් නිරීක්ෂණයකින් හෝ සාම නිලධරයකු විසින් නම් කරන ලද නිලධරයකුට හෝ විමර්ශන නිලධරයකුට දැනුම් දෙනු ලබන ඒ සාම නිලධරයා විසින් සිදු කරන එවැනි යම් නිරීක්ෂණයකින් පසුව.

මේ පනත යටතේ විමර්ශනයක් පවත්වන ආකාරය

**53.** (1) 52 වන වගන්තියේ සඳහන් කරන ලද යම් ආකාරයකින් තොරතුරක් ලැබුණු පසු විමර්ශන නිලධරයා විසින් අවශ්‍ය අවස්ථාවක, කරුණු සොයා ගැනීම සඳහා වූ පරීක්ෂණයක් පැවැත්වීමට පියවර ගනු ලැබිය යුතු ය. කරුණු සොයා ගැනීම සඳහා වූ පරීක්ෂණයේ පරමාර්ථය විය යුත්තේ 52 වන වගන්තිය යටතේ ලද තොරතුරුවල සත්‍යතාවය තීරණය කිරීම විය යුතු ය:

එසේ වුව ද, 52 වන වගන්තිය යටතේ ලද තොරතුරු පරීක්ෂා කිරීමෙන් පසුව අපරාධයකින් උත්පාදිත දේ පැවතීම පිළිබඳ විමර්ශන නිලධරයකුගේ හෝ නම් කරන ලද නිලධරයකුගේ යම් නිරීක්ෂණයකින් පසුව හෝ නම් කරන ලද නිලධරයා හෝ විමර්ශන නිලධරයා විසින් විශ්වාසනීය යයි සලකනු ලැබිය හැකි අපරාධයකින් උත්පාදිත දේ පැවතීම පිළිබඳ සාම නිලධරයකුගේ යම් නිරීක්ෂණයක් ලැබීමෙන් පසුව විමර්ශන නිලධරයාට ඒවායෙහි අන්තර්ගත තොරතුරුවල සත්‍යතාවය පිළිබඳව විශ්වාස කිරීම සඳහා සාධාරණ හේතු පවතී නම් වාර්තාගත කරනු ලැබිය යුතු හේතු මත කරුණු සොයා ගැනීම සඳහා වූ පරීක්ෂණයක් පැවැත්වීමෙන් තොරව මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි විමර්ශනයක් පැවැත්වීම ආරම්භ කළ යුතු ය:

එසේ වුව ද, එවැනි විමර්ශනයක් ආරම්භ කිරීම මේ වගන්තියේ (4) වන උපවගන්තියට යටත්ව සිදු කළ යුතු ය:

එසේ ම තවදුරටත්, 52 වන වගන්තියේ සඳහන් කරන ලද යම් ආකාරයකින් ලද තොරතුරු මගින් අපරාධයකින් උත්පාදිත දේවල අනන්‍යතාවය සහ පිහිටීම පිළිබඳ විශ්වාස කිරීම සඳහා විමර්ශන නිලධරයා සඳහා සාධාරණ හේතු ඉදිරිපත් වන්නේ නම්, විමර්ශන නිලධරයාට කරුණු තහවුරු කිරීම සඳහා මේ වගන්තිය යටතේ

විමර්ශනයක් පැවැත්වීම දේපළ සොයා ගැනීම සහ හඳුනා ගැනීම හෝ මෙහි මින් මතු ප්‍රකාශ කර ඇති විමර්ශනයක් පැවැත්වීම අවශ්‍ය නොවිය යුතු අතර මේ යටතේ විධිවිධාන සලසා ඇති පරිදි-

(අ) පැහැදිලි කිරීමක් කැඳවීමේ දැන්වීමක් භාර දීමට;

(ආ) දේපළ භාවිතය තහනම් කිරීම, දේපළ සංරක්ෂණය කිරීම සඳහා විධානයක් නිකුත් කිරීම; හෝ

(ඇ) දේපළ තහනමට ගැනීම,

සඳහා අවශ්‍ය පියවර ගැනීමට හිමිකම පැවතිය යුතු ය.

(2) මේ පනතේ කාර්යයන් සඳහා ‘කරුණු සොයා ගැනීම සඳහා වූ පරීක්ෂණයක් යන්නෙන්’ තොරතුරුවල සහ දේ පිළිබඳ මූලික විභාගයක් සහ 52 වන වගන්තියේ සඳහන් කරන ලද යම් ආකාරයකින් ලද තොරතුරු විශ්වසනීය සහ අපරාධයකින් උත්පාදිත දේ සම්බන්ධයෙන් වන තොරතුරු වන්නේ ද යන්න තීරණය කිරීමේ කාර්යය සඳහා යම් තැනැත්තකුගේ යම් අයිතිවාසිකමක් උල්ලංඝනය වීමේ හැකියාව ඇති යම් ක්‍රියාකාරකමක් සිදු කිරීමෙන් තොරව තොරතුරු සත්‍යාපනය කිරීමේ ක්‍රියාවලියක් අදහස් වේ.

(3) 52 වන වගන්තියේ සඳහන් කරන ලද යම් ආකාරයකින් ලැබුණු තොරතුරු සත්‍යාපනය කිරීමේ ක්‍රියාවලියේ දී යම් පුද්ගලයකුගේ ලිඛිත නීතිය මගින් පිළිගන්නා ලද යම් අයිතිවාසිකමක් උල්ලංඝනය වීම සිදු නොවිය හැකි ආකාරයෙන් මේ පනතේ විධිවිධාන සලසා ඇති ඕනෑම විමර්ශන බලතලයක් ක්‍රියාත්මක කළ හැකි ය:

එසේ වුව ද, නීත්‍යානුකූල වෙළඳ, වාණිජ හෝ මූල්‍ය කටයුතු හෝ යම් වෘත්තියක් හෝ රැකියාවකට අගතිදායක ලෙස බලපාන අයුරින් කරුණු සොයා ගැනීම සඳහා වූ පරීක්ෂණයක් සිදු නොකළ යුතු ය.

(4) (1) වන උපවගන්තියේ සඳහන් කරුණු සොයා ගැනීම සඳහා වූ පරීක්ෂණය නිම කිරීමෙන් පසුව, විමර්ශන නිලධරයා විසින්-

(අ) අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ පිළිබඳ විමර්ශනයක් පැවැත්වීම අවශ්‍ය ද යන්න පිළිබඳ; සහ

(ආ) මේ පනත යටතේ අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ පිළිබඳ විමර්ශනයක් පැවැත්වීම සාධාරණීකරණයට සහ අවශ්‍ය කරවන බවට අදාළ අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ හි මූල්‍ය වටිනාකම ප්‍රමාණාත්මකව ඉහළ අගයක් ගන්නේ ද යන්න,

පිළිබඳ නිශ්චය කිරීමේ කාර්ය සඳහා නම් කරන ලද නිලධරයා විමසිය යුතු අතර, එකී නිශ්චය කිරීම වාර්තාගත කළ යුතු ය. එම නිශ්චය කිරීම සඳහා වන හේතු වාර්තා කළ යුතු අතර විමර්ශන නිලධරයා සහ අනුරූප නම් කරන ලද නිලධරයා යන දෙදෙනාම එම නිශ්චය කිරීම අත්සන් කළ යුතු ය.

(5) සත්‍යාපනය කිරීමෙන් පසු 52 වන වගන්තියේ සඳහන් කරන ලද යම් ආකාරයකින් ලැබුණු තොරතුරු හෝ ඉන් කොටසක් විශ්වසනීය බවට සහ අපරාධයකින් උත්පාදිත දේට සම්බන්ධ වන බව සොයා ගන්නා සහ ඒ අනුව මේ පනත යටතේ විමර්ශනයක් ආරම්භ කිරීම අවශ්‍ය අවස්ථාවක, විමර්ශන නිලධරයකු විසින්, නම් කරන ලද නිලධරයාගේ අනුමතයට සහ ඔහු විසින් නිකුත් කරනු ලබන සාමාන්‍ය හෝ විශේෂ විධානයන්ට යටත්ව, මේ පනත යටතේ විමර්ශනයක් ආරම්භ කර පවත්වාගෙන යාම සිදු කළ යුතු ය:

එසේ වුව ද, නම් කරන ලද නිලධරයාගේ පූර්ව අනුමතය ලබා ගැනීමේ දී අවස්ථානුගත කරුණු අනුව ප්‍රායෝගික විය නොහැකි හෝ මේ පනතේ අරමුණු යටපත් කිරීමේ හැකියාව ඇති අවස්ථාවක විමර්ශන නිලධරයා විසින් වාර්තාගත කරනු ලැබිය යුතු හේතු මත තමා විසින් ම විමර්ශනයක් ආරම්භ කර ඉන්පසුව හැකි ඉක්මනින් නම් කරන ලද නිලධරයාගේ අනුමතය ලබා ගත හැකි ය.

(6) මේ වගන්තිය යටතේ විමර්ශන නිලධරයකු විසින් නම් කරන ලද නිලධරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කිරීමෙන් පසු ඔහු විසින් විමර්ශනයක් පැවැත්වීමට අනුමතය දීම, හෝ අනුමතය දීම ප්‍රතික්ෂේප කිරීම සිදු කළ හැකි ය. නම් කරන ලද නිලධරයා විසින් විමර්ශනයක් පැවැත්වීමට අනුමතය දීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවක දී ඔහු විසින් ඒ සඳහා හේතු වාර්තාගත කළ යුතු අතර, විමර්ශනයක් පැවැත්වීම අනුමත නොකළ යුතු ය යන ඒ තීරණය සම්බන්ධයෙන් වාර්තාවක් ඔහු පොලිසියේ නම් කරන ලද නිලධරයා නම්, පොලිස්පතිවරයා වෙත භාර දිය යුතු ය. නම් කරන ලද නිලධරයා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වන අවස්ථාවක, ඒ වාර්තාව ඔහු විසින් කොමිෂන් සභාව වෙත භාරදිය යුතු ය.

(7) විමර්ශන නිලධරයා විසින් අවශ්‍ය අවස්ථාවක අපරාධයකින් උත්පාදිත දේ විය යුතු බවට විශ්වාස කරන දේපළක් සොයා ගැනීම සහ හඳුනා ගැනීමට පියවර ගනු ලැබිය යුතු ය.

විමර්ශන නිලධරයකුගේ විමර්ශන බලතල

**54**. මේ පනත යටතේ විමර්ශනයක් ආරම්භ කිරීමෙන් පසු, විමර්ශන නිලධරයකුට පහත දැක්වෙන විමර්ශන බලතල පැවතිය යුතු ය:-

(අ) නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සිදු කිරීම ඇතුළු අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ පිළිබඳව යම් තොරතුරු හෝ කරුණක් දැන සිටී යයි විශ්වාස කරනු ලබන යම් තැනැත්තකුට, එවැනි විමර්ශන නිලධරයකු විසින් ඔහුගෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු දීමට නියම කිරීම සහ ඒ විමර්ශන නිලධරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන කාරණා පිළිබඳව ලිඛිත ප්‍රකාශයක් සපයන ලෙසට නියම කිරීම;

(ආ) යම් තැනැත්තකු සමඟ සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීම සහ ඔහු විසින් තම ප්‍රකාශය සිදු කිරීම වීඩියෝ පටිගත කිරීම;

(ඇ) මේ පනතේ 68 වන වගන්තියට අනුව දැන්වීම් නිකුත් කර අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ පිළිබඳ විමර්ශනයක් සිදු කිරීමට පහසුකම් සැලැස්වීමට යම් තොරතුරු කැඳවීම;

(ඈ) අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ හඳුනා ගැනීම, සොයා ගැනීම, ආපසු ලබා ගැනීම සහ විභාග පැවැත්වීම සඳහා අවශ්‍ය විය හැකි පියවර ගැනීම;

(ඉ) තහනම් කරන ලද, තහනමට ගන්නා ලද සහ අක්‍රිය කරන ලද අපරාධයකින් උත්පාදිත දේ සඳහා අවශ්‍ය ආරක්ෂාව සහ සංරක්ෂණය සැලසීම;

(ඊ) විශේෂිත ඩිජිටල් සහ වෙනත් වැඩසටහන් භාවිතා කිරීමට සම්බන්ධ විය හැකි විශ්ලේෂණ ඇතුළුව මූල්‍ය විශ්ලේෂණ පැවැත්වීම;

(උ) අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ පිළිබඳ තක්සේරු කිරීමක් ලබා ගැනීම;

(ඌ) දූෂණ විරෝධී පනත අනුව භාර දෙන ලද වත්කම් සහ බැරකම් ප්‍රකාශයක සහතික කළ පිටපතක් ලබා ගැනීම;

(එ) විමර්ශනය සිදු කරන්නා වූ අපරාධයකින් උත්පාදිත දේවලට අදාළ කරුණු, දත්ත සහ තොරතුරු ඇතුළත් බවට විශ්වාස කරන යම් ගොනු වාර්තා, ඩිජිටල් දත්ත ගබඩා කිරීමේ උපාංග හෝ වෙනත් යම් ස්ථානවල ඇතුළත් ලේඛන, දේ සහ තොරතුරු පරීක්ෂා කිරීම භාරයට ගැනීම.

නම් කරන ලද නිලධරයකුගේ අනුමතය මත විමර්ශන නිලධරයකුගේ විමර්ශන බලතල

**55**. (1) මේ පනත යටතේ විමර්ශනයක් ආරම්භ කිරීමෙන් පසු නම් කරන ලද නිලධරයාගේ අවසරය මත විමර්ශන නිලධරයකු වෙත-

(අ) මේ පනතේ පසුව සඳහන් විධිවිධානවල දක්වා ඇති පරිදි දේපළක් භාවිත කිරීමෙන් හෝ ඒ සමග ගනුදෙනු කිරීමෙන් යම් තැනැත්තකු තහනම් කිරීමේ සහ අපරාධයකින් උත්පාදිත දේ විය හැකි බවට සැක කිරීමට සාධාරණ හේතු පවතින යම් දේපළක් විමර්ශන නිලධරයා විසින් ලිඛිත තහනම් නියෝගයක නිශ්චිතව සඳහන් කරන ලද ආකාරයකින් ආරක්ෂා කිරීමට යම් තැනැත්තකුට නියම කිරීමේ බලතල;

(ආ) අපරාධයකින් උත්පාදිත දේ හි සන්තකය, ආධිපත්‍යය, භාරකාරත්වය හෝ පාලනය දරන යම් තැනැත්තකු වෙත ඒ දේපළ සම්බන්ධයෙන් තහනම් කරනු ලැබ ඇති ක්‍රියා සම්බන්ධයෙන් ඇතුළත් විය යුතු විධානයක් සහිතව තහනම් කිරීමේ සහ සංරක්ෂණය කිරීමේ නියෝගයක් නිකුත් කිරීමේ බලතල;

(ඇ) මේ පනතේ පසුව සඳහන් කළ විධිවිධානවල සඳහන් කර ඇති පරිදි විමර්ශන නිලධරයාට අපරාධයකින් උත්පාදිත දේ බවට සැක කිරීමට සාධාරණ හේතු පවතින යම් දේපළක් තහනමට ගැනීමේ බලතල:

එසේ වුව ද, අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත යම් දෙයක් තහනමට ගැනීමට පෙරාතුව විමර්ශන නිලධරයා විසින්-

(i) අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේවල ආසන්නම මූල්‍ය වටිනාකම;

(ii) ඒ වටිනාකම තහනමට ගනු ලැබිය හැකි දේපළක අවම වටිනාකම ලෙස අධිකාරිය

විසින් නිශ්චිතව සඳහන් කරන ලද වටිනාකම ඉක්මවා යන වටිනාකමක් ද යන්න පිළිබඳව; සහ

(iii) මහාධිකරණයෙන් ආරක්ෂාව, සංරක්ෂණය සහ කළමනාකරණය සඳහා ආඥාවක් ලබා ගන්නා තෙක් තහනමට ගන්නා ලද දේපළ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීමට ආර්ථික වශයෙන් සකසුරුවම් විය හැකි ද යන්න පිළිබඳව,

සලකා බැලිය යුතු ය:

එසේ ම තවදුරටත්, තහනම් කළ යුතු දේපළක වටිනාකම අවම හෝ අධිකාරිය විසින් නිශ්චිතව සඳහන් කරන ලද ප්‍රමාණයට වඩා අඩු වුව ද නම් කරන ලද නිලධරයා විමසා විමර්ශන නිලධරයා විසින් ඒ අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ තහනමට ගැනීම මහජන යහපත සඳහා යයි මතයක් දරන විට විමර්ශන නිලධරයා විසින් ඒ සම්බන්ධයෙන් වාර්තා කළ යුතු හේතු වෙනුවෙන් මේ පනත අනුව එවැනි දේපළක් තහනම් කළ යුතු ය;

(ඇ) තහනම් කළ අපරාධයකින් උත්පාදිත දේ හි සන්තකය ලබා ගැනීම පිළිබඳව;

(ඉ) තහනම් කළ හෝ තහනමට ගන්නා ලද අපරාධයකින් උත්පාදිත දේට අදාළව අධිකරණමය ක්‍රියා විරහිත කිරීමේ ආඥාවක් ඉල්ලුම් කිරීම, ලබා ගැනීම, භාරදීම සහ බලාත්මක කිරීම පිළිබඳව;

(ඊ) දේශීය හෝ විදේශීය නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් හා එක්ව හෝ සහාය ඇතිව අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ විමර්ශනයක් පැවැත්වීම පිළිබඳ;

(උ) අපරාධයකින් උත්පාදිත දේ යයි සැක කරනු ලබන දේ අධිකරණමය ක්‍රියා විරහිත කිරීමක් හෝ රජය සතු කිරීමක් වෙනුවෙන් නඩු කටයුතු පැවරීම සලකා බැලීම සඳහා වන නීතිපතිවරයාගෙන් ඉල්ලා සිටීම සඳහා; සහ

(ඌ) (i) අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ;

(ii) නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සිදු කිරීම;

(iii) අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ පිළිබඳ අදාළ ගනුදෙනු; සහ

(iv) අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ හි සන්තකය, ආධිපත්‍යය, භාරය, පාලනය සහ භාවිතයට,

අදාළ තොරතුරු රැස් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලිසියේ බුද්ධි අංශ සහභාගී වීම මාර්ගයෙන් ආවේක්ෂණය පැවැත්වීම හෝ පැවැත්වීමට සැලැස්වීම සඳහා,

බලතල පැවතිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ඌ) ඡේදය යටතේ වන ආවේක්ෂණයක් -

(අ) පටිගත කිරීම් සහිතව හෝ රහිතව පෞද්ගලික සන්නිවේදන අවහිර කිරීමට;

(ආ) ආවේක්ෂණය යටත් තැනැත්තකුගේ පුද්ගලික පරිශ්‍ර තුළ ඩිජිටල් ආවේක්ෂණයට;

(ඇ) ප්‍රසිද්ධියේ නොවන යම් තැනැත්තකුගේ පෞද්ගලික ජීවිතයට අදාළ විය හැකි වෙනත් යම් ආවේක්ෂණයකට,

සම්බන්ධ වන අවස්ථාවක, ඒ ආවේක්ෂණය, විමර්ශනය ආරම්භ කිරීම හෝ පවත්වාගෙන යාම දැනටමත් වාර්තා කර ඇති මහෙස්ත්‍රාත්වරයාගෙන් සහ එසේ වාර්තාවක් ඉදිරිපත් කර නොමැති නම් ආවේක්ෂණ ස්ථානය සම්බන්ධයෙන් ප්‍රාදේශීය අධිකරණ බලය පවතින මහෙස්ත්‍රාත්වරයකුගෙන් ලබා ගත් පූර්ව අනුමතයක් සහිතව පමණක් පවත්වනු ලැබිය යුතු ය:

එසේ වුව ද, හදිසි ස්වාභාවයෙන් වන හේතු මත හෝ විමර්ශන නිලධරයකුගේ පාලනය ඉක්මවා යන හේතු මත හෝ මහෙස්ත්‍රාත්වරයාගේ පූර්ව අවසරය ලබා ගැනීම මේ පනතේ අරමුණු යටපත් කරවිය හැකි අවස්ථාවක, විමර්ශන නිලධරයා විසින් සමකාලීනව වාර්තා කළ යුතු, යම් ක්‍රියාමාර්ග ගැනීම සඳහා හේතු සහිතව යම් පූර්ව අවසරයක් ලබා ගැනීමෙන් තොරව ඒ ආවේක්ෂණය සිදු කරනු ලැබිය හැකි ය:

එසේ ම තවදුරටත්, ඒ විමර්ශන නිලධරයා විසින්, එසේ යම් ආවේක්ෂණයක් සිදු කිරීමෙන් පැය විසිහතරක කාලයක් ඇතුළත රහසිගත සන්නිවේදනයක් මගින් අදාළ මහෙස්ත්‍රාත්වරයා වෙත දැනුම් දිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වන ආවේක්ෂණයක් සඳහා මහෙස්ත්‍රාත්වරයාගේ අවසරය සඳහා ඉදිරිපත් කරන ඉල්ලීමක්, රහසිගත ඉල්ලීමක් මගින් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයා විසින් ඒකපාර්ශ්විකව අප්‍රසිද්ධියේ සලකා බැලිය යුතු ය. මහෙස්ත්‍රාත්වරයා විසින් එවැනි ඉල්ලීමක් සහ ඒ සම්බන්ධයෙන් දෙන ලද තීන්දුව සම්බන්ධයෙන් රහස්‍යභාවය පවත්වාගෙන යාමට සෑම සාධාරණ පියවරක් ම ගනු ලැබිය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ ආවේක්ෂණයක් සඳහා අවසර ලබා දීමට පෙරාතුව මහේස්ත්‍රාත්වරයා විසින් කරගෙන යා යුතු විමර්ශන පියවර සඳහා සමානුපාතිකත්වයේ මූලධර්මය මත පදනම්ව නීත්‍යානුකූලභාවය, අවශ්‍යතාව සහ සාධාරණීය කිරීම සලකා බැලිය යුතු ය.

විමර්ශනයක් පැවැත්වීමට අධිකරණ අවසරය ලබා ගැනීම

**56.** (1) මේ පනත යටතේ විමර්ශනයක් ආරම්භ කිරීමෙන් පසු පරිපාලන නියමයන්ට යටත්ව විමර්ශන නිලධරයා අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ පිහිටා ඇති බවට විශ්වාස කරන ස්ථානය අයත් වන ප්‍රාදේශීය අධිකරණ බල සීමාව හෝ අයත් මහෙස්ත්‍රාත් අධිකරණය වෙත හෝ ඒවා පිහිටා තිබෙන ස්ථානය, ශ්‍රී ලංකාවෙන් පිටත හෝ විමර්ශන නිලධරයා නොදන්නේ නම්, කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත රහසිගත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට හිමිකම් ලැබිය යුතු අතර, ඒකපාර්ශ්වීය අප්‍රසිද්ධ නඩු විභාගයකින් පසුව, විමර්ශන පැවැත්වීමට පහසුකම් සැලැස්වීම පිණිස මහෙස්ත්‍රාත් අවසරයක් හෝ ආඥාවක් ලබා ගැනීමට හිමිකම් ලැබිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ විමර්ශන නිලධරයකුගෙන් ඉල්ලීමක් ලැබුණු පසුව, මහෙස්ත්‍රාත්වරයා ඒකපාර්ශ්වීය අප්‍රසිද්ධ නීති කෘත්‍යයක දී නොපමාව ඉල්ලීම සලකා බැලිය යුතු අතර, අවසර ලබා දීම පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය විය යුතු බවට සෑහීමට පත්වෙමින් මහෙස්ත්‍රාත්වරයා අවශ්‍ය අවස්ථාවක සුදුසු යයි සලකනු ලබන යම් කොන්දේසිවලට යටත්ව ඒ අවසරය හෝ ආඥාව ප්‍රදානය කළ යුතු ය.

ඇතුළු වීම, සෝදිසි කිරීම සහ පරීක්ෂා කිරීම

**57.** (1) 56 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ සොයා ගැනීම ඒවායේ පිහිටීම හෝ ස්වභාවය සහ පැවැත්ම පිළිබඳව තහවුරු කර ගැනීම සඳහා යම් පරිශ්‍රයක්, ස්ථානයක්, පහසුකමක්, ජාලයක්, ඩිජිටල් දත්ත ගබඩා කිරීමේ උපාංගයක්, වෙනත් යම් දේපළක් හෝ දෙයක් හෝ තැනැත්තකු වෙත ඇතුළු වීමට, සෝදිසි කිරීමට, පරීක්ෂා කිරීමට සහ අවශ්‍ය අවස්ථාවක සන්තකය ලබා ගැනීමට විමර්ශන නිලධරයකුට බලය තිබිය යුතු ය:

එසේ වුව ද, හදිසි ස්වභාවයෙන් වන හේතු මත හෝ විමර්ශන නිලධරයාගේ පාලනය ඉක්මවා යන හේතු මත මහෙස්ත්‍රාත්වරයාගේ පූර්ව අවසරය ලබා ගැනීම මේ පනතේ අරමුණු යටපත් කර විය හැකි අවස්ථාවක, ඒ ක්‍රියාමාර්ග ගැනීම සඳහා විමර්ශන නිලධරයා විසින් සමකාලීනව වාර්තාගත කළ යුතු හේතු සහිතව එසේ පූර්ව අවසරයක් ලබා ගැනීමෙන් තොරව ඒ

සෝදිසි කිරීම සිදු කරනු ලැබිය හැකි ය. එම විමර්ශන නිලධරයා විසින් එසේ යම් සෝදිසි කිරීමක් සිදු කිරීමෙන් පැය විසිහතරක කාලයක් ඇතුළත එම සෝදිසි කිරීම සිදු කිරීම සම්බන්ධයෙන් අදාළ මහෙස්ත්‍රාත්වරයා වෙත වාර්තා කළ යුතු ය.

(2) මේ වගන්තිය යටතේ සෝදිසි කිරීමේ බලතල ක්‍රියාත්මක කරන විමර්ශන නිලධරයකු වෙත අවසර ලබා දීම සහ ඒ සෝදිසි කිරීමට පහසුකම් සැලසීම යම් පරිශ්‍රයක්, ස්ථානයක්, පහසුකමක්, ජාලයක්, ඩිජිටල් දත්ත ගබඩා කිරීමේ උපාංගයක්, වෙනත් යම් දේපළක් හෝ දෙයක් හෝ තැනැත්තකුගේ පාලනය, සන්තකය හෝ භාරකාරත්වය සහිත තැනැත්තාගේ වගකීම විය යුතු ය.

(3) යම් පරිශ්‍රයක්, ස්ථානයක්, පහසුකමක්, ජාලයක්, ඩිජිටල් දත්ත ගබඩා කිරීමේ උපාංගයක්, වෙනත් යම් දේපළක් හෝ දෙයක් වෙත ඇතුළු වීමට හෝ ප්‍රවේශ වීමට හෝ තැනැත්තෙකු වෙත ප්‍රවේශ වීමට, නොහැකි හෝ ඇතුළු වීම හෝ ප්‍රවේශ වීම අවහිර කර ඇති අවස්ථාවක, සෝදිසි කිරීමේ බලය ක්‍රියාත්මක කරන්නා වූ විමර්ශන නිලධරයකු විසින්, එම පරිශ්‍රය, ස්ථානය, පහසුකම, ජාලය, ඩිජිටල් දත්ත ගබඩා කිරීමේ උපාංගය, වෙනත් යම් දේපළ හෝ දෙය වෙත ඇතුළු වීම හෝ ප්‍රවේශ වීම හෝ තැනැත්තා වෙත ප්‍රවේශ වීම සඳහා අවශ්‍ය බලය භාවිත කිරීම ඇතුළු සෝදිසි කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය පියවර ගැනීම නීත්‍යානුකූල විය යුතු ය.

තොරතුරු ලබා ගැනීමේ බලතල

**58**. 56 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, විමර්ශන නිලධරයකුට පහත දැක්වෙන තොරතුරු ලබා ගැනීමට බලතල පැවතිය යුතු ය:-

(අ) බැංකු ගිණුම්, තැන්පතු, ණය, වෙනත් පහසුකම් සහ වෙනත් සමාන බැංකු සාධන පත්‍ර සහ මාර්ගගත බැංකු පහසුකම් භාවිත කිරීමට අදාළ තොරතුරු ඇතුළු බැංකු සම්බන්ධතාවයන්ට අදාළ තොරතුරු;

(ආ) වෙනත් යම් මූල්‍ය ආයතන හෝ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් හෝ අතථ්‍ය සේවා සැපයුම්කරුවන්ගෙන් මූල්‍ය සාධන පත්‍රවලට හෝ නිෂ්පාදන සහ සේවාවලට අදාළ තොරතුරු;

(ඈ) ක්‍රිප්ටෝ මුදල්, බිට්කොයින්, බ්ලොක් චේන් ගනුදෙනු සහ ඩිජිටල් මාධ්‍ය භාවිතයෙන් සිදු කරනු ලබන වෙනත් ගනුදෙනු සම්බන්ධයෙන් ප්‍රවේශය, භාවිතය සහ ගනුදෙනු සිදු කිරීම සම්බන්ධ තොරතුරු ලබා ගැනීමට;

(ඇ) ලියාපදිංචි නොකළ සහ නියාමනය නොවන යම් මූල්‍ය ආයතනයකින් ලබා ගන්නා මූල්‍ය සාධන පත්‍ර හෝ නිෂ්පාදන සහ සේවාවලට අදාළ තොරතුරු ලබා ගැනීමට;

(ඉ) අනාගත වෙළෙඳ ද්‍රව්‍ය වෙළෙඳාම වැනි අතථ්‍ය වෙළෙඳාමට අයත් වන තොරතුරු ලබා ගැනීමට;

(ඊ) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ ප්‍රකාශවල පිටපත් සහ අන්තර්ගත තොරතුරු ලබා ගැනීම;

(උ) රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ ප්‍රකාශවල පිටපත් සහ ඊට අදාළ සහ අන්තර්ගත තොරතුරු ලබා ගැනීම;

(ඌ) රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත හෝ හිමිකම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත සපයන ලද ප්‍රකාශ සහ තොරතුරු ලබා ගැනීම;

(එ) ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හෝ හිමිකම් ලියාපදිංචි කාර්යාලයේ ගොනු කරන ලද ඔප්පුවල සහ වෙනත් පැවරීම්වල පිටපත් ලබා ගැනීම;

(ඒ) විදේශීය විනිමය කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා භාරයේ පවතින තොරතුරු ලබා ගැනීම;

(ඔ) දුරකථන සහ ජංගම දුරකථන ඇමතුම් වාර්තා,

සම්ප්‍රේෂණ තොරතුරු, ඇමතුම් අවසන් කිරීමේ තොරතුරු, ඩිජිටල් දත්ත සේවා භාවිතය, භූවමාරුවන දත්ත, අන්තර්ජාල ද්වාර සහ දොරටුවලට සහ ප්‍රවේශ වීම ආදිය ලබා ගැනීම;

(ඕ) සාධාරණත්ව හිමිකමකට, කොටස් සහ වෙනත් සාධාරණත්ව ගනුදෙනුවක් ආදියට අදාළ තොරතුරු ලබා ගැනීම;

(ක) ඩිජිටල් දත්ත ගබඩා කිරීමේ උපාංග ඇතුළු යම් ඩිජිටල් උපාංගයකින් දත්ත සහ තොරතුරු උපුටා ගැනීම:

එසේ වුව ද, මහෙස්ත්‍රාත් ආඥාවක් ලබා ගන්නා තෙක් විමර්ශන නිලධරයකු විසින් ඒ උපාංගය භාරයට ගෙන එය රඳවා තබා ගැනීම නීත්‍යානුකූල විය යුතු ය;

(ග) ඩිජිටල් උපාංගයට, ඩිජිටල්කරණය කරන ලද යෙදවුමකට, වෙබ් අඩවියකට, සර්වරයකට හෝ වෙනත් යම් සයිබර් හෝ ජාලගත පරිසරයකට ප්‍රවේශය ලබා ගැනීමට පරිශීලක නාමය සහ මුරපදය හෝ වෙනත් යම් තොරතුරුවලට අයිතිය ඇතැයි විශ්වාස කරන යම් තැනැත්තකු වෙත කරන විධානයක් ලබා ගැනීමට;

(ච) යම් ඩිජිටල් උපාංගයක් හෝ ඩිජිටල් ගබඩා කිරීමක්, දත්ත කේතවලට හැරවීම ඉවත් කිරීම සඳහා හෝ එහි ප්‍රවේශ කේතයක් අක්‍රීය කිරීමට හෝ මඟහැර යාම සඳහා අවශ්‍ය පියවර ගැනීමට;

(ජ) තමා සන්තකයේ තිබිය හැකි හෝ තමාට ප්‍රවේශය ඇති යම් දත්ත හෝ තොරතුරුවල රහස්‍යභාවය පවත්වා ගැනීම සම්බන්ධයෙන් යම් නීතියක, ගිවිසුම්ගත හෝ වෙනත් බැඳීමක කුමක් සඳහන් වුව ද-

(i) එම තොරතුරු;

(ii) ලේඛනවල, ගොනුවල හෝ රෙජිස්ටරවල සහතික කළ පිටපත්; හෝ

(iii) යම් ඩිජිටල් උපාංග,

යම් විමර්ශන නිලධරයකුට ලබා දීමට යම් ආයතනයක යම් ප්‍රධානියකුට හෝ ප්‍රධාන විධායක නිලධරයකුට හෝ ඒ ආයතනයේ වෙනත් යම් තැනැත්තකුට, නියම කිරීමට;

(ට) විමර්ශන නිලධරයකු සෘජුව ඉල්ලා සිටි යම් තොරතුරු හෝ දේ ඒවා සන්තකයෙහි පවතින යම් තැනැත්තකු විසින් ලබා නොදෙන විට ඒවා ලබා ගැනීමට;

(ඩ) පවත්නා ලේඛනයක සහතික කළ පිටපතක් හෝ විමර්ශන පැවැත්වීම සඳහා අවශ්‍ය විය හැකි ඉහත සඳහන් නොකළ වෙනත් යම් තොරතුරු ඇතුළු යම් දත්ත හෝ තොරතුරු ආඥාවේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙන් සහ ආකාරයෙන් සපයන ලෙසට ඉහත සඳහන් නොකළ යම් තැනැත්තකු වෙත ආඥාවක් ලබා ගැනීමට;

(ණ) යම් දේපළකට අදාළ වන දත්ත සහ තොරතුරු සහ එවැනි දේපළක අයිතිය, සන්තකය, භාරකාරත්වය, ආධිපත්‍ය හෝ පාලනය දරන තැනැත්තන්ට අදාළ දත්ත සහ තොරතුරුවල යම් පොදු හෝ පෞද්ගලික තැන්පතුවකට ප්‍රවේශ වීමට.

**59.** (1) (අ) මේ පනත යටතේ යම් විමර්ශනයක කාර්ය යම් ඉලෙක්ට්‍රොනික උපාංගයක ගබඩා කර ඇති යම් තොරතුරු හෝ දත්ත සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි බවට; සහ — තොරතුරු සංරක්ෂණය

(ආ) එම තොරතුරු හෝ දත්ත නැති වීමේ, විනාශ වීමේ, වෙනස් කිරීමේ හෝ ප්‍රවේශ විය නොහැකි වීමේ අවදානමක් පවතින බවට,

විමර්ශන නිලධරයකු සෑහීමට පත් වන අවස්ථාවක, දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලබන දවස් තිහක කාලසීමාවක් නොඉක්මවන යම් කාලසීමාවක් සඳහා ඒ තොරතුරු හෝ දත්ත සංරක්ෂණය කළ යුතු බවට ඒ ඉලෙක්ට්‍රොනික උපාංග පාලනයේ ඇත්තේ යම් තැනැත්තකුගේ ද, ඒ තැනැත්තා වෙත ඒ විමර්ශන නිලධාරියා විසින් ලිඛිත දැන්වීමකින් නියම කරනු ලැබිය හැකි ය.

(2) මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ සිදු කරනු ලබන ඉල්ලීමකින්, තොරතුරු හා දත්ත සංරක්ෂණය කළ යුතු කාලසීමාව තව දුරටත් දීර්ඝ කරනු ලැබිය හැකි ය.

විශේෂ විමර්ශන ක්‍රමවේද සඳහා අධිකරණ අවසරය

**60**. (1) විමර්ශන නිලධරයකුට, 56 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි මහෙස්ත්‍රාත්වරයකුගේ අධිකරණ අවසරයකට යටත්ව පහත දැක්වෙන විශේෂ විමර්ශන ක්‍රමවේද මෙහෙයවීමට බලතල පැවතිය යුතු ය:-

(අ) පාලනය නතු කළ භාර දීම;

(ආ) ඩිජිටල්, කටහඬ, වීඩියෝ සන්නිවේදන අවහිර කිරීම සහ පටිගත කිරීම ඇතුළු ඩිජිටල් ආවේක්ෂණය;

(ඇ) උපාය දූතයන් සම්බන්ධ වන්නා වූ මෙහෙයුම් ඇතුළු ආවරණ මෙහෙයුම්;

(ඈ) උගුල් ඇටවීම; සහ

(ඉ) පරිගණක, ජංගම දුරකථන, ඩිජිටල් දත්ත ගබඩා කිරීමේ උපාංග සහ වෙනත් ඩිජිටල් උපකරණ මගින් දත්ත, තොරතුරු සහ ප්‍රතිබිම්බවල වෝහාරික උපුටා ගැනීම්.

(2) ඉහත සඳහන් කරන ලද පරිදි විමර්ශන නිලධරයාගෙන් ඉල්ලීමක් ලැබුණු පසුව මහෙස්ත්‍රාත්වරයා විසින් නොපමාව එකී ඉල්ලීම සලකා බැලිය යුතු අතර, සෑහීමට පත්වීමෙන් පසු

අවශ්‍ය විශේෂ විමර්ශන ක්‍රමවේද සිදු කිරීම සඳහා අවසර ලබා දිය යුතු ය. මහෙස්ත්‍රාත්වරයා විසින්, අවශ්‍ය අවස්ථාවක, යුක්තියේ කාර්ය සඳහා සපුරාලිය යුතු කොන්දේසි පනවනු ලැබිය හැකි ය.

(3) මහෙස්ත්‍රාත්වරයා විසින් විශේෂ විමර්ශන ක්‍රමවේද සිදු කිරීම සඳහා අවසර ලබා දීමට පෙරාතුව සිදු කළයුතු එම විමර්ශන ක්‍රමවේද සඳහා සමානුපාතිකත්වයේ මූලධර්මය මත පදනම්ව එය සිදු කිරීම සඳහා අවශ්‍යතාවය සහ සාධාරණීකරණය කිරීම පිළිබඳව සලකා බැලිය යුතු ය.

(4) ඉහත සඳහන් පරිදි අවසරය ලබා ගැනීමෙන් පසු විමර්ශන නිලධරයා විසින් එසේ අවසරය ලබා ගත් විශේෂ විමර්ශන ක්‍රමවේද භාවිත කරමින් සිදු කරන විමර්ශනයේ ප්‍රගතිය දින දාහතරකට වරක් අදාළ මහෙස්ත්‍රාත්වරයා වෙත වාර්තා කළ යුතු ය.

විමර්ශනවලදී අවශ්‍ය වන යම් කටයුතු සිදු කිරීමට යම් තැනැත්තකු වෙත කරන අධිකරණ ආඥා

**61**. විමර්ශන නිලධරයකුට,

(අ) වෝහාරික විගණනය;

(ආ) දත්ත සහ තොරතුරුවල ඩිජිටල් වෝහාරික උපුටා ගැනීම්;

(ඇ) දේපළ තක්සේරු කිරීම;

(ඈ) දත්ත සහ තොරතුරු ඩිජිටල් දත්ත ගබඩා කිරීමේ උපංගවල පිටපත් කිරීම සහ ගබඩා කිරීම;

(ඉ) දේපළවලට අදාළ යම් ගනුදෙනුවල වෝහාරික විශ්ලේෂණ; සහ

(ඊ) මේ පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය වෙනත් යම් ක්‍රියාකාරකමක්,

සිදු කිරීම ඇතුළු අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ පිළිබඳ යම් විමර්ශනයක් සිදු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම්

ක්‍රියාකාරකමක් සිදු කරන ලෙස යම් තැනැත්තකුට නියම කරන අධිකරණ ආඥාවක් ලබා ගැනීමට විමර්ශන නිලධරයකුට බලය තිබිය යුතු ය:

එසේ වුව ද, ඒ ක්‍රියාකාරකම පුද්ගලික පාර්ශ්වයක් විසින් මෙහෙය විය යුතු බවට විධානය කරන අවස්ථාවක, මහෙස්ත්‍රාත්වරයා විසින් අදාළ සේවා සැපයුම්කරු විමසා ගෙවිය යුතු ගාස්තු තීරණය කර ඒ ගාස්තු ගෙවන ලෙසට අදාළ නීතිය බලාත්මක කිරීමේ අධිකාරයට නියම කළ යුතු ය.

වෘත්තීය සේවා විමර්ශන සඳහා භාවිත කළ හැකි බව

**62**. අපරාධයකින් උත්පාදිත දේ බවට සැක කරන හෝ අපරාධයකින් උත්පාදිත දේ අඩංගු වන දේපළක්, සොයා ගැනීම, හඳුනා ගැනීම, සෝදිසි කිරීම සහ පරීක්ෂා කිරීම සඳහා මුදල් සංසරණ විමර්ශනවලට, මූල්‍ය විශ්ලේෂණ, වෝහාරික ගිණුම්කරණය, වෝහාරික විගණනය, වාණිජ දත්ත සමුදායන්ට ප්‍රවේශ වීමට අදාළව දේශීය හෝ විදේශීය නිසි දක්ෂතා ඇති තැනැත්තකුගේ හෝ ආයතනයක හෝ සංවිධානයක වෘත්තීය සේවාවක් නම් කරන ලද නිලධරයකු විසින් ලබා ගෙන හෝ සපයාගෙන ඇති අවස්ථාවක, විමර්ශන නිලධරයා විසින්-

(අ) තවදුරටත් විමර්ශන කරගෙන යාම;

(ආ) විමර්ශනය යටතේ පවතින දේපළක් සම්බන්ධයෙන් මතයක් නිර්මාණය කිරීමේ; සහ

(ඇ) මේ පනත අනුව යම් ක්‍රියාමාර්ගයක් ගැනීමේ,

කාර්ය සඳහා එම ක්‍රියාවලි තුළින් රැස්කරගත් දේ සහ තොරතුරු මත කටයුතු කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

තවදුරටත් විමර්ශන

**63**. (1) මේ පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සඳහා විමර්ශන නිලධරයා විසින් තවදුරටත් විමර්ශන පවත්වනු ලැබිය යුතු අතර, විශේෂයෙන්,

(අ) අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ හඳුනා ගැනීමට, සෝදිසි කිරීමට, සොයා ගැනීමට, අය කර ගැනීමට සහ පරීක්ෂා කිරීමට අවශ්‍ය පියවර ගැනීම;

(ආ) හඳුනාගත් දේපළක් හෝ එහි කොටසක් අපරාධයකින් උත්පාදිත දෙයක් ද නැතහොත් නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සිදු කිරීමෙන් උපයනු ලැබ තිබේ ද යන්න නිශ්චය කිරීම;

(ඇ) නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කරන ලද තැනැත්තාගේ අනන්‍යතාව ඇතුළු නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සිදු කිරීමට අදාළව සාක්ෂි රැස් කිරීම;

(ඈ) අතීතය සහ වර්තමාන යන දෙකට ම අදාළව දේපළ සන්තකය, භාරය, පාලනය, භාවිතය සහ ආධිපත්‍යයට අදාළව සාක්ෂි රැස් කිරීම;

(ඉ) ඒ දේපළෙහි අර්ථලාභී සම්බන්ධතාවක් තිබිය හැකි තැනැත්තන් හඳුනා ගැනීම;

(ඊ) හඳුනාගත් අපරාධවලින් උත්පාදිත දේ උත්පාදනය කළා වූ නීතිවිරෝධී ක්‍රියාකාරකම නිශ්චය කිරීම;

(උ) දේපළෙහි ස්වභාවය සහ ආසන්න වටිනාකම නිශ්චය කිරීම;

(ඌ) එවැනි දේපළක් තහනම් කිරීම, තහනමට ගැනීම සහ අධිකරණමය ක්‍රියා විරහිත කිරීම සිදු කිරීමට අවශ්‍ය විය හැකි යම් තොරතුරු විමසා දැන ගැනීම;

(එ) මේ පනතේ අරමුණු ළඟා කර ගැනීමට අවශ්‍ය විය හැකි වෙනත් යම් වැඩිදුරටත් වූ තොරතුරු රැස් කිරීම; සහ

(ඒ) මේ පනතේ අරමුණු ළඟා කර ගැනීමට අවශ්‍ය විය හැකි වැඩිදුරටත් වූ යම් ක්‍රියාමාර්ග ගැනීම,

සිදු කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ දක්වා ඇති අරමුණු ළඟා කර ගැනීමේ කාර්ය සඳහා මේ පනත යටතේ විමර්ශන නිලධරයකු වෙත පවරන ලද විමර්ශන බලතල ක්‍රියාත්මක කිරීමට විමර්ශන නිලධරයකුට හිමිකම් ලැබිය යුතු ය.

(3) විමර්ශනයකට භාජනය වී ඇති යම් දේපළක් අපරාධයකින් උත්පාදිත දේ බවට සාධාරණ හේතු පවතින ඕනෑම අවස්ථාවක, (1) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි තවදුරටත් වූ විමර්ශන සම්පූර්ණ කර නොමැති වුව ද, මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි ඒ දේපළ තහනම් කිරීම, සංරක්ෂණය කිරීම හෝ තහනමට ගැනීම සම්බන්ධයෙන් වන ක්‍රියාමාර්ග ගැනීම විමර්ශන නිලධරයකු විසින් සිදු කරනු ලැබිය හැකි ය.

විමර්ශන සහ තවදුරටත් වූ විමර්ශන පැවැත්වීමේ අරමුණු

**64**. වෙනත් කරුණු අතර මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි යම් විමර්ශනයක් හෝ තවදුරටත් වූ විමර්ශනයක් පැවැත්වීමේ අරමුණු:-

(අ) විමර්ශනය සිදුවෙමින් පවතින දේපළ අපරාධයකින් උත්පාදිත දෙයක් ද යන්න නිශ්චය කිරීම;

(ආ) ඒ දේපළට අදාළ මේ පනතේ ඇතුළත් යම් වරදක් සිදු කරනු ලැබ තිබේ ද යන්න සහ එසේ සිදු කරනු ලැබ ඇත්නම් ඒ වරද සිදු කළ තැනැත්තා හඳුනා ගැනීම සහ ඒ වරදකරුට නඩු පැවරීම සඳහා සාක්ෂි රැස් කිරීම; සහ

(ඇ) යම් දේපළක් උත්පාදනය කරවන ලද යම් නීති විරෝධී ක්‍රියාකාරකමක් හඳුනා ගැනීමේ කාර්යය සහ ඒ අපරාධයකින් උත්පාදිත දේ රජය සතු කිරීමේ නඩු කටයුතු සාර්ථකව සිදු කිරීම හැකි කරවීම සඳහා

ඒ නීති විරෝධී ක්‍රියාකාරකම සම්බන්ධයෙන් සාක්ෂි රැස් කිරීමේ කාර්යය,

විය යුතුය.

විමර්ශනවලට අදාළ සාමාන්‍ය විධිවිධාන

**65**. (1) අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ සම්බන්ධව සිදු කරන යම් විමර්ශනයක් ඒ අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ තහනමට ගැනීම හෝ අධිකරණමය ක්‍රියා විරහිත කිරීමක් නොසලකා ද අඛණ්ඩව කරගෙන යනු ලැබිය හැකි ය.

(2) මේ පනත අනුව විමර්ශනයක් පවත්වන විමර්ශන නිලධරයකුට, යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සිදු කිරීම සම්බන්ධයෙන් පවත්වනු ලබන විමර්ශනයකට අදාළව විමර්ශන සටහන්වල ඇතුළත් දේ සහ තොරතුරු සැලකිල්ලට ගෙන ඒ අනුව ක්‍රියා කිරීමට හිමිකම් ලැබිය යුතු ය.

(3) දූෂණ විරෝධී පනතේ ඇතුළත් වරදක් පිළිබඳ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් පූර්ණ හෝ අර්ධ වශයෙන් පවත්වන විමර්ශනයකට අදාළව විමර්ශන සටහන්වල ඇතුළත් දේ සහ තොරතුරු සැලකිල්ලට ගෙන ඒ අනුව ක්‍රියා කිරීමට පොලිස් විමර්ශන නිලධරයකු වෙත හිමිකම් ලැබිය යුතු ය:

එසේ වුව ද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නම් කරන ලද නිලධරයා වෙත එවැනි ඉල්ලීමක් පොලිසියේ නම් කරන ලද නිලධරයා හරහා කරනු ලැබිය යුතු ය. පොලිසියේ නම් කරන ලද නිලධරයාගෙන් ඉල්ලීමක් ලැබුණු පසුව දූෂණ විරෝධී පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නම් කරන ලද නිලධරයා විසින් පොලිසියේ නම් කරන ලද නිලධරයාට අවශ්‍ය කරන දේ ලබා දීමට සැලැස්විය යුතු ය.

(4) මේ පනතේ විධිවිධානවලට බලාත්මකභාවය ලබා දීමේ කාර්ය සඳහා මිස, එසේ ලැබුණ දේ හි ඇතුළත් තොරතුරුවලට අදාළ රහසිගතභාවය පවත්වාගෙන යාමට පොලිසියේ නම් කරන ලද නිලධරයා සහ පොලිසියේ විමර්ශන නිලධරයා බැඳී සිටිය යුතු ය.

(5) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සහ මේ පනත අනුව ක්‍රියා කිරීමට බලය පවරන ලද එහි නිලධරයන්, වෙත පොලිස් විමර්ශන නිලධරයකු විසින් මේ පනතේ සටහන් අනුව සිදු කරන විමර්ශනවලට අදාළ විමර්ශන නීත්‍යානුකූල මාර්ගයෙන් ලැබී හෝ ලැබීමට ඉඩ සලසා ඇත්නම් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධරයකු විසින් තවදුරටත් වූ යම් විමර්ශන සිදු කර හෝ නොකර ඒ විමර්ශන සටහන්වල ඇතුළත් තොරතුරු සහ දේ සැලකිල්ලට ගෙන ඒ අනුව ක්‍රියා කළ යුතු ය.

(6) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නම් කරන ලද නිලධරයා විසින් එකී දේ සැලකිල්ලට ගැනීම මත පදනම්ව සහ අවශ්‍ය අවස්ථාවක දී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් පවත්වන තවදුරටත් වූ යම් විමර්ශන ක්‍රියාවලියක දී රැස් කර ගනු ලැබිය හැකි තවදුරටත් වූ යම් දේ මත පදනම්ව මේ පනත අනුව ක්‍රියා කරමින් අපරාධයකින් උත්පාදිත දේ රජය සතු කිරීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

(7) මේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, වෙනත් යම් නීතියකට අනුව යම් වරදක් පිළිබඳ පවත්වාගෙන යනු ලබන විමර්ශනක දී එවැනි විමර්ශනයක් පවත්වාගෙන යන පොලිස් නිලධරයකු හෝ විමර්ශනය පවත්වන යම් නිලධරයකුගේ උපදෙස් මත ක්‍රියා කරන වෙනත් යම් පොලිස් නිලධරයකු විසින් ඒ විමර්ශනයේ දී ඒ වරද කිරීමෙන් උත්පාදිත දේ සොයා ගන්නා අවස්ථාවක, ඒ අපරාධයකින් උත්පාදිත දේ තහනමට ගැනීමට සහ ඒ විමර්ශනය පවත්වනු ලැබුවේ යම් නීතියක් යටතේ ද, එවැනි යම් නීතියකට අනුව ඒ දේපළ සම්බන්ධව ක්‍රියා කිරීමට හෝ මේ පනත අනුව ක්‍රියාමාර්ග ගැනීමට ඔහුට බලතල තිබිය යුතු ය.

*උදාහරණ:*

සොරකමක් සිදුවීමේ අවස්ථාවක් සම්බන්ධයෙන් තොරතුරු ලැබෙන්නා වූ පොලිස් නිලධරයකු විසින් අපරාධ නඩු විධාන සංග්‍රහය

පනත අනුව ඒ සොරකම පිළිබඳව විමර්ශනයක් පැවැත්වීම ආරම්භ කරනු ලබයි. විමර්ශනය සිදු කරන අතරතුර දී සෝදිසි කිරීමක් සිදු කිරීමේ දී සොරකම සිදු කිරීමෙන් උත්පාදිත දේ බවට විශ්වාස කිරීමට ඔහු වෙත සාධාරණ හේතු පවතින දේපළක් ඔහු විසින් සොයා ගනු ලබයි. මේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, අපරාධ නඩු විධාන සංග්‍රහය පනත අනුව ඒ දේපළ ඔහුගේ භාරයට ගෙන නඩු පැවරීමට සහ නීතියට අනුව තවදුරටත් වූ ක්‍රියාමාර්ග ගැනීමට ඔහු හිමිකම් ලැබිය යුතු ය.

(8) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන ජනාධිපති විශේෂ විමර්ශන කොමිෂන් සභා පනත යටතේ පත් කළ කොමිෂන් සභාවක් හෝ (393 වන අධිකාරය වූ) විමර්ශන කොමිෂන් සභා පනත යටතේ පත් කළ විමර්ශන කොමිෂන් සභාවක් විසින් පවත්වන විමර්ශන නීති කෘත්‍යයක සහ විමර්ශනවල ඇතුළත්ව ඇති යම් තොරතුරු සහ දේ නීතිවිරෝධී ක්‍රියාකාරකම්වලින් උත්පාදිත දේ හා අදාළ යම් තොරතුරු වනතාක් දුරට නීතිපතිවරයා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, නම් කරන ලද නිලධරයකු සහ විමර්ශන නිලධරයකු විසින් ඒ තොරතුරු හා දේ සැලකිල්ලට ගෙන ඒ අනුව ක්‍රියා කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

(9) විදේශීය රටක නිසි බලධරයන්ගෙන් ලබා ගත යුතු විය හැකි අවශ්‍ය බල අධිකාරියට යටත්ව සහ පරිපාලන නියමයන්ට යටත්ව විමර්ශන නිලධරයකු විසින් මේ පනත යටතේ වන විමර්ශනයක් සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් විදේශ රටක දී සිදු කරනු ලැබීමට හිමිකම් ලැබිය යුතු ය. ඒ කාර්ය සඳහා විමර්ශන නිලධරයා විසින් ඒ විදේශ රාජ්‍යයේ නීතිය බලාත්මක කිරීමේ නිලධරයකුගේ සහාය ලබා ගැනීම සිදු කළ හැකි ය.

(10) විමර්ශන නිලධරයකුට විදේශීය රටක නීතිය බලාත්මක කිරීමේ නිලධරයකු විසින් සහාය සපයන, ඒ අනුව අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ පිළිබඳව යම් විමර්ශනයක් සිදු කරන අවස්ථාවක, ඒ විමර්ශනය හෝ එයින් කොටසක් විමර්ශන නිලධරයකු විසින් පවත්වනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ විදේශීය රාජ්‍යයක නීතිය බලාත්මක කිරීමේ නිලධරයා විසින් රැස් කළ කරුණු මත සොයාගත් සාක්ෂි අධිකරණ නීති කෘත්‍යයක දී ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

*පැහැදිලි කිරීම:*

විදේශීය රටක් තුළ විමර්ශනයක් පැවැත්වීමේ දී විදේශීය නීතිය බලාත්මක කිරීමේ නිලධරයකුගේ සහාය ලබා ගැනීමේ කාර්යය සඳහා, ඒ විදේශීය රට තුළ විමර්ශනයේ අදාළ කොටස සිදු කරමින් තිබූ අවස්ථාවක, විමර්ශන නිලධරයකු සිටිනු ලැබ තිබීම අවශ්‍ය නොවේ.

(11) ශ්‍රී ලංකා පොලිසියේ සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නම් කරන ලද නිලධරයන් සහ විමර්ශන නිලධරයන් විසින් මේ පනත යටතේ ලබා ගත් සහ විමර්ශනයක් සිදු කිරීමේ කාලය තුළ දී රැස්කර ගත් තොරතුරු සහ වෙනත් දේ ආරක්ෂා කිරීම සහ සුරක්ෂිත කිරීම සම්බන්ධ උචිත පියවර ගනු ලැබිය යුතු ය. මේ පනතේ නිශ්චිතව දක්වා ඇති කාර්ය සඳහා මේ පනතේ විධිවිධාන යටතේ පමණක් ඒ තොරතුරු සහ දේ භාවිත කරනු ලැබිය යුතු ය.

නම් කරන ලද නිලධරයා හෝ විමර්ශන නිලධරයා විසින් මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන පියවර ගනු ලැබිය හැකි බව

**66**. මේ පනතේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා සහ මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ එම නිලධරයන්ට පැවරී ඇති බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා, නම් කරන ලද නිලධරයකු හෝ විමර්ශන නිලධරයකු විසින් මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවූ වෙනත් යම් උචිත පියවර ගනු ලැබිය හැකි ය.

වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන සලස්වා නොමැති අවස්ථා

**67**. මේ පනත මගින් හෝ තත්කාලයේ බලපවත්නා වෙනත් යම් නීතියක් මගින් විශේෂ විධිවිධාන සලස්වා නොමැති කාර්යපටිපාටිත කාරණා සම්බන්ධයෙන් වන විට, අදාළ අවස්ථාවේ දී යුක්තිය උදෙසා අවශ්‍ය විය හැකි වූ ද, මේ පනතට අනනුකූල නොවන්නා වූ ද යම් කාර්ය පටිපාටියක් අනුගමනය කරනු ලැබිය හැකි ය.

පැහැදිලි කිරීම් කැඳවීමේ දැන්වීම

**68**. (1) අපරාධයකින් උත්පාදිත දේ යැයි සැක සහිත දේ සම්බන්ධව තොරතුරු ලැබීමෙන් පසුව, අවශ්‍ය අවස්ථාවක දී,

කරුණු සොයා ගැනීම සඳහා වූ පරීක්ෂණයක් හෝ විමර්ශනයකින් පසුව හඳුනාගත් දේපළක් අපරාධයකින් උත්පාදිත දේ බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු තිබෙන්නේ නම්, විමර්ශන නිලධරයකු විසින් සමකාලීන හේතු වාර්තා කිරීමකින් පසුව අනුරූප නම් කරන ලද නිලධරයාගේ අනුමතය ඇතිව -

(අ) ඒ දේපළේ සන්තකය, භාරය, පාලනය හෝ ආධිපත්‍ය දරන තැනැත්තාට;

(ආ) ඒ දේපළෙහි අයිතිය ලියාපදිංචි වී ඇති හෝ ඒ දේපළට හිමිකම් කියනු ලබන්නේ යයි දන්නා තැනැත්තා වෙත;

(ඇ) ඒ දේපළෙහි අර්ථලාභී සම්බන්ධතාවය දරන යම් තැනැත්තා වෙත;

(ඈ) මේ උපවගන්තියේ (අ), (ආ) හෝ (ඇ) ඡේදයේ සඳහන් තැනැත්තන්ගේ නියෝජිතයකු, නාමිකයකු, අනුයෝජිතයකු, කළමනාකරුවකු, ප්‍රධාන නිලධරයකු හෝ ඇටෝර්නි බලකරුවකු වෙත; හෝ

(ඉ) මේ උපවගන්තියේ (අ), (ආ), (ඇ) හෝ (ඈ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකුට,

මේ පනතේ I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙන් දැන්වීමක් භාරදෙනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන දැන්වීමක් මගින් දැන්වීම භාර දී ඇත්තේ යම් තැනැත්තකු වෙත ද, ඒ තැනැත්තාට පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු සපයන ලෙසට නියම කළ යුතු ය:-

(අ) ඔහු විසින් ඒ දේපළ අත් කර ගැනීම, සන්තකය දැරීම, හිමිකාරිත්වය දැරීම, පාලනය කිරීම, ආධිපත්‍ය දැරීම හෝ භාවිතය සිදු කරන ලද ආකාරය;

(ආ) එම අත්කර ගැනීම, සන්තකය දැරීම, හිමිකාරිත්වය දැරීම, පාලනය කිරීම, ආධිපත්‍ය දැරීම හෝ භාවිතය සඳහා සපයන ලද ප්‍රතිෂ්ඨාවල මූලාශ්‍ර ඇතුළුව ඒ දේපළ ඔහු විසින් අත්කර ගැනීමේ, සන්තකය දැරීමේ, හිමිකාරිත්වය දැරීමේ, පාලනය කිරීමේ, ආධිපත්‍ය දැරීමේ හෝ භාවිත කිරීමේ නීත්‍යානුකූලභාවය;

(ඇ) දේපළ භාර ගනු ලැබුවේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තාගේ අනන්‍යතාවය සහ ඒ දේපළ ලැබීමට අදාළ අවස්ථානුගත කරුණු; සහ

(ඈ) ඒ දැන්වීමේ නිශ්චිතව දක්වා තිබිය හැකි ඒ දේපළට අදාළ වන වෙනත් යම් තොරතුරු.

(3) ඒ දැන්වීමේ විස්තර කර ඇති දේපළවලට අදාළව පැහැදිලි කිරීමක් සහ තොරතුරු ලබා ගැනීමේ කාර්යය සඳහා සහ විශේෂයෙන් වෙනත් කරුණු අතරේ පහත දැක්වෙන කරුණු පිළිබඳ විමසා දැන ගැනීමේ කාර්ය සඳහා ඒ දැන්වීම භාර දෙනු ලැබිය යුතු ය:-

(අ) හඳුනා ගත් දේපළ අපරාධයකින් උත්පාදිත දේ වන දේපළක් බව;

(ආ) නිශ්චිත එක් නීතිවිරෝධී ක්‍රියාකාරකමක් හෝ ඊට වැඩි ගණනක් සිදු කිරීමෙන් දේපළ උපයා ඇති බව සහ එසේ නම් ඒ අපරාධයකින් උත්පාදිත දේ උපයා ඇති එවැනි නීතිවිරෝධී ක්‍රියාකාරකමේ අනන්‍යතාවය සහ එවැනි නීතිවිරෝධී ක්‍රියාකාරකම් වලට අදාළ සාක්ෂි;

(ඇ) ඒ දේපළ සම්බන්ධයෙන් යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කර තිබේ ද යන්න;

(ඈ) අනුරූප නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කර ඇති තැනැත්තාගේ අනන්‍යතාවය; සහ

(ඉ) ඒ නීතිවිරෝධී ක්‍රියාකාරකම සහ අපරාධයකින් උත්පාදිත දේ වලට අදාළ සාක්ෂි.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා "භාර දීම" යන්නෙන්, අතින්, ලියාපදිංචි තැපෑලෙන් හෝ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් සම්ප්‍රේෂණය කිරීම අදහස් වන අතර, ලබන්නා විසින් පිළිගැනීම ප්‍රතික්ෂේප කරන ලද අවස්ථා ද ඇතුළත් වේ.

(5) මේ පනතේ සඳහන් කිසිවක් මගින් විමර්ශන නිලධරයකු විසින් මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පැහැදිලි කිරීම් කැඳවීමේ දැන්වීමක් භාර දෙන අවස්ථාවක දී නැතහොත් ඉන් ඉක්බිතිවම හෝ 69 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පැහැදිලි කිරීමේ ප්‍රකාශයක් ලැබීමෙන් පසු හෝ 71 වන වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාර නියෝගයක් භාරදීම වළක්වනු නොලැබිය යුතු ය.

පැහැදිලි කිරීමේ ප්‍රකාශය

**69**. (1) 68 වන වගන්තිය යටතේ දැන්වීම ලැබුණු පසුව, ඒ දැන්වීම ලැබී වැඩකරන දින තුනක් නොඉක්මවන කාලයක දී ඒ සඳහා (මේ පනතේ "පැහැදිලි කිරීමේ ප්‍රකාශයක්" ලෙස සඳහන් කරන) සත්‍ය සහ විස්තරාත්මක පිළිතුරක්, දිවුරුමක් හෝ ප්‍රතිඥා දුන් ප්‍රකාශයක් ආකාරයෙන් ලිඛිතව සැපයීම ඒ දැන්වීම ලබන්නා වූ තැනැත්තාගේ කාර්ය විය යුතු ය:

එසේ වුවද, දැන්වීම භාර දෙනු ලැබුවේ යම් තැනැත්තකු වෙත ද, එම තැනැත්තා විසින් විමර්ශන නිලධරයා වෙත ලබා දිය යුතු ප්‍රමාණවත් හේතු මත සහ එකී හේතු සද්භාවී වන බවට තහවුරු වී ඇති අවස්ථාවක, පැහැදිලි කිරීමේ ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා දින දාහතරක කාලසීමාවක් නොඉක්මවන්නා වූ තවදුරටත් දීර්ඝ කළ හැකි කාලසීමාවක් ලිඛිතව ඉල්ලා සිටිනු ලැබිය හැකි ය:

එසේ ම තවදුරටත්, එවැනි අවස්ථාවන්හි දී, විමර්ශන නිලධරයා විසින්, මේ පනතේ අරමුණු යටපත් නොවන බවට තහවුරු කිරීමේ කාර්යය සඳහා මේ පනත යටතේ තහනම් නියෝගයක් නිකුත් කළ හැකි වෙනත් අවස්ථාවන්ට අතිරේකව තහනම් නියෝගයක්

නිකුත් කරනු ලැබිය හැකි අතර, එය පැහැදිලි කිරීමේ ප්‍රකාශය ඔහු වෙත ලැබුණු අවස්ථාවේ සිට පැය හැත්තෑ දෙකක කාලසීමාවක් සඳහා පමණක් වලංගු විය යුතු ය.

(2) පැහැදිලි කිරීමේ ප්‍රකාශය ලැබීමෙන් පසු, විමර්ශන නිලධරයා විසින්, විමර්ශනය කරනු ලබන්නේ යම් දේපළක් සම්බන්ධයෙන් ද, එම දේපළ අපරාධයකින් උත්පාදිත දෙයක් වන බවට සාධාරණ හේතු ඇත් ද යන්න සලකා බැලීම සහ තීරණය කිරීම කරනු ලැබිය යුතු ය. එකී කාර්යය සඳහා අවශ්‍ය විට දී, ඔහු විසින්, වැඩිදුර විමර්ශන සිදු කරනු ලැබිය හැකි අතර, ඊට පැහැදිලි කිරීමේ ප්‍රකාශය ඉදිරිපත් කළ තැනැත්තාගෙන් සහ අනෙකුත් සහ තවත් තැනැත්තන්ගෙන් ප්‍රශ්න කිරීම සහ එකී තැනැත්තාගේ ප්‍රකාශයක් සහ අනෙකුත් සහ තවත් තැනැත්තන්ගේ ප්‍රකාශ වාර්තා කිරීම ද ඇතුළත් විය යුතු ය.

(3) 68 වන වගන්තිය යටතේ වන දැන්වීමක් තනි පුද්ගල ව්‍යාපාරයක් වෙත භාර දිය යුතු වන අවස්ථාවක, එකී දැන්වීම එහි හිමිකරු වෙත භාර දෙනු ලැබිය යුතු ය. මෙහි මින් පෙර විධිවිධාන සලස්වා ඇති ආකාරයට එකී දැන්වීමට ප්‍රතිචාර දැක්වීම එකී හිමිකරුගේ කාර්යය විය යුතු ය.

(4) 68 වන වගන්තිය යටතේ වන දැන්වීමක් හවුල් ව්‍යාපාරයක් වෙත භාර දිය යුතු වන අවස්ථාවක, එකී දැන්වීම එහි යම් හවුල්කරුවකු වෙත භාරදිය යුතු අතර, මෙහි මින් පෙර විධිවිධාන සලස්වා ඇති ආකාරයට ප්‍රතිචාර දැක්වීම එකී හවුල්කරුගේ කාර්යය වන්නේ ය. මෙහි මින් පෙර විධිවිධාන සලස්වා ඇති ආකාරයට එකී දැන්වීමට අනුකූලව කටයුතු කරමින්, එකී හවුල්කරු විසින්, ලබා දුන් පැහැදිලි කිරීමේ අන්තර්ගතය සහතික කරමින් හෝ තම පෞද්ගලික පැහැදිලි කිරීම් දක්වමින්, එකී හවුල් ව්‍යාපාරයේ සියලුම හවුල්කරුවන් විසින් අත්සන් කරන ලද සංදේශයක් ලබා ගත යුතු අතර, එය සති තුනක් ඇතුළත විමර්ශන නිලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. ඉහත සඳහන් කරන ලද සංදේශය සහතික කිරීම හෝ තමාගේ පැහැදිලි කිරීම අදාළ විමර්ශන නිලධරයා වෙත ලබා දීම හවුල් ව්‍යාපාරයක සියලුම හවුල්කරුවන්ගේ කාර්යය විය යුතු ය.

(5) 68 වන වගන්තිය යටතේ වන දැන්වීමක් සංස්ථාපිත නොවන පුද්ගල මණ්ඩලයක් වෙත භාර දිය යුතු වන අවස්ථාවක, එකී දැන්වීම එහි ප්‍රධාන ධුරය දරන නිලධරයා වෙත හෝ එවැනි ප්‍රධාන ධුරය දරන නිලධරයකු නොසිටින අවස්ථාවක දී, එහි වෙනත් යම් ධුරයක් දරන නිලධරයකු වෙත හෝ භාරදිය යුතු අතර, මෙහි මින් පෙර විධිවිධාන සලස්වා ඇති ආකාරයට එකී දැන්වීමට පිළිතුරු දීම එකී ධුරය දරන නිලධරයාගේ කාර්යය විය යුතු ය. එකී දැන්වීමට අනුකූලව කටයුතු කරමින් එකී ධුරය දරන නිලධරයා විසින්, ලබා දුන් පැහැදිලි කිරීමේ අන්තර්ගතය සහතික කරමින් හෝ තම පෞද්ගලික පැහැදිලි කිරීම් දක්වමින් එකී සංස්ථාපිත නොවන පුද්ගල මණ්ඩලයේ සියලුම ධුර දරන නිලධරයන් විසින් අත්සන් කරන ලද සංදේශයක් ලබා ගෙන එය සති තුනක් ඇතුළත විමර්ශන නිලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. ඉහත සඳහන් කරන ලද සංදේශය සහතික කිරීම හෝ තමාගේ පැහැදිලි කිරීම අදාළ විමර්ශන නිලධරයා වෙත ලබා දීම එකී සියලුම ධුර දරන නිලධරයන්ගේ කාර්යය විය යුතු ය.

(6) 68 වන වගන්තිය යටතේ වන දැන්වීමක් සංස්ථාපිත පුද්ගල මණ්ඩලයක් වෙත භාර දිය යුතු වන අවස්ථාවක, එකී දැන්වීම එහි කළමනාකාර අධ්‍යක්ෂවරයා වෙත හෝ ඔහු නොසිටින අවස්ථාවක එහි යම් අධ්‍යක්ෂවරයකු වෙත හෝ භාරදිය යුතු අතර, මෙහි මින් පෙර විධිවිධාන සලස්වා ඇති ආකාරයට එකී දැන්වීමට පිළිතුරු දීම එකී අධ්‍යක්ෂවරයාගේ කාර්යය විය යුතු ය. එකී දැන්වීමට අනුකූලව කටයුතු කරමින්, එකී අධ්‍යක්ෂවරයා විසින්, ලබා දුන් පැහැදිලි කිරීමේ අන්තර්ගතය සහතික කරමින් හෝ තම පෞද්ගලික පැහැදිලි කිරීම් දක්වමින් එකී සංස්ථාපිත පුද්ගල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අත්සන් කරන ලද සංදේශයක් ලබා ගෙන එය සති තුනක් ඇතුළත විමර්ශන නිලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. ඉහත සඳහන් කරන ලද සංදේශය සහතික කිරීම හෝ තමාගේ පැහැදිලි කිරීම අදාළ විමර්ශන නිලධරයා වෙත ලබා දීම එකී සියලුම අධ්‍යක්ෂවරුන්ගේ කාර්යය විය යුතු ය.

විමර්ශන අවසන් කිරීම

**70**. (1) මේ පනතේ යම් විධිවිධානයක් යටතේ නම් කරන ලද නිලධරයකු හෝ විමර්ශන නිලධරයකු වෙත පැමිණිල්ලක්

ඉදිරිපත් කරන, තොරතුරු සපයන හෝ වාර්තාවක් ඉදිරිපත් කරන යම් තැනැත්තකු වෙත එම පැමිණිල්ල, තොරතුරු හෝ වාර්තාව ලැබීම පිළිබඳ තහවුරු කිරීමක් සපයනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ විධිවිධාන යටතේ නම් කරන නිලධරයකු හෝ විමර්ශන නිලධරයකු වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරන, තොරතුරු සපයන හෝ වාර්තාවක් ඉදිරිපත් කරන යම් තැනැත්තකු විසින්, එම විමර්ශනයේ ආරම්භය හෝ ප්‍රගතිය පිළිබඳ තොරතුරු ලබාදෙන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී, එම තොරතුරු මුදාහැරීම මගින් විමර්ශනය පැවැත්වීමට අගතියක් නොවන තාක් දුරට, එසේ ඉල්ලා සිටිනු ලබන තොරතුරු සැපයීම අනුරූප නම් කළ නිලධරයාගේ වගකීම විය යුතු ය. යම් පැමිණිල්ලක්, තොරතුරක්, වාර්තාවක් හෝ පවත්වාගෙන යන්නා වූ විමර්ශනයක් සම්බන්ධයෙන් තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(3) විමර්ශන සහ මෙහි මින් පෙර විධිවිධාන සලසා ඇති පරිදි තවදුරටත් වූ විමර්ශන සිදු කිරීමෙන් පසු විමර්ශන නිලධරයාගේ වාර්තාව අනුව සහ යම් විමර්ශන සටහන් සලකා බැලීමෙන් පසු විමර්ශනය කළ දේපළ අපරාධයකින් උත්පාදිත දේ බවට සාධාරණ හේතු අඩංගු නොවන බවට යම් නම් කරන ලද නිලධරයකු තීරණය කරන්නේ නම් ඒ සඳහා වාර්තා ගත කළ යුතු හේතු සහිතව විමර්ශනය පැවැත්වීම අවසන් කිරීමට ඔහු විසින් නියෝග කළ යුතු ය. අදාළ තොරතුරු, පැමිණිල්ල, පෙත්සම හෝ වාර්තාව භාරදුන් තැනැත්තාගේ අනන්‍යතාවය දන්නා අවස්ථාවක ඒ තැනැත්තා වෙත විමර්ශනය අවසන් කිරීමට ගත් තීරණය සහ ඒ සඳහා හේතු දැනුම් දිය යුතු ය.

තහනම් නියෝග හෝ සංරක්ෂණ නියෝග නිකුත් කිරීමේ ආකාරය සහ අවස්ථානුගත කරුණු

**71.** (1) ඕනෑම අවස්ථාවක දී-

(අ) අපරාධයකින් උත්පාදිත දෙයක් බවට සාධාරණ ලෙස විශ්වාස කරනු ලබන යම් දේපළක් හෝ එකී අපරාධයෙන් උත්පාදිත දෙයෙහි අනුරූපී වටිනාකමින් යුත් දේපළක් තහනමට ගැනීමෙන් තොරව මේ පනතේ අරමුණු සාක්ෂාත් කර ගත හැකි බවට; සහ

(ආ) වාර්තාගත කරනු ලැබිය යුතු කරුණු අනුව දේපළ සම්බන්ධයෙන් යම් විශේෂිත ගනුදෙනුවක නිරත නොවීමට සහ දේපළ සංරක්ෂණය කිරීමට අවශ්‍ය පියවර ගැනීමට දේපළ සන්තකයේ, භාරයේ, පාලනයේ හෝ ආධිපත්‍යයේ තබා ගත් පුද්ගලයාට විධාන කිරීමට අවශ්‍ය වන්නා වූ බවට,

විශ්වාස කිරීමට විමර්ශන නිලධරයාට සාධාරණ හේතු ඇත්තා වූ ද සහ නම් කරන ලද නිලධරයා විසින් එකී මතය අනුමත කර ඇත්තා වූ ද අවස්ථාවක, විමර්ශන නිලධරයා විසින්, දේපළ සන්තකයේ තබා ගෙන ඇති, පාලනය කරන, භාරකාරත්වය ඇති හෝ ආධිපත්‍ය ඇති තැනැත්තකුට ඔහු විසින් නිශ්චිතව දක්වා ඇති යම් ක්‍රියාකාරකමක නිරතවීමෙන් වළකින ලෙස ඉල්ලා (මේ පනතේ "තහනම් කිරීමේ නියෝගය" යනුවෙන් සඳහන් කරනු ලබන) නියෝගයක් හෝ (මේ පනතේ "සංරක්ෂණ නියෝගය" යනුවෙන් සඳහන් කරනු ලබන) දේපළ සංරක්ෂණය කිරීමට අවශ්‍ය පියවර ගැනීමට නියෝගයක් විමර්ශන නිලධරයා විසින් ලබා දිය යුතු ය.

(2) තහනම් කිරීමේ නියෝගයක් සහ සංරක්ෂණ නියෝගයක් පිළිවෙලින් මේ පනතේ II වන උපලේඛනයේ සහ III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙන් විය යුතු ය.

(3) තහනම් කිරීමේ නියෝගයකට හෝ සංරක්ෂණ නියෝගයකට එකී දේපළෙහි වටිනාකම සැලකිය යුතු ලෙස අඩු නොවන ආකාරයකින් එකී දේපළ සාමාන්‍ය සද්භාවී භාවිතය හෝ මේ පනතේ අරමුණු ව්‍යර්ථ නොවන ආකාරයකින් එකී දේපළ අන්‍යාකාරයකින් හැසිරවීම සම්බන්ධයෙන් තහනමක් ඇතුළත් නොවිය යුතු ය.

(4) තහනම් කිරීමේ නියෝගයක් සහ සංරක්ෂණ නියෝගයක් කලින් අවලංගු නොකළේ නම් මිස, දින තිහක් නොඉක්මවන්නා වූ ඒ නියෝගයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාවක් සඳහා බලාත්මක විය යුතු ය.

(5) වාර්තාගත කරනු ලැබිය යුතු හේතු මත, තහනම් කිරීමේ නියෝගයක් හෝ සංරක්ෂණ නියෝගයක් ක්‍රියාත්මක වීමේ කාලසීමාව, එකී නියෝගය සමස්තයක් ලෙස දින අනූවක කාලසීමාවක් නොඉක්මවන පරිදි, වරකට තවත් දින තිහක කාලසීමාවක් බැගින් තවත් වාර දෙකක දී දීර්ඝ කිරීමට විමර්ශන නිලධරයකු හිමිකම් ලැබිය යුතු ය.

(6) යම් තහනම් කිරීමේ නියෝගයක් එකී තහනම් කිරීමේ නියෝගය කලින් අවලංගු කර ඇත්නම් මිස, හෝ එකී තහනම් නියෝගය ලබා දුන් දින සිට දින තිහක කාලසීමාවක් ගතව ඇත්නම් මිස, අදාළ විමර්ශන නිලධරයාගේ අනුමතය නොමැතිව, එකී තහනම් නියෝගය මගින් තහනම් කරන ලද යම් කටයුත්තක නිරත නොවන ලෙස හෝ මේ පනතේ අරමුණු ව්‍යර්ථ වන වෙනත් යම් කටයුත්තක් සිදු නොකරන ලෙස එකී නියෝගය පනවා ඇති තැනැත්තාට නියම කරනු ලැබිය යුතු ය.

(7) යම් සංරක්ෂණ නියෝගයකින්, එකී සංරක්ෂණ නියෝගය කලින් අවලංගු කර ඇත්නම් මිස හෝ එකී සංරක්ෂණ නියෝගය ලබා දුන් දින සිට දින තිහක කාලසීමාවක් ගතව ඇත්නම් මිස, අදාළ දේපළ පවත්නා ආකාරයෙන් ම එහි වටිනාකම සහ වර්තමාන තත්ත්වය සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස සහ අදාළ විමර්ශන නිලධරයාගේ අනුමතයකින් තොරව, අදාළ දේපළ දිරාපත් වීමට, විනාශ වීමට හෝ අන්‍යාකාරයකින් එහි වටිනාකම අඩුවීමට හේතු වන යම් කටයුත්තක නිරත නොවන ලෙස ද, මේ පනතේ අරමුණු ව්‍යර්ථ වන වෙනත් යම් කටයුත්තක් ක්‍රියාවේ යෙදවීමෙහි නිරත නොවන ලෙස ද, එකී නියෝගය පනවා ඇති තැනැත්තාට නියම කරනු ලැබිය යුතු ය.

(8) අවශ්‍ය විට දී, විමර්ශන නිලධරයකු විසින්, අපරාධයකින් උත්පාදිත දේ බවට සැක සහිත දේපළ සම්බන්ධයෙන් වන යම් ගනුදෙනුවක් වැළැක්වීමේ හෝ එම දේපළේ වටිනාකම සංරක්ෂණය කිරීමේ හැකියාව ඇති යම් තැනැත්තකු හෝ ආයතනයක් වෙත තහනම් කිරීමේ නියෝගයක් හෝ සංරක්ෂණ නියෝගයක් නිකුත් කරනු ලැබිය හැකි අතර, එවැනි අවස්ථාවක දී, අදාළ නියෝගය ප්‍රකාර කටයුතු කිරීම එකී තැනැත්තාගේ හෝ ආයතනයේ කාර්යය විය යුතු ය.

*පැහැදිලි කිරීම:*

මේ වගන්තිය ප්‍රකාර කටයුතු කරන විමර්ශන නිලධරයකු විසින්, අපරාධයකින් උත්පාදිත යම් නිශ්චිත මුදල් ප්‍රමාණයක් අන්තර්ගත වන බවට එකී විමර්ශන නිලධරයා සාධාරණ ලෙස සැක කරනු ලබන, තුන්වන පාර්ශ්වයක් විසින් පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුමක් ඇති බැංකුවක් වෙත නියෝගයක් නිකුත් කරනු ලැබිය හැකි ය. එකී නියෝගය ලැබුණු විට දී, එකී නියෝගයේ නිශ්චිතව දක්වා ඇති මුදල් ප්‍රමාණය එම ගිණුම තුළ සංරක්ෂණය කොට සහ එකී නියෝගයට යටත්ව ගිණුම්හිමියාට එම ගිණුම ක්‍රියාත්මක කිරීමට අවසර දීම එම බැංකුවේ කාර්යය විය යුතු ය.

(9) වාර්තා කළ යුතු කරුණු අනුව, තහනම් කිරීමේ නියෝගයක් හෝ සංරක්ෂණ නියෝගයක් නිකුත් කරන ලද යම් දේපළක් තහනමට ගැනීම අවශ්‍ය නොවන බවට විමර්ශන නිලධරයා සෑහීමට පත් වන්නේ නම්, ඔහු විසින් ඍජුව ම 75 වන වගන්තිය අනුව ඒ දේපළ අධිකරණමය ක්‍රියා විරහිත කිරීමක් සඳහා, මහාධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය.

අපරාධයකින් උත්පාදිත දේ තහනමට ගැනීම

**72.** (1) තහනම් නියෝගයකට හෝ සංරක්ෂණ නියෝගයකට යටත් යම් දේපළක් ඇතුළුව අපරාධයකින් උත්පාදිත දෙයක් බවට විශ්වාස කිරීමට තමාට සාධාරණ හේතු ඇති දේපළක් හෝ අපරාධයකින් උත්පාදිත දෙයක් හඳුනාගත නොහැකි හෝ නොපවතින අවස්ථාවක, අපරාධයකින් උත්පාදිත දෙයක් බවට විශ්වාස කිරීමට තමාට සාධාරණ හේතු ඇති දේපළක් හෝ එකී අපරාධයකින් උත්පාදිත දෙයෙහි වටිනාකමට අනුරූපී දේපළක් විමර්ශන නිලධරයකු විසින් තහනමට ගනු ලැබිය හැකි ය.

(2) යම් දේපළක් සම්බන්ධයෙන් 68 වන වගන්තිය යටතේ යම් තැනැත්තකු වෙත පැහැදිලි කිරීම් කැඳවීමේ දැන්වීමක් ලබා දී ඇති අවස්ථාවක-

(අ) එකී තැනැත්තා විසින්, නියම කර ඇති කාලසීමාව ඇතුළත සත්‍ය පැහැදිලි කිරීමක් ලබා දී නොමැති නම්;

(ආ) ලබා දී ඇති පැහැදිලි කිරීම අසත්‍ය, සාවද්‍ය, ප්‍රමාණවත් නොවන හෝ නොමඟ යවනසුලු වන බව සොයා ගනු ලැබුවහොත්; හෝ

(ඇ) ප්‍රශ්නගත දේපළ වංචනික ආකාරයකින් සපයා ගන්නා ලද හෝ රැස්කරගෙන තිබෙන බවට හෝ ත්‍යාගයක් මගින් ලබා ගෙන තිබෙන බවට හෝ හෙළිදරව් වුවහොත්,

මිස, එකී දේපළ තහනමට ගනු නොලැබිය යුතු ය.

(3) අපරාධයකින් උත්පාදිත දේ බවට සැක කරන දෙයක් හෝ අපරාධයකින් උත්පාදිත දෙයෙහි වටිනාකමට අනුරූපී දේපළක් තහනමට ගැනීමෙන් පසු, විමර්ශන නිලධරයා විසින්, එකී දේපළේ සන්තකය, පාලනය, භාරය හෝ ආධිපත්‍ය දරන තැනැත්තාට මේ පනතේ IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙන් තහනමට ගැනීමේ දැන්වීමක් ලබා දීම මගින් එම දේපළෙහි සන්තකය, පාලනය, භාරය හෝ ආධිපත්‍ය ලබා ගත යුතු අතර, එමගින් එම දේපළේ ඵලදායී සන්තකය, පාලනය, භාරය හෝ ආධිපත්‍ය ලබා ගත යුතු ය:

එසේ වුව ද, අවම වශයෙන් පැහැදිලි කිරීම් කැඳවීමේ දැන්වීම ලබා දුන් දිනට වසර තිහකටවත් පෙරාතුව තමාට ප්‍රශ්නගත දේපළ උරුම වී තිබූ බවට විමර්ශන නිලධරයා සෑහීමට පත් වන පරිදි විශ්වසනීය කරුණු එකී දේපළෙහි සන්තකය, පාලනය, භාරය හෝ ආධිපත්‍ය දරන තැනැත්තා විසින් විමර්ශන නිලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, විමර්ශන නිලධරයා විසින් මේ පනත යටතේ කිසිදු වැඩිදුර ක්‍රියාමාර්ගයක් ගනු නොලැබිය යුතු ය:

එසේ ම තවදුරටත්, ඉහත අතුරු විධානයේ පටහැනිව කුමක් සඳහන් වුව ද, ප්‍රශ්නගත දේපළ පොදු දේපළ විෂයෙහි ලා සිදු

කරනු ලබන වැරදි පිළිබඳ පනතේ අර්ථ නිරූපණය කර ඇති පරිදි රාජ්‍ය මූල්‍ය හෝ රජයේ දේපළ සම්බන්ධයෙන් අහිතකර බලපෑමක් ඇති නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සිදු කිරීම මගින් ආරම්භයේ දී සපයාගෙන ඇති බවට බැලූ බැල්මට පෙනෙන කරුණු පවතින අවස්ථාවක, එකී දේපළ උරුම වූ අවස්ථාවේ සිට වසර තිහක් ගත වී තිබුණ ද, එය නොතකා, විමර්ශන නිලධරයා විසින් එකී දේපළ තහනමට ගැනීම නීත්‍යානුකූල විය යුතු ය.

(4) පවත්නා කරුණු අනුව, දේපළක් අපරාධයකින් උත්පාදිත දෙයක් හෝ අපරාධයකින් උත්පාදිත දෙයෙහි වටිනාකමට අනුරූපී දේපළක් බවට සහ එම දේපළ තහනමට ගැනීම සඳහා වහාම පියවර නොගතහොත් මේ පනතේ අරමුණු ව්‍යර්ථ වන බවට විශ්වාස කිරීම සඳහා විමර්ශන නිලධරයාට සාධාරණ හේතු ඇති අවස්ථාවක, නම් කරන ලද නිලධරයාගේ අනුමතය ලබා ගැනීමෙන් පසු, 68 වන වගන්තිය යටතේ වන පැහැදිලි කිරීම් කැඳවීමේ දැන්වීමක් ලබා දෙන අවස්ථාවේ දී ම එම දේපළ තාවකාලික ලෙස තහනමට ගැනීම සඳහා පියවර ගැනීමට විමර්ශන නිලධරයා හිමිකම් ලැබිය යුතු ය:

එසේ වුව ද, පැහැදිලි කිරීම් කැඳවීමේ දැන්වීමක් ලබා දෙන අවස්ථාවේ දී අපරාධයකින් උත්පාදිත දෙයක් බවට සැක කරන දෙයක් හෝ අපරාධයකින් උත්පාදිත දෙයෙහි වටිනාකමට අනුරූපී දේපළක් තාවකාලික ලෙස තහනමට ගනු ලැබූ අවස්ථාවක, එකී පැහැදිලි කිරීම් කැඳවීමේ දැන්වීම සඳහා පැහැදිලි කිරීමේ ප්‍රකාශයන් විමර්ශන නිලධරයා වෙත ලැබීමෙන් පසු, පැහැදිලි කිරීමේ ප්‍රකාශයේ ලබා දී ඇති පැහැදිලි කිරීම සලකා බලා එකී පැහැදිලි කිරීම පිළිගෙන නැතහොත් ප්‍රතික්ෂේප කොට ඒ සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා ඔහුට සාධාරණ කාලයක් ලැබෙන තෙක් පමණක් එකී තහනමට ගැනීම වලංගු විය යුතු ය.

(5) පැහැදිලි කිරීමේ ප්‍රකාශය සලකා බැලීමෙන් පසු, එකී පැහැදිලි කිරීම පිළිගැනීමට විමර්ශන නිලධරයා විසින් තීරණය කරනු ලැබූ අවස්ථාවක, ඔහු විසින්, තාවකාලික ලෙස තහනමට

ගැනීමේ නියෝගය අහෝසි කර, එකී දේපළේ සන්තකය ලබා ගත්තේ යම් පාර්ශ්වයකින් ද, එම පාර්ශ්වය වෙත එම දේපළේ සන්තකය ආපසු ලබා දිය යුතු ය. පැහැදිලි කිරීමේ ප්‍රකාශයෙහි ලබා දී ඇති පැහැදිලි කිරීම ප්‍රතික්ෂේප කිරීමට විමර්ශන නිලධරයා විසින් තීරණය කරනු ලැබූ අවස්ථාවක, එකී දේපළ තහනමට ගැනීම සඳහා මේ පනත ප්‍රකාර වැඩිදුර නියෝගයක් නිකුත් කර, එමගින් එම දේපළෙහි සන්තකය රඳවා තබා ගැනීමට ඔහුට හිමිකම් ලැබිය යුතු ය.

(6) (2) වන උපවගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි මිස, යම් දේපළක්, එකී දේපළේ හිමිකාරිත්වය හෝ සන්තකය සඳහා හිමිකම් දරන හෝ එහි භාරය, පාලනය හෝ ආධිපත්‍ය දරන තැනැත්තාට එකී දේපළ අපරාධයකින් උත්පාදිත දේ නොවන බව පැහැදිලි කිරීම සඳහා අවස්ථාවක් ලබා දී ඇත්නම් සහ පැහැදිලි කිරීමේ ප්‍රකාශයෙහි ලබා දී ඇති පැහැදිලි කිරීම විමර්ශන නිලධරයා විසින් වාර්තා ගත කරනු ලබන හේතු මත ප්‍රතික්ෂේප කර ඇත්නම් ද මිස, තහනමට ගනු නොලැබිය යුතු ය:

එසේ වුව ද, එකී අවස්ථානුගත කරුණු යටතේ -

(අ) ඉහත කී පරිදි අවස්ථාවක් ලබා දීම ප්‍රායෝගික නොවන්නා වූ ද; හෝ

(ආ) එකී අවස්ථාව ලබා දීමේ දී සිදු විය හැකි යම් ප්‍රමාදයක් හෝ පැහැදිලි කිරීමේ ප්‍රකාශයේ අන්තර්ගත තොරතුරු සත්‍යායනය කිරීම සඳහා ගත විය හැකි කාලය හේතුවෙන් මේ පනතේ අරමුණු ව්‍යර්ථ වන්නා වූ ද; සහ

(ඇ) එකී දේපළ අපරාධකින් උත්පාදිත දෙයක් හෝ එම අපරාධයකින් උත්පාදිත දෙයෙහි වටිනාකමට අනුරූපී දේපළක් යයි විශ්වාස කිරීමට විමර්ශන නිලධරයාට සාධාරණ හේතු ඇත්තා වූ ද,

අවස්ථාවක, ඔහු විසින්, වහාම නම් කරන ලද නිලධරයාගේ අනුමතය ඇතිව එම දේපළ තහනමට ගනු ලැබිය යුතු ය.

(7) අපරාධයකින් උත්පාදිත දෙයක් බවට සැක කරන දේපළ හෝ එම අපරාධයකින් උත්පාදිත දෙයෙහි වටිනාකමට අනුරූපී දේපළ තහනම් කිරීමේ හෝ එම දේපළ තහනමට ගැනීමේ නියෝගයක් නිකුත් කිරීමෙන් පසු, එකී මුළු දේපළ ම හෝ ඉන් කොටසක් හෝ තහනම් කරනු ලබන හෝ තහනමට ගනු ලබන දේපළ තුළ වූ නැතහොත් ඒ හා සම්බන්ධ වෙනත් යම් දේපළක්, අවස්ථාවෝචිත පරිදි, තහනමට ගැනීමේ හෝ අධිකරණමය ක්‍රියා විරහිත කිරීමේ ආඥාවකින් බැහැර කළ යුතු ද යන්න නිශ්චය කිරීමේ කාර්යය සඳහා එම දේපළ සහ එම දේපළට සම්බන්ධ ලේඛන, වාර්තා හෝ තොරතුරු පරීක්ෂා කිරීමට විමර්ශන නිලධරයා හිමිකම් ලැබිය යුතු ය.

(8) තහනමට ගැනීමේ දැන්වීම ලබා දෙන අවස්ථාවේ දී, අදාළ විමර්ශන නිලධරයා විසින්, වහාම අදාළ දේපළෙහි සන්තකය ලබා ගත යුතු ය:

එසේ වුව ද, විමර්ශන නිලධරයකු විසින් පහත දැක්වෙන යම් දේපළ අයිතමයක් තහනමට ගනු ලැබිය යුතු වුව ද, එම දේපළ සන්තකය දරන්නා හෝ ඔහු වෙනුවෙන් කටයුතු කරන වෙනත් යම් පාර්ශ්වයක් විසින් මේ පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම වළක්වන හෝ එකී අරමුණු ව්‍යර්ථ කරන ආකාරයකින් කටයුතු කරන බවට නිගමනය කිරීම සඳහා සාධාරණ හේතු ඇත්නම් මිස, ඔහු විසින් එම දේපළෙහි සන්තකය සහ පාලනය ලබා නොගත යුතු ය:-

(අ) එකී දේපළ සන්තකය දරන තැනැත්තා සැබෑ ලෙසට පදිංචිව සිටින එකම නිවස;

(ආ) අත්‍යවශ්‍ය ඇඳුම් පැළඳුම්;

(ඇ) එකී නිවසේ ඇති අත්‍යවශ්‍ය ගෘහ භාණ්ඩ, සවිකුරු සහ සවි කිරීම් සහ ඉවුම් පිහුම් උපකරණ;

(ඈ) දෛනිකව අදාළ තැනැත්තා ප්‍රවාහනය කිරීම සඳහා සහ ඔහුගේ රැකියාව සඳහා ඔහු විසින් සාමාන්‍යයෙන්

භාවිත කරන මෙවලම් සහ උපකරණ ප්‍රවාහනය කිරීම සඳහා භාවිත කරන වාහනයක් සහ ඔහු රැකියාවෙන් උපයාගන්නා ලද දේ; සහ

(ඉ) ඔහුගේ දිවිපැවැත්ම සහ රැකියාව සඳහා අත්‍යවශ්‍ය වෙනත් යම් දේ:

එසේ වුව ද, මේ විධිවිධානය, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ සහ (218 වන අධිකාරය වූ) විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනතේ විධිවිධාන යටතේ වන තහනමට ගැනීම් සඳහා අදාළ නොවිය යුතු ය.

(9) යම් විමර්ශන නිලධරයකු විසින් (8) වන උපවගන්තියේ සඳහන් යම් දේපළක් තහනමට ගෙන, එය සන්තකයේ දරන ලද තැනැත්තා සතුවම එහි සන්තකය තබා ගැනීමට අවසර දෙනු ලැබූ අවස්ථාවක, මහාධිකරණය විසින් එකී දේපළ අධිකරණමය ක්‍රියා විරහිත කිරීම සඳහා ආඥාවක් කරනු ලැබූ අවස්ථාවක, එකී දේපළ මහාධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියම කරමින් බැඳුම්කරයක් ඇති කරගන්නා ලෙස ඔහු විසින්, එකී තැනැත්තාට නියම කරනු ලැබිය යුතු ය.

*පැහැදිලි කිරීම:*

මේ පනතේ විධිවිධානවලට යටත්ව, විමර්ශන නිලධරයකු විසින්, (8) වන උපවගන්තියේ සඳහන් යම් දේපළ අයිතමයක් සම්බන්ධයෙන් තහනම් කිරීමේ නියෝගයක් හෝ සංරක්ෂණ නියෝගයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(10) තහනමට ගනු ලැබූ දේපළ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා මහාධිකරණයෙන් ආඥාවක් ලැබෙන තෙක්, තහනමට ගනු ලැබූ දේපළ සඳහා අවශ්‍ය ආරක්ෂාව ලබා දීම ද එකී දේපළ ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා පියවර ගැනීම ද අදාළ විමර්ශන නිලධරයාගේ කාර්යය විය යුතු ය. එකී කාර්යය සඳහා, යම් රජයේ නියෝජ්‍යායතනයක සේවාවන් ලබා ගැනීමට විමර්ශන නිලධරයකු හිමිකම් ලැබිය යුතු ය.

(11) අපරාධයකින් උත්පාදිත දෙයක් බවට සැක සහිත දෙයක් හෝ එම අපරාධයකින් උත්පාදිත දෙයෙහි වටිනාකමට අනුරූපී දේපළක් තහනමට ගැනීමෙන් පැය හැත්තෑ දෙකක් ඇතුළත, අදාළ විමර්ශන නිලධරයා විසින්, එකී තහනමට ගැනීම සිදු කරන ලද්දේ කවර මහෙස්ත්‍රාත් අධිකරණයක අධිකරණ බලසීමාව ඇතුළත ද, එම මහෙස්ත්‍රාත් අධිකරණය වෙත එම තහනමට ගැනීම සම්බන්ධයෙන් වාර්තා කරනු ලැබිය යුතු ය. එසේ වාර්තා කරනු ලැබීමේ අරමුණ, මේ පනත ප්‍රකාර ගන්නා ලද ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත්වරයා දැනුම්වත් කිරීම සහ විමර්ශන නිලධරයාට වැඩිදුර විමර්ශන සිදු කිරීම සඳහා පහසුකම් සැලසීම සඳහා ආඥා ලබා ගැනීමට හැකි කරවීම විය යුතු ය.

(12) ඉහත සඳහන් අපරාධයකින් උත්පාදිත දෙයක් බවට සැක සහිත දෙය හෝ එම අපරාධයෙන් උත්පාදිත දෙයෙහි වටිනාකමට අනුරූපී දේපළ තහනමට ගැනීම විමර්ශන නිලධරයා විසින් කලින් අහෝසි කරනු ලබන්නේ නම් මිස, හෝ පනත යටතේ සහ ප්‍රකාර මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු විසින් අධිකරණමය ක්‍රියාවිරහිත කිරීමේ ආඥාවක් නිකුත් කරනු ලැබුවහොත් හෝ අධිකරණමය ක්‍රියාවිරහිත කිරීමේ ආඥාවක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් මිස දින තිහක කාලසීමාවක් දක්වා බලාත්මක විය යුතු ය.

(13) දේපළ හෝ යම් දෙයක් සහ ඔහු වෙත කරන ලද කරුණු ඉදිරිපත් කිරීම් පරීක්ෂා කිරීමෙන් පසු, නිකුත් කරන ලද තහනම් කිරීමේ නියෝගය හෝ ක්‍රියාත්මක කරන ලද තහනමට ගැනීම වෙනස් කළ යුතු බව හෝ අහෝසි කරනු ලැබිය යුතු බව විමර්ශන නිලධරයාගේ මතය වන අවස්ථාවක, ඔහු විසින්, නම් කරන ලද නිලධරයාගේ අනුමතය ඇතිව එකී වෙනස් කිරීම හෝ අහෝසි කිරීම සිදු කර, අවශ්‍ය විට දී, එම දේපළ කලින් සන්තකය දරන ලද, පාලනය කරන ලද, භාරය දරන ලද හෝ ඒ විෂයයෙහි ආධිපත්‍යය දරන ලද පාර්ශ්වයට එකී ප්‍රතිශෝධිත තහනම් කිරීමේ නියෝගය හෝ තහනමට ගැනීමේ දැන්වීම ලබා දිය යුතු අතර, අවශ්‍ය විට දී, අදාළ දේපළ නිදහස් කරනු ලැබිය යුතු ය. ඔහු විසින්, වහාම, ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ගය දැනුම් දෙමින් අදාළ මහෙස්ත්‍රාත් අධිකරණයෙහි වාර්තාවක් ගොනු කරනු ලැබිය යුතු ය.

(14) සම්බන්ධිත අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගැනීමේ දී, නම් කරන ලද නිලධරයාගේ පූර්ව අනුමතය ලබා ගැනීම ප්‍රායෝගික නොවන හෝ එමගින් මේ පනතේ අරමුණු ව්‍යර්ථ වන අවස්ථාවක, විමර්ශන නිලධරයකු විසින්, හේතු වාර්තා කර, ස්වකීය මෙහෙයවීම යටතේ, අවස්ථාවෝචිත පරිදි, එකී තහනම් නියෝගය නිකුත් කිරීම හෝ එකී අපරාධයකින් උත්පාදිත දේ තහනමට ගැනීම ක්‍රියාත්මක කිරීම කරනු ලැබිය යුතු අතර, ඉන් පසු හැකිතාක් ඉක්මනින් නම් කරන ලද නිලධරයාගේ අනුමතය ලබාගත යුතු ය.

විමර්ශනයක් අවසන් කිරීමෙන් පසු

**73.** (1) අපරාධයකින් උත්පාදිත බවට සැක කරන දේ පිළිබඳ විමර්ශනයක් අවසන් වීමෙන් පසු, විමර්ශන නිලධරයා විසින්, එම විමර්ශනය අතරතුර රැස්කරගත් ලේඛනවල සහ වාර්තාවල පිටපත් සහ රැස්කරගත් දේ පිළිබඳ විස්තරයක් අන්තර්ගත ලැයිස්තුවක් ද සමඟ එම විමර්ශනයේ සටහන් නම් කරන ලද නිලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. ඔහු විසින් තම තීරණ ඇතුළත් වාර්තාවක් ද ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) ඉදිරිපත් කළ ලේඛන, වාර්තා සහ දේ සහ විමර්ශන නිලධරයාගේ වාර්තාව ද සලකා බැලීමෙන් පසු, එම දේපළ අපරාධයකින් උත්පාදිත දෙයක් බව ද එම නිසා එම දේපළ අධිකරණමය ක්‍රියා විරහිත කිරීම සඳහා සහ පසුව රජය සතු කිරීම සඳහා මහාධිකරණයේ නඩු පැවරීමට අවශ්‍ය කරන බව ද තම මතය වන අවස්ථාවක, නම් කරන ලද නිලධරයා විසින්, එම දේපළ අධිකරණමය ක්‍රියා විරහිත කිරීම සඳහා සහ රජය සතු කිරීම සඳහා නඩු පැවරීමට සහ නඩු කටයුතු පවත්වාගෙන යාමට මේ පනත ප්‍රකාරව ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් සලකා බැලීම සඳහා නීතිපතිවරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) පවත්නා කරුණු සලකා බැලීමෙන් පසු ප්‍රශ්නගත දේපළ අපරාධයකින් උත්පාදිත දෙයක් නොවන බව නම් කරන ලද නිලධරයාගේ මතය වන අවස්ථාවක, එම දේපළ ක්‍රියා විරහිත කර නොමැති නම්, ඔහු විසින්, ප්‍රශ්නගත දේපළ සම්බන්ධයෙන් කිසිදු

වැඩිදුර ක්‍රියාමාර්ගයක් නොගැනීම සඳහා ගන්නා ලද තීරණය මහෙස්ත්‍රාත්වරයා වෙත දැනුම් දෙමින් අදාළ විමර්ශන නිලධරයා මාර්ගයෙන් අදාළ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඉහත සඳහන් පරිදි ක්‍රියාමාර්ගයක් ගැනීමට පෙරාතුව නීතිපතිවරයාගේ උපදෙස් ඉල්ලා සිටීමට ද, ලබා ගැනීමට ද, නම් කරන ලද නිලධරයා හිමිකම් ලැබිය යුතු ය.

(4) විමර්ශනය අතරතුර රැස්කරගත් කරුණු සලකා බැලීමෙන් පසු, තහනම් කිරීමේ නියෝගයක් නිකුත් කර ඇති හෝ තහනමට ගැනීමක් කර ඇති යම් දේපළක් එකී දේපළ අපරාධයකින් උත්පාදිත දෙයක් බවට හෝ එකී දේපළ එකී අපරාධයකින් උත්පාදිත දෙයෙහි වටිනාකමට අනුරූපී දේපළක් බවට කිසිදු ප්‍රමාණවත් හේතුවක් නොමැති හෙයින් නිදහස් කළ යුතු බව ස්වකීය මෙහෙවීම මත හෝ නීතිපතිවරයාගේ උපදෙස් ලබා ගැනීමෙන් පසු නම් කරන ලද නිලධරයාගේ මතය වන අවස්ථාවක, ඔහු විසින්, හේතු වාර්තා කර විමර්ශන නිලධරයා වෙත එම හේතු දන්වා, වහාම එම නියෝගය අහෝසි කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට විමර්ශන නිලධරයාට විධාන කරනු ලැබිය යුතු ය.

(5) එකී විධානයට අනුකූලව කටයුතු කිරීමෙන් පසු, විමර්ශන නිලධරයා විසින්, එම කරුණු අදාළ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත වාර්තා කර, අවස්ථාවෝචිත පරිදි, නම් කරන ලද නිලධරයාගෙන් හෝ නීතිපතිවරයාගෙන් ලැබුණු හේතු තහනම් කිරීමේ නියෝගය හෝ තහනමට ගැනීමේ දැන්වීම ලබා දී ඇත්තේ යම් පාර්ශ්වයක් වෙත ද එම පාර්ශ්වය වෙත දන්වනු ලැබිය යුතු අතර, අදාළ විට දී, එම දේපළේ භාරය ආපසු ලබා දිය යුතු ය.

(6) මේ වගන්තියේ සඳහන් කිසිවක් මගින්, රජය සතු කිරීම සඳහා හෝ වරදකරු නොකිරීම මත පදනම් වූ රජය සතු කිරීම සඳහා මේ පනත ප්‍රකාර නඩු පැවරීමෙන් නීතිපතිවරයා වළක්වනු නොලැබිය යුතු ය:

එසේ වුව ද, නම් කරන ලද නිලධරයා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වන්නේ නම්, නීතිපතිවරයා විසින්, කොමිෂන් සභාවේ උපදෙස් අනුව කටයුතු කරනු ලැබිය යුතු ය.

(7) වැඩිදුර විමර්ශන සිදු කිරීමෙන් පසු නිදහස් කළ දේපළ අපරාධයකින් උත්පාදිත දෙයක් බව යම් විමර්ශන නිලධරයකුගේ මතය වන අවස්ථාවක, යම් විමර්ශන නිලධරයකු විසින්, කලින් දේපළ නිදහස් කිරීමෙන් වසරක් ඇතුළත, නම් කරන ලද නිලධරයාගේ පූර්ව අනුමතය ඇතිව, අලුත් තහනම් කිරීමකින් සහ තහනමට ගැනීමකින් බලපෑමට ලක් විය හැකි පාර්ශ්වය වෙත පූර්ව දැන්වීමක් ලබා දී, කලින් නිදහස් කළ දේපළ තහනම් කිරීම සහ තහනමට ගැනීම සඳහා ආඥාවක් ඉල්ලමින් මහාධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(8) බලපෑමට ලක් වූ පාර්ශ්වය වෙත අදාළ දැන්වීම යථා පරිදි ලබා දී ඇති බවට මහාධිකරණය සෑහීමට පත් වන්නේ නම් පරීක්ෂණයකින් පසුව ඒකපාර්ශ්විකව හෝ මහාධිකරණය විසින් මේ විධිවිධානය ප්‍රකාර දේපළ තහනම් කිරීම සහ තහනමට ගැනීම සඳහා ආඥාවක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(9) ප්‍රශ්නගත දේපළ අපරාධයකින් උත්පාදිත දෙයක් බවට මහාධිකරණයට විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතින්නේ නම් මිස, මහාධිකරණය විසින්, දේපළ තහනම් කිරීම හෝ තහනමට ගැනීම සඳහා කිසිම ආඥාවක් කරනු නොලැබිය යුතු ය.

මේ පනතේ තහනමට ගැනීම සම්බන්ධයෙන් වන විධිවිධාන අනෙකුත් වෙනත් නීති සඳහා අදාළ නොවිය යුතු බව

**74**. මේ පනතේ සඳහන් කිසිවක් මගින් පහත දැක්වෙන නීති ද ඇතුළුව, දේපළ තහනමට ගැනීම සඳහා බලය දෙන යම් නීතියක් ප්‍රකාර දේපළ තහනමට ගැනීම වළක්වනු නොලැබිය යුතු ය:-

(අ) මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත;

(ආ) (218 වන අධිකාරය වූ) විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනත;

(ඈ) (451 වන අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනත;

(ඇ) (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත;

(ඉ) (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනත; සහ

(ඊ) (188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත:

එසේ වුව ද, එකී නීතිය ප්‍රකාර දේපළක් තහනමට ගනු ලැබූ අවස්ථාවක, තහනමට ගැනීමෙන් පසු එම දේපළ සම්බන්ධයෙන් කටයුතු කිරීම ද ඒ නීතිය ප්‍රකාරව ම කරනු ලැබිය යුතු ය.

## III වන කොටස

### අපරාධයකින් උත්පාදිත දේ අධිකරණමය ක්‍රියා විරහිත කිරීම

මහාධිකරණය විසින් අධිකරණමය ක්‍රියා විරහිත කිරීමේ ආඥාවක් නිකුත් කිරීම

**75.** (1) තහනමට ගනු ලැබූ දේපළ ක්‍රියා විරහිත කිරීමට අවශ්‍ය බව විමර්ශන නිලධරයකුගේ මතය වන අවස්ථාවක, ඔහු විසින්, එකී දේපළ තහනමට ගැනීමෙන් වැඩකරන දින හතක් ඇතුළත, නම් කරන ලද නිලධරයාගේ අනුමතය ඇතිව, මේ පනතේ V වන උපලේඛනය ප්‍රකාර දැන්වීමක් -

(අ) එකී දේපළ තහනමට ගනු ලැබුවේ යම් තැනැත්තකුගෙන් ද එම තැනැත්තා;

(ආ) තහනම් කිරීමේ නියෝගය භාර දෙනු ලැබුවේ යම් තැනැත්තකු වෙත ද එම තැනැත්තා;

(ඇ) එකී දේපළ තහනමට ගැනීමෙන් හෝ තහනම් කිරීමෙන් බලපෑමට ලක් වන තැනැත්තකු බවට ඔහු වෙත අනන්‍යතාව අනාවරණය වී ඇති යම් තැනැත්තකු; සහ

(ඈ) කලින් නිකුත් කර ඇත්නම් තහනම් කිරීමේ නියෝගයෙන් හෝ තහනමට ගැනීමේ නියෝගයෙන් සෘජුව ම බලපෑමට ලක්ව ඇති බවට ඔහු විශ්වාස කරන තැනැත්තකු,

වෙත භාර දීමෙන් පසු, ඔහු විසින් ම හෝ වෙනත් යම් පොලිස් නිලධරයකුගේ හෝ නීතිපතිවරයාගේ හෝ නීතිපතිවරයා විසින් පත් කරනු ලබන නීතිඥවරයකුගේ සහාය ඇතිව, අපරාධයකින් උත්පාදිත දෙයක් බවට ඔහු විසින් විශ්වාස කරන යම් දේපළක් හෝ එම අපරාධයෙන් උත්පාදිත දෙයෙහි අනුරූපී වටිනාකම අධිකරණමය ක්‍රියා විරහිත කිරීමේ ආඥාවක් ඉල්ලා සිටිමින් තහනමට ගනු ලැබූ දේපළ හෝ එහි කොටසක් පිහිටා ඇති අධිකරණ කලාපයේ මහාධිකරණය වෙත හෝ ඒ දේපළ පිහිටා ඇති ස්ථානය සොයාගත නොහැකි නම් කොළඹ අධිකරණ කලාපයේ මහාධිකරණය වෙත හෝ ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, දේපළ තහනමට ගැනීම හෝ තහනම් කිරීම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධරයකු විසින් සිදු කරනු ලැබූ අවස්ථාවක, ඉහත කී පරිදි මහාධිකරණය වෙත ඉල්ලීමක් කිරීම එකී කොමිෂන් සභාවේ නිලධරයකු, කොමිෂන් සභාව විසින් කරනු ලබන ඉල්ලීමක් මත නීතිපතිවරයා විසින් පත් කරනු ලබන නිලධරයකු හෝ කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන නීතිඥවරයකු විසින් කරනු ලැබිය යුතු ය.

(2) විමර්ශන නිලධරයකු විසින් එවැනි ඉල්ලීමක් කිරීමෙන් පසු මහාධිකරණය විසින් -

(අ) විමර්ශන නිලධරයා විසින් අධිකරණය වෙත ඉදිරිපත් කළ කරුණු;

(ආ) යුක්තියේ යහපත පිණිස අධිකරණය විසින් අවසර දිය හැකි වෙනත් යම් අදාළ කරුණක්;

(ඇ) තහනමට ගනු ලැබූ හෝ තහනම් කළ දේපළ විෂයයෙහි සම්බන්ධතාවක් හෝ හිමිකමක් ඇති යම් පාර්ශ්වයක්;

(ඇ) යුක්තියේ යහපත පිණිස අධිකරණය විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි සහ පරීක්ෂා කරනු ලැබිය හැකි යම් වැඩිදුර කරුණක්; සහ

(ඉ) පාර්ශ්වකරුවන් වෙනුවෙන් අධිකරණය වෙත කරන ලද කරුණු ඉදිරිපත් කිරීම්,

සලකා බලා, පහත දැක්වෙන කරුණු පිළිබඳ අධිකරණය සෑහීමට පත් වන්නේ නම්, දේපළ අධිකරණමය ක්‍රියා විරහිත කිරීම සඳහා ආඥාවක් කරනු ලැබිය යුතු ය:-

(i) දේපළ අධිකරණමය ක්‍රියා විරහිත කිරීම සඳහා මහාධිකරණය වෙත ඉල්ලීමක් කිරීමට තමා අදහස් කරන බවට වන දැන්වීම විමර්ශන නිලධරයා විසින් මෙහි මින් පෙර ලැයිස්තුගත කරන ලද පාර්ශ්වකරුවන් වෙත භාර දී ඇති බවට;

(ii) එකී දේපළ අපරාධයකින් උත්පාදිත දෙයක් බවට හෝ එකී අපරාධයකින් උත්පාදිත දෙය ලබා ගත නොහැකි අවස්ථාවක, එම අපරාධයකින් උත්පාදිත දෙයෙහි වටිනාකමට අනුරූපී දේපළක් බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇති බවට; සහ

(iii) එවැනි ආඥාවක් කිරීම යුක්තියේ යහපත සඳහා හේතුවන බවට.

(3) එකී අධිකරණමය ක්‍රියා විරහිත කිරීමේ ආඥාව, මහාධිකරණය විසින්, මේ පනතේ VI වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙන් නිකුත් කරනු ලැබිය යුතු ය.

(4) අධිකරණමය ක්‍රියා විරහිත කිරීමේ ආඥාවක් සඳහා ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක දී, ප්‍රශ්නගත දේපළ, තහනමට ගැනීමකට යටත් නොවන්නේ නම් දේපළ අධිකරණමය ක්‍රියා විරහිත කිරීම සඳහා වන ඉල්ලීම සම්බන්ධයෙන් ආඥාවක් කරනු

ලබන තෙක්, නීතිපතිවරයාගේ මෙහෙයවීම මත, මහාධිකරණය විසින්, දේපළ තාවකාලිකව ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා සුදුසු ආඥා කරනු ලැබිය යුතු ය.

(5) තහනමට ගනු ලැබූ දේපළෙහි ස්වභාවය සහ අධිකරණමය ක්‍රියා විරහිත කිරීමේ ආඥාව නිකුත් කිරීම පිළිබඳ නොදන්නා තැනැත්තන් ක්‍රියා විරහිත කළ දේපළ සම්බන්ධයෙන් වන යම් ගනුදෙනුවක යෙදීමේ හෝ යෙදීමට තැත් කිරීමේ ඉඩකඩ නිසි පරිදි සැලකිල්ලට ගනිමින්, මහාධිකරණය විසින්, අධිකරණ ආඥාවේ නිශ්චිතව දක්වා ඇති ආකාරයෙන් අධිකරණමය ක්‍රියා විරහිත කිරීමේ ආඥාව හෝ එහි යම් කොටසක් පළ කරන ලෙස විමර්ශන නිලධරයාට විධාන කරනු ලැබිය යුතු ය. ක්‍රියා විරහිත කළ දේපළ සම්බන්ධයෙන් වන වැඩිදුර ආඥාවක නිශ්චිතව දක්වා ඇති පියවර ගන්නා ලෙස ද අධිකරණය විසින් යම් රජයේ නිලධරයකුට විධාන කරනු ලැබිය හැකි ය.

(6) තහනමට ගනු ලැබූ දේපළ ක්‍රියා විරහිත කිරීම සඳහා මහාධිකරණයෙන් අඥාවක් ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කිරීමේ කාර්යය සඳහා වැඩිදුර විමර්ශන සිදු කිරීමට වැඩ කරන දින හතකට වැඩි කාලසීමාවක් අවශ්‍ය බව විමර්ශන නිලධරයාගේ මතය වන අවස්ථාවක, ඔහු විසින්, නම් කරන ලද නිලධරයාගේ අනුමතය ඇතිව, දේපළ තහනමට ගැනීමෙන් වැඩ කරන දින හතක් ඇතුළත, තහනමට ගනු ලැබූ දේපළ ක්‍රියා විරහිත කිරීම සඳහා ඉල්ලීමක් කිරීම සඳහා තහනමට ගැනීමෙන් වැඩ කරන දින හතක කාලසීමාව අවසන් වන දින සිට තවත් වැඩ කරන දින හතකට වඩා දීර්ඝ නොවන කාලයකට එකී කාලසීමාව දීර්ඝ කරන ලෙස එකී ඉල්ලීම සඳහා වන හේතු දක්වන ලද ඉල්ලීමක් මහාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(7) (6) වන උපවගන්තිය යටතේ විමර්ශන නිලධරයකු විසින් එවැනි ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක, දේපළ තහනම් කිරීම සහ තහනමට ගැනීම, මහාධිකරණය විසින් ඒ සම්බන්ධයෙන් ආඥාවක් කරන තෙක් බලාත්මකව පැවතිය යුතු ය.

(8) දේපළ අධිකරණමය ක්‍රියා විරහිත කිරීම සඳහා ආඥාවක් කිරීමේ දී, අධිකරණය විසින්, අවශ්‍ය විට දී ක්‍රියා විරහිත කළ දේපළ සම්බන්ධයෙන් මේ පනත ප්‍රකාර ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා ද ආඥා කරනු ලැබිය යුතු ය.

(9) දේපළක් තහනම් කිරීමෙන් හෝ තහනමට ගැනීමෙන් පසු, විමර්ශන නිලධරයකු විසින් කරනු ලැබූ ඉල්ලීමක් අනුව තහනමට ගනු ලැබූ හෝ තහනම් කරනු ලැබූ දේපළ අධිකරණමය ක්‍රියා විරහිත කිරීම සඳහා මහාධිකරණය විසින් ආඥාවක් කරනු නොලැබූ අවස්ථාවක, දේපළ තහනමට ගැනීම සහ තහනමට ගනු ලැබූ දේපළ සම්බන්ධයෙන් කරන ලද තහනම් නියෝගය අහෝසි විය යුතු ය. අවශ්‍ය විට දී, මහාධිකරණය විසින්, එකී දේපළ තහනමට ගනු ලැබුවේ යම් තැනැත්තකුගෙන් ද, එම තැනැත්තාට හෝ එකී දේපළ ආපසු ලබා දිය යුතු බවට අධිකරණයට පෙනී යන වෙනත් යම් තැනැත්තකුට එකී දේපළ ආපසු ලබා දීම සඳහා ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(10) දේපළක් අධිකරණමය ක්‍රියා විරහිත කිරීම සඳහා මහාධිකරණය වෙත ඉල්ලීමක් කිරීමෙන් පසු මහාධිකරණය විසින් එකී දේපළ නිදහස් කිරීම සඳහා තීරණය කරනු ලැබූ විට, සහ එකී දේපළ එසේ නිදහස් කර ඇති විට වැඩිදුර විමර්ශන සිදු කිරීමෙන් පසු, නිදහස් කළ දේපළ අපරාධයකින් උත්පාදිත දේ බවට විමර්ශන නිලධරයා විසින් සාධාරණ හේතු අනුව සලකනු ලබන්නා වූ ද අවස්ථාවක, දේපළ නිදහස් කිරීම සඳහා වන එකී ආඥාව කිරීමෙන් එක් වසරක් ඇතුළත, ඔහු විසින් නම් කරන ලද නිලධරයාගේ අනුමතය ඇතිව, මහාධිකරණය විසින් කලින් එකී දේපළ නිදහස් කරනු ලැබ ඇත්තේ යම් පාර්ශ්වකරුවකුට ද, එම පාර්ශ්වකරුට සහ අධිකරණමය ක්‍රියා විරහිත කිරීමේ ආඥාවකින් බලපෑමට ලක් විය හැකි වෙනත් යම් පාර්ශ්වකරුවකුට දැන්වීමක් භාර දී, කලින් නිදහස් කළ දේපළ අධිකරණමය ක්‍රියා විරහිත කිරීමට ඉල්ලා සිටිමින් මහාධිකරණය වෙත එක් වැඩිදුර ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(11) බලපෑමට ලක් වූ පාර්ශ්වකරුට යථා පරිදි දැන්වීම භාර දී ඇති බවට සහ ප්‍රශ්නගත එකී දේපළ අපරාධයකින් උත්පාදිත දේ බවට විශ්වාස කිරීම සඳහා සාධාරණ හේතු ඇති බවට මහාධිකරණය සෑහීමට පත් වන්නේ නම් පමණක් (10) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර එකී දේපළ අධිකරණමය ක්‍රියා විරහිත කිරීම සඳහා ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(12) (අ) අපරාධයකින් උත්පාදිත දේ බවට විශ්වාස කරන දේපළක් අධිකරණමය ක්‍රියා විරහිත කිරීම සඳහා විමර්ශන නිලධරයකු විසින් මහාධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබ, එකී දේපළ අපරාධයකින් උත්පාදිත දෙයක් බවට විශ්වාස කිරීම සඳහා සාධාරණ හේතු ඇති බව ද එම නිසා එය ක්‍රියා විරහිත කළ යුතු බවට ද මහාධිකරණය සෑහීමට පත් වන අවස්ථාවක, අධිකරණය විසින් එකී දේපළ තහනමට ගෙන හෝ තහනම් කර ඇත්තේ යම් පාර්ශ්වකරුවකුගේ සන්තකයෙන්, පාලනයෙන් හෝ ආධිපත්‍යයෙන් ද, එවැනි පාර්ශ්වකරුවකු විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට, පරීක්ෂණයක් සිදු කරනු ලැබිය යුතු ය.

(ආ) මහාධිකරණය විසින් අවශ්‍ය පරීක්ෂණයකින් පසු, මහජන යහපත පිණිස එකී දේපළ ඵලදායී ලෙස ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා එකී දේපළ අධිකරණමය ක්‍රියා විරහිත කිරීම සඳහා ආඥාවක් කිරීමට අමතරව, එම අවස්ථාවේ දී ම හෝ ඉන්පසු ඕනෑම අවස්ථාවක දී ඉහත කී ඉල්ලීම කරන ලද පාර්ශ්වකරුට එකී දේපළ හෝ ඉන් කොටසක් තාවකාලික වශයෙන් නිදහස් කිරීම සඳහා වැඩිදුර ආඥාවක් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, එම තාවකාලික වශයෙන් නිදහස් කිරීම අධිකරණය විසින් නිශ්චිතව දක්වනු ලබන ආකාරයෙන් සහ ස්වභාවයෙන් සාධාරණ ඇපයක් එකී පාර්ශ්වකරු විසින් අධිකරණයට ලබා දීමට ද නිශ්චිත ගනුදෙනු තහනම් කිරීමේ කොන්දේසි ද ඇතුළුව අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව ද, විය යුතු ය.

(13) එකී දේපළ තාවකාලික වශයෙන් නිදහස් කිරීම මගින් මේ පනතේ අරමුණු ව්‍යර්ථ නොවන බවට මහාධිකරණය සෑහීමට

පත් වන්නා වූ ද, යම් පාර්ශ්වකරුවකු විසින් හිතාමතා සිදු කරන ක්‍රියාකලාපය හේතුවෙන් එහි වටිනාකම අඩුවීමෙන් තොරව එම දේපළ මේ පනතේ සඳහන් පරිදි රජය සතු කිරීමේ නඩු කටයුතුවලට යටත්වීමට දිගට ම පවතින බවට අධිකරණය සෑහීමට පත් වන්නා වූ ද අවස්ථාවක පමණක් එකී දේපළ තාවකාලික වශයෙන් නිදහස් කිරීම සඳහා ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(14) අපරාධයකින් උත්පාදිත දෙයක් බවට සැක සහිත යම් දේපළක් අධිකරණමය ක්‍රියා විරහිත කිරීම සඳහා මහාධිකරණය විසින් කරන ලද ආඥාවක් එකී දේපළ කලින් සන්තකය දරන ලද, පාලනය කරන ලද හෝ ඒ විෂයයෙහි ආධිපත්‍ය දරන ලද සහ එකී අධිකරණමය ක්‍රියා විරහිත කිරීමේ ආඥාවෙන් සෘජුවම බලපෑමට ලක්වීමට ඉඩ ඇති පාර්ශ්වකරුවන් වෙත වහාම භාර දිය යුතු ය. තව ද, එය මහාධිකරණය විසින් විධාන කරනු ලබන ආකාරයෙන් පළ කරනු ලැබිය යුතු ය.

(15) අධිකරණමය ක්‍රියා විරහිත කිරීමේ ආඥාවක්, ආරම්භයේ දී, මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා වලංගු විය යුතු ය.

(16) අවස්ථාවෝචිත පරිදි, නීතිපතිවරයා හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට, මහාධිකරණය විසින්, හේතු වාර්තා කර, අධිකරණමය ක්‍රියා විරහිත කිරීමේ ආඥාවක් වරකට මාස හයක කාලසීමාවක් බැගින් මාස විසිහතරක් නොඉක්මවන කාලසීමාවක් සඳහා දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(17) මහාධිකරණය විසින් දේපළක් අධිකරණමය ක්‍රියා විරහිත කිරීමෙන් පසු එකී ක්‍රියා විරහිත කළ දේපළ ජනිත කරනු ලැබුවේ යයි කියනු ලබන නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කිරීම සම්බන්ධයෙන්, අවස්ථාවෝචිත පරිදි, මහාධිකරණයෙහි හෝ මහෙස්ත්‍රාත් අධිකරණයෙහි නඩු පවරනු ලැබූ අවස්ථාවක, මහාධිකරණය විසින් කරන ලද අධිකරණමය ක්‍රියා විරහිත කිරීමේ ආඥාව, එකී නඩු තීන්දුව ප්‍රකාශ කිරීමෙන් පසු මාස තුනක් නොඉක්මවන කාලසීමාවක් සඳහා බලාත්මකව පැවතිය යුතු ය.

(18) 17 වන උපවගන්තියේ සඳහන් නඩු කටයුතු යටතේ චූදිතයා වරදකරු කරනු ලැබ ඇත්තා වූ ද, එම වරදකරු කිරීම සම්බන්ධයෙන් අභියාචනයක් ගොනු කර ඇත්තා වූ ද අවස්ථාවක, අභියාචනය අවසන් කර, නඩු තීන්දුව ලබා දී නඩු තීන්දුව ලබා දීමෙන් පසු මාස තුනක කාලසීමාවක් ගත වන තෙක් අධිකරණමය ක්‍රියා විරහිත කිරීමේ ආඥාව බලාත්මකව පැවතිය යුතු ය:

එසේ වුව ද, එකී මහාධිකරණය හෝ මහෙස්ත්‍රාත් අධිකරණය විසින් චූදිතයා නිදොස් කොට නිදහස් කරනු ලැබ ඇත්තා වූ ද, එම නිදොස් කොට නිදහස් කිරීම සම්බන්ධයෙන් අභියාචනයක් ගොනු කර ඇත්තා වූ ද අවස්ථාවක, අභියාචනය අවසන් කර, නඩු තීන්දුව ලබා දීමෙන් පසු මාස තුනක් ගතවන තෙක් අධිකරණමය ක්‍රියා විරහිත කිරීමේ ආඥාව බලාත්මකව පැවතිය යුතු ය.

(19) අධිකරණමය ක්‍රියා විරහිත කිරීමේ ආඥාවක් කිරීමෙන් පසු, එකී අධිකරණමය ක්‍රියා විරහිත කිරීමේ ආඥාව කිරීමෙන් සෘජුවම බලපෑමට ලක් වූ යම් තැනැත්තකු විසින්, එකී අධිකරණමය ක්‍රියා විරහිත කිරීමේ ආඥාව වෙනස් කරන ලෙස ඉල්ලා සිටිමින් මහාධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි අතර, ඉල්ලා සිටින ලද වෙනස් කිරීම අපරාධයකින් උත්පාදිත දෙයට සම්බන්ධ නොමැති බවට අධිකරණය සෑහීමට පත් වන්නේ නම්, අධිකරණය විසින්, එම වෙනස් කිරීම ප්‍රදානය කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, යම් ගනුදෙනුවක් අපරාධයකින් උත්පාදිත දේට සම්බන්ධ නම්, එකී ගනුදෙනු නීත්‍යානුකූල වුව ද, එම ගනුදෙනු සිදු කිරීම සඳහා අධිකරණය විසින් අවසර දෙනු නොලැබිය යුතු ය.

(20) අධිකරණමය ක්‍රියා විරහිත කිරීමේ ආඥාවක් නිකුත් කිරීමෙන් පසු, මහාධිකරණය විසින්, එකී අධිකරණමය ක්‍රියා විරහිත කිරීමේ ආඥාව ක්‍රියාත්මක වන කාලසීමාව සහ රජය සතු කිරීමේ නඩු කටයුතු පවත්වනු ලැබිය යුතු යම් දීර්ඝ කරන ලද කාලසීමාවක් සඳහා අදාළ විය යුතු ක්‍රියාවිරහිත කළ අපරාධයකින් උත්පාදිත දේ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය ආඥා කරනු ලැබිය යුතු ය. එකී දේපළ අධිකරණමය ක්‍රියා විරහිත කිරීම, ආරක්ෂා කිරීම,

සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා වන ආඥාව මේ පනතේ IV වන කොටසේ විධිවිධාන සලස්වා ඇති පරිදි නිකුත් කරනු ලැබිය යුතු ය.

(21) මහාධිකරණයක් විසින් අපරාධයකින් උත්පාදිත දේ බවට සැක කරන දේ අධිකරණමය ක්‍රියා විරහිත කිරීමෙන් පසු, අධිකරණය විසින්, රජය සතු කිරීමේ නඩු කටයුතු පවත්වනු ලබන හෝ රජය සතු කිරීමේ ආඥාවක් කරනු ලබන තෙක්, එකී දේපළ සඳහා හිමිකම් ලැබූ පාර්ශ්වකරුවකු විසින් කරන ලද ඉල්ලීමක් මත, එකී දේපළ සම්බන්ධයෙන් තක්සේරුවක් ලබා ගැනීමෙන් පසු හිමිකම් පාන්නා -

(අ) සද්භාවයෙන් කටයුතු කරන බවට සහ එය අපරාධයකින් උත්පාදිත දේ බවට සොයාගනු ලැබුවහොත් එම දේපළ සඳහා හිමිකම් ලබන බවට;

(ආ) අධිකරණය විසින් විධාන කරනු ලබන ආකාරයට එම දේපළෙහි වටිනාකමට ඇපයක් ලබා දීමට කැමති බවට,

අධිකරණය සෑහීමට පත් වන අවස්ථාවක, යම් වැඩිදුර කොන්දේසිවලට සහ ඇපයක් ලබා දීමට යටත්ව, එකී දේපළ හෝ ඉන් කොටසක් තාවකාලික වශයෙන් එම හිමිකම් පාන්නා වෙත නිදහස් කරනු ලැබිය හැකි ය. එකී ඇපය මහාධිකරණය විසින් විධාන කරනු ලබන පරිදි අධිකරණයෙහි ම හෝ අධිකාරියෙහි තැන්පත් කරනු ලැබිය යුතු ය.

(22) 21 වන උපවගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි ඇපයක් මත තාවකාලික වශයෙන් නිදහස් කරනු ලැබූ දේපළ, එම දේපළ නිදහස් කරනු ලැබුවේ යම් පාර්ශ්වකරුවකු වෙත ද, එම පාර්ශ්වකරු විසින්, අධිකරණය විසින් නියම කරනු ලබන කාර්ය සඳහා පමණක් භාවිත කරනු ලැබිය යුතු අතර, මහාධිකරණය විසින් ආපසු ඉල්ලූ කවර වූ හෝ අවස්ථාවක, අධිකරණය හෝ අධිකාරිය වෙත භාර දෙනු ලැබිය යුතු ය.

(23) මේ පනත ප්‍රකාර, එකී දේපළ නිදහස් කරනු ලැබුවේ යම් පාර්ශ්වකරුවකු වෙත ද, එකී පාර්ශ්වකරු විසින්, මේ පනතේ විධිවිධාන සලස්වා ඇති පරිදි රජය සතු කිරීමේ නඩුකටයුතුවලට විෂය විමට හෝ රජය සතු කිරීමේ නියෝගයෙන් පසු රජය සතු කිරීමේ නඩුකටයුතුවල විධිවිධාන සලස්වා ඇති ආකාරයට බැහැර කිරීම සඳහා එකී තාවකාලික වශයෙන් නිදහස් කළ දේපළ මහාධිකරණය වෙත ලබා දෙනු ලැබිය යුතු ය. එකී දේපළ අධිකරණය වෙත ආපසු ලබා දීමෙන් පසු, ලබා දුන් ඇපය ඉල්ලා සිටීමට හිමිකම්පාන්නාට හිමිකම් ලැබිය යුතු ය:

එසේ වුව ද, මහාධිකරණය වෙත දේපළ ආපසු භාර දෙන අවස්ථාවේ දී එහි වටිනාකම අඩු වී ඇත්නම්, ඇපයේ අදාළ වටිනාකම රජය සතු කර ඉතිරි යම් වටිනාකමක් වෙතොත්, එම වටිනාකම පමණක් හිමිකම්පාන්නා වෙත ආපසු ලබා දීමට අධිකරණය හිමිකම් ලැබිය යුතු ය.

(24) දේපළක් තාවකාලික වශයෙන් හිමිකම්පාන්නකු වෙත නිදහස් කරනු ලැබූ විට දී, ඔහු විසින්, එය ඵලදායී ලෙස ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා වගකීම දරනු ලැබිය යුතු අතර, එම දේපළ විනාශ වීමට හෝ එම දේපළෙහි වටිනාකම අඩුවීමට හේතු වන යම් කටයුත්තක චේතනාන්විතව නොයෙදිය යුතු ය.

(25) දේපළ අධිකරණමය ක්‍රියා විරහිත කිරීම සඳහා බලය දෙන යම් නීතියක් ප්‍රකාර දේපළ අධිකරණමය ක්‍රියා විරහිත කිරීම මේ පනතේ සඳහන් කිසිවකින් වළක්වනු නොලැබිය යුතු ය:

එසේ වුව ද, එකී වෙනත් යම් නීතියක් ප්‍රකාර දේපළක් ක්‍රියා විරහිත කරනු ලැබූ අවස්ථාවක, එකී දේපළ අධිකරණමය ක්‍රියා විරහිත කිරීමෙන් පසු එම නීතිය ප්‍රකාරවම කටයුතු කරනු ලැබිය යුතු ය.

## IV වන කොටස

## අපරාධයකින් උත්පාදිත දේ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම

**76**. (1) තහනමට ගනු ලැබූ හෝ ක්‍රියා විරහිත කරනු ලැබූ අපරාධයකින් උත්පාදිත දෙයක් විනාශ නොවන බවට හෝ දිරාපත් නොවන බවට සහ එහි වටිනාකම අඩු නොවන බවට හෝ ඊට අහිතකර ලෙස බල නොපාන බවට වගබලා ගැනීමේ අරමුණ ඇතිව සහ අපරාධයකින් උත්පාදිත දෙයක් තහනමට ගැනීම හෝ අධිකරණමය ක්‍රියාවිරහිත කිරීම මගින්:-

තහනමට ගනු ලැබූ හෝ ක්‍රියා විරහිත කරනු ලැබූ අපරාධයකින් උත්පාදිත දේ ආරක්ෂා කිරීමේ, සංරක්ෂණය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ අරමුණු සහ පරමාර්ථ

(අ) නීත්‍යානුකූල මූල්‍ය, වෙළෙඳ සහ වාණිජ කටයුතුවලට;

(ආ) නීත්‍යානුකූල මූල්‍ය, වෙළෙඳ සහ වාණිජ කටයුතු මගින් ආර්ථික ප්‍රතිලාභයක් ව්‍යුත්පන්න වීමට;

(ඇ) තැනැත්තන්ගේ නීත්‍යානුකූල රැකියාවලට; සහ

(ඈ) තුන්වන පාර්ශ්වයන්හි සම්බන්ධතාවලට,

බාධා නොවන බවට හෝ අහිතකර ලෙස බල නොපාන බවට වගබලා ගැනීමේ කාර්යය සඳහා, විමර්ශන නිලධරයකු විසින්, අපරාධයකින් උත්පාදිත දෙයක් බවට විශ්වාස කරන තහනමට ගනු ලැබූ හෝ ක්‍රියා විරහිත කරනු ලැබූ දේපළ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා මේ පනතින් විධිවිධාන සලස්වා ඇති අර්ථාන්විත සහ ඵලදායී ක්‍රියාමාර්ග ගනු ලැබිය යුතු ය.

(2) අපරාධයකින් උත්පාදිත දෙයක් බවට සැක සහිත තහනමට ගනු ලැබූ හෝ ක්‍රියා විරහිත කරනු ලැබූ දේපළ, අදාළ අපරාධයකින් උත්පාදිත දේ උත්පාදනය කළ බවට විශ්වාස කරන යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සිදු කිරීම හෝ වෙනත් යම් වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව අපරාධ නඩු පැවරීම සඳහා අවශ්‍ය වන සාක්ෂි සංරක්ෂණය කිරීමේ කාර්යය

සඳහා ද ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම සිදු කරනු ලැබිය යුතු ය.

තහනමට ගනු ලැබූ හෝ ක්‍රියා විරහිත කරනු ලැබූ අපරාධයකින් උත්පාදිත දේ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා විමර්ශන නිලධරයා විසින් පියවර ගැනීම

**77.** (1) අපරාධයකින් උත්පාදිත දේ බවට සැක කරන තහනම් කළ හෝ තහනමට ගනු ලැබූ දේපළක් ආරක්ෂා කළ යුතු බව හෝ සංරක්ෂණය කළ යුතු බව විමර්ශන නිලධරයකුගේ මතය වන අවස්ථාවක, ඔහු විසින් තමා විසින් ම හෝ අදාළ පරිපාලනමය විධානවලට යටත්ව, වෙනත් යම් පොලිස් නිලධරයකුගේ හෝ වෙනත් රජයේ නිලධරයකුගේ සහාය ඇතිව, එකී දේපළ සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සහ අවශ්‍ය ආරක්ෂාව සැපයීම කරනු ලැබිය යුතු ය.

(2) අවශ්‍ය විට දී, තහනම් කළ, තහනමට ගනු ලැබූ හෝ ක්‍රියා විරහිත කරන ලද දේපළ ඵලදායී ලෙස ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා මහෙස්ත්‍රාත් අධිකරණයෙන් සහ මහාධිකරණයෙන් ආඥා ලබා ගත යුතු ය.

(3) මහාධිකරණයෙන් අවශ්‍ය ආඥා ලබා ගන්නා තුරු, එකී දේපළ සඳහා අවශ්‍ය ආරක්ෂාව සැපයීම සහ එකී දේපළ සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම, අපරාධයකින් උත්පාදිත බවට සැක සහිත දේපළක් තහනමට ගන්නා විමර්ශන නිලධරයකුගේ කාර්යය විය යුතු ය.

(4) තහනමට ගනු ලැබූ දේපළ සඳහා ආරක්ෂාව සැපයීම හෝ ආරක්ෂා කිරීම හෝ සංරක්ෂණය කිරීම සඳහා යම් රජයේ හෝ ව්‍යවස්ථාපිත ආයතනයක සහාය හෝ සේවාවන් ලබා ගැනීම අවශ්‍ය බව විමර්ශන නිලධරයාගේ මතය වන අවස්ථාවක, ඔහු විසින්, මේ පනතේ මෙම කොටස ප්‍රකාරව මහාධිකරණය විසින් ආඥාවක් කරන තුරු අදාළ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක් කර, තහනමට ගනු ලැබූ දේපළ ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය විය හැකි පියවර ගන්නා ලෙස

නිශ්චිත රජයේ නිලධරයකු හෝ රජයේ ආයතනයක් වෙත විධාන කරමින් මහෙස්ත්‍රාත්වරයකුගෙන් ආඥාවක් ලබා ගත යුතු ය.

තහනමට ගනු ලැබූ හෝ ක්‍රියා විරහිත කරනු ලැබූ අපරාධයකින් උත්පාදිත දේ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා වන අධිකරණ ආඥාව

**78**. (1) අපරාධයකින් උත්පාදිත දෙයක් බවට සැක කරන දේපළක් මහාධිකරණය විසින් ක්‍රියා විරහිත කරනු ලැබූ අවස්ථාවක හෝ දේපළ අධිකරණමය ක්‍රියා විරහිත කිරීම සම්බන්ධයෙන් ආඥාවක් කරන තුරු, එකී අධිකරණය විසින් ස්වකීය මෙහෙයවීම යටතේ හෝ විමර්ශන නිලධරයකු විසින් කරනු ලැබූ ඉල්ලීමක් මත, එකී ක්‍රියා විරහිත කරනු ලැබූ දේපළ හෝ ක්‍රියා විරහිත කිරීමට අපේක්ෂා කරන දේපළ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා මේ පනත ප්‍රකාර අවශ්‍ය ආඥා කරනු ලැබිය යුතු ය.

(2) තහනමට ගනු ලැබූ හෝ ක්‍රියා විරහිත කරනු ලැබූ දේපළක් ඵලදායී ලෙස ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම මහාධිකරණය විසින් ආඥාවක් කරන ලද යම් රජයේ නිලධරයකුගේ හෝ රජයේ හෝ ව්‍යවස්ථාපිත ආයතනයේ කාර්යය විය යුතු ය.

(3) මහාධිකරණය විසින් තහනමට ගනු ලැබූ හෝ ක්‍රියා විරහිත කරනු ලැබූ දේපළ රජය සතු කිරීම හෝ එකී දේපළේ සන්තකය දැරීමට නීත්‍යානුකූලව හිමිකම් ඇති පාර්ශ්වකරු වෙත එය නිදහස් කිරීම හෝ ආපසු ලබා දීම සම්බන්ධයෙන් අධිකරණමය ආඥාවක් ලබා දෙන තුරු එම දේපළ, ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම භාරව සිටින පාර්ශ්වකරු විසින් අවස්ථාවෝචිත පරිදි, රජය වෙනුවෙන් හෝ අදාළ අපරාධයේ වින්දිතයා වෙනුවෙන් හෝ එම දේපළ සඳහා නීත්‍යානුකූල ලෙස හිමිකම් ලැබූ පාර්ශ්වකරු වෙනුවෙන් භාරයක් ලෙස දරනු ලැබිය යුතු ය.

ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීමට යටත් තහනමට ගනු ලැබූ හෝ ක්‍රියා විරහිත කරනු ලැබූ අපරාධයකින් උත්පාදිත දේ නීත්‍යානුකූල මූල්‍ය, වෙළඳ හෝ වාණිජ කටයුත්තක් සඳහා භාවිත කිරීම

**79.** (1) තහනමට ගනු ලැබූ හෝ අධිකරණමය ක්‍රියා විරහිත කරනු ලැබූ අවස්ථාවේ දී, යම් නීත්‍යානුකූල මූල්‍ය, වෙළෙඳ හෝ වාණිජ කටයුත්තක් ක්‍රියාවේ යෙදවීම සඳහා භාවිත කරමින් තිබූ අපරාධයකින් උත්පාදිත දෙයක් බවට සැක කරන යම් තහනමට ගනු ලැබූ හෝ ක්‍රියා විරහිත කරනු ලැබූ දේපළක්, මහාධිකරණය විසින් එම දේපළ කළමනාකරණය කිරීම භාර දෙන ලද තැනැත්තා විසින් -

(අ) එම දේපළ විනාශ වීම හෝ දිරාපත් වීම;

(ආ) එහි ආර්ථික වටිනාකම අඩු වීම;

(ඇ) නීත්‍යානුකූල මූල්‍ය, වෙළෙඳ හෝ වාණිජ කටයුතුවලට බාධා වීම;

(ඈ) නීත්‍යානුකූල රැකියාවකට බාධා වීම; සහ

(ඉ) තුන්වන පාර්ශ්වයන්හි සම්බන්ධතාවලට යම් අහිතකර බලපෑමක් සිදු වීම,

වැළැක්වීම සඳහා සෑම අර්ථාන්විත පියවරක් ම ගනිමින්, එම නීත්‍යනුකූල ආකාරයෙන් ම හෝ ඊට බොහෝ සෙයින් සමාන ආකාරයකින් භාවිත කරනු ලැබිය යුතු ය.

(2) දේපළ රජය සතු කරන තුරු හෝ එම දේපළ සඳහා නීත්‍යානුකූල හිමිකමක් ඇති පාර්ශ්වකරුට එම දේපළ නිදහස් කරන හෝ ආපසු ලබා දෙන තුරු හෝ මහාධිකරණයේ වැඩිදුර ආඥාවක් ලැබෙන තුරු ඉහත දක්වා ඇති පරිදි අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබිය යුතු ය. මේ වගන්තියේ සඳහන් පරමාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා වැඩිදුර ක්‍රියාමාර්ග ගනු ලැබීමට අවශ්‍ය අවස්ථාවක, දේපළ කළමනාකරණය කිරීමේ කාර්යය භාරව සිටින තැනැත්තා විසින්, මහාධිකරණය වෙත සුදුසු ඉල්ලීම් කර අවශ්‍ය වැඩිදුර අවසර ලබා ගත යුතු ය.

අපරාධයකින් උත්පාදිත දේ කළමනාකරණය කිරීම මගින් ජනිත වූ ලාභ සහ එහි පිරිවැය

**80**. (1) අපරාධයකින් උත්පාදිත දේ කළමනාකරණය කිරීමෙන් ව්‍යුත්පන්න වූ හෝ ජනනය වූ යම් ලාභයක් හෝ වෙනත් උපචිත මහාධිකරණයේ පූර්ව අනුමතය ඇතිව, මහාධිකරණය විසින් එම දේපළ කළමනාකරණය කිරීම පවරා ඇති පාර්ශ්වකරු විසින් -

(අ) එම මූල්‍ය, ව්‍යාපාරික හෝ වෙළෙඳ කටයුත්තම සංවර්ධනය කිරීම;

(ආ) වෙනත් යම් නීත්‍යානුකූල මූල්‍ය, වෙළෙඳ හෝ වාණිජ කටයුත්තක්; හෝ

(ඇ) වඩාත් උචිතම ආකාරයෙන් එය ආයෝජනය කිරීම,

සඳහා භාවිත කරනු ලැබිය යුතු ය.

(2) මහාධිකරණය විසින් අපරාධයකින් උත්පාදිත දේ බවට සැක කරන දේ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා බලය දෙන ලද තැනැත්තා විසින්, මහාධිකරණයේ අවසරය ඇතිව, එම දේපළ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා ඔහු විසින් නීත්‍යානුකූල ලෙස වැය කරන ලද මුදල් අඩු කර ගැනීම හෝ අධිකාරියෙන් එම මුදල ප්‍රතිපූරණය කර ගැනීම නීත්‍යානුකූල විය යුතු ය.

රජයේ ආයතනයක් හෝ ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු විසින් දේපළක් ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම

**81**. මහාධිකරණය විසින් ක්‍රියා විරහිත කරන ලද දේපළක් ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම, එම මහාධිකරණය විසින් අධිකාරිය හෝ වෙනත් යම් සුදුසු රජයේ ආයතනයක් වෙත භාර දෙනු ලැබිය යුතු ය. ක්‍රියා විරහිත කරන ලද අපරාධයකින් උත්පාදිත දේ ආරක්ෂා කිරීමේ, සංරක්ෂණය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ කර්තව්‍ය එවැනි ආයතන එකකට වැඩි සංඛ්‍යාවකට පවරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, ක්‍රියා විරහිත කරන ලද දේපළෙහි ස්වභාවය සහ එය තහනම් කරන ලද හෝ තහනමට ගන්නා ලද අවස්ථාවේ දී

එය භාවිත කර තිබූ කාර්යය සැලකිල්ලට ගනිමින්, එකී දේපළ අධිකාරිය හෝ වෙනත් යම් රජයේ ආයතනයක් විසින් ඵලදායී ලෙස ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම හෝ කළමනාකරණය කිරීම කළ නොහැකි බව මහාධිකරණයේ මතය වන අවස්ථාවක, මහාධිකරණය විසින්, එම අධිකරණය විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් කර්තව්‍ය කිරීම සඳහා ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු පත් කරනු ලැබිය යුතු ය.

අධිකාරිය, ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු පත් කිරීම

**82**. (1) ක්‍රියා විරහිත කරන ලද අපරාධයකින් උත්පාදිත දේ ඵලදායී ලෙස ආරක්ෂා කිරීමේ, සංරක්ෂණය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ කාර්යය සඳහා මහාධිකරණය විසින් -

(අ) මේ පනතේ විධිවිධාන සලස්වා ඇති පරිදි තහනමට ගනු ලැබූ හෝ ක්‍රියා විරහිත කරන ලද දේපළක් ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා තැනැත්තකු පත් කිරීම සඳහා විමර්ශන නිලධරයා විසින් අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබූ; සහ

(ආ) තහනමට ගන්නා ලද හෝ ක්‍රියා විරහිත කරන ලද අපරාධයකින් උත්පාදිත දේට සම්බන්ධයෙන් අදාළ අවස්ථානුගත කරුණු අනුව ඒ දේපළ ඵලදායී ලෙස ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා අධිකාරිය හෝ ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු පත් කිරීමට අවශ්‍ය යැයි අධිකරණය විසින් සලකා බලනු ලබන,

අවස්ථාවක, අධිකාරිය, ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු පත් කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, විමර්ශන නිලධරයා විසින් අධිකාරිය හෝ ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු පත් කිරීම සඳහා ඉල්ලීමක් කර නොමැත්තා වූ ද, එහෙත් තහනමට ගනු ලැබූ

හෝ ක්‍රියා විරහිත කරනු ලැබූ දේපළෙහි ස්වභාවය, වටිනාකම සහ ඊට අදාළ අවස්ථානුගත කරුණු සලකා බැලීමෙන් පසු, අධිකාරිය හෝ ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු පත් කිරීම අවශ්‍ය බව අධිකරණයේ මතය වන්නා වූ අවස්ථාවක දී, අධිකරණය විසින්, ස්වකීය අභිමතය පරිදි, දේපළ ආරක්ෂා කිරීමේ, සංරක්ෂණය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ වගකීම මේ පනතේ මේ කොටස ප්‍රකාර අධිකාරිය වෙත පැවරීම හෝ ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු පත් කිරීම කරනු ලැබිය යුතු ය.

(2) වාර්තාගත කරනු ලැබිය යුතු අවස්ථානුගත කරුණු හේතුවෙන්, සාමාන්‍යයෙන්, අධිකාරිය සඳහා බලය ලබා දීමේ හෝ ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු පත් කිරීමේ ආඥාවක්, අපරාධයකින් උත්පාදිත දේ බවට සැක කරනු ලබන දේ අධිකරණමය ක්‍රියා විරහිත කිරීමේ ආඥාවකට පසුව, කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මහාධිකරණය විසින්, එකී දේපළ තහනම් කර හෝ තහනමට ගෙන සහ අපරාධයකින් උත්පාදිත දේ බවට සැක සහිත ලබන දේ අධිකරණමය ක්‍රියා විරහිත කිරීම සඳහා මහාධිකරණයේ නඩු පවරා ඇත්නම්, අපරාධයකින් උත්පාදිත බවට සැක සහිත දේ අධිකරණමය ක්‍රියා විරහිත කිරීම සම්බන්ධයෙන් ආඥාවක් කරන තුරු, දේපළ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා අධිකාරිය හෝ විශේෂ කළමනාකරුවකු පත් කරමින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(3) තහනම් කරනු ලැබූ, තහනමට ගනු ලැබූ හෝ ක්‍රියා විරහිත කරනු ලැබූ දේපළේ වටිනාකම, ස්වභාවය සහ එකී දේපළ ආරක්ෂා කිරීමේ, සංරක්ෂණය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ පිරිවැය දේපළේ වටිනාකම ඉක්මවන්නේ ද යන්න ඇතුළුව ඊට අදාළ අවස්ථානුගත කරුණු සලකා බැලීමෙන් පසු, අධිකරණය විසින් ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු පත් කිරීමට විකල්පයක් ලෙස, සාධාරණ ලෙස හැකි තාක් දුරට එම දේ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය

කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට විමර්ශන නිලධරයා වෙත විධානය කරනු ලැබිය හැකි ය.

අධිකාරිය, වෙනත් යම් රජයේ ආයතනයක් හෝ ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු විසින් දේපළේ සන්තකය දැරීම, භාවිත කිරීම සහ පාලනය කිරීම ආදිය කළ යුතු බව

**83**. (1) අපරාධයකින් උත්පාදිත දෙයක් බවට සැක කරනු ලබන දේපළක් ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා වන ආඥාවක් තහනමට ගනු ලැබූ හෝ ක්‍රියා විරහිත කරනු ලැබූ දේපළ සම්බන්ධයෙන් කරනු ලැබූ අවස්ථාවක, මහාධිකරණය විසින් පත් කරන ලද, අධිකාරිය, වෙනත් යම් රජයේ ආයතනයක් හෝ ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු මහාධිකරණය විසින් පනවන ලද කොන්දේසිවලට සහ විධානවලට යටත්ව එකී ආඥාව ක්‍රියාත්මකව පවතින කාලසීමාව තුළ එකී දේපළේ සන්තකය දැරීම, භාරය දැරීම, භාවිත කිරීම සහ පාලනය කිරීම සඳහා හිමිකම් ලැබිය යුතු ය.

(2) තහනමට ගනු ලැබූ හෝ ක්‍රියා විරහිත කරනු ලැබූ දේපළ සම්බන්ධයෙන් මහාධිකරණය විසින් අධිකාරිය, ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු පත් කර ඇති අවස්ථාවක, එකී වලංගු කාලසීමාව තුළ, එකී දේපළේ සියලු අයිතිවාසිකම්, අවස්ථාවෝචිත පරිදි, අධිකාරිය හෝ ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරු සතු වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) තහනමට ගනු ලැබූ හෝ ක්‍රියා විරහිත කරනු ලැබූ දේපළ සම්බන්ධයෙන් මහාධිකරණය විසින් අධිකාරිය, ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු පත් කර ඇති අවස්ථාවක, එම දේපළ සම්බන්ධයෙන් ස්වකීය නිල නාමයෙන් යම් නඩුවක් හෝ වෙනත් යම් නඩු කටයුත්තක් පැවරීමට හෝ විත්තිවාචක ඉදිරිපත් කිරීමට, අවස්ථාවෝචිත පරිදි, අධිකාරිය හෝ ප්‍රතිග්‍රාහක හෝ විශේෂ කළමනාකරු හිමිකම් ලැබිය යුතු ය.

අධිකාරිය විසින් ප්‍රතිග්‍රාහකයකු ලෙස කටයුතු කළ යුතු බව

**84**. (1) මේ පනතේ කාර්ය සඳහා, අධිකාරිය, පනතේ මේ කොටස ප්‍රකාර ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු ලෙස කටයුතු කිරීම සඳහා බලය තිබිය යුතු ය.

(2) අධිකාරිය පිහිටුවා ඇති අවස්ථාවක හෝ තහනමට ගනු ලැබූ හෝ ක්‍රියා විරහිත කරනු ලැබූ දේපළක් ඵලදායී ලෙස ආරක්ෂා කිරීමේ, සංරක්ෂණය කිරීමේ හෝ කළමනාකරණය කිරීමේ හැකියාව ඇති රජයේ වෙනත් යම් විශේෂිත ආයතනයක් ඇති අවස්ථාවක, අධිකාරිය විමසීමෙන් අනතුරුව සහ තහනමට ගනු ලැබූ හෝ ක්‍රියා විරහිත කරනු ලැබූ දේපළෙහි ස්වභාවය සලකා බැලීමෙන් පසු, අධිකාරිය හෝ එකී වෙනත් රජයේ ආයතනය විසින් එම දේපළ නිසි පරිදි ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම හෝ කළමනාකරණය කිරීම කළ නොහැකි බව අධිකරණයේ මතය වන්නේ නම් මිස, මහාධිකරණය විසින්, ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු ලෙස කටයුතු කිරීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කරනු නොලැබිය යුතු ය.

(3) අධිකාරිය පිහිටුවා නොමැති හෝ ඵලදායී ලෙස ක්‍රියාත්මක නොවන්නේ හෝ තහනමට ගනු ලැබූ හෝ ක්‍රියා විරහිත කරනු ලැබූ දේපළ ඵලදායී ලෙස අරක්ෂා කිරීමේ, සංරක්ෂණය කිරීමේ හෝ කළමනාකරණය කිරීමේ හැකියාව ඇති යම් රජයේ විශේෂිත ආයතනයක් නොමැති අවස්ථාවක, මහාධිකරණය විසින්, හේතු වාර්තා කර, ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු පත් කිරීම සම්බන්ධයෙන් ඍජුවම සලකා බලනු ලැබිය හැකි ය.

**85**. (1) ප්‍රතිග්‍රාහකයකු, තහනමට ගනු ලැබූ හෝ ක්‍රියා විරහිත කරනු ලැබූ අපරාධයකින් උත්පාදිත දෙයක් ආරක්ෂා කිරීමේ, සංරක්ෂණය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ ශක්නුතාව ඇති තැනැත්තකු විය යුතු ය. විශේෂ කළමනාකරුවකු, අපරාධයකින් උත්පාදිත බවට සැක සහිත දේ ආරක්ෂා කිරීමේ, සංරක්ෂණය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීමේ අරමුණ ඇතිව, යම් තහනමට ගනු ලැබූ හෝ ක්‍රියා විරහිත කරනු ලැබූ සුවිශේෂී කාණ්ඩයක අපරාධයකින් උත්පාදිත දේ කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය විය හැකි විශේෂඥතාව ඇති තැනැත්තකු විය යුතු ය.

ප්‍රතිග්‍රාහකයන්

(2) අවශ්‍යතාවක් පැන නැඟුණු අවස්ථාවක, හේතු වාර්තා කර, මහාධිකරණයක් විසින්, අපරාධයකින් උත්පාදිත දේ

බවට සැක සහිත එක් දෙයක් සඳහා ප්‍රතිග්‍රාහකයකු සහ විශේෂ කළමනාකරුවකු යන දෙදෙනාම පත් කරනු ලැබිය හැකි ය.

(3) විශේෂ කළමනාකරුවන් එක් අයකු හෝ වැඩි සංඛ්‍යාවක් සේවයේ නියුක්ත කිරීමට ප්‍රතිග්‍රාහකයකුට හිමිකම් ලැබිය යුතු ය.

ප්‍රතිග්‍රාහකයින් ලියාපදිංචි කිරීම

**86**. (1) මේ පනතේ මේ කොටස යටතේ ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු පත් කිරීමේ කාර්යය සඳහා, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින්, එකී ප්‍රතිග්‍රාහකයින්ට සහ විශේෂ කළමනාකරුවන්ට ආරක්ෂා කිරීමේ, සංරක්ෂණය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ හැකියාව ඇති දේපළ වර්ගය හා ස්වභාවය සහ එම විශේෂ කළමනාකරුවන්ගේ විශේෂඥතාව පිළිබඳ වර්ගීකරණයක් මත පදනම්ව ලියාපදිංචි ප්‍රතිග්‍රාහකයින් සහ විශේෂ කළමනාකරුවන් පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින්, මේ පනත යටතේ සාදනු ලබන නියෝග ප්‍රකාර, කලින් කල, මේ පනතේ මේ කොටස යටතේ ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු ලෙස ලියාපදිංචි වීමට අපේක්ෂා කරන තැනැත්තකුට, අවස්ථාවෝචිත පරිදි, සතු විය යුතු හෝ තිබිය යුතු සුදුසුකම්, පළපුරුද්ද සහ නුසුදුසුකම් ඇතුළු වෙනත් අදාළ අවශ්‍යතා නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය. එකී සුදුසුකම්, නුසුදුසුකම් සහ පළපුරුද්ද පොදු ස්වභාවයෙන් හෝ එක් එක් දේපළ වර්ගයට විශේෂිත වූ ස්වභාවයකින් සමන්විත විය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන සුදුසුකම්, පළපුරුද්ද සහ වෙනත් යම් අවශ්‍යතා සතු යම් තැනැත්තකු විසින් ඕනෑම අවස්ථාවක දී, ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු ලෙස පත් කිරීම සඳහා අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ලියාපදිංචිය ඉල්ලා සිටිනු ලැබිය හැකි ය. ඉල්ලුම්කරු විසින් ලියාපදිංචිය ඉල්ලා සිටිමින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත්‍රයේ තම සුදුසුකම්, පළපුරුද්ද සහ අමාත්‍යවරයා

විසින් නියම කරන ලද අවශ්‍යතා සපුරා ඇති බවට වූ සාක්ෂි සහ විවිධ දේපළ වර්ග ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම පිළිබඳ විශේෂඥතා කිසිවක් ඇත්නම්, එම විශේෂඥතා සහ ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු ලෙස කටයුතු කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තු ද සඳහන් කරනු ලැබිය යුතු ය. කිසිදු නුසුදුසුකමක් නොමැති බවට ද ඔහු විසින් දිවුරුම් ප්‍රකාශයක් මගින් සහතික කරනු ලැබිය යුතු ය.

(4) ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු ලෙස පත් කිරීම සඳහා ඉල්ලා සිටිමින් යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් ලැබුණු පසු, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අමාත්‍යවරයා විසින් නියම කරන ලද සුදුසුකම්, පළපුරුද්ද සහ වෙනත් අවශ්‍යතා ඉල්ලුම්කරු සතු වන බවට ද, යම් නුසුදුසුකමක් නොමැති බවට ද, සෑහීමට පත් වීමෙන් පසු, වසර පහක් නොඉක්මවන කාලසීමාවක් සඳහා එම තැනැත්තා ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(5) ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු ලෙස ලියාපදිංචි කළ යම් තැනැත්තකු -

(අ) බන්ධනාගාරගත කිරීමේ කාලසීමාවෙන් දඬුවම් කළ හැකි වරදක් හෝ චරිත දූෂණය සම්බන්ධ වෙනත් යම් හැසිරීමක් සිදු කිරීම සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ විට දී;

(ආ) ඔහු විසින් ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු ලෙස ස්වකීය කර්තව්‍ය යථා පරිදි ඉටු කර නොමැති බවට සඳහන් කරමින් මහාධිකරණයෙන් වාර්තාවක් ලැබුණු විට දී;

(ඇ) එකී තැනැත්තා අමාත්‍යවරයා විසින් නියම කරන ලද නුසුදුසුකමකින් පෙළෙන බවට සාක්ෂි ඇති විට දී; හෝ

(ඇ) අදාළ තැනැත්තා විසින් ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු ලෙස කටයුතු කිරීමෙන් නිදහස් කරන ලෙස ඉල්ලීමක් කරනු ලැබූ විට දී,

අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා, එකී තැනැත්තාව ලියාපදිංචි ප්‍රතිග්‍රාහකයන් සහ විශේෂ කළමනාකරුවන්ගේ ලේඛනයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

(6) එම තැනැත්තාගේ නම ලියාපදිංචි ප්‍රතිග්‍රාහකයින් සහ විශේෂ කළමනාකරුවන් පිළිබඳ ලේඛනයෙන් ඉවත් කරනු ලැබූ පසු, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින්, එකී ඉවත් කිරීම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(7) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින්, කලින් කලට සහ වසරකට එක් වරකට නොඅඩු වාර ගණනක දී ප්‍රතිග්‍රාහකයින් සහ විශේෂ කළමනාකරුවන් ලෙස ලියාපදිංචි වූ තැනැත්තන්ගේ නම් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

ප්‍රතිග්‍රාහකයින් පත් කිරීම

**87**. මේ පනතේ මේ කොටස ප්‍රකාර, තහනමට ගනු ලැබූ හෝ ක්‍රියා විරහිත කරනු ලැබූ අපරාධයකින් උත්පාදිත දෙයක් බවට සැක කරන දේපළ සඳහා ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු පත් කිරීම අවශ්‍ය වූ මහාධිකරණයක් විසින්, ගැසට් පත්‍රයේ පළ කරන ලද ලියාපදිංචි ප්‍රතිග්‍රාහකයින් සහ විශේෂ කළමනාකරුවන්ගේ ලැයිස්තුවෙන් එකී ප්‍රතිග්‍රාහකයා හෝ විශේෂ කළමනාකරු තෝරා ගනු ලැබිය යුතු ය. එකී පත් කිරීම සිදු කිරීමේ දී, මහාධිකරණය විසින්, පහත දැක්වෙන කරුණු සැලකිල්ලට ගනු ලැබිය යුතු ය:-

(අ) දේපළේ ස්වභාවය සහ තත්ත්වය;

(ආ) දේපළ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය විය හැකි විශේෂඥතාව;

(ඇ) හඳුනා ගත් තැනැත්තා ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු ලෙස පත්වීම භාර ගැනීමට කැමති ද යන්න;

(ඇ) දේපළ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා හඳුනා ගත් ප්‍රතිග්‍රාහකයාට හෝ විශේෂ කළමනාකරුට ගෙවිය යුතු ගාස්තු;

(ඉ) විමර්ශන නිලධරයාගේ අදහස්;

(ඊ) නඩු කටයුත්තේ එම අවස්ථාවේ දී පෙනී සිටින යම් පාර්ශ්වකරුවකු විසින් ඉදිරිපත් කරන ලද අදහස්; සහ

(උ) මේ පනතේ පරමාර්ථ බලාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වෙනත් යම් කරුණක්.

ප්‍රතිග්‍රාහකයකු පත් කිරීම පිළිබඳ දැන්වීම

**88**. (1) මහාධිකරණය විසින් අධිකාරිය, වෙනත් යම් රජයේ ආයතනයක් හෝ ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු පත් කරනු ලබන අවස්ථාවක, එකී පත් කිරීම පිළිබඳ දැන්වීමක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

(2) අධිකරණය විසින්, ස්වකීය අභිමතය පරිදි, එම දේපළ තහනමට ගනු ලැබුවේ යම් තැනැත්තකුගෙන් ද, එම තැනැත්තා ඇතුළු යම් පාර්ශ්වකරුවකු සහ යම් නියාමන හෝ නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් වෙත එකී දැන්වීම භාර දීම සඳහා ආඥාවක් කරනු ලැබිය හැකි ය.

ප්‍රතිග්‍රාහකයකු විසින් ඉදිරිපත් කරන මූලික වාර්තාව

**89**. තහනමට ගනු ලැබූ හෝ ක්‍රියා විරහිත කරනු ලැබූ දේපළක් මහාධිකරණයේ ආඥාවක් මගින් ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු සතු කරනු ලැබූ බවට සලකනු ලබන අවස්ථාවක, ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරු විසින්, ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් සහ වැඩ කරන දින හතකට පසු නොවන කාලයක් තුළ -

(අ) තහනමට ගෙන හෝ ක්‍රියා විරහිත කර ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරු සතු වූ දේපළ, අවස්ථාවෝචිත පරිදි, තහනමට ගැනීමේ

හෝ අධිකරණමය ක්‍රියා විරහිත කිරීමේ ආඥාවේ විස්තර කර ඇති දේපළම ද යන්න තහවුරු කිරීම;

(ආ) තහනමට ගනු ලැබූ හෝ ක්‍රියා විරහිත කරනු ලැබූ දේපළෙහි ස්වභාවය, තත්ත්වය, වර්තමානයේ පිහිටි ස්ථානය, වටිනාකම සහ ඒ දේපළ සම්බන්ධයෙන් වන වෙනත් අදාළ විස්තර;

(ඇ) මේ පනතේ සඳහන් පරිදි දේපළ ආරක්ෂා කිරීමේ, සංරක්ෂණය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සහ ජාතික ආර්ථිකය, වෙළඳාම සහ වාණිජ්‍යය වර්ධනය කිරීම සහ එහි වටිනාකම වර්ධනය කිරීම සඳහා දායක වීම පිණිස එම දේපළ භාවිත කළ හැකි ආකාරය ද ඇතුළුව තහනමට ගනු ලැබූ හෝ ක්‍රියා විරහිත කරනු ලැබූ දේපළ ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරු විසින් ආරක්ෂා කිරීමට, සංරක්ෂණය කිරීමට සහ කළමනාකරණය කිරීමට අපේක්ෂා කරන ආකාරය;

(ඈ) ප්‍රතිග්‍රාහකයකු පත් කර ඇති අවස්ථාවක, ඔහුගේ මතය අනුව එකී දේපළ ඵලදායී ලෙස ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා විශේෂ කළමනාකරුවකු පත් කිරීමට අවශ්‍ය ද යන්න; සහ

(ඉ) අදාළ වන්නේ නම්, දේපළ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා දැරිය යුතු යම් වියදමක් සහ එකී දේපළෙන් උපචිත විය හැකි යම් ආදායමක්, ලාභයක් ආදිය,

සම්බන්ධයෙන් අධිකරණය වෙත මූලික වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

තහනමට ගනු ලැබූ හෝ ක්‍රියාවිරහිත කරනු ලැබූ අපරාධයකින් උත්පාදිත දේ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් අධිකාරිය, යම් රජයේ ආයතනයක් හෝ ප්‍රතිග්‍රාහකයකු සතු කාර්ය, කර්තව්‍ය සහ බලතල

**90.** (1) තහනමට ගනු ලැබූ හෝ ක්‍රියා විරහිත කරනු ලැබූ අපරාධයකින් උත්පාදිත දේ ආරක්ෂා කිරීමේ, සංරක්ෂණය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ කාර්යය පවරා, එම තහනමට ගනු ලැබූ හෝ ක්‍රියා විරහිත කරනු ලැබූ දේපළක් සම්බන්ධයෙන් මහාධිකරණය විසින් අධිකාරිය හෝ වෙනත් යම් රජයේ ආයතනයක් හෝ ප්‍රතිග්‍රාහකයකු පත් කර ඇති අවස්ථාවක, එම අධිකාරිය, වෙනත් යම් රජයේ ආයතනය හෝ ප්‍රතිග්‍රාහකයා විසින්, මහාධිකරණයේ අනුමතයකට යටත්ව, එකී දේපළ සහ එහි වටිනාකම ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා සාධාරණ ලෙස අවශ්‍ය යම් පියවරක් ගැනීම  හෝ ගැනීමට කටයුතු සැලැස්වීම කරනු ලැබිය හැකි අතර, එකී පියවරවලට පහත දැක්වෙන දේ ඇතුළත් විය හැකි ය:-

(අ) අවශ්‍ය විට දී, දේපළ ලියාපදිංචි කිරීම;

(ආ) එම දේපළේ සන්තකය දැරීම, භාවිත කිරීම සහ ඊට අදාළ ගනුදෙනු නීතියට අනුකූල වන බවට වගබලා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම;

(ඇ) අවශ්‍ය වන්නේ නම්, දේපළ රක්ෂණය කර ඇති බවට වගබලා ගැනීම;

(ඈ) එකී දේපළ තහනමට ගැනීමට හෝ අධිකරණමය ක්‍රියා විරහිත කිරීමට පෙරාතුව එය යම් නිශ්චිත නීත්‍යනුකූල මූල්‍ය කටයුත්තක් හෝ වෙළෙඳාම හෝ  වාණිජ්‍යය සඳහා භාවිත කර ඇති අවස්ථාවක, එකී දේපළ එකී කාර්යය සඳහා දිගට ම භාවිත කිරීම සහ කළමනාකරණය කිරීම සහ එකී වෙළෙඳ හෝ ව්‍යාපාරික කටයුත්ත කරගෙන යාම සඳහා අවශ්‍ය විය හැකි පියවර ඒ සම්බන්ධයෙන් ගැනීම, අවශ්‍ය ප්‍රාග්ධන පුනරාවර්තන වියදම් දැරීම, ගිවිසුම්වලට එළඹීම, නියෝජිතයන් සේවයේ නියුක්ත කිරීම, අදාළ කටයුත්ත ක්‍රියාවේ යෙදවීම සඳහා අවශ්‍ය විය හැකි අවශ්‍ය විශේෂඥතාව සහ කුසලතා ඇති සුදුසු තැනැත්තන් සමඟ ගිවිසුම්ගත වීම සහ ඒ සම්බන්ධයෙන් වෙනත් යම් අවශ්‍ය පියවර ගැනීම;

(ඉ) එකී දේපළ -

(i) සඳහා යම් පාර්ශ්වයක් හිමිකම්පෑමක් නොකළ;

(ii) විනාශ විය හැකි;

(iii) අනාරක්ෂිත වන හෝ අනතුරුදායක වන;

(iv) වේගයෙන් නාස්ති වීමට, දිරාපත් වීමට, වේගයෙන් ක්ෂය වීමට හෝ වෙනත් ආකාරයේ අලාභයන්ට ලක් වන;

(v) පරිපාලනය කිරීම දුෂ්කර වන;

(vi) දේපළෙහි ස්වභාවය සැලකිල්ලට ගැනීමේ දී එය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම හෝ නඩත්තු කිරීම හෝ එහි වටිනාකම වර්ධනය කිරීම සඳහා අවශ්‍ය විශේෂඥතාව ලබා ගත නොහැකි හෝ ලබා ගැනීමට අපහසු;

(vii) අවස්ථාවෝචිත පරිදි, එය ආරක්ෂා කිරීමේ, සංරක්ෂණය කිරීමේ, නඩත්තු කිරීමේ, ගබඩා කිරීමේ සහ කළමනාකරණය කිරීමේ පිරිවැය එම දේපළේ වර්තමාන වටිනාකමට වඩා බොහෝ සෙයින් වැඩි වන,

අවස්ථාවක, එය බැහැර කිරීම හෝ එහි වටිනාකම ඉක්මනින් උපලබ්ධි කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම;

(ඊ) තහනමට ගනු ලැබූ දේපළෙහි ස්වභාවය හේතුවෙන් එය ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම ප්‍රායෝගික නොවන අවස්ථාවක, එම දේපළ බැහැර කිරීම සඳහා පියවර ගැනීම;

(ඇ) දේපළේ වටිනාකම විචලන හෝ පරිවර්තනීය වන අවස්ථාවක, සංරක්ෂණ ක්‍රමයකට යටත් කිරීම මගින් හෝ එම දේපළ යම් නීත්‍යානුකූල ගනුදෙනුවක් සඳහා භාවිත කිරීම මගින් අවස්ථාවෝචිත පරිදි, එහි වටිනාකම සංරක්ෂණය කිරීම හෝ එය බැහැර කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම;

(ඈ) දේපළ, එහි වටිනාකම වැඩි කිරීමට හෝ ප්‍රතිලාභ උත්පාදනය කිරීමට ඉඩ ඇති මූල්‍ය, වෙළෙඳ හෝ වාණිජ ගනුදෙනුවලට යටත් විය හැකි නම්, එම කාර්යය සඳහා අවශ්‍ය නීත්‍යානුකූල ගනුදෙනු සිදු කරගෙන යාමට කටයුතු සැලැස්වීම;

(එ) දේපළ ආරක්ෂා කිරීමේ, ගබඩා කිරීමේ, සංරක්ෂණය කිරීමේ හෝ නඩත්තු කිරීමේ පිරිවැය එහි වටිනාකම ඉක්මවා යාමට හැකි නම්, අධිකරණය විසින් විධානය කරනු ලැබිය හැකි යම් ආකාරයකින් එය බැහැර කිරීම;

(ඒ) තහනමට ගන්නා ලද හෝ ක්‍රියා විරහිත කරන ලද දේපළ, පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන්, තනි පුද්ගල ව්‍යාපාරයක්, හවුල් ව්‍යාපාරයක්, සංස්ථාගත සමාගමක්, භාරයක් හෝ වෙනත් යම් ව්‍යාපාරික අස්තිත්වයක් විය හැකි, පවත්වාගෙන යන නීත්‍යානුකූල ව්‍යාපාරයකින් සමන්විත වන්නේ නම් -

(i) ව්‍යාපාරය සාමාන්‍ය පරිදි කරගෙන යාමේ දී එකී ව්‍යාපාරයේ හිමිකරු, හවුල්කරුවන්, අධ්‍යක්ෂ මණ්ඩලය, භාරකරුවන් හෝ ප්‍රධාන විධායක නිලධරයන් විසින් ඉටු කරනු ලැබිය හැකි යම් කර්තව්‍ය ඉටු කිරීම;

(ii) ව්‍යාපාරය කළමනාකරණය කිරීමේ කාර්යයන් සහ ඒ සම්බන්ධ කාරණා සඳහා චෙක්පත් මගින් හෝ අන්‍යාකාරයකින් යම් ගෙවීම් සිදු කිරීම; සහ

(iii) මනා වාණිජමය පදනමක් මත ව්‍යාපාරය කරගෙන යාම සඳහා අවශ්‍ය හෝ පහසු වෙනත් යම් දෙයක් කිරීම;

(ඔ) දේපළ, සමාගමක කොටස් හෝ වෙනත් සුරැකුම්පත්වලින් සමන්විත වන්නේ නම් හෝ දේපළට ඒවා ඇතුළත් වන්නේ නම්, එම දේපළ තහනමට ගන්නා ලද්දේ යම් තැනැත්තකු වෙතින් ද, එම තැනැත්තා විසින් අන්‍යාකාරයකින් හිමිකම් ලබන, එම කොටස් හෝ සුරැකුම්පත්වලට බැඳුණු අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම;

(ඕ) දේපළ, යම් බැංකු ගිණුමකින් හෝ යම් මූල්‍ය ආයතනයක පවත්වාගෙන යනු ලබන වෙනත් යම් ගිණුමකින් සමන්විත වන්නේ නම්, එම දේපළ තහනමට ගන්නා ලද්දේ යම් තැනැත්තකු වෙතින් ද, එම තැනැත්තා විසින් අන්‍යාකාරයකින් ඉටු කරනු ලැබීමට හිමිකම් ලබන, යම් ගිණුමකට සහ වෙනත් යම් ආශ්‍රිත හෝ සම්බන්ධිත ගිණුමකට අදාළව යම් කර්තව්‍ය ඉටු කිරීම;

(ක) අවශ්‍ය ව්‍යවස්ථාපිත ගෙවීම් සිදු කිරීම;

(ග) දේපළ යම් පොලියක් උපචිත වන හෝ ලබා ගන්නා ස්ථාවර තැන්පතුවක් හෝ වෙනත් යම් ආකාරයක ආයෝජනයක් වන්නේ නම්, එකී ආයෝජනයෙන් උපරිම ප්‍රතිලාභයක් ලබා ගැනීමේ කාර්ය සඳහා එම දේපළ කළමනාකරණය කිරීම සහ එම ආයෝජන දරන්නා වූ පාර්ශ්වයන් වෙත අවශ්‍ය විධාන නිකුත් කිරීම; සහ

(ච) දේපළ, පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන්, නීත්‍යනුකූල ව්‍යාපාර කටයුත්තකට අදාළ නොවන බවට පෙනෙන, දැනට කරගෙන යමින් පවතින කටයුත්තකින් සමන්විත වන්නේ නම්, තහනමට

ගැනීමට පෙර එකී දේපළ භාවිත කරනු ලැබූ යම් නීත්‍යානුකූල කාර්ය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා එකී දේපළ කළමනාකරණය කිරීම.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, අධිකාරිය, වෙනත් රජයේ ආයතනය හෝ ප්‍රතිග්‍රාහකයා හෝ විශේෂ කළමනාකාරවරයා විසින්, මහාධිකරණයේ පූර්ව අනුමතය ලබා ගැනීමේ දී සිදු වන ප්‍රමාදය මගින් -

(අ) දේපළෙහි වටිනාකම සැලකිය යුතු ලෙස අඩු වීමට;

(ආ) අපරාධයකින් උත්පාදිත දේ බවට සැක සහිත දේ ආරක්ෂා කිරීමේ, සංරක්ෂණය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ අරමුණු ව්‍යර්ථ වීමට;

(ඇ) නීත්‍යානුකූල මූල්‍ය, වෙළෙඳාම සහ වාණිජ්‍යයට අහිතකර ලෙස බලපෑම් ඇති වීමට;

(ඈ) දේපළේ වටිනාකමට අහිතකර ලෙස බලපෑමට හෝ

(ඉ) මහජන සෞඛ්‍යයට සහ ආරක්ෂාවට අනතුරක් ඇති කරවීමට,

ඉඩ ඇති අවස්ථානුගත කරුණුවල දී එම පූර්ව අනුමතය ලබා ගැනීමෙන් තොරව ඉහත සඳහන් කරන ලද කර්තව්‍ය ඉටු කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් කරන ලද අවස්ථාවල දී, අවස්ථාවෝචිත පරිදි, අධිකාරිය, වෙනත් රජයේ ආයතනයක් හෝ ප්‍රතිග්‍රාහකයා හෝ විශේෂ කළමනාකරු විසින්, අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමෙන් පසුව, පහත දැක්වෙන කරුණු වහාම මහාධිකරණය වෙත දැනුම් දිය යුතු ය:-

(අ) දේපළ බැහැර කිරීම හෝ විකිණීම සඳහා හේතු;

(ආ) එකී දේපළ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා ගන්නා ලද පියවර සහ එහි සඵලත්වය අඩු වීම;

(ඇ) දේපළේ වටිනාකම උපලබ්ධි කිරීමට අදාළ විස්තර.

විශේෂ කළමනාකරුවකු පත් කිරීම, ඔහුගේ කාර්ය, කර්තව්‍ය සහ බලතල

**91.** (1) මහාධිකරණය විසින් විශේෂ කළමනාකරුවකු පත් කර තිබේ නම් හෝ ප්‍රතිග්‍රාහකයකු පත් කිරීමෙන් පසුව, තහනමට ගන්නා ලද සහ ක්‍රියා විරහිත කරන ලද දේපළෙහි සඵලදායී ආරක්ෂාව, සංරක්ෂණය සහ කළමනාකරණය සඳහා එකී කටයුතුවල ප්‍රවීණත්වයක් දරන විශේෂ කළමනාකරුවකු පත් කරනු ලැබිය යුතු බවට වූ මතයක් ප්‍රතිග්‍රාහකයා විසින් ඉදිරිපත් කර ඒ අනුව මහාධිකරණය විසින් විශේෂ කළමනාකරුවකු පත් කරන්නේ නම්, ඒ විශේෂ කළමනාකරු විසින්, මහාධිකරණය විසින් බලය ලබා දී ඇති පරිදි, ප්‍රතිග්‍රාහකයකුගේ යම් කර්තව්‍ය සහ මහාධිකරණය විසින් ඉටු කිරීමට ඔහු වෙත බලය ලබා දී ඇති වෙනත් කර්තව්‍ය ඉටු කරනු ලැබිය හැකි ය. මහාධිකරණය විසින් පත් කරනු ලබන විශේෂ කළමනාකරු වෙත, එකී පත්වීම ප්‍රකාර මේ පනතින් නියම කර ඇති පරිදි ප්‍රතිග්‍රාහකයකුගේ කර්තව්‍ය, කාර්ය සහ බලතල පවරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ප්‍රකාරව පත් කරනු ලබන ප්‍රතිග්‍රාහකයකු සහ විශේෂ කළමනාකරුවකු සහ එකී ප්‍රතිග්‍රාහකයා හෝ විශේෂ කළමනාකරු විසින් තමා වෙත පැවරී ඇති කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා හෝ තමාට සහාය වීම සඳහා පත් කර ගනු ලබන වෙනත් යම් තැනැත්තකු එකී පත්වීම පවත්නා කාලය ඇතුළත, දූෂණ විරෝධී පනතේ කාර්ය සඳහා රජයේ සේවකයකු වශයෙන් ද දණ්ඩ නීති සංග්‍රහයේ කාර්ය සඳහා රජයේ සේවකයකු වශයෙන් ද සලකනු ලැබිය යුතු ය.

(3) මේ පනත ප්‍රකාරව පත් කරනු ලබන ප්‍රතිග්‍රාහකයකු විශේෂ කළමනාකරුවකු සහ එකී ප්‍රතිග්‍රාහකයා හෝ විශේෂ කළමනාකරු විසින් තමා වෙත පැවරී ඇති කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා හෝ තමාට සහාය වීම සඳහා පත් කර ගනු ලබන වෙනත් යම් තැනැත්තකු, අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ කාර්ය සඳහා සාක්ෂිකරුවකු වශයෙන් සලකනු ලැබිය යුතු ය.

ප්‍රතිග්‍රාහකයකු සහ විශේෂ කළමනාකරුවකු ඉල්ලා අස්වීම සහ ඉවත් කිරීම

**92.** (1) මේ පනත යටතේ පත් කරනු ලබන ප්‍රතිග්‍රාහකයකුට හෝ විශේෂ කළමනාකරුවකුට හේතු දක්වා ඉල්ලා අස්විය හැකි ය:

එසේ වුව ද, අවස්ථාවෝචිත පරිදි, මහාධිකරණය විසින් හේතු වාර්තා කර ඒ ප්‍රතිග්‍රාහකයාගේ හෝ විශේෂ කළමනාකරුගේ ඉල්ලා අස්වීම භාර ගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි වන අතර, දේපළෙහි නිසි ආරක්ෂාව, සංරක්ෂණය සහ කළමනාකරණය සඳහා අවශ්‍ය විය හැකි යම් කාර්යයන් ඉටු කරන ලෙසට සහ එකී ප්‍රතිග්‍රාහකයා හෝ විශේෂ කළමනාකරු විසින් ඉටු කරනු ලැබ ඇති යම් කර්තව්‍යවලට අදාළ ගිණුම් අවසන් කරන ලෙසට එකී ප්‍රතිග්‍රාහකයා හෝ විශේෂ කළමනාකරු වෙත විධාන කරනු ලැබිය හැකි ය;

එසේ ම තවදුරටත්, මහාධිකරණය විසින්, අනුප්‍රාප්තික ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු පත් කරන තෙක් ඉහත කී ඉල්ලා අස්වීම භාර ගැනීම රඳවා ගැනීම ද සිදු කරනු ලැබිය හැකි ය.

(2) පහත දැක්වෙන හේතූන් එකක් හෝ වැඩි ගණනක් මත මහාධිකරණය විසින් ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු ඉවත් කරනු ලැබිය හැකි ය -

(අ) ප්‍රතිග්‍රාහකයාගේ හෝ විශේෂ කළමනාකරුගේ නම ලියාපදිංචි ප්‍රතිග්‍රාහකයන් සහ විශේෂ කළමනාකරුවන් පිළිබඳ ලේඛනවලින් ඉවත් කරනු ලැබ තිබීම; සහ

(ආ) පරීක්ෂණයකින් පසුව, ප්‍රතිග්‍රාහකයා හෝ විශේෂ කළමනාකරු විසින් -

(i) මේ පනතේ හෝ වෙනත් යම් නීතියක විධිවිධානවලට පටහැනිව හෝ මහාධිකරණය විසින් නිකුත් කරන ලද විධානයන්ට පටහැනි ආකාරයකින් ක්‍රියා කර ඇති බවට;

(ii) හිතාමතාම දේපළෙහි වටිනාකමට අනර්ථදායක වන ආකාරයකින් ක්‍රියා කර ඇති බවට;

(iii) දේපළ සම්බන්ධයෙන් වරදක් සිදු කර ඇති බවට;

(iv) අසද්භාවයෙන් ක්‍රියා කර ඇති බවට;

(v) දේපළ තහනමට ගන්නා ලද්දේ කවර තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තා සමඟ වංක සහයෝගයකින් යුතුව කටයුතු කර ඇති බවට;

(vi) නිසි උද්යෝගයකින් තොරව කටයුතු කර ඇති බවට; හෝ

(vii) මේ පනතේ කාර්ය ව්‍යර්ථ කරන ආකාරයකින් කටයුතු කර ඇති බවට,

මහාධිකරණය විසින් තීරණය කරනු ලැබීම.

ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු පත් කරනු ලැබ ඇත්තේ යම් දේපළක් සම්බන්ධයෙන් ද ඒ දේපළෙහි ආරක්ෂාවට, සංරක්ෂණයට සහ කළමනාකරණ- යට අදාළ වියදම්

**93.** (1) තහනමට ගන්නා ලද හෝ ක්‍රියා විරහිත කරන ලද දේපළක් ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම අධිකාරය හෝ වෙනත් යම් රජයේ ආයතනයක් වෙත පවරනු ලැබ ඇති අවස්ථාවක දී, ඔවුන් විසින් ඒ දේපළ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා අදාළ වියදම් දරනු ලැබිය යුතු ය.

(2) තහනමට ගන්නා ලද හෝ ක්‍රියා විරහිත කරන ලද දේපළක් ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම මේ පනතේ විධිවිධාන සලස්වා ඇති පරිදි ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු වෙත පවරනු ලැබ ඇති අවස්ථාවක දී, දේපළ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය අරමුදල්, එම ප්‍රතිග්‍රාහකයා හෝ විශේෂ කළමනාකරු පත් කරනු ලැබූ මහාධිකරණයේ අනුමතය ඇතිව අධිකාරියෙහි අපරාධයකින් උත්පාදිත දේ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා වූ අරමුදලෙන් ගෙවා හෝ ප්‍රතිපූරණය කර ගනු ලැබිය යුතු ය.

ප්‍රතිග්‍රාහකයා සහ විශේෂ කළමනාකරුගේ අවසාන වාර්තාව

**94**. (1) තහනමට ගන්නා ලද හෝ ක්‍රියා විරහිත කරන ලද දේපළ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීමට අදාළ කාර්ය සහ කර්තව්‍ය අවස්ථාවෝචිත පරිදි, ප්‍රතිග්‍රාහකයා හෝ විශේෂ කළමනාකරු විසින් සපුරාලීමෙන් පසුව, ඔහු විසින්, දේපළට අදාළ මූල්‍ය කාර්යසාධනය මෙන්ම තම කාර්ය සහ කර්තව්‍ය පිළිබඳ ප්‍රකාශයක් ඇතුළත් වන, මහාධිකරණය විසින් නිකුත් කරන ලද පිරිවිතරවලට අනුකූලව පිළියෙල කර සහතික කරන ලද වාර්තාවක් මහාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. අවස්ථාවෝචිත පරිදි, ප්‍රතිග්‍රාහකයා හෝ විශේෂ කළමනාකරු විසින්, දේපළට අදාළව ඉදිරිපත් කරන ලෙස මහාධිකරණය විසින් ඔහු වෙත නියම කළ හැකි යම් වැඩිදුර තොරතුරු සහ ඇතුළත් කිරීම සුදුසු යයි ඔහු සිතන වෙනත් යම් තොරතුරු ද එම වාර්තාවේ ඇතුළත් කරනු ලැබිය යුතු ය.

(2) අවසාන වාර්තාව ඉදිරිපත් කිරීමෙන් පසුව, මහාධිකරණය විසින් එය සලකා බැලිය යුතු අතර වාර්තාව පිළිගැනීම සඳහා මහාධිකරණයට අවශ්‍ය විය හැකි පැහැදිලි කිරීම් සහ වැඩිදුර තොරතුරු කැඳවීමට යටත්ව වාර්තාව පිළිගත යුතු ය.

ප්‍රතිග්‍රාහකයා සහ විශේෂ කළමනාකරු මුදා හැරීම

**95**. (1) මේ පනත ප්‍රකාරව පත් කරනු ලබන ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු, පහත දැක්වෙන අවස්ථානුගත කරුණුවල දී, මහාධිකරණය විසින්, ඔහුගේ කාර්ය සහ කර්තව්‍යවලින් මුදා හරිනු ලැබිය හැකි ය:-

(අ) දේපළ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් ඔහු වෙත පවරා ඇති කාර්ය සහ කර්තව්‍ය අවසන් කිරීම සහ අවසාන වාර්තාව ඉදිරිපත් කර එය පිළිගැනීමෙන් පසුව;

(ආ) ඔහුගේ කාර්ය සපුරාලීමට යටත්ව සහ ඉල්ලා අස්වීම පිළිගැනීමෙන් පසුව;

(ඇ) මේ පනතේ විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් ප්‍රතිග්‍රාහකයා හෝ විශේෂ කළමනාකරු ඉවත් කිරීමෙන් පසුව:

එසේ වුව ද, යම් ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු ඉවත් කරනු ලැබීමෙන් පසුව ඔහුගේ කාර්ය සහ කර්තව්‍යවලින් මුදා හරිනු ලැබීමට නියමිත වූයේ නම්, එම ප්‍රතිග්‍රාහකයා හෝ විශේෂ කළමනාකරු විසින්, ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු වශයෙන් තම පත්වීමට අදාළව අධිකරණය විසින් යම් විධාන පනවා ඇත්තේ නම්, එම විධාන ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) පරීක්ෂණය අවසන් කිරීමෙන් පසුව, තහනමට ගෙන තිබූ හෝ ක්‍රියා විරහිත කරනු ලැබ තිබූ දේපළ එහි අයිතිකරු, එහි සන්තකය දරන්නා හෝ එකී දේපළට හිමිකම්පාන වෙනත් යම් පාර්ශ්වයක් වෙත පවරන ලෙසට අධිකරණය විසින් ආඥා කරනු ලබන්නේ නම්, අධිකරණය විසින් වාර්තාව සහ ප්‍රතිග්‍රහකයා හෝ විශේෂ කළමනාකරු මුදා හැරීමට එරෙහිව දේපළේ අයිතිකරු හෝ හිමිකරු විසින් අවධාරණයෙන් දක්වනු ලැබිය හැකි යම් විරෝධතා සලකා බැලීමෙන් පසුව, ප්‍රතිග්‍රාහකයා හෝ විශේෂ කළමනාකරු, ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු වශයෙන් ඔහුගේ කර්තව්‍ය ඉටු කිරීමෙන් මුදා හරිනු ලැබිය යුතු ය.

(3) ප්‍රතිග්‍රාහකයා හෝ විශේෂ කළමනාකරු මුදා හැරීම රඳවා ගනු ලබන අවස්ථාවක දී, මහාධිකරණය විසින්, එයට සාධාරණ යයි සිතෙන පරිදි, එකී දේපළෙහි අයිතිකරුගේ හෝ එයට හිමිකම්පාන තැනැත්තාගේ ඉල්ලීම මත, තහනමට ගන්නා ලද හෝ ක්‍රියාවිරහිත කරන ලද දේපළ ආරක්ෂා කිරීමේ දී, සංරක්ෂණය කිරීමේ දී සහ කළමනාකරණය කිරීමේ දී කරන ලද හෝ පැහැර හරින ලද යම් ක්‍රියාවක ප්‍රතිඵලයක් සම්බන්ධයෙන් ප්‍රතිග්‍රාහකයා හෝ විශේෂ කළමනාකරු වග විය යුතු බව නියම කරමින් යම් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(4) ප්‍රතිග්‍රාහකයා හෝ විශේෂ කළමනාකරු මුදාහරිමින් මහාධිකරණය විසින් කරනු ලබන ආඥාවක් මගින්, දේපළ ආරක්ෂා කිරීමේ දී, සංරක්ෂණය කිරීමේ දී සහ කළමනාකරණය කිරීමේ දී ඔහු විසින් කරන ලද හෝ පැහැර හරින ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් හෝ අන්‍යාකාරයෙන් ප්‍රතිග්‍රාහකයා හෝ විශේෂ කළමනාකරු වශයෙන් ඔහුගේ චර්යාව සම්බන්ධයෙන් වන සියලු වගකීම්වලින් ඔහුව නිදහස් කරනු ලැබිය යුතු ය.

## V වන කොටස

### අපරාධයකින් උත්පාදිත දේ කළමනාකරණය කිරීමේ අධිකාරිය

**96**. (1) මේ පනතේ කාර්යය සඳහා අපරාධයකින් උත්පාදිත දේ කළමනාකරණය කිරීමේ අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු ය.

අපරාධයකින් උත්පාදිත දේ කළමනාකරණය කිරීමේ අධිකාරිය පිහිටු වීම

(2) අධිකාරිය, මේ පනත මගින් ඒ වෙත පවරා තිබෙන නාමයෙන් සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර, එයට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. එකී නාමයෙන්, එය විසින් ද, එයට එරෙහිව ද, නඩු පවරනු ලැබීමට හැකියාව ඇත්තේ ය.

(3) මේ පනතේ අරමුණු ඉටු කර ගැනීම සඳහා සහ මේ පනත යටතේ අධිකාරිය වෙත පැවරී ඇති කාර්ය කිරීම, කර්තව්‍ය ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා මේ පනත මගින් හෝ වෙනත් යම් ලිඛිත නීතියක් මගින් නිශ්චිතව දක්වනු ලබන කාර්ය, කර්තව්‍ය සහ බලතල එයට තිබිය යුතු ය.

(4) අපරාධයකින් උත්පාදිත දේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විෂය ක්ෂේත්‍රය විය හැකි විභාග වීමට ඇති අනාගත අපරාධ නඩු කටයුතුවලට අදාළ හෝ අධිකරණ නියෝගයක් මගින් නිශ්චිතව දක්වනු ලබන වෙනත් යම් දෙයක් ආරක්ෂා කිරීමේ, සංරක්ෂණය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ කාර්ය සඳහා වෙනත් යම් ලිඛිත නීතියක් මගින් හෝ නිසි අධිකරණයක ආඥාවක් මගින් නෛතික අධිකාරය ද අධිකාරිය වෙත පවරනු ලැබිය හැකිය:

එසේ වුව ද, අධිකාරියෙහි මූලික වගකීම මේ පනත යටතේ අපරාධයකින් උත්පාදිත දේ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම විය යුතු බව අධිකරණය විසින් පිළිගත යුතු ය.

(5) වැරදි සිදු කරනු ලැබ ඇත්තේ යම් දේපළක් සම්බන්ධයෙන් ද එවැනි දේපළක් ලෙස සහ හිමිකම් කියනු නොලබා ඇති

දේපළක් ලෙස වර්ග කරනු ලබන දේපළ වන, අධිකරණය විසින් අධිකාරිය වෙත භාර දී ඇති දේපළ ආරක්ෂා කිරීමේ, සංරක්ෂණය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ බලය අධිකාරිය සතු විය යුතු ය. අධිකරණය විසින් තවදුරටත් ආඥා ලබාදෙන තෙක් අධිකාරිය විසින් එවැනි දේපළ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු ය.

(6) අධිකාරිය මගින් එහි කාර්ය කිරීමේ දී හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, සහ බලතල ඉටු කිරීමේ දී, අධිකාරිය වෙත විධාන කිරීමට හෝ එය අධීක්ෂණය කිරීමට නීතිය යටතේ හිමිකම් ලබන අධිකරණයක් හැර, වෙනත් යම් තැනැත්තකුගෙන් ලැබෙන යම් විධානයකට හෝ වෙනත් මැදිහත්වීමකට යටත් නොවී අධිකාරිය විසින් එකී කාර්ය, කර්තව්‍ය සහ බලතල, කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ යුතු ය.

(7) මේ පනත මගින් අධිකාරිය වෙත පැවරී ඇති කාර්ය, කර්තව්‍යය සහ බලතල කිරීමේ දී, ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී, ඊට යම් මැදිහත්වීමක් හෝ බාධා කිරීමක් සිදු කිරීමට නීත්‍යනුකූල අධිකාරයක් නොමැතිව එසේ කිරීම මගින් මේ පනත ප්‍රකාරව වරදක් සංස්ථාපනය වන්නේ ය.

අධිකාරියෙහි කාර්ය, කර්තව්‍ය සහ බලතල

**97**. (1) අපරාධයකින් උත්පාදිත දේ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීමට අදාළව මේ පනත මගින් ප්‍රතිග්‍රාහකයන් සහ විශේෂ කළමනාකරුවන් වෙත පවරා ඇති කාර්ය, කර්තව්‍ය සහ බලතල අධිකාරිය සතුව තිබිය යුතු ය.

(2) වෙනත් යම් ලිඛිත නීතියක් ප්‍රකාරව හෝ එකී නීතිය ප්‍රකාරව කරන ලද අධිකරණ නියෝගයක් ප්‍රකාරව, අපරාධයකින් උත්පාදිත දේ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා එකී වෙනත් නීතිය යටතේ ප්‍රතිග්‍රාහකයකුගේ හෝ විශේෂ කළමනාකරුවකුගේ කර්තව්‍ය අධිකාරිය වෙත පවරා ඇත්තේ නම්, අධිකාරිය විසින් එකී වෙනත් යම් ලිඛිත නීතිය මගින් ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු වෙත පවරා ඇති කාර්ය කිරීම, කර්තව්‍ය ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම ද සිදු කළ යුතු ය.

(3) අධිකරණයක් විසින් අධිකාරිය වෙත නිකුත් කරන ලද යම් ආඥාවක් බලාත්මක කිරීමේ කාර්යය අධිකාරිය සතුව විය යුතු ය.

(4) මහාධිකරණය විසින් ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු ලෙස පත් කිරීමේ දී, මේ පනතේ අන්තර්ගත පරිදි ප්‍රතිග්‍රාහකයකුගේ හෝ විශේෂ කළමනාකරුවකුගේ කර්තව්‍ය, බලතල සහ කාර්ය අධිකාරිය සතුව තිබිය යුතු ය.

(5) වෙනත් යම් ලිඛිත නීතියක් ප්‍රකාරව යම් අධිකරණයක් විසින් ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු ලෙස පත් කිරීමේ දී, එකී වෙනත් ලිඛිත නීතියේ අන්තර්ගත පරිදි ප්‍රතිග්‍රාහකයකුගේ හෝ විශේෂ කළමනාකරුවකුගේ කර්තව්‍ය, බලතල සහ කාර්ය අධිකාරිය සතුව තිබිය යුතු ය.

(6) අධිකාරිය විසින් සිය කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් වාර්තා සහ සංඛ්‍යාලේඛන පවත්වාගෙන යා යුතු ය.

(7) අධිකාරිය විසින්, පසුව එළඹෙන වර්ෂයේ පළමු මාස හය ඇතුළත, පෙර වර්ෂය තුළ සිය කාර්ය සාධනයට අදාළ වාර්ෂික වාර්තාවක් අමාත්‍යවරයා මගින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. අධිකාරිය විසින් එම වාර්ෂික වාර්තාව සිය වෙබ් අඩවියේ පළ කළ යුතු ය.

(8) අධිකාරිය විසින්, පොලිසියේ නම් කරන ලද නිලධරයා සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නම් කරන ලද නිලධරයා විමසා, තහනමට ගනු ලැබීමකට හෝ අධිකරණමය ක්‍රියා විරහිත කිරීමකට යටත් විය යුතු වන අපරාධයකින් උත්පාදිත දේ හි අවම මූල්‍යමය වටිනාකම, කලින් කල, නියම කළ යුතු ය.

(9) තහනමට ගන්නා ලද අපරාධයකින් උත්පාදිත දේ විමර්ශන නිලධරයන් විසින් ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා පහසුකම් සැලැස්වීම පිණිස, අධිකාරිය විසින් කලින් කල, නම් කළ නිලධරයන් වෙත සම්මත මෙහෙයුම් ප්‍රොටකෝල් සකස් කර නිකුත් කළ යුතු ය.

(10) අධිකාරිය වෙත -

(අ) යම් මිලදී ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් අධිකාරිය වෙත පවරනු ලැබිය හැකි යම් චංචල හෝ නිශ්චල දේපළක් තබා ගැනීම සහ එය විකිණීම, උකස් කිරීම, බද්දට දීම, ප්‍රදානය කිරීම, පැවරීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ආ) ඇප සහිතව හෝ රහිතව ණයට ගැනීම හෝ අරමුදල් රැස් කිරීම සහ මුදලින් හෝ ද්‍රව්‍යවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම:

එසේ වුව ද, අධිකාරියෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, අධිකාරිය වෙත කරනු ලබන සියලු විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාගවලට අදාළව මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය;

(ඇ) අධිකාරියෙහි කර්තව්‍ය ඉටු කිරීම සඳහා සෘජුව ම හෝ අධිකාරියෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් යම් නිලධරයකු හෝ බලයලත් අනුයෝජිතයකු මඟින් අවශ්‍ය විය හැකි සියලු කොන්ත්‍රාත්තු හෝ ගිවිසුම්වලට එළඹීම සහ ලියා අත්සන් කිරීම;

(ඈ) අධිකාරියෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබිය හැකි යම් බැංකුවක යම් ගිණුමක් විවෘත කිරීම, මෙහෙයුම් කිරීම සහ පවත්වාගෙන යාම සහ වසා දැමීම;

(ඉ) අධිකාරියෙහි නිලධරයන් සහ සේවානියුක්තිකයන් පත් කිරීම, සේවයෙන් පහ කිරීම හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීම සහ ඔවුන් විෂයයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම;

(ඊ) අධිකාරියෙහි කටයුතු පරිපාලනය සඳහා රීති සකස් කිරීම; සහ

(උ) සේවය පිළිබඳ නියම සහ කොන්දේසි සහ මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව එසේ පත් කරන ලද නිලධරයන්ට, සේවානියුක්තයන්ට, අනුයෝජිතයන්ට, කොන්ත්‍රාත්කරුවන්ට, උපදේශකවරුන්ට සහ විශේෂඥයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමිකය පිළිබඳ නිශ්චය කිරීම,

සඳහා බලතල තිබිය යුතු ය.

අධිකාරිය කළමනාකරණය සහ පරිපාලනය

**98**. (1) අධිකාරියෙහි කටයුතු කළමනාකරණය සහ පරිපාලනය කිරීම (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතු ය.

(2) අධිකාරියෙහි කටයුතු කළමනාකරණය කිරීමේ සහ පරිපාලනය කිරීමේ කාර්ය සඳහා, මණ්ඩලය විසින්, මේ පනත මගින් අධිකාරිය වෙත පවරා ඇති, පනවා ඇති හෝ නියම කර ඇති කාර්ය, කර්තව්‍ය සහ බලතල කිරීම, ඉටු කිරීම සහ ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතු ය.

(3) මණ්ඩලය -

(අ) පහත දැක්වෙන නිල බලයෙන් පත්වන සාමාජිකයන්ගෙන්:-

(i) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් නිලයට නොඅඩු නිලයක් දරන එම අමාත්‍යාංශයේ නිලධරයකු;

(ii) මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ

ලේකම්වරයා විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් නිලයට නොඅඩු නිලයක් දරන එම අමාත්‍යාංශයේ නිලධරයකු;

(iii) රාජ්‍ය පරිපාලනය විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් නිලයට නොඅඩු නිලයක් දරන එම අමාත්‍යාංශයේ නිලධරයකු;

(iv) ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබන නියෝජ්‍ය පොලිස්පති නිලය දරන පොලිස්පතිවරයාගේ අනුයෝජිතයකු; සහ

(ආ) පහත දැක්වෙන ආකාරයෙන් (මෙහි මින් මතු ''පත් කරන ලද සාමාජිකයන්'' යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් හත් දෙනකුගෙන් -

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනය විමසා වරලත් ගණකාධිකාරීවරයකු;

(ii) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විමසා ඉංජිනේරුවරයකු;

(iii) ශ්‍රී ලංකා නීතිඥ සංගමය විමසා නීතිඥවරයකු;

(iv) ශ්‍රී ලංකා තක්සේරු ආයතනය විමසා වරලත් තක්සේරුකරුවකු;

(v) ලංකා වාණිජ මණ්ඩලය විමසා කළමනාකරණයෙහි සුදුසුකම් සහ පළපුරුද්ද සහිත තැනැත්තකු; සහ

(vi) පාරදෘශ්‍යභාවය සංවර්ධනය කිරීම, දූෂණ විරෝධී පියවර ශක්තිමත් කිරීම හෝ අපරාධ යුක්තිය පසිඳලීමේ අරමුණු වැඩිදියුණු කිරීම තම විෂයපථයට ඇතුළත් දේශපාලනිකව නොබැඳි කීර්තිමත් සිවිල් සංවිධානවලින් සමාජ සේවා විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා පත් කරන ලද තැනැත්තන් දෙදෙනකු.

(4) මෙහි සඳහන් සංවිධාන විසින්, ඔවුන්ගේ මතය අමාත්‍යවරයා විසින් අපේක්ෂා කරනු ලබන අවස්ථාවක දී, එහි මතය අනුව වඩාත් සුදුසු සාමාජිකයා නම් කරනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සභාපතිවරයා

**99.** (1) අමාත්‍යවරයා විසින් ඔහුගේ මතය අනුව පත් කරන ලද සාමාජිකයන් අතරින් මණ්ඩලයේ සභාපතිවරයාගේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා වඩාත් සුදුසු තැනැත්තා පත් කරනු ලැබිය යුතු අතර, ඉන්පසුව ඒ පත් කිරීම සඳහා වන හේතු වාර්තා කරනු ලැබිය යුතු ය.

(2) සභාපතිවරයා අධිකාරියෙහි ප්‍රධානියා විය යුතු අතර, මණ්ඩලයේ රැස්වීම්වල මුලසුන දරනු ලැබිය යුතු ය.

(3) සභාපතිවරයා විසින් අමාත්‍යවරයා අමතා ලියනු ලබන ලිපියක් මගින් ඔහුගේ ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් පිළිගනු ලබන දින සිට ඒ ඉල්ලා අස්වීම බලාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් හේතු දක්වා සභාපතිවරයාව සභාපති ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර, ඒ ඉවත් කිරීමට හේතු සමඟ ඒ ඉවත් කිරීම පාර්ලිමේන්තුවට ඇමතීමක් කිරීම මගින් පාර්ලිමේන්තුව වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

(5) සභාපතිවරයා අසනීප වීම, වෙනත් අශක්නුතාවයක්, ශ්‍රී ලංකාවේ දීර්ඝ කාලයක් නොසිටීම හෝ වෙනත් යම් හේතුවක් මත ඔහුගේ ධුරයේ කාර්ය කිරීමට තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් වෙනත් යම් පත් කරන ලද සාමාජිකයකු, පත් කරන ලද සාමාජිකයකු වශයෙන් ඔහුගේ සාමාන්‍ය කාර්යවලට අමතරව සභාපතිවරයා ලෙස කටයුතු කිරීම සඳහා පත් කරනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ සාමාජිකයකු වීමේදී අදාළ වන නුසුදුසුකම්

**100**. (1) මණ්ඩලයේ සෑම පත් කරන ලද සාමාජිකයකු ම -

(අ) මණ්ඩලයේ පත් කරන දිනය වන විට වයස අවුරුදු හැත්තෑවට වඩා නොවැඩි විය යුතු ය;

(ආ) යහපත් මානසිකත්වයෙන් යුක්ත විය යුතු ය; සහ

(ඇ) අවංකත්වයෙන් යුතු සහ යහපත් පිළිගැනීමක් ඇති සුදුසු තැනැත්තකු විය යුතු ය;

(2) යම් තැනැත්තකු -

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් සභාවක සභිකයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වන්නේ නම් හෝ එසේ වුවහොත්;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම නවත්වනු ලැබුවහොත්;

(ඇ) ශ්‍රී ලංකාවේ යම් නීතියක් යටතේ වස්තුභංගත්වයට පත් වූවකු බවට හෝ බංකොලොත්භාවයට පත් වූවකු බවට ප්‍රකාශයට පත් කර තිබෙන තැනැත්තකු වන්නේ නම්;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් මගින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ

දඬුවමක් විඳිමින් සිටින්නේ නම් හෝ විඳ ඇත්තේ නම්;

(ඉ) අධිකාරිය විසින් හෝ අධිකාරිය වෙනුවෙන් එළඹෙන ලද යම් ගිවිසුමක් යටතේ යම් අයිතිවාසිකමක් හෝ ප්‍රතිලාභයක් දරනු ලබන්නේ නම් හෝ බුක්තිවිඳ ඇත්තේ නම්;

(ඊ) මේ පනත යටතේ ප්‍රතිග්‍රාහකයකු ලෙස හෝ විශේෂ කළමනාකරුවකු ලෙස ලියාපදිංචි වී ඇති තැනැත්තකු වන්නේ නම්; හෝ

(උ) මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ඔහුගේ කර්තව්‍යය ඔහු විසින් ඉටු කිරීම සම්බන්ධයෙන් අගතිදායක බලපෑමට ඉඩ ඇති ආකාරයේ යම් මූල්‍යමය හෝ වෙනත් සම්බන්ධතාවක් ඇත්තේ නම්,

ඒ තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ අඛණ්ඩව කටයුතු කිරීමට නුසුදුස්සකු විය යුතු ය.

මණ්ඩලයේ පත් කරන ලද සාමාජිකයන්ගේ ධුර කාලය

**101**. (1) මණ්ඩලයේ සෑම පත් කරන ලද සාමාජිකයකුම මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කිරීමෙන් ස්වකීය ධුරය කලින් හිස් කළ හොත් මිස, වසර තුනක කාලසීමාවක් සඳහා ධුරය දැරිය යුතු අතර, අනුගාමී කාලසීමා දෙකක් සඳහා හෝ අන්‍යාකාරයෙන් නැවත පත් කිරීම සඳහා සුදුසු විය යුතු ය:-

එසේ වුව ද, මේ පනතේ විධිවිධාන යටතේ පත් කරන ලද පළමු මණ්ඩලයේ පත් කරන ලද සාමාජිකයන් පහත දැක්වෙන ආකාරයට පත්වීම් දිනයේ සිට ධුර දරනු ලැබිය යුතු ය:

(අ) සභාපතිවරයා අවුරුදු තුනක කාලසීමාවක් සඳහා ධුර දරනු ලැබිය යුතු ය;

(ආ) සභාපතිවරයා හැර වෙනත් සාමාජිකයන් තිදෙනෙකු අවුරුදු දෙකක කාලසීමාවක් සඳහා ධුර දරනු ලැබිය යුතු ය; සහ

(ඇ) ඉතිරි සාමාජිකයන් තිදෙනා අවුරුද්දක කාලසීමාවක් සඳහා ධුර දරනු ලැබිය යුතු අතර,

පළමු මණ්ඩලයට පත් කිරීමේ සිට පළමු සහ දෙවන අවුරුද්ද අතරතුර දී ධුරය හිස් කළ යුතු පළමු මණ්ඩලයේ සාමාජිකයන් මණ්ඩලයේ පළමු රැස්වීමේ දී කුසපත් ඇදීමෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලයේ පත් කරන ලද සාමාජිකයකුගේ ධුර කාලය ඉකුත්වීම හේතුවෙන් ඔහුගේ ධුරයේ පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක දී, ඔහුගේ ධුරයට අලුත් සාමාජිකයකු පත් කරන තුරු ඒ සාමාජිකයා විසින් අඛණ්ඩව ඒ ධුරය දරනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලයේ පත් කරන ලද සාමාජිකයකුගේ ධුර කාලසීමාව ඉකුත්වීම හේතුවෙන් ඒ මණ්ඩලයේ සාමාජිකයාගේ ධුරයේ පුරප්පාඩුවක් ඇති වීමෙන් මාසයක් ඇතුළත අමාත්‍යවරයා විසින් ඔහුගේ ධුරයට අලුත් සාමාජිකයකු පත් කරනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයන් ඉවත් කිරීම සහ ඉල්ලා අස්වීම

**102**. (1) පත් කරන ලද සෑම සාමාජිකයකු ම, තත්කාර්ය සඳහා අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින්, ඕනෑම වේලාවක, ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් ලිඛිතව පිළිගනු ලබන දින සිට බලාත්මක විය යුතු ය.

(2) යම් පත් කරන ලද සාමාජිකයකු රෝගාතුර වීම, අශක්නුතාවයකට පත් වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර වීම හේතුවෙන් තාවකාලිකව ස්වකීය ධුරයේ කර්තව්‍ය ඉටු කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සාමාජිකයන්ගේ සංයුතිය සම්බන්ධයෙන් වන මේ පනතේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ඔහුගේ ධුරයේ කටයුතු කිරීමට වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින්, පැහැදිලි කිරීම සඳහා අදාළ සාමාජිකයාට අවස්ථාවක් ලබා දීමෙන් පසුව සහ ඒ අනුව ඒ

සාමාජිකයා ඉවත් කිරීම සුදුසු වන බවට සෑහීමට පත් වන්නේ නම්, එවිට ඒ සාමාජිකයාට සහ මණ්ඩලයට ලිඛිතව හේතු දක්වා යම් පත් කරන ලද සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) පත් කරන ලද සාමාජිකයකු මිය යන, ඉල්ලා අස්වන හෝ ධුරයෙන් ඉවත් කරන අවස්ථාවේ දී, අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සාමාජිකයන්ගේ සංයුතිය සම්බන්ධයෙන් වන මේ පනතේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් ඔහුගේ ධුරයේ කටයුතු කිරීමට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි අතර, එසේ පත් කරන ලද තැනැත්තා විසින් ඔහු අනුප්‍රාප්තිය ලබන සාමාජිකයාගේ ඉකුත් නොවූ ධුර කාලසීමාව සඳහා ධුරය දරනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයන් විසින් යම් සම්බන්ධතාවක් හෙළිදරව් කරනු ලැබිය යුතු බව

**103**. (1) මණ්ඩලයේ සාමාජිකයකු විසින් මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් වීම සලකා බැලීමේ කාලයේ දී අධිකාරියෙහි අරමුණු සහ කර්තව්‍ය සමඟ ගැටීමක් හෝ තරඟකාරීත්වයක් ඇති වීමට හේතු විය හැකි ඔහු සතුව පැවතිය හැකි යම් සම්බන්ධතාවයක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) සලකා බලමින් පවතින කාරණයක් හෝ මණ්ඩලය හමුවේ ගැනීමට ඇති කාරණයක් සම්බන්ධයෙන් ගැටෙන හෝ තරඟකාරී සම්බන්ධතාවයකට හේතු විය හැකි යම් කාරණයක් සම්බන්ධයෙන් සෘජුව හෝ වක්‍රව සම්බන්ධතාවයක් සහිත මණ්ඩලයේ සාමාජිකයකු විසින් ඒ සම්බන්ධතාවයේ ස්වභාවය මණ්ඩලයට හෙළිදරව් කරනු ලැබිය යුතු අතර ඒ කාරණය සම්බන්ධයෙන් වන මණ්ඩලයේ කිසිදු සාකච්ඡාවකට හෝ තීරණ ගැනීමකට සහභාගී නොවිය යුතු ය.

මණ්ඩලයේ ගණපූරණය සහ රැස්වීම්

**104**. (1) මණ්ඩලයේ රැස්වීම් අවම වශයෙන් මසකට එක් වතාවක් පවත්වනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලයේ රැස්වීමක් සඳහා වන ගණපූරණය අවම වශයෙන් නිල බලයෙන් පත්වන සාමාජිකයන් දෙදෙනකුගෙන් සමන්විත වන සාමාජිකයන් පස් දෙනකු විය යුතු ය.

(3) සභාපතිවරයා මණ්ඩලයේ සෑම රැස්වීමක ම මුලසුන දැරිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි අවස්ථාවක දී, පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා පත් කරගත් සාමාජිකයකු එකී රැස්වීමේ මුලසුන දරනු ලැබිය යුතු ය.

(4) මණ්ඩලයේ යම් රැස්වීමක දී තීරණය කරනු ලැබිය යුතු, සියලු ප්‍රශ්න, එකී රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සමාන වන අවස්ථාවක දී, සභාපතිවරයාට හෝ ඒ රැස්වීමේ මුලසුන දරන වෙනත් යම් සාමාජිකයාට ස්වකීය ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(5) මේ වගන්තියේ පූර්ව විධිවිධානයන්ට යටත් ව, මණ්ඩලය විසින් එහි රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු සම්බන්ධයෙන් එහි කාර්යපටිපාටිය නියාමනය කරනු ලැබිය හැකි ය.

(6) මණ්ඩලය විසින්, කලින් කල මණ්ඩලයේ ලේකම්වරයා ලෙස කටයුතු කිරීම සඳහා පූර්ණ කාලීන හෝ අර්ධකාලීන පදනම මත නීතිඥවරයකු හෝ වරලත් ලේකම්වරයකු පත් කරනු ලැබිය යුතු අතර, ඒ තැනැත්තාට ගෙවිය යුතු පාරිශ්‍රමිකය ද තීරණය කරනු ලැබිය යුතු ය.

(7) සභාපතිවරයාගේ මෙහෙයවීම පරිදි හෝ මණ්ඩලයේ යෝජනා සම්මතයක් මත පදනම්ව මණ්ඩලයේ රැස්වීම් කැඳවීම මණ්ඩලයේ ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය.

(8) මණ්ඩලයේ රැස්වීම්වල වාර්තා පවත්වාගෙන යාම සහ මණ්ඩලයේ රැස්වීම් පැවැත්වීමට අවශ්‍ය වන සැකසුම් සඳහා පහසුකම් සැලසීම මණ්ඩලයේ ලේකම්වරයාගේ වගකීම විය යුතු ය.

යම් පුරප්පාඩුවක් පැවතීම හේතුව නිසා මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු වූ ලෙස සලකනු නොලැබිය යුතු බව

**105**. මණ්ඩලය විසින් ස්වකීය සාමාජිකයන් අතරේ යම් පුරප්පාඩුවක් පැවතිය ද එය නොතකා ක්‍රියාකරනු ලැබිය හැකි අතර, මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් එහි සාමාජිකයන් අතරේ යම් පුරප්පාඩුවක් පැවතීම හෝ එහි සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් පැවතීමේ හේතුව මත ම පමණක් අවලංගු නොවිය යුතු අතර, අවලංගු වූ ලෙස සලකනු නොලැබිය යුතු ය.

**106**. මණ්ඩලයේ සාමාජිකයන්ට මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය මත අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යම් ආකාරයට සහ යම් අනුප්‍රමාණ මත පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය. මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික

**107**. (1) අධිකාරියෙහි මුද්‍රාව මණ්ඩලයේ ලේකම්වරයාගේ භාරයේ තබනු ලැබිය යුතු ය. අධිකාරියෙහි මුද්‍රාව

(2) අධිකාරියෙහි මුද්‍රාව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලයේ අවසරය සහිතව මිස සහ තමන් පැමිණි බවට සලකුණක් වශයෙන් සාධනපත්‍රයේ හෝ ලේඛනයේ තම නම අත්සන් කරනු ලැබිය යුතු මණ්ඩලයේ සභාපතිවරයා සහ මණ්ඩලයේ වෙනත් එක් සාමාජිකයකු ඉදිරිපිට දී මිස කිසිදු සාධනපත්‍රයකට හෝ ලේඛනයකට අධිකාරියෙහි මුද්‍රාව නොතැබිය යුතු ය:

එසේ වුව ද, යම් සාධනපත්‍රයකට හෝ ලේඛනයකට අධිකාරියෙහි මුද්‍රාව තබන විට දී සභාපතිවරයා පැමිණීමට නොහැකි වන අවස්ථාවක දී, තත්කාර්ය සඳහා සභාපතිවරයා විසින් ලිඛිතව අවසර ලබාදෙන ලද මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු මේ උපවගන්තියේ පූර්ව විධිවිධානයන්ට අනුකූලව එකී සාධනපත්‍රය හෝ ලේඛනය අත්සන් කිරීමට ද සුදුසුකම් ලබන්නේ ය:

එසේ ම තවදුරටත්, සභාපතිවරයා නොමැති අවස්ථාවක දී, ඔහු වෙනුවෙන් අත්සන් කිරීම සඳහා මණ්ඩලයේ සාමාජිකයකු සභාපතිවරයා විසින් පත් කර නොමැති නම්, ඒ කර්තව්‍ය ඉටු කිරීම සඳහා මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු වෙත බලය පවරමින් මණ්ඩලය විසින් ඒ සාමාජිකයා පත් කරනු ලැබිය යුතු ය.

(4) අධිකාරියෙහි මුද්‍රාව තබන ලද සාධන පත්‍රවල සහ ලේඛනවල රෙජිස්ටරයක් පවත්වාගෙන යා යුතු ය.

අධිකාරියෙහි ප්‍රධාන විධායක නිලධරයා

**108**. (1) මණ්ඩලය විසින් අධිකාරියෙහි කාර්යය සහ කර්තව්‍ය නිසි ලෙස සැලකිල්ලට ගෙන වර්ධනය කරන ලද සහ අනුමත කර අනුගමනය කරන ලද බඳවාගැනීමේ පටිපාටිය සැලකිල්ලට ගනිමින්, සුදුසු තැනැත්තකු පත් කිරීම සඳහා විනිවිදභාවයෙන් යුතු බඳවා ගැනීමේ පටිපාටියක් අනුගමනය කරමින් මණ්ඩලය විසින් අධිකාරියෙහි ප්‍රධාන විධායක නිලධරයා පත් කරනු ලැබිය යුතු ය. අධිකාරිය විසින් අදාළ ආයතන ප්‍රධානියාගේ අනුමතය සහිතව අනුයුක්තයක් මත සුදුසු රජයේ නිලධරයකු ප්‍රධාන විධායක නිලධරයා ලෙස පත් කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

(2) එසේ පත් කරන ලද ප්‍රධාන විධායක නිලධරයා අධිකාරියෙහි සියලු විධායක සහ පරිපාලන කර්තව්‍ය භාරව කටයුතු කරනු ලැබිය යුතු අතර, අධිකාරියෙහි ප්‍රධාන මූල්‍ය නිලධරයා විය යුතු ය.

(3) මණ්ඩලය විසින් ඒ ප්‍රධාන විධායක නිලධරයා කෙරෙහි විනය අධිකාරිය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(4) ප්‍රධාන විධායක නිලධරයා විසින් මණ්ඩලයේ ආරාධනය මත, මණ්ඩලයේ රැස්වීම්වලට සහභාගී වීමට හිමිකම් ලැබිය යුතු ය.

(5) ප්‍රධාන විධායක නිලධරයා, මිය යාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම නිසා ඔහු විසින් කලින් ධුරය හිස්කර ඇත්නම් මිස, අවුරුදු දහයක් නොඉක්මවන කාලසීමාවක් සඳහා ඒ ධුරයේ සේවය කිරීමට හිමිකම් ලැබිය යුතු ය.

(6) ප්‍රධාන විධායක නිලධරයා විසින් මණ්ඩලයේ සාමාන්‍ය විධානයන්ට සහ අධීක්ෂණයට යටත් ව -

(අ) කාර්ය මණ්ඩලයේ පරිපාලනය සහ පාලනය ඇතුළුව අධිකාරියෙහි කටයුතු පරිපාලනය කිරීම සහ විධායක කර්තව්‍ය කරනු ලැබිය යුතු ය;

(ආ) මණ්ඩලයේ සියලු තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු ය; සහ

(ඇ) මණ්ඩලය විසින් ප්‍රධාන විධායක නිලධරයාට පවරනු ලැබිය හැකි සියලු කර්තව්‍යයන් කරනු ලැබිය යුතු ය.

(7) ප්‍රධාන විධායක නිලධරයා -

(අ) ප්‍රධාන විධායක නිලධරයාගේ ධුරයේ කාර්ය, කාර්ය ඉටු කිරීමට ස්ථිරව අපොහොසත් තත්ත්වයට ඔහු පත්ව ඇත්නම්;

(ආ) මණ්ඩලයේ මතය අනුව, ඒ නිලධරයාගේ කාර්ය, කර්තව්‍යය සහ බලතලවලට, නොගැළපෙන යම් ක්‍රියාවක් ඔහු විසින් සිදු කර ඇත්නම්, මේ පනතේ කාර්ය පරාජය කරනු ලබන ආකාරයකින් හෝ අධිකාරියෙහි සම්බන්ධතාවලට අගතියක් වන ආකාරයකින් ක්‍රියාකර ඇත්නම් හෝ අකාර්යක්ෂමව ඇත්නම්; හෝ

(ඇ) මණ්ඩලය විසින් නිකුත් කරන ලද යම් විධානයන්ට අනුකූලවීම පැහැර හැර ඇත්නම්,

ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(8) මරණය, (7) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කිරීම හෝ ඒ ධුරය දරන්නා විසින් මණ්ඩලය අමතා තත්කාර්යය සඳහා යවන ලිපියක් මගින් ඉල්ලා අස්වීම නිසා හෝ වසර දහයක සේවා කාලය සම්පූර්ණ කිරීම මත ප්‍රධාන විධායක නිලධරයාගේ ධුරය හිස් විය යුතු ය.

(9) ප්‍රධාන විධායක නිලධරයාගේ ධුරයේ යම් පුරප්පාඩුවක් පවතී නම්, පත් කිරීමක් සිදු කරන තෙක් ප්‍රධාන විධායක නිලධරයාගේ කාර්යය ඉටු කිරීම සඳහා මණ්ඩලය විසින්

කළමනාකරණ වගකීම් දරන්නා වූ අධිකාරියෙහි නිලධරයකු පත් කිරීම කරනු ලැබිය හැකි ය.

(10) ප්‍රධාන විධායක නිලධරයා විසින් අධිකාරියෙහි අරමුණු සහ කර්තව්‍ය කෙරෙහි නිසි සැලකිල්ලක් ඇතිව සෑම අවුරුද්දකම හතරවන කාර්තුව ඇතුළත පසුව එළඹෙන වර්ෂය සඳහා ආයතනික සැලැස්මක් අනුමතය සඳහා මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(11) ප්‍රධාන විධායක නිලධරයාට මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

අධිකාරියෙහි කාර්ය මණ්ඩලය

**109**. (1) මේ පනතේ විධිවිධානවලට යටත් ව, අපරාධයකින් උත්පාදිත දේ කළමනාකරණය කිරීමේ අධිකාරියෙහි බලතල සහ කර්තව්‍ය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා එයට අවශ්‍ය වන යම් නිලධරයන් සහ වෙනත් සේවා නියුක්තකයන් පත් කිරීමට ප්‍රධාන විධායක නිලධරයාට අධිකාරී බලය තිබිය යුතු ය.

(2) කළමනාකාර වගකීම් පවරනු ලබන්නා වූ නිලධරයන් බඳවා ගැනීම, මණ්ඩලය විසින් අනුමත කරන ලද බඳවාගැනීමේ පටිපාටියක් මත පදනම්ව ප්‍රධාන විධායක නිලධරයා විසින් කරනු ලැබිය යුතු අතර, එවැනි සෑම පත් කිරීමක් ම මණ්ඩලය විසින් අනුමත කරනු ලැබිය යුතු ය.

(3) ප්‍රධාන විධායක නිලධරයා විසින් මේ පනතේ විධිවිධානවලට යටත්ව අධිකාරියෙහි නිලධරයන් සහ සේවා නියුක්තකයන් කෙරෙහි විනය පාලනය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මණ්ඩලය විසින් අනුමතය ලබා දී ඇත්නම් මිස, කළමනාකරණ වගකීම් පවරන ලද නිලධරයකු සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ගයක් ප්‍රධාන විධායක නිලධරයා විසින් සිදු නොකළ යුතු ය.

(4) අධිකාරියෙහි නිලධරයන්ගේ සහ සේවා නියුක්තයන්ගේ සේවා නියම සහ කොන්දේසි තීරණය කිරීමට ප්‍රධාන විධායක නිලධරයාට බලය තිබිය යුතු ය:

එසේ වුව ද, කළමනාකරණ වගකීම් පවරන ලද නිලධරයකු සම්බන්ධයෙන් වන නියම සහ කොන්දේසි මණ්ඩලය විසින් ස්ථිර කරනු ලැබිය යුතු ය.

(5) අධිකාරියෙහි සෑම නිලධරයකුම සහ සේවානියුක්තයකු විසින් ම සේවා නියුක්තියෙන් එක් මාසයක් ඇතුළත අධිකාරියෙහි කටයුතු සහ ගනුදෙනු සම්බන්ධයෙන් වන ඔවුන්ගේ ඍජු හෝ වක්‍ර පෞද්ගලික සම්බන්ධතා මෙන්ම ඔවුන්ගේ සමීප ඥාතීන් හෝ එකී නිලධරයාට හෝ සේවානියුක්තයාට සැලකිය යුතු සම්බන්ධතාවක් ඇති කරුණු සම්බන්ධයෙන් අධිකාරිය වෙත ලිඛිතව ප්‍රකාශ කරනු ලැබිය යුතු ය.

අධිකාරිය සඳහා රාජ්‍ය නිලධරයන් පත් කිරීම

**110**. (1) අධිකාරිය විසින් ප්‍රධාන විධායක නිලධරයාගේ නිර්දේශය මත යම් රජයේ නිලධරයකුගේ හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක නිලධරයකුගේ හෝ සේවානියුක්තයකුගේ සේවය, එවැනි රජයේ නිලධරයකුගේ, නිලධරයාගේ හෝ සේවානියුක්තයකුගේ කැමැත්ත සහ ඔහුගේ පත් කිරීමේ අධිකාරියේ කැමැත්ත ඇතිව, අනුයුක්ත කිරීම මත, තාවකාලික හෝ කොන්ත්‍රාත් පදනම මත ලබාගත හැකි ය. ඒ රජයේ නිලධරයාට, නිලධරයාට හෝ සේවානියුක්තයාට ගෙවිය යුතු පාරිශ්‍රමික මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(2) යම් රජයේ නිලධරයකු අධිකාරියෙහි කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක දී -

(අ) ඔහු අධිකාරියෙහි කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවේ දී, රාජ්‍ය සේවයේ ඔහුගේ ස්ථිර තනතුර විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාව යටතේ විශ්‍රාම වැටුප් සහිත වන බවට ප්‍රකාශිත තනතුරක් වුවහොත් -

(i) ඔහු අධිකාරියෙහි සේවානියුක්තව සිටින අතරතුර දී රාජ්‍ය ප්‍රතිපත්තියේ පදනම් මත වැටුප් රහිතව ප්‍රදානය කරන ලද නිවාඩු මත සේවයේ කාර්යයෙන් බැහැරව සිටින බවට සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒ ව්‍යවස්ථාවේ 10(1) වන වගන්තිය ඔහුට අදාළ විය යුතු ය; සහ

(ii) ඔහු සම්බන්ධයෙන් මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි රාජ්‍ය සේවයේ ඔහුගේ ස්ථිර තනතුරේ ඔහුට ගෙවනු ලබන වැටුපෙන් සියයට විසිපහක ප්‍රතිශතයක් නොඉක්මවනු ලබන යම් මුදල් ප්‍රමාණයක් ඔහු අධිකාරියෙහි සේවානියුක්තව සිටින කාලය අතරතුර සම්පූර්ණ කරනු ලබන සෑම මාසයක් සඳහා ම ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා අධිකාරිය විසින් අධිකාරියෙහි අරමුදලින් භාණ්ඩාගාරයට ගෙවනු ලැබිය යුතු ය; සහ

(ආ) අධිකාරියෙහි කාර්ය මණ්ඩලයට ඔහුව තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවේ දී රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත යටතේ පිහිටුවන ලද රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ඔහු දායකයකු වුවහොත්, ඒ ආඥාපනතේ කාර්යය සඳහා අධිකාරිය වෙත කරනු ලබන ඔහුගේ සේවය ආණ්ඩුවට කරනු ලබන සේවයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව අධිකාරියෙහි සේවානියුක්තව සිටින අතරතුර ඔහු විසින් එම ආඥාපනත යටතේ ගෙවීමට යටත් විය හැකි යම් දායක මුදල් ප්‍රමාණයක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට අඛණ්ඩව ගෙවනු ලැබිය යුතු ය. එසේම ඔහු සම්බන්ධයෙන් අධිකාරිය විසින් එක් එක් මුදල් වර්ෂය අවසානයේ දී ආණ්ඩුව විසින් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට යටත්වන යම් දායක මුදල් ප්‍රමාණයකට සමාන මුදලක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ අදාළ ගිණුමට බැර කිරීම

සඳහා අධිකාරියෙහි අරමුදලින් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාට ගෙවනු ලැබිය යුතු ය.

(3) යම් රජයේ නිලධරයකු අධිකාරියෙහි කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලබන අවස්ථාවක දී -

(අ) ඔහු රාජ්‍ය සේවය හැරගිය ලෙස සලකනු ලැබිය යුතු ය;

(ආ) ඔහු අධිකාරියෙහි කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලබන අවස්ථාවේ දී රාජ්‍ය සේවයේ ඔහුගේ ස්ථිර තනතුර විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාව යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක් වුවහොත් -

(i) අධිකාරියෙහි කාර්ය මණ්ඩලයට ඔහුව ස්ථිරවම පත් කරන ලද දිනයේ දී ඔහු රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගොස් තිබුණේ නම්, ඔහුට ලැබිය යුතුව පැවති ආකාරයේ ඒ ව්‍යවස්ථාව යටතේ වන එවැනි යම් ප්‍රදානයකට ඔහු සුදුසුකම් ලැබිය යුතු ය;

(ii) ඒ ව්‍යවස්ථාව යටතේ කරන ලද එවැනි යම් ප්‍රදානයක මුදල් ප්‍රමාණය, අධිකාරියෙහි කාර්ය මණ්ඩලයේ ඔහුගේ සේවානියුක්තිය, වයස හෝ අයහපත් සෞඛ්‍ය මත විශ්‍රාම යාම මගින් හෝ ඒ කාර්ය මණ්ඩලයේ ඔහු විසින් දරන ලද තනතුර අහෝසි කිරීම මගින් හෝ රාජ්‍ය පරිපාලනය විෂයය පවරා ඇති අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද යම් වෙනත් පදනමක් මත නතර කරනු ලබන්නේ නම් මිස ඔහුට නොගෙවිය යුතු ය;

(iii) අධිකාරියෙහි සේවානියුක්තව සිටිය දී ඔහුගේ මරණය සිදුවන අවස්ථාවක දී, අධිකාරියෙහි කාර්ය මණ්ඩලයට ඔහුව ස්ථිරවම පත් කිරීමට පෙරාතුව ම ඔහු මියගොස් තිබුණේ නම්, ඒ ව්‍යවස්ථා යටතේ ඔහු සම්බන්ධයෙන් කළ යුතු ව තිබූ යම් ප්‍රදානයක් ඔහු සම්බන්ධයෙන් කරනු ලැබිය හැකි ය; සහ

(ඇ) අධිකාරියෙහි කාර්ය මණ්ඩලයට ඔහුව ස්ථිරව පත් කරනු ලබන අවස්ථාවේ දී, ඔහු රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත මගින් පිහිටුවන ලද රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායකයකු වුවහොත්, ඔහු විසින් ඒ ආඥාපනතේ කාර්යය සඳහා සේවයෙන් පහ කිරීමක් නොවන අන්‍යාකාරයකින් රජයේ කැමැත්ත ඇතිව ඔහුගේ ගිවිසුම තීරණය කිරීම මත රජයේ සේවය අතහැර ගියා ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) ආණ්ඩුව සමග ගිවිසුමකට එළඹ, සහ එම ගිවිසුම මගින් නිශ්චිත කාලසීමාවක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වී ඇති යම් තැනැත්තකු අධිකාරිය විසින් සේවයේ නියුක්ත කරවනු ලබන අවස්ථාවක දී, එකී තැනැත්තා විසින් අධිකාරිය සඳහා සේවය කළ යම් සේවා කාලයක් එකී ගිවිසුම යටතේ වන බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුව වෙත සේවය කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

අධිකාරිය විසින් වෙනත් සේවක පිරිස්වල සේවාවන් ලබාගත යුතු බව

**111**. මේ පනත මගින් විධිවිධාන සලස්වා ඇති පරිදි හෝ අධිකරණ ආඥාවක් ප්‍රකාර කළ යුතු යයි විධාන කර ඇති අධිකාරියෙහි කර්තව්‍ය නිසි පරිදි ඉටු කිරීම සඳහා, එකී තැනැත්තාගේ සේවාවන් අවශ්‍ය බවට අධිකාරිය සෑහීමට පත්වන්නේ නම්, අධිකාරිය විසින්, ප්‍රධාන විධායක නිලධරයාගේ නිර්දේශය මත, ස්ථිර කාලීන ගිවිසුම් හෝ සැපයිය යුතු නිශ්චිත සේවාවන් සඳහා වන ගිවිසුම් මත වෙනත් යම් තැනැත්තන්ගේ සේවාවන් ලබාගත හැකි ය.

අධිකාරියෙහි අරමුදල්

**112**. (1) පහත දැක්වෙන අරමුදල් අධිකාරිය සතු විය යුතු ය:-

(අ) අධිකාරියෙහි කළමනාකරණ සහ පරිපාලන අරමුදල;

(ආ) අපරාධයකින් උත්පාදිත දේ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා වන අරමුදල.

(2) අධිකාරියෙහි කළමනාකරණ සහ පරිපාලන අරමුදල වෙත-

(අ) අධිකාරියෙහි ප්‍රයෝජනය සඳහා, පාර්ලිමේන්තුව විසින්, කලින් කල, වෙන් කරනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණ;

(ආ) අධිකරණය විසින් අරමුදලට ප්‍රේෂණය කරනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණ; සහ

(ඇ) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත කවර වූ හෝ මූලාශ්‍රයකින් ණය, ප්‍රදාන, ත්‍යාග, රික්තවරණ හෝ පරිත්‍යාග වශයෙන් අධිකාරිය වෙත ලැබිය හැකි සියලු මුදල්,

බැර කරනු ලැබිය යුතු ය.

(3) අපරාධයකින් උත්පාදිත දේ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා වන අරමුදල වෙත:

(අ) අධිකරණ විසින් අරමුදලට ප්‍රේෂණය කරනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණ;

(ආ) අධිකාරියෙහි ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල, වෙන් කරනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණ; සහ

(ඇ) අපරාධයකින් උත්පාදිත දේ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා අධිකාරිය වෙත ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණ,

බැර කරනු ලැබිය යුතු ය.

(4) අධිකාරියෙහි කළමනාකරණ සහ පරිපාලන අරමුදල මගින්-

(අ) අධිකාරියෙහි දෛනික ක්‍රියාකාරිත්වයට අදාළ වියදම් ඇතුළුව අධිකාරියෙහි කර්තව්‍ය ඉටු කිරීම සඳහා වන යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය වන සියලු මුදල් ප්‍රමාණ;

(ආ) මණ්ඩලයට සහ ප්‍රධාන විධායක නිලධරයාට, නිලධරයන්ට සහ සේවා නියුක්තයන්ට සහ කොන්ත්‍රාත් පදනම මත සේවය ලබා ගෙන ඇති වෙනත් තැනැත්තන්ට වැටුප්, දීමනා, වන්දි, ගාස්තු සහ වෙනත් ගෙවීම් කිරීම සඳහා අවශ්‍ය සියලු මුදල්; සහ

(ඇ) මණ්ඩලය විසින් බලය දෙන ලද වෙනත් යම් ගෙවීම්,

ගෙවනු ලැබිය යුතු ය.

(5) අපරාධයකින් උත්පාදිත දේ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා වන අරමුදල මගින්-

(අ) මේ පනත මගින් හෝ වෙනත් යම් ලිඛිත නීතියක් මගින් සහ අධිකරණයක ආඥාවක් මගින් අපරාධයකින් උත්පාදිත දේ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම, සහ එම ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීමට අදාළ නිශ්චිත සේවාවන් සපයා ඇති තැනැත්තන්ට කළ යුතු ගෙවීම් ද ඇතුළුව, ඒ හා සම්බන්ධ කරුණු සම්බන්ධයෙන් අධිකාරිය වෙත පවරා ඇති කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය සියලු මුදල් ප්‍රමාණ;

(ආ) ප්‍රධාන විධායක නිලධරයාගේ නිර්දේශය මත, මණ්ඩලයේ අනුමතය ඇතිව, අධිකාරියෙහි කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වාර්ෂික වියදමෙන් සියයට විසිපහක් නොඉක්ම විය යුතු මුදල් ප්‍රමාණයක්; සහ

(ඇ) (i) නම් කරන ලද නිලධරයන් සහ විමර්ශන නිලධරයන්ට පුහුණුව ලබා දීම;

(ii) මේ පනතේ පරමාර්ථ සහ කර්තව්‍ය සාක්ෂාත් කර ගැනීම සඳහා වෘත්තීය සේවාවන් සපයන නීති නිලධරයන්ට සහ වෙනත් නීතිඥවරුන්ට පුහුණුව ලබා දීම;

(iii) අපරාධයකින් උත්පාදිත දේ සොයා ගැනීම, සෝදිසි කිරීම, හඳුනා ගැනීම සහ පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය විය හැකි උපකරණ සහ වැඩසටහන් සපයා ගැනීම;

(iv) මුදල් ප්‍රවාහ සොයා ගැනීම, මුදල් විශ්ලේෂණය සහ අපරාධයකින් උත්පාදිත දේ සොයා ගැනීම සිදු කිරීමේ කාර්යය සඳහා නම් කරන ලද නිලධරයන් විසින් කොන්ත්‍රාත් දෙනු ලැබිය හැකි විශේෂඥයන්ට ගෙවිය යුතු වෘත්තීය ගාස්තු ගෙවීම;

(v) මේ පනතේ විධිවිධාන සම්බන්ධයෙන් දැනුවත්භාවය ඇති කිරීම සඳහා අවශ්‍ය වැඩසටහන්;

(vi) අපරාධයකින් උත්පාදිත දේ සාර්ථකව රජය සතු කිරීමෙන් පසු, පොලිස්පතිවරයා විසින් සාදනු ලබන පටිපාටියකට අනුව විමර්ශන නිලධරයන් වෙත, විමර්ශනය පැවැත්වීමට සහාය දක්වන ලද වෙනත් තැනැත්තන් වෙත සහ තොරතුරු සපයන්නන් වෙත ත්‍යාග මුදල් ගෙවීම වෙනුවෙන් භාවිත කිරීම පිණිස (53 වන අධිකාරය වූ) පොලිස් ආඥාපනතේ 73 වන වගන්තිය යටතේ පිහිටුවන ලද පොලිස් ත්‍යාග අරමුදලට බැර කිරීම; සහ

(vii) අපරාධයකින් උත්පාදිත දේ සාර්ථකව රජය සතු කිරීමෙන් පසු, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් සාදනු ලබන

පටිපාටියකට අනුව විමර්ශන නිලධරයන් වෙත, විමර්ශන පැවැත්වීමට සහාය දක්වන තැනැත්තන් වෙත සහ තොරතුරු සපයන්නන් වෙත ත්‍යාග මුදල් ගෙවීම වෙනුවෙන් භාවිත කිරීම පිණිස, එකී කොමිෂන් සභාව විසින් පිහිටුවනු ලබන ත්‍යාග අරමුදලකට බැර කිරීම සඳහා අවශ්‍ය මුදල් ඇතුළුව මණ්ඩලය විසින් බලය දෙන ලද වෙනත් යම් ගෙවීම් ගෙවනු ලැබිය යුතු ය.

(6) අධිකාරිය වෙත ණය මුදල්, ප්‍රදාන, ත්‍යාග, රික්තවරණ හෝ පරිත්‍යාග වශයෙන් යම් මුදලක් ලැබෙන අවස්ථාවක දී, එම ණය මුදල්, ප්‍රදාන, ත්‍යාග, රික්තවරණ හෝ ප්‍රදාන ලැබෙන මූලාශ්‍රය සහ ඒවායේ අරමුණ, එම මුදල් ලැබීමේ දින සිට මාස එකක කාලයක් ඇතුළත අධිකාරියෙහි නිල වෙබ් අඩවියෙහි එම මුදල් ලැබීම් පළකිරීම මගින් ප්‍රසිද්ධියට පත් කරනු ලැබිය යුතු ය.

(7) ප්‍රධාන විධායක නිලධරයා විසින්, මණ්ඩලයේ අනුමතය ඇතිව, අධිකාරියෙහි කළමනාකරණ සහ පරිපාලන අරමුදල සහ අපරාධයකින් උත්පාදිත දේ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා වන අරමුදල මගින් මුදල් ආයෝජනය කිරීම, කළමනාකරණය කිරීම සහ ගෙවීම සම්බන්ධයෙන් සැලසුම් සහ අදාළ මාර්ගෝපදේශ සාදනු ලැබිය යුතු ය.

(8) අධිකාරියෙහි වාර්ෂික වාර්තාවේ අධිකාරිය වෙත ලැබුණු සියලු මුදල් සහ අරමුදල්වල මූලාශ්‍ර ද ඇතුළත් විය යුතු වාර්ෂික විගණනය කරන ලද ගිණුම් වාර්තාව ද ඇතුළත් විය යුතු ය.

අධිකාරියෙහි මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය

**113**. (1) අධිකාරියෙහි මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) ප්‍රධාන විධායක නිලධරයා විසින්, අධිකාරියෙහි ආදායම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනුවල

නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය සම්බන්ධයෙන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන අධිකාරියෙහි ගිණුම් විගණනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) ප්‍රධාන විධායක නිලධරයා විසින්, මණ්ඩලය මාර්ගයෙන්, එක් එක් මුදල් වර්ෂය අවසානයේ සිට මාස තුනක් ඇතුළත, ඒ මුදල් වර්ෂය තුළ අධිකාරිය විසින් සිදු කරන ලද කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාවක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඒ වර්ෂයට අදාළ පහත දැක්වෙන එක් එක් ලේඛනයේ පිටපතක් එම වාර්තාවට ඇමිණීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය:-

(අ) විගණකාධිපතිවරයාගේ වාර්තාව ද සමග, වර්ෂය සඳහා වන අධිකාරියෙහි විගණනය කරන ලද ගිණුම්;

(ආ) එම වාර්තාව සහ ගිණුම් අදාළ වන වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන වර්ෂය සඳහා වන යෝජිත කටයුතු පිළිබඳ වාර්තාවක්.

(5) අමාත්‍යවරයා විසින්, එම වාර්තාව සහ ලේඛන, ඒවා ලැබීමෙන් මාස දෙකක් ඇතුළත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර එම වාර්තාව සහ ලේඛන රාජ්‍ය භාෂාවලින් අධිකාරියේ නිල වෙබ් අඩවියේ ප්‍රසිද්ධියට පළ කරනු ලැබිය යුතු ය.

නඩු සහ නඩුකරවලින් ආරක්ෂාව

**114**. මේ පනත හෝ ඒ යටතේ නිකුත් කරන ලද හෝ සාදන ලද යම් නියෝගයක්, රීතියක්, නියමයක් හෝ විධානයක් යටතේ වන තම බැඳියාව ඉටු කිරීමේ දී හෝ ඉටු කිරීමට අදහස් කිරීමේ දී හෝ ඊට අදාළව තමා විසින් නිසි උද්යෝගයෙන් සහ සාධාරණ සැලකිල්ලෙන් කටයුතු කළ බවට ද, සද්භාවයෙන් ක්‍රියා කළ

බවට ද ඔහු විසින් ඔප්පු කරනු ලබන්නේ නම්, එය -

(අ) මණ්ඩලයේ සාමාජිකයකු;

(ආ) අධිකාරියෙහි ප්‍රධාන විධායක නිලධරයා, නිලධරයකු හෝ යම් සේවානියුක්තයකු,

විසින් කරන ලද හෝ නොකර හරින ලද යමක් සම්බන්ධයෙන් යම් අපරාධ හෝ සිවිල් නඩු කටයුත්තක දී විත්තිවාචකයක් විය යුතු ය.

දරන ලද වියදම් අධිකාරියෙහි කළමනාකරණ සහ පරිපාලන අරමුදල මගින් ගෙවිය යුතු බව

**115**. අධිකාරිය විසින් හෝ මේ පනත යටතේ හෝ අධිකාරියෙහි විධානය යටතේ යම් තැනැත්තකු විසින් නිල තත්වයෙන් සිදු කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් අධිකාරිය හෝ එම තැනැත්තාට විරුද්ධව යම් අධිකරණයක පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී එම ක්‍රියාව සද්භාවයෙන් කර ඇති බවට අධිකරණය තීරණය කරනු ලබන්නේ නම්, මණ්ඩලයේ සාමාජිකයකු හෝ අධිකාරියෙහි වෙනත් යම් නිලධරයකු හෝ සේවානියුක්තයකු හෝ අනුයෝජිතයකු හෝ වෙනත් යම් හිටපු සාමාජිකයකු, නිලධරයකු, සේවානියුක්තයකු හෝ අනුයෝජිතයකු විසින් දරන ලද යම් වියදමක්, අධිකාරියෙහි කළමනාකරණ සහ පරිපාලන අරමුදල මගින් ගෙවනු ලැබිය යුතු ය.

අධිකාරියෙහි සාමාජිකයන් ආදිය රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව

**116**. (1) අධිකාරියෙහි සාමාජිකයන්, අධිකාරියෙහි ප්‍රධාන විධායක නිලධරයා සහ නිලධරයන් සහ සේවානියුක්තයන් සහ කොන්ත්‍රාත් පදනම මත සේවාවන් ලබා ගෙන ඇත්තේ යම් තැනැත්තකුගෙන් ද, එවැනි වෙනත් යම් තැනැත්තකු දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) අධිකාරිය දූෂණ විරෝධී පනතේ කාර්ය සඳහා උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

## VI වන කොටස

## ක්‍රියා විරහිත කරන ලද අපරාධයකින් උත්පාදිත දේ රජය සතු කිරීම සහ ඒ හා සම්බන්ධ නඩු කටයුතු

වරදකරු කිරීමෙන් පසුව රජය සතු කිරීම පිළිබඳ සාමාන්‍ය විධිවිධාන

**117.** (1) නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සිදු කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කර, අදාළ නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සිදු කිරීම සම්බන්ධයෙන් සැකකාර අපරාධකරුට විරුද්ධව අපරාධ නඩු පවරා එම නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කිරීම සම්බන්ධයෙන් ඔහු වරදකරු කරනු ලැබ ඇති අවස්ථාවක -

(අ) ක්‍රියා විරහිත කර ඇති එකී නීතිවිරෝධී ක්‍රියාකාරකම මගින් උත්පාදිත දේ රජය සතු කිරීම; හෝ

(ආ) අපරාධයකින් උත්පාදිත දෙයෙහි අනුරූපී වටිනාකම අයකර ගෙන රජය සතු කිරීම,

සඳහා වරදකරු කිරීමෙන් පසුව රජය සතු කිරීමේ නඩු කටයුතු යනුවෙන් හඳුන්වනු ලබන නඩු කටයුතු පවරනු ලැබිය හැකි ය.

(2) එම නඩු කටයුතු -

(අ) අදාළ අපරාධයකින් උත්පාදිත දෙය උත්පාදනය කළ නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කිරීම සම්බන්ධයෙන් වරදකරු කර ඇති තැනැත්තා හෝ එම අපරාධයකින් උත්පාදිත දෙයෙහි අනුරූපී වටිනාකමෙන් යුත් දේපළෙහි සන්තකය, පාලනය හෝ ආධිපත්‍යය දරන තැනැත්තාට; හෝ

(ආ) අදාළ අපරාධයකින් උත්පාදිත දේ සොයා ගනු ලැබූවේ වෙනත් යම් තැනැත්තකුගෙන් ද, එම වෙනත් යම් තැනැත්තාට,

විරුද්ධව පවරනු ලැබිය යුතු ය.

(3) වරදකරු කිරීමෙන් පසු රජය සතු කිරීමේ නඩු කටයුතු යටතේ වන රජය සතු කිරීමේ නඩු කටයුතු වරදකරු අනුරූපී නීතිවිරෝධී ක්‍රියාකාරකම සම්බන්ධයෙන් වරදකරු කිරීමෙන් පසු ආරම්භ කළ යුතු අතර, එම වරදකරු කිරීමට විරුද්ධව යම් අභියාචනයක් වෙතොත්, අභියාචනයේ තීරණය ලැබෙන තෙක් බලා සිටිය යුතු නොවන්නේ ය:

එසේ වුව ද, අභියාචනයක් ගොනු කර ඇත්තා වූ ද, වරදකරු කිරීමෙන් පසු රජය සතු කිරීමේ නඩු කටයුතුවලින් පසු දේපළ රජය සතු කර ඇත්තා වූ ද අවස්ථාවක, අභියාචනය සම්බන්ධයෙන් තීරණයක් ලබා දෙන තෙක් රජය සතු කිරීමේ ආඥාව ක්‍රියාත්මක කරනු නොලැබිය යුතු අතර, අභියාචනයේ දී වරදකරු කිරීම ස්ථිර කරනු ලැබුවහොත් පමණක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය:

එසේ ම තවදුරටත්,

(අ) නඩු විභාගයෙන් චූදිතයා වරදකරු කරනු නොලැබූ අවස්ථාවක; හෝ

(ආ) වරදකරු කිරීමට එරෙහි අභියාචනය සාර්ථක වී, වරදකරු කිරීම ඉවතලනු ලැබූ අවස්ථාවක,

නීතිපතිවරයා විසින්, අපරාධයකින් උත්පාදිත දෙයක් බවට විශ්වාස කරන දේපළ සම්බන්ධයෙන් හෝ එම අපරාධයකින් උත්පාදිත දෙයෙහි වටිනාකමට අනුරූපී දේපළ සම්බන්ධයෙන් වරදකරු නොකිරීම මත පදනම් වූ රජය සතු කිරීමේ නඩු කටයුතු ආරම්භ කරනු ලැබිය හැකි ය.

අපරාධයකින් උත්පාදිත දෙයෙහි වටිනාකමට සමාන දණ්ඩනයක්

**118**. (1) යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සිදු කිරීම සම්බන්ධයෙන් යම් තැනැත්තකු වරදකරු කිරීමෙන් පසු, එම තැනැත්තා වරදකරු කරනු ලැබූ අධිකරණය, අදාළ නීතියෙහි එම නීතිවිරෝධී ක්‍රියාකාරකම සඳහා නියම කර ඇති දඬුවමට අමතරව, නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කළ අවස්ථාවේ දී

ව්‍යුත්පන්න වූ අපරාධයකින් උත්පාදිත දෙයෙහි වටිනාකමට සහ එම අපරාධයකින් උත්පාදිත දෙය උපයෝගී කර ගැනීමෙන් ව්‍යුත්පන්න වූ යම් වටිනාකමට සමාන දණ්ඩනයක් නියම කිරීමට හිමිකම් ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කරන ලද්දේ නම්, ඉහත විධිවිධාන සලස්වා ඇති පරිදි දණ්ඩනයක් ගෙවීම සඳහා ආඥාවක් කරනු නොලැබිය යුතු ය:

එසේ ම තවදුරටත්, එකී නීතිවිරෝධී ක්‍රියාකාරකම මගින් උත්පාදිත දේ හෝ එකී අපරාධයකින් උත්පාදිත දේ හි අනුරූපී වටිනාකමට අදාළ දේපළක් මේ පනත ප්‍රකාරව තහනමට ගෙන හෝ ක්‍රියාවිරහිත කරනු ලැබ ඇත්නම් හෝ අන්‍යාකාරයකින් මේ පනත ප්‍රකාරව රජය සතු කිරීමේ නඩු කටයුතුවලට යටත් කිරීමට තිබෙන්නේ නම්, ඉහත විධිවිධාන සලස්වා ඇති පරිදි දණ්ඩනයක් ගෙවීම සඳහා ආඥාවක් කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාරව පනවන ලද දණ්ඩනයක් අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අන්තර්ගත දඩ මුදල් අය කර ගැනීමට අදාළ අය කර ගැනීමේ නඩු කටයුතුවල ආකාරයෙන් අය කර ගනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද නීතිවිරෝධී ක්‍රියාකාරකම කිරීම හේතුවෙන් ව්‍යුත්පන්න වූ අපරාධයකින් උත්පාදිත දේ යම් තැනැත්තකුගේ පුද්ගලික දේපළක් වූයේ නම් සහ වගන්තියේ නිශ්චිතව දක්වන ලද දණ්ඩනය වරදකරු කරනු ලැබූ තැනැත්තා විසින් ගෙවන ලද්දේ නම්, අධිකරණය විසින්, අපරාධයකින් උත්පාදිත දේ සඳහා හිමිකම් ලබන එකී තැනැත්තා වෙත ගෙවන ලද මුදල මුදා හැරීම සඳහා ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි දණ්ඩනය වරදකරු කරනු ලැබූ තැනැත්තා විසින් සම්පූර්ණයෙන් ම ගෙවන ලද්දේ නම්, අදාළ අපරාධයකින් උත්පාදිත දේ, වරදකරු කරනු ලැබීමෙන් පසුව රජය සතු කිරීම සඳහා නඩු පැවරීමට නීතිපතිවරයා හිමිකම් නොලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි දණ්ඩනය වරදකරු කරනු ලැබූ තැනැත්තා විසින් සම්පූර්ණයෙන් ම නොගෙවන ලද්දේ නම්, නොගෙවා ඇති ඉතිරි මුදල සම්බන්ධයෙන් අදාළ අපරාධයකින් උත්පාදිත දේ, වරදකරු කරනු ලැබීමෙන් පසුව රජය සතු කිරීම සඳහා නඩු පැවරීමට නීතිපතිවරයා හිමිකම් ලැබිය යුතු ය.

වරදකරු කරනු ලැබීමෙන් පසුව රජය සතු කිරීම සඳහා නීතිපතිවරයා විසින් නඩු පවරනු ලැබිය යුතු බව

**119**. (1) නඩුව විභාගය කරන ලද අධිකරණයෙන්, නීතිවිරෝධී ක්‍රියාකාරකමක් කිරීම සඳහා යම් තැනැත්තකු වරදකරු කරනු ලැබීමෙන් පසුව සහ, එකී නීතිවිරෝධී ක්‍රියාකාරකම කිරීම හේතුවෙන් ව්‍යුත්පන්න වූ අපරාධයකින් උත්පාදිත දේ බවට විශ්වාස කරන දේපළ හෝ එකී අපරාධයකින් උත්පාදිත දේ හි අනුරූපී වටිනාකමට අදාළ දේපළ හඳුනාගෙන තිබේ නම් වරදකාර චූදිතයා විසින් එකී වරදකරු කරනු ලැබීමට එරෙහිව අභියාචනයක් ගොනු කර තිබුණ ද ඒ බව නොතකා, චූදිතයා වරදකරු කර දණ්ඩන නියම කරනු ලැබීමේ දිනයේ සිට මාස තුනක් ඇතුළත නීතිපතිවරයා විසින් -

(අ) (i) එකී අපරාධයකින් උත්පාදිත දේ;

(ii) එකී අපරාධයකින් උත්පාදිත දේ හි අනුරූපී වටිනාකමට අදාළ දේපළ;

(iii) අපරාධයකින් උත්පාදිත දේ අධිකරණමය ක්‍රියා විරහිත කිරීමට පසුව එය මුදා හැරීමට හිලව් වශයෙන් අධිකරණයට ඉදිරිපත් කරනු ලබන ඇපය; හෝ

(iv) රජය සතු කිරීමේ නඩු කටයුතු විභාග වීමට පෙරාතුව අපරාධයකින් උත්පාදිත දේ බැහැර කිරීමෙන් උපයා ගන්නා ලද මුදල්,

රජය සතු කිරීම සඳහා; සහ

(ආ) එකී අපරාධයකින් උත්පාදිත දේ, එකී අපරාධයකින් උත්පාදිත දේ හි අනුරූපී වටිනාකමට අදාළ දේපළ, ඇපය හෝ අපරාධයකින් උත්පාදිත දේ බැහැර කිරීමෙන් උත්පාදිත දේ නීතිවිරෝධී ක්‍රියාකාරකමෙහි අදාළ වින්දිතයකු සිටින්නේ නම්, එම වින්දිතයාට මුදා හරින ලෙසට විධානයක් කිරීම සඳහා,

මේ පනත යටතේ එම අධිකරණය විසින් පරීක්ෂණයක් පවත්වන ලෙස ඉල්ලා සිටිමින් අදාළ නඩු විභාග අධිකරණයේ නඩු පවරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, චූදිතයා වරදකරු කිරීමෙන් පසුව, දණ්ඩනය නියම කිරීමේ දී නඩු විභාග අධිකරණය විසින් අදාළ අපරාධයකින් උත්පාදිත දේ හි වටිනාකමට නොඅඩු මුදලක දණ්ඩනයක් අදාළ නීතිය යටතේ වරදකාර චූදිතයාට පනවා ඇත්නම්, අපරාධයකින් උත්පාදිත දේ, වරදකරු කරනු ලැබීමෙන් පසුව රජය සතු කිරීම සඳහා මේ පනත යටතේ නඩු පැවරීමට නීතිපතිවරයා හිමිකම් නොලැබිය යුතු ය:

එසේ ම තවදුරටත්, අදාළ අපරාධයකින් උත්පාදිත දේ ද්විතීයික හෝ අඛණ්ඩ ආදායම් හෝ දේපළ ජනිත කරවීමට හැකි ස්වභාවයෙන් වන බවට අධිකරණය තීරණය කරනු ලබන්නේ නම්, අපරාධයකින් උත්පාදිත දේ වරදකරු කිරීමෙන් පසුව රජය සතු කිරීම සඳහා නීතිපතිවරයා විසින් නඩු පැවරිය යුතු ය.

(2) නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සිදු කර තිබීම සඳහා යම් තැනැත්තකු වරදකරු කර ඇති නඩු විභාග අධිකරණයට (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද ඉල්ලීමක් භාර ගැනීමට සහ මෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි පහත දැක්වෙන පරීක්ෂණ පැවැත්වීමෙන් පසුව -

(අ) (i) එකී අපරාධයකින් උත්පාදිත දේ;

(ii) එකී අපරාධයකින් උත්පාදිත දේ හි අනුරූපී වටිනාකමට අදාළ දේපළ;

(iii) අපරාධයකින් උත්පාදිත දේ අධිකරණමය ක්‍රියා විරහිත කිරීමට පසුව එය මුදා හැරීමට හිලව් වශයෙන් අධිකරණයට ඉදිරිපත් කරනු ලබන ඇපය; හෝ

(iv) රජය සතු කිරීමට පෙර අපරාධයකින් උත්පාදිත දේ බැහැර කිරීමෙන් ජනිත වූ දේ,

රජය සතු කිරීම සඳහා ආඥා කිරීමට; හෝ

(ආ) එකී අපරාධයකින් උත්පාදිත දේ, එකී අපරාධයකින් උත්පාදිත දේ හි අනුරූපී වටිනාකමට අදාළ දේපළ, ඇපය හෝ අපරාධයකින් උත්පාදිත දේ බැහැර කිරීමෙන් උපයා ගනු ලැබූ දේ, නීතිවිරෝධී ක්‍රියාකාරකමෙහි අදාළ වින්දිතයකු සිටින්නේ නම්, එම වින්දිතයා වෙත මුදා හරින ලෙසට විධානයක් කිරීම සඳහා,

අධිකරණ බලය තිබිය යුතු ය.

නඩු පැවරීමේ ආකාරය

**120**. (1) 119 වන වගන්තිය ප්‍රකාරව නඩු පැවරීම, නිසි පරිදි සහතික කරන ලද අවශ්‍ය තහවුරු කිරීමේ සාක්ෂි සමඟ පෙත්සමක් සහ දිවුරුම් ප්‍රකාශයක් ගොනු කිරීම මගින් සිදු කරනු ලැබිය යුතු ය. වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, දිවුරුම් ප්‍රකාශය මගින් ප්‍රතිඥා දීම හෝ දිවුරුම් දෙනු ලැබීම පෙත්සමේ අන්තර්ගත ප්‍රකාශ හොඳින් දන්නා තැනැත්තකු විසින් සිදු කරනු ලැබිය යුතු ය.

(2) අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 192 වන හෝ 241 වන වගන්ති යටතේ කරන ලද ආඥාවකින් පසුව චූදිතයාට එරෙහි නඩු විභාගය ආරම්භ කර චූදිතයා නොමැතිව එය පවත්වනු ලැබ තිබුණ ද, මේ පනතේ මේ කොටස ප්‍රකාරව නඩු පැවරීමට නීතිපතිවරයා හිමිකම් ලැබිය යුතු ය.

(3) නඩු විභාගය අතරතුර සැඟව සිට ඇති වරදකරු වූ චූදිතයකු විසින් නඩු විභාගය සඳහා අධිකරණය ඉදිරියේ පෙනී සිට තමා නඩුවට ඉදිරිපත් නොවීම පිළිබඳ නිදහසට කරුණු කියා සිට නඩු විභාගයට ඔහුගේ නොපැමිණීම -

(අ) ඔහු නඩු විභාගය පිළිබඳව දැනුම්වත් නොවීම; හෝ

(ආ) ඔහුගේ පාලනයෙන් තොර වූ හේතු,

නිසාවෙන් සිදු වූ බව, සනාථ කරනු ලැබුවේ නම් මිස, ඔහු විසින් පරීක්ෂණයේ විෂයගත කාරණාව වන දේපළ මුදා හැරීම සඳහා හිමිකම්පෑමක් ඉදිරිපත් කිරීමට හෝ මේ පනතේ මේ කොටස යටතේ නඩු කටයුතුවලට සහභාගී වීමට හිමිකම් නොලැබිය යුතු ය.

(4) වරදකාර චූදිතයා මිය යාම නොතකා, මේ කොටස යටතේ නඩු පැවරීමට නීතිපතිවරයා හිමිකම් ලැබිය යුතු ය:

එසේ වුව ද, වරදකරු කරනු ලැබූ මියගිය චූදිතයාගේ අවස්ථාවෝචිත පරිදි උරුමක්කරු, අද්මිනිස්ත්‍රාසිකරු හෝ පොල්ම:කරු සිටින්නේ නම්, නීතිපතිවරයා විසින් ඔවුන්ගෙන් කිසිවකු හෝ වගඋත්තරකරු ලෙස සඳහන් කළ යුතු ය.

(5) නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කිරීම සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ තැනැත්තා වගඋත්තරකරු ලෙස සඳහන් කරනු ලැබිය යුතු ය. එකී දේපළ තහනමට ගන්නා ලද්දේ යම් තැනැත්තකුගේ සන්තකයෙන් හෝ පාලනයෙන් ද එම වෙනත් යම් තැනැත්තා සහ දේපළ අධිකරණමය ක්‍රියා විරහිත කිරීම සඳහා වන නඩු කටයුත්තක් පවත්වන අතරතුර දී එකී දේපළ සම්බන්ධයෙන් හිමිකම්පෑමක් ඉදිරිපත් කරන අපරාධයේ වින්දිතයා ද ඇතුළුව වෙනත් යම් පාර්ශ්වයක් වගඋත්තරකරුවන් ලෙස සඳහන් කරනු ලැබිය යුතු ය.

නඩු පිළිබඳ දැන්වීම

**121**. වරදකරු කිරීමෙන් පසුව රජය සතු කිරීම සඳහා නඩු ගොනු කිරීමෙන් පසුව, අධිකරණය විසින් -

(අ) අධිකරණය විසින් නියම කරනු ලබන ආකෘතියෙන් සහ ආකාරයෙන් දැන්වීමක් පළ කිරීම;

(ආ) නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කිරීම හේතුවෙන් අපරාධයකින් උත්පාදිත දේ අහිමි වී ඇති යම් අපරාධයේ වින්දිතයකු වෙත දැන්වීම ද සමඟ ඉල්ලීමේ පිටපතක් භාර දීම;

(ඇ) ප්‍රස්තුත දේපළ රජය සතු කරනු නොලැබිය යුත්තේ කුමක් හේතුවෙන් ද යන්න සඳහා හේතු තිබේ නම්, හේතු දක්වන ලෙසට, වරදකාර වූදිතයා සහ දේපළ සම්බන්ධයෙන් හිමිකම් පෑමක් ඉදිරිපත් කර ඇති වෙනත් යම් තැනැත්තන් ද කැඳවමින් දැන්වීමක් ද සමඟ සහ එකී හේතු දැක්වීම අධිකරණයට ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ කවර දිනයකට පෙර ද යන්න එකී තැනැත්තාට දන්වමින් එකී තැනැත්තන් වෙත ඉල්ලීම භාර දීම; සහ

(ඈ) දැන්වීමේ පිටපතක් අධිකාරිය වෙත සහ සිටී නම් අදාළ දේපළ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා අධිකරණය විසින් පත් කරන ලද ප්‍රතිග්‍රාහකයා හෝ විශේෂ කළමනාකරු වෙත දැන්වීමේ පිටපතක් භාර දීම,

සඳහා නීතිපතිවරයාට විධාන කළ යුතු ය.

විරෝධතා ප්‍රකාශ

**122.**(1) නඩුවට වගඋත්තරකරුවකු වන යම් පාර්ශ්වයක් හෝ අපරාධයේ වින්දිතයකු සිටින්නේ නම් ඒ අපරාධයේ වින්දිතයා ඇතුළුව රාජසන්තක කිරීමට අපේක්ෂා කරන දේපළ සඳහා හිමිකම් පෑමට නෛතික හිමිකමක් ඇති වෙනත් යම් පාර්ශ්වයක් -

(අ) දේපළ රජය සතු කරනු නොලැබිය යුතු; සහ

(ආ) එකී දේපළ අදාළ හිමිකම්පාන්නා වෙත මුදා හරිනු ලැබිය යුතු බවට,

අධිකරණය සෑහීමට පත් කිරීමේ කාර්ය සඳහා දිවුරුම් ප්‍රකාශයක් සහ නිසි පරිදි සහතික කරන ලද තහවුරු කිරීමේ සාක්ෂි ද සමඟ 121 වන වගන්තියේ සඳහන් දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත, විරෝධතා ප්‍රකාශයක් ගොනු කිරීම සඳහා හිමිකම් ලැබිය යුතු ය.

(2) වගඋත්තරකරුවන් හෝ හිමිකම්පාන්නන් එක් අයකු හෝ ඊට වැඩි ගණනක් විසින් විරෝධතා ප්‍රකාශ ගොනු කරන අවස්ථාවක දී, වෙනත් යම් තහවුරු කිරීමේ සාක්ෂි ද සමඟ ප්‍රතිවිරෝධතා ගොනු කිරීමට පෙත්සම්කරු හිමිකම් ලැබිය යුතු ය.

**123**. (1) මේ පනතේ මේ කොටස ප්‍රකාරව වන පරීක්ෂණයක්, දිවුරුම් ප්‍රකාශ සහ ලේඛනමය සාක්ෂි පරීක්ෂා කිරීමෙන් පසුව පවත්වනු ලැබිය යුතු ය: පරීක්ෂණය

එසේ වුව ද, වාර්තා කරනු ලැබිය යුතු හේතු මත, අධිකරණය විසින්, විශේෂ අවස්ථානුගත කරුණුවල දී, වාචික සහ ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කිරීමට අවසර දෙනු ලැබිය හැකි වන අතර, එහි දී සාක්ෂි ආඥාපනතේ අන්තර්ගත වන පරිදි සාක්ෂිකරුවන් පරීක්ෂා කිරීමට සහ ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කිරීමට අදාළ රීති අදාළ විය යුතු ය.

(2) ඉහත සඳහන් කරන දේ ගොනු කිරීමෙන් පසුව, අධිකරණය විසින් ඒ කාරණය සම්බන්ධව පරීක්ෂණයක් සිදු කළ යුතු ය. ඉල්ලීමක් ගොනු කරනු ලැබ ඇත්තේ යම් දේපළක් සම්බන්ධයෙන් ද, එකී දේපළ යම් තැනැත්තකු වරදකට වරදකරු කරනු ලැබ ඇත්තේ යම් වරදකට ද, ඒ වරද සිදු කිරීමෙන් උපයා ගන්නා ලද අපරාධයකින් උත්පාදිත දෙයක් වන බවට අධිකරණය සෑහීමකට පත් වන පරිදි නීතිපතිවරයා විසින් බැලූබැල්මට

පෙනෙන නඩුකරයක් ඉදිරිපත් කර ඇත්තේ ද යන්න අධිකරණය විසින් මුලින් ම සලකා බැලිය යුතු ය. එකී නිගමනයට එළඹීමේ කාර්ය සඳහා, අධිකරණය විසින්-

(අ) නඩු විභාගය අතරතුර අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද සාක්ෂි;

(ආ) සාක්ෂි ආඥාපනතේ 25 වන සහ 26 වන වගන්තිවල සහ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 110 වන වගන්තියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, වරදකරු කරනු ලැබූ තැනැත්තා විසින් කරන ලද ප්‍රකාශ ඇතුළුව නිතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කිරීම පිළිබඳ විමර්ශනය කිරීමේ දී වාර්තාගත කරන ලද ප්‍රකාශ ඇතුළුව විමර්ශනවල සටහන්;

(ඇ) නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කිරීම සඳහා චූදිතයා වරදකරු කරනු ලැබූ නඩු විභාග අධිකරණය විසින් ප්‍රකාශ කරන ලද නඩු තීන්දුව; සහ

(ඈ) යුක්තිය උදෙසා සලකා බැලීම අවශ්‍ය යයි අධිකරණය විසින් සලකනු ලබන වෙනත් යම් සාක්ෂි,

සලකා බැලිය හැකි ය.

(3) පරීක්ෂණයෙන් පසුව, නීතිපතිවරයා විසින් බැලූබැල්මට පෙනෙන නඩුකරයක් ඉදිරිපත් කර ඇති බවට අධිකරණය සෑහීමට පත් වන්නේ නම්, අධිකරණය විසින්, නීතිපතිවරයාගේ ඉල්ලීමට අවසර නොදිය යුත්තේ කුමක් හේතුවෙන් ද යන්න සහ ඒ අනුව දේපළ රජය සතු කරනු නොලැබිය යුත්තේ කුමක් හේතුවෙන් ද යන්න සඳහා හේතු දැක්වීම සඳහා වගඋත්තරකරුවන් කැඳවිය යුතු ය.

(4) නීතිපතිවරයා විසින් බැලූබැල්මට පෙනෙන නඩුකරයක් ඉදිරිපත් කර ඇති බවට අධිකරණය සෑහීමට පත් නොවන්නේ නම්, අධිකරණය විසින්, හේතු දක්වීම සඳහා වගඋත්තරකරුවන් කැඳවීමෙන් තොරව ඉල්ලීම නිෂ්ප්‍රභ කළ යුතු අතර, මේ පනත ප්‍රකාරව අදාළ දේපළ සම්බන්ධයෙන් කලින් කරන ලද අධිකරණමය ක්‍රියා විරහිත කිරීමේ ආඥාවක් තිබේ නම්, එකී ආඥාව අවලංගු කරමින් ආඥාවක් කළ යුතු ය. අධිකරණය විසින්, දේපළට හිමිකම් කියනු ලබන පාර්ශ්වය වෙත එම දේපළ මුදා හැරීම සඳහා ද සුදුසු ආඥාවක් කළ යුතු ය.

(5) වගඋත්තරකරුවන් විසින් හේතු දක්වන්නේ නම්, අධිකරණය විසින්, ඒ කාරණය සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණයක් පැවැත්විය යුතු ය.

(6) පරීක්ෂණයෙන් පසුව, රජය සතු කිරීම සඳහා ඉල්ලීමක් ගොනු කරනු ලැබ ඇත්තේ යම් දේපළක් සම්බන්ධයෙන් ද එම දේපළ -

(අ) අපරාධයකින් උත්පාදිත දේ බවට;

(ආ) අපරාධයකින් උත්පාදිත දේ හි අනුරූපී වටිනාකමට අදාළ දේපළක් බවට; හෝ

(ඇ) එකී දේපළෙහි සන්තකය ගැනීමට නෛතික හිමිකමක් ඇති නීතිවිරෝධී ක්‍රියාකාරකමේ කිසිදු වින්දිතයකු හෝ හිමිකම්පාන්නකු නැති බවට,

ශක්‍යතා වැඩිබර මත අධිකරණය සෑහීමට පත් වන්නේ නම්, අධිකරණය විසින්, එකී ඉල්ලීමට සම්බන්ධ දේපළ, තැන්පත් කරන ලද ඇපය හෝ නඩු විභාගය හෝ රාජසන්තක කිරීමේ නඩු කටයුතු බලාපොරොත්තුවෙන් සිටිය දී දේපළ බැහැර කිරීම මගින් උත්පාදිත දේ රජය සතු කිරීම සඳහා ආඥා කරනු ලැබිය යුතු ය.

(7) පරීක්ෂණයෙන් පසුව, නඩු කටයුතු පවරනු ලැබ ඇත්තේ යම් දේපළක් සම්බන්ධයෙන් ද එම දේපළ සඳහා නඩුවේ වගඋත්තරකරුට හෝ හිමිකම්පාන්නාට නෛතික හිමිකමක් ඇති

බවට ශක්‍යතා වැඩිබර මත අධිකරණය සෑහීමට පත් වන්නේ නම්, අධිකරණය විසින් එම දේපළ හෝ එහි වටිනාකම එකී පාර්ශ්වය වෙත මුදා හැරීම සඳහා ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(8) (අ) ඉල්ලීම නිෂ්ප්‍රභ කිරීම සඳහා;

(ආ) දේපළ රජය සතු කිරීම සඳහා; හෝ

(ඇ) දේපළ වගඋත්තරකරු හෝ හිමිකම්පාන්නා වෙත මුදාහැරීම සඳහා,

මේ පනත ප්‍රකාරව කරන ලද ආඥාවක් අවසන් ආඥාවක් වන ලෙස සලකනු ලැබිය යුතු අතර, එකී ආඥාව මගින් අගතියට පත් යම් පාර්ශ්වයක්, අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අන්තර්ගත කාර්යපටිපාටිය අනුගමනය කරමින්, එකී ආඥාව කරන ලද දිනයේ සිට දින දාහතරක කලසීමාවක් ඇතුළත අභියාචනාධිකරණය වෙත එකී ආඥාවට එරෙහිව අභියාචනා කිරීමට හිමිකම් ලැබිය යුතු ය.

(9) දේපළ රජය සතු කිරීම හෝ මුදා හැරීම සඳහා ආඥා කරන අධිකරණය විසින් එකී ආඥාව සඳහා වූ හේතු වාර්තා කරනු ලැබිය යුතු ය.

(10) අපරාධයකින් උත්පාදිත දේ රජය සතු කිරීම සම්බන්ධයෙන් තීරණය කිරීමක් සඳහා මේ පනතේ මේ කොටස ප්‍රකාරව පවරනු ලබන නඩු කටයුතු, අදාළ දේපළ නඩු විභාගය පැවැත්වීමේ බලාපොරොත්තුවෙන් සිටිය දී බැහැර කර තිබීම සහ එහි වටිනාකම අය කරගෙන තිබීම නොතකා, පවත්වනු ලැබිය හැකි ය.

(11) මේ පනතේ මේ කොටස ප්‍රකාරව පවරනු ලබන නඩු කටයුතු, නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කිරීම හේතුවෙන් ව්‍යුත්පන්න වන මූල්‍ය ප්‍රතිලාභවල වටිනාකම අය කර ගැනීම සඳහා පවත්වනු ලැබිය හැකි ය.

(12) (අ) නීතිවිරෝධී ක්‍රියාකාරකම මේ පනත බලාත්මක වීමට පෙරාතුව සිදු කරනු ලැබ තිබීම; හෝ

(ආ) ප්‍රස්තුත දේපළ මේ පනත ප්‍රකාරව තහනම් කර, තහනමට ගෙන හෝ ක්‍රියා විරහිත කරනු ලැබ නොතිබීම,

නොතකා, අපරාධයකින් උත්පාදිත දේ හෝ එකී අපරාධයකින් උත්පාදිත දේ හි අනුරූපී වටිනාකමට අදාළ දේපළ රජය සතු කිරීම සඳහා නීතිපතිවරයා විසින් මේ පනතේ මේ කොටස ප්‍රකාරව නඩු විභාග අධිකරණය වෙත ඉල්ලීමක් කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

(13) දූෂණ විරෝධී පනත යටතේ සහ ප්‍රකාරව වරදක් සංස්ථාපනය වන නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සිදු කිරීම සඳහා තැනැත්තකු වරදකරු කරනු ලැබූ අවස්ථාවක දී, මේ පනතේ මේ කොටසේ නීතිපතිවරයා මත පවරා ඇති හිමිකම, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් කරනු ලබන ඉල්ලීමක් මත නීතිපතිවරයා විසින් හෝ දූෂණ විරෝධී පනතේ 65 වන වගන්තිය යටතේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් විශේෂයෙන් බලය දෙන ලද යම් නීතිඥවරයකු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(14) මේ පනතේ මේ කොටස යටතේ වන නඩු කටයුත්තක් අතරතුර දී අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද සාක්ෂි මත සහ අධිකරණය විසින් කැඳවා පරීක්ෂා කරන ලද යම් වැඩිදුර සාක්ෂි තිබේ නම් එම සාක්ෂි මත, රජය සතු කිරීමේ නඩු කටයුතු පවරා ඇත්තේ යම් දේපළක් සම්බන්ධයෙන් ද එම දේපළ, කොටසක් අපරාධයකින් උත්පාදිත දේවලින් ද කොටසක් අපරාධයකින් උත්පාදිත දේ නොවන දේපළකින් ද සමන්විත වන බවට අධිකරණය සෑහීමට පත් වන විටක, අධිකරණය විසින්, එකී දේපළෙහි තක්සේරුවක් ලබා ගත යුතු අතර, අපරාධයකින් උත්පාදිත දේ වන කොටසේ ප්‍රතිශත වටිනාකම නිර්ණය කර අපරාධයකින් උත්පාදිත දේට සමාන වටිනාකම සම්බන්ධයෙන් පමණක් රජය සතු කිරීම සඳහා ආඥාවක් සිදු කරනු ලැබිය යුතු ය.

(15) එකී දේපළ සම්බන්ධයෙන් පාර්ශ්ව එකක් හෝ වැඩි ප්‍රමාණයක් විසින් හිමිකම්පෑමක් ඉදිරිපත් කරන්නේ නම් සහ මේ පනතේ විධිවිධාන සලස්වා ඇති පරිදි ශක්‍යතා වැඩිබරක් මත එකී හිමිකම්පෑම තහවුරු කරන්නේ නම්, අධිකරණය විසින්, අපරාධයකින් උත්පාදිත දේට අදාළ නොවන්නා වූ එකී තහවුරු කළ හිමිකම්පෑමට අනුරූපී වන එකී දේපළෙහි ප්‍රතිශත වටිනාකම එකී හිමිකම්පාන්නාගේ හිමිකමක් බවට පත් වන බවට විධාන කරනු ලැබිය යුතු ය.

(16) අධිකරණය විසින්, මේ පනත මගින් විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් එකී දේපළ බැහැර කිරීම සඳහා විධාන කළ හැකි අතර එහි වටිනාකම උපලබ්ධි වීමෙන් පසුව අධිකරණය විසින් නිර්ණය කරන ලද මුදල හිමිකම්පාන්නා වෙත ගෙවන ලෙස ද අපරාධයකින් උත්පාදිත දේ වල ප්‍රතිශත වටිනාකමට අනුරූපී ඉතිරි මුදල රජය සතු කළ යුතු ලෙස ද අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත විධාන කරනු ලැබිය යුතු ය.

වටිනාකම පදනම් කර ගත් රජය සතු කිරීම

**124**. (1) නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සිදු කරනු ලැබීම සම්බන්ධයෙන් යම් තැනැත්තකුට එරෙහිව අපරාධ නඩු පැවරීමෙන් සහ ඔහු වරදකරු කරනු ලැබීමෙන් පසුව, එකී නීතිවිරෝධී ක්‍රියාකාරකම මගින් උපයා ගන්නා ලද අපරාධයකින් උත්පාදිත දේ -

(අ) සොයා ගැනීමට සහ හඳුනා ගැනීමට උද්යෝගීව දරන ලද උත්සාහයන් නොතකා සොයාගෙන හෝ නිශ්චිතව හඳුනා ගෙන නොමැති බව;

(ආ) විනාශ වී, දිරාපත් වී හෝ නොවටිනා බවට පත්ව ඇති බව;

(ඇ) සැලකිය යුතු ලෙස වෙනස් වී ඇති බව;

(ඈ) විකුණා ඇති බව;

(ඉ) වෙනත් දේපළක් සමඟ කලවම් වී වෙන් කර ගැනීමට නොහැකි හෝ අසීරු වී ඇති බව;

(ඊ) ශ්‍රී ලංකාවෙන් පිටතට යවා ඇති බව;

(උ) අන්‍යාකාරයකින් මුදල් විශුද්ධිකරණයට විෂය වී ඇති බව;

(ඌ) වරදකරුවකු හෝ වෙනත් යම් තැනැත්තකු විසින් භාවිත කර එබැවින් තවදුරටත් නොපවතින බව;

(එ) කවර හෝ හේතුවක් මත වෙනස්වීමකට ලක්ව ඒ බැවින් එහි වටිනාකම නොවටිනාසුලු ප්‍රමාණයක් දක්වා අඩු වී හෝ එහි මුල් උපයෝගීතාව හෝ වාණිජමය වටිනාකම නැති වී තිබෙන බව;

(ඒ) මුදල්වලින් මැනිය හැකි ප්‍රතිලාභයක, ලැබීමක, සේවාවක හෝ වාසියක ආකාරය ආරෝපණය වී ඇති බව;

(ඔ) ජාතික ආර්ථිකයට සැලකිය යුතු බලපෑමක් කිරීමට හෝ සද්භාවී තුන්වන පාර්ශවයක සම්බන්ධතා කෙරෙහි අහිතකර බලපෑමක් කිරීමට හැකියාවක් තිබීම හේතුවෙන් තහනමට ගෙන හෝ ක්‍රියා විරහිත කර නොමැති බව; හෝ

(ඕ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අධිකරණ බලයෙන් පිටත යම් ස්ථානයක පවතින බව,

පෙනී යන්නේ නම්, නීතිපතිවරයා විසින් -

(i) අපරාධයකින් උත්පාදිත දේ හි වටිනාකම බවට නිශ්චය කරනු ලබන මුදලක් වරදකාර චූදිතයා විසින් ගෙවන ලෙසට ආදේශිත මුදල් රජය සතු කිරීම යනුවෙන් හඳුන්වනු ලබන ආඥාවක් සඳහා; හෝ

(ii) සංසන්දනීය මූල්‍යමය වටිනාකමක් ඇති වරදකාර වූදිතයාගේ දේපළ රජය සතු කිරීම සඳහා ආදේශිත දේපළ රජය සතු කිරීම යනුවෙන් හඳුන්වනු ලබන ආඥාවක් සඳහා; හෝ

අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) (අ) ආදේශිත දේපළ රජය සතු කිරීමේ ආඥාවකට යටත් වන දේපළෙහි වටිනාකම සහ ආදේශිත මුදල් රජයසතු කිරීමේ ආඥාවකට යටත් වන මූල්‍යමය වටිනාකම නිශ්චය කිරීමේ දී, අධිකරණය විසින්, කාලය ගතවීම හේතුවෙන් මුල් අපරාධයකින් උත්පාදිත දේ හි වටිනාකම වැඩිවීම හෝ අඩුවීම සහ එකී අපරාධයකින් උත්පාදිත දේ ආයෝජනය සඳහා හෝ ව්‍යාපාර කාර්ය සඳහා යොදා ගනු ලැබීමට ඇති හැකියාව සැලකිල්ලට ගත යුතු ය.

(ආ) එකී කාර්යය සඳහා, නීතිපතිවරයා විසින්, එකී රජය සතු කිරීමට යටත් විය හැකි වරදකාර වූදිතයාගේ දේපළ හඳුනා ගැනීමට අවශ්‍ය වන්නේ ය.

(3) එකී රජය සතු කිරීමේ නඩු කටයුතුවල දී අනුගමනය කළ යුතු කාර්යපටිපාටිය, අවශ්‍ය වෙනස්කම් සහිතව, වරදකරු කරනු ලැබීමෙන් පසු රජය සතු කිරීමේ නඩු කටයුතුවලට අදාළ වන කාර්යපටිපාටිය විය යුතු ය.

(4) අපරාධයකින් උත්පාදිත දෙයට සංසන්දනීය වටිනාකමකින් යුත් වරදකාර වූදිතයාගේ දේපළ හඳුනා ගැනීමට නොහැකි වන්නේ නම්, අධිකරණය විසින්, නීතිපතිවරයා විසින් කරනු ලබන ඉල්ලීමක් මත, තම වත්කම් පිළිබඳ දිවුරා ප්‍රකාශයක් ලබා දෙන ලෙස වරදකාර වූදිතයාට විධාන කළ හැකි ය. එකී ප්‍රකාශය ඉදිරිපත් කිරීමෙන් සහ සලකා බැලීමෙන් පසුව, නීතිපතිවරයා විසින්, ඉහත සඳහන් කරන ලද කාර්යපටිපාටිය ප්‍රකාරව, ඉහත කී ප්‍රකාශයේ අන්තර්ගත තොරතුරු මත පදනම්ව සංසන්දනීය වටිනාකමකින් යුත් වරදකාර වූදිතයාගේ යම් දේපළක් රජය සතු කිරීම සඳහා ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(5) ඉහත කී ප්‍රකාශයේ සංසන්දනීය වටිනාකමකින් යුත් යම් දේපළකට අදාළ තොරතුරු අන්තර්ගත නොවන්නේ නම්, නීතිපතිවරයා විසින් කරනු ලබන ඉල්ලීමක් මත අධිකරණය විසින්, අපරාධයකින් උත්පාදිත දේ හි වටිනාකමට සමාන මුදලක් ගෙවන ලෙස වරදකාර චූදිතයාට ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(6) අධිකරණය විසින් ආඥා කරන ලද ඉහත කී මුදල අධිකරණය විසින් පනවනු ලබන දඩයක් ආකාරයෙන් ම අය කර ගනු ලැබිය යුතු ය.

(7) මේ පනතේ මේ කොටස යටතේ වටිනාකම පදනම් කරගත් අපරාධයකින් උත්පාදිත දේ රජය සතු කිරීම සඳහා වූ නඩු කටයුතුවල දී, යම් පාර්ශ්වයක්, නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සිදු කිරීමෙන් ව්‍යුත්පන්න වූ වටිනාකම හෝ වෙනත් දේපළක් රජය සතු කරනු ලැබීම සම්බන්ධයෙන් විරුද්ධ වන්නේ නම්, අධිකරණය විසින් නියම කරන ආකාරයෙන් අධිකරණයට ඇපයක් මුලින් තැන්පත් කරන ලෙසට අධිකරණය විසින් එකී හිමිකම්පාන්නා වෙත විධාන කරනු ලැබිය යුතු ය.

(8) චූදිතයා වරදකරු කිරීමෙන් පසුව, දණ්ඩනය නියම කරන විට, නඩු විභාග අධිකරණය විසින්, අදාළ අපරාධයකින් උත්පාදිත දේ හි වටිනාකමට නොඅඩු ප්‍රමාණයකට වූ දණ්ඩනයක් අදාළ නීති යටතේ වරදකාර චූදිතයා වෙත පවරනු ලැබ තිබේ නම්, වටිනාකම පදනම් කරගත් අපරාධයකින් උත්පාදිත දේ රජය සතු කිරීමක් සඳහා මේ පනත යටතේ නඩු පැවරීමට නීතිපතිවරයාට හිමිකමක් නොතිබිය යුතු ය.

වරදකරු නොකිරීම මත පදනම් වූ රජය සතු කිරීම සඳහා වන සාමාන්‍ය විධිවිධාන

**125**. (1) අපරාධයකින් උත්පාදිත දෙයක් බවට සැක කරනු ලබන දේපළක් විමර්ශනයට ලක් කර, බැලූබැල්මට පෙනෙන පරිදි දේපළ අපරාධයකින් උත්පාදිත දේ බව තහවුරු කිරීමට සාක්ෂි එකතු කර, එකී දේපළ තහනම් කරනු ලැබ හෝ තහනමට ගෙන සහ ඉන්පසුව මේ පනත ප්‍රකාරව ක්‍රියා විරහිත කරනු ලැබ ඇති අවස්ථාවක දී, මේ පනතේ විධිවිධාන සලස්වා ඇති පරිදි අපරාධයකින් උත්පාදිත දේ බවට සැක කරන එකී දේපළ රජය සතු කිරීම සඳහා, එකී දේපළට එරෙහිව, මේ පනත ප්‍රකාරව මහාධිකරණයේ සිවිල් නඩු කටයුතු පවරනු ලැබිය හැකි ය. එම

සිවිල් නඩු කටයුතු වරදකරු නොකිරීම මත පදනම් වූ රජය සතු කිරීමේ නඩු කටයුතු ලෙස සඳහන් කරනු ලැබිය යුතු ය.

(2) වරදකරු නොකිරීම මත පදනම් වූ රජය සතු කිරීමේ නඩු කටයුතු ප්‍රකාරව අපරාධයකින් උත්පාදිත දෙයක් රජය සතු කිරීම සඳහා, අදාළ අපරාධයකින් උත්පාදිත දේ උපයා දුන් නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කරන ලද තැනැත්තාට එරෙහිව අපරාධ නඩු පවරා වරදකරු කිරීමක් ලබා ගැනීම අවශ්‍ය නොවිය යුතු ය.

(3) වරදකරු නොකිරීම මත පදනම් වූ රජය සතු කිරීමේ නඩු කටයුතු යටතේ වන රජය සතු කිරීමේ නඩු කටයුතු අනුරූපී නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කර තිබීම වෙනුවෙන් තැනැත්තකුට එරෙහිව නඩු පැවරීම සඳහා විකල්පයක් නොවිය යුතු ය. විමර්ශන මගින් ප්‍රමාණවත් සාක්ෂි ලැබෙන අවස්ථාවක, අනුරූපී නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කළ තැනැත්තාට එරෙහිව අදාළ නීති ප්‍රකාරව අපරාධ නඩු පවරනු ලැබිය යුතු ය.

(4) නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සිදු කිරීම සම්බන්ධයෙන් තැනැත්තකුට එරෙහිව අපරාධ නඩු පවරා ඔහු වරදකරු කරනු ලැබූ සහ එකී නීතිවිරෝධී ක්‍රියාකාරකමක් උත්පාදිත දේ පවතින අවස්ථාවක, වරදකරු කිරීමෙන් පසුව අපරාධයකින් උත්පාදිත දේ රජය සතු කිරීම, එකී නීතිවිරෝධී ක්‍රියාකාරකමෙන් උත්පාදිත දේ රජය සතු කිරීම සඳහා සාමාන්‍යයෙන් බලාත්මක කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කිරීම වෙනුවෙන් ඊට වගකිව යුතු වරදකරුට එරෙහිව නීතිපතිවරයා විසින් නඩු පැවරීම සහ පවත්වාගෙන යාම සිදු කිරීමට සමගාමීව හෝ නීතිපතිවරයා විසින් එසේ සිදු නොකෙරුව ද, අපරාධයකින් උත්පාදිත දේ වරදකරු නොකිරීම මත පදනම් වූ රජය සතු කිරීමට අදාළව මේ පනතේ අන්තර්ගත අවශ්‍යතා සපුරා තිබේ නම්, එකී නීතිවිරෝධී ක්‍රියාකාරකම මගින් උත්පාදිත දේ සම්බන්ධව මේ පනත ප්‍රකාරව නඩු කටයුතු පවත්වාගෙන යනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

(5) කොළඹ අධිකරණ කලාපය තුළ පිහිටි ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණයට, එකී අධිකරණයේ දේශීය අධිකරණ සීමාවෙන්

පිටත එකී දේපළ පිහිටීම නොතකා, අපරාධයකින් උත්පාදිත දේ වරදකරු නොකිරීම මත පදනම් වූ රජය සතු කිරීම සඳහා වන ඉල්ලීමක් භාර ගැනීම සහ ඒ සම්බන්ධයෙන් විනිශ්චය කිරීම සඳහා අධිකරණ බලය තිබිය යුතු ය:

එසේ වුව ද, වරදකරු නොකිරීම මත පදනම් වූ රජය සතු කිරීමක් සඳහා වන ඉල්ලීමක් වෙනත් යම් අධිකරණ කලාපයක මහාධිකරණයක් විසින් භාරගෙන ඒ සම්බන්ධයෙන් විනිශ්චය කරනු ලැබිය යුතු බවට, නීතිපතිවරයාගේ ඉල්ලීම මත අගවිනිසුරුවරයා විසින් විධාන කරනු ලබන අවස්ථාවක දී, එකී අධිකරණයට ඒ අධිකරණ බලය තිබිය යුතු ය:

එසේ ම තවදුරටත්, විධානයක් සඳහා නීතිපතිවරයා විසින් කරන ලද ඉල්ලීමක් නිශ්චය කිරීමේ දී, වරදකරු නොකිරීම මත පදනම් වූ රජය සතු කිරීමේ නඩු කටයුතු මෙහෙයවීමේ සහ විභාග කිරීම අවසන් කිරීමේ දී සිදු විය හැකි ප්‍රමාදයන් හේතුවෙන් මේ පනතේ අරමුණු යටපත් විය හැකි ද සහ කොළඹ අධිකරණ කලාපය තුළ නොපිහිටි මහාධිකරණයක් වෙත අධිකරණ බලය පවරනු ලැබීම යෝග්‍ය වනු ඇත්දැයි අගවිනිසුරුවරයා විසින් සලකා බැලිය යුතු ය.

(6) සාමාන්‍යයෙන්, වරදකරු නොකිරීම මත පදනම් වූ රජය සතු කිරීමේ නඩු කටයුතු පැවරීම සඳහා, අධිකරණමය ක්‍රියා විරහිත කිරීමේ ආඥාවක් පූර්ව අවශ්‍යතාවක් වුව ද, අදාළ නම් කරන ලද නිලධරයාගේ හෝ විමර්ශන නිලධරයාගේ පාලනයෙන් තොර හේතු මත අධිකරණමය ක්‍රියා විරහිත කිරීමේ ආඥාවක් ලබා ගැනීමට නොහැකි වූ බව තහවුරු කිරීමට නීතිපතිවරයාට හැකි වන්නේ නම්, අධිකරණමය ක්‍රියා විරහිත කිරීමේ ආඥාවක් නොමැතිව වුව ද, වරදකරු නොකිරීම මත පදනම් වූ රජය සතු කිරීම සඳහා නඩු පැවරීමට ඔහුට හිමිකම් ලැබිය යුතු ය.

(7) අපරාධයකින් උත්පාදිත දේ රජය සතු කිරීම සාර්ථකව සිදු කිරීම සඳහා, නඩු පවරා ඇත්තේ යම් දේපළක් සම්බන්ධයෙන් ද එකී දේපළ අපරාධයකින් උත්පාදිත දේ වන බවට, ශක්‍යතා වැඩිබරක් මත මහාධිකරණය සෑහීමට පත් විය යුතු ය.

(8) අනුරූපී නීතිවිරෝධී ක්‍රියාකාරකම් සිදු කිරීම වෙනුවෙන් චූදිත තැනැත්තාට එරෙහිව අපරාධ නඩු පවරා ඔහු නඩු විභාගයේ දී හෝ අභියාචන අදියරේ දී නිදොස් කර හෝ නිදහස් කරනු ලැබ ඇති අවස්ථාවක දී වුව ද වරදකරු නොකිරීම මත පදනම් වූ රජය සතු කිරීමේ නඩු පවරනු ලැබිය හැකි ය.

(9) මේ පනතේ බලය යටතට වැටෙන යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමකින් උත්පාදිත දේ ශ්‍රී ලංකාවෙන් පිටත දී පිහිටා තිබුණ ද, මේ පනත ප්‍රකාරව තහනම් කිරීමක්, තහනමට ගැනීමක් හෝ අධිකරණමය ක්‍රියා විරහිත කිරීමක් සිදු කිරීමේ කිසිදු ආරම්භක පියවරක් ගැනීමෙන් තොරව, මහාධිකරණයේ, එකී දේපළ සම්බන්ධයෙන් වන වරදකරු නොකිරීම මත පදනම් වූ රජය සතු කිරීමේ නඩු කටයුතු පවරනු ලැබිය හැකි ය.

(10) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සිදු කර ඇති යම් තැනැත්තකු වෙනත් යම් රටක නිසි අධිකරණ බලය සහිත අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබ ඇති සහ එකී නීතිවිරෝධී ක්‍රියාකාරකම මගින් උත්පාදිත දේ ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති අවස්ථාවක දී, මේ පනත ප්‍රකාරව එකී දේපළ තහනම් කිරීමේ, තහනමට ගැනීමේ හෝ අධිකරණමය ක්‍රියා විරහිත කිරීමේ ආරම්භක පියවර ගැනීමෙන් තොරව, එකී දේපළ සම්බන්ධයෙන්, වරදකරු නොකිරීම මත පදනම් වූ රජය සතු කිරීමේ නඩු කටයුතු පවරා පවත්වාගෙන යනු ලැබිය හැකි ය.

(11) මේ පනත ප්‍රකාරව නඩු කටයුතු ජාතික ආර්ථිකයට හෝ මහජන සුබසිද්ධියට බරපතළ බලපෑමක් ඇති කිරීමට හේතු නොවන බව සහතික කිරීමේ අවශ්‍යතාව සලකා බලන විට, නඩු කටයුතු පවරා ඇත්තේ යම් දේපළක් සම්බන්ධයෙන් ද එම දේපළ කිසිදු පූර්ව තහනම් කිරීමකට, සංරක්ෂණය කිරීමකට, තහනමට ගැනීමකට හෝ අධිකරණමය ක්‍රියා විරහිත කිරීමකට යටත්ව තිබී නොමැති බව නොතකා නීතිපතිවරයා විසින්, මහාධිකරණයේ වරදකරු නොකිරීම මත පදනම් වූ රජය සතු කිරීමේ නඩු කටයුතු පැවරීම නීත්‍යානුකූල විය යුතු ය:

එසේ වුව ද, අපරාධයකින් උත්පාදිත දේ යයි සැක කරන දේ, වරදකරු නොකිරීම මත පදනම් වූ රජය සතු කරනු ලැබීමේ නඩු

කටයුතු ආරම්භ කිරීම සඳහා වූ ඉල්ලීම ගොනු කිරීමෙන් පසුව, නඩු පවරා ඇත්තේ යම් දේපළක් සම්බන්ධයෙන් ද බැලූබැල්මට එම දේපළ අපරාධයකින් උත්පාදිත දෙයක් බව නීතිපතිවරයා විසින් මහාධිකරණය සෑහීමට පත් කරනු ලැබිය යුතු ය.

වරදකරු නොකිරීම මත පදනම් වූ රජය සතු කිරීමේ නඩු කටයුතු පවරනු ලැබිය හැකි අවස්ථා

**126.** (1) පහත දැක්වෙන අවස්ථානුගත කරුණුවල දී වරදකරු නොකිරීම මත පදනම් වූ රජය සතු කිරීමේ නඩු කටයුතු පවරනු ලැබිය හැකි අතර, එය මේ අවස්ථානුගත කරුණුවලට ම පමණක් සීමා නොවිය යුතු ය:-

(අ) අනුරූපී නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කළ තැනැත්තා මියගොස්, නඩු විභාගය අතරතුර දී මිය යන, යුක්තියෙන් සැඟව සිටින, අපරාධ නඩු පැවරීමෙන් මුක්තියක් ඇති හෝ අන්‍යාකාරයකින් ඔහුට එරෙහිව අපරාධ නඩු පැවරීමට නොහැකි හෝ එකී අපරාධකරු හඳුනාගත නොහැකි හෝ නොදන්නා අවස්ථාවක;

(ආ) අපරාධයකින් උත්පාදිත දේ උරුමයෙන් අයිති වී, අන්‍යාකාරයකින් ලැබී හෝ එසේ තුන්වන පාර්ශ්වයක් විසින් රඳවා ගෙන ඇති අවස්ථාවක;

(ඇ) වරද සිදු කිරීම (68 වන අධිකාරය වූ) කාලාවරෝධ ආඥාපනත යටතේ කාලාවරෝධී වී ඇති බැවින්, නීතිවිරෝධී ක්‍රියාකාරකමට සම්බන්ධ අපරාධකරුට එරෙහිව නඩු පැවරීම සිදු කරගෙන යනු ලැබිය නොහැකි අවස්ථාවක;

(ඈ) නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කළ තැනැත්තාට එරෙහිව අපරාධ නඩු කටයුතු පැවරීමට සහ ඔහුට එරෙහිව සාර්ථක ලෙස නඩු පවත්වාගෙන යාමට කිසිදු සාක්ෂියක් නොමැති හෝ ප්‍රමාණවත් සාක්ෂි නොමැති අවස්ථාවක;

(ඉ) අදාළ අපරාධයකින් උත්පාදිත දේ ලබා දුන් නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කිරීම සම්බන්ධයෙන්

කිසිදු විමර්ශනයක් පවත්වා නොමැති හෝ විමර්ශනයක් පැවැත්වීමට නොහැකි වී ඇති අවස්ථාවක;

(ඊ) මේ පනතේ බලයට යටත් තැනැත්තකු විසින් වෙනත් යම් රටක දී නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සිදු කර ඔහුට විරුද්ධව එම රටේ දී නඩු පවරා හෝ ඔහුව වරදකරු කර නොමැතිව සහ නීතිවිරෝධී ක්‍රියාකාරකම මගින් උත්පාදිත දේ ශ්‍රී ලංකාව තුළ හෝ වෙනත් ස්ථානයක තිබෙන අවස්ථාවක;

(උ) ශ්‍රී ලංකාවේ අධිකරණ බලයට යටත් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් පිටත දී නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සිදු කර එකී නීතිවිරෝධී ක්‍රියාකාරකම මගින් උත්පාදිත දේ ශ්‍රී ලංකාවෙන් පිටත තිබෙන අවස්ථාවක;

(ඌ) මේ පනතේ බලය ඇතුළත වූ යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමක් මගින් උත්පාදිත දේ ශ්‍රී ලංකාවෙන් පිටත තිබෙන අවස්ථාවක;

(එ) ශ්‍රී ලංකාව ඇතුළත දී හෝ ඉන් පිටත දී හෝ නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සිදු කර ඇති තැනැත්තකු, වෙනත් රටක නිසි අධිකරණ බලය සහිත අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබ ඇති අතර, එකී නීතිවිරෝධී ක්‍රියාකාරකම මගින් උත්පාදිත දේ ශ්‍රී ලංකාව ඇතුළත පිහිටා තිබෙන අවස්ථාවක;

(ඒ) තහනම් කළ, තහනමට ගන්නා ලද හෝ ක්‍රියා විරහිත කරන ලද දේපළ-

(i) නීතිවිරෝධී ක්‍රියාකාරකමක් මගින් උත්පාදිත දේවල කොටසක් පමණක් වන අවස්ථාවක;

(ii) නීතිවිරෝධී ක්‍රියාකාරකම් කිහිපයක් සිදු

කිරීමෙන් ව්‍යුත්පන්න වූ කොටස්වලින් සමන්විත වන අවස්ථාවක; හෝ

(iii) මේ ඡේදයේ (i) වන සහ (ii) වන අනුඡේදවල නිශ්චිතව දක්වා ඇති දේපළවල සංයුක්තයක් වන අවස්ථාවක දී; හෝ

(ඔ) අපරාධයකින් උත්පාදිත දේ බවට සැක කරන දේපළක් විමර්ශනය කර එකී දේපළෙහි හිමිකාරිත්වය සඳහා කිසිදු තැනැත්තකු විසින් හිමිකම් කියා නොමැති, යම් තැනැත්තකු එකී දේපළ සම්බන්ධයෙන් හිමිකම් පෑමක් ඉදිරිපත් කර පසුව එය ඉල්ලා අස්කරගෙන ඇති හෝ එකී දේපළ සම්බන්ධයෙන් කිසිදු තැනැත්තකු විසින් කිසිදු හිමිකම් පෑමක් කර නොමැති අවස්ථාවක මේ කාණ්ඩයේ දී, වරදකරු නොකිරීම මත පදනම් වූ රජය සතු කිරීම සඳහා වන නඩු කටයුතු, එකී දේපළ කළින් තහනම් කිරීමකින්, තහනමකට ගැනීමකින් හෝ අධිකරණමය ක්‍රියා විරහිත කිරීමකින් තොරව පවරනු ලැබිය හැකි ය.

(2) මේ පනතේ විධිවිධාන මගින් නිශ්චිතව විධිවිධාන සලස්වා ඇත්තේ නම් මිස, කිසිදු දේපළක්, වරදකරු නොකිරීම මත පදනම් වූ රජය සතු කිරීම සඳහා මේ පනත ප්‍රකාරව නඩු කටයුතුවලින් මුක්ත නොවිය යුතු ය.

වරදකරු නොකිරීම මත පදනම් වූ රජය සතු කිරීමේ නඩු කටයුතු

**127**. (1) අපරාධයකින් උත්පාදිත දේ බවට සැක කරන දේපළ සම්බන්ධයෙන් විමර්ශනය කිරීම අවසන් කිරීමෙන් සහ සාමාන්‍ය පරිදි එකී දේපළ සම්බන්ධයෙන් මහාධිකරණය විසින් අධිකරණමය ක්‍රියා විරහිත කිරීමේ ආඥාවක් කරනු ලැබීමෙන් පසුව, අවස්ථාවෝචිත පරිදි, නීතිපතිවරයා හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකී දේපළ රජය සතු කිරීම සඳහා හෝ එහි නීත්‍යානුකූල අයිතිකරු හෝ එහි සන්තකය සඳහා හිමිකම් කියන පාර්ශ්වය වෙත ආපසු ලබා දීම සඳහා ආඥාවක් කරන ලෙස එකී මහාධිකරණයෙන් ඉල්ලා සිටින, ඉල්ලීමක් ගොනු කිරීම මගින් එකී දේපළට එරෙහිව මේ පනතේ මේ කොටස යටතේ මහාධිකරණයේ නඩු කටයුතු පවරනු ලැබිය හැකි ය.

(2) එකී ඉල්ලීමේ අන්තර්ගත දේ අදාළ විමර්ශන නිලධරයා මගින් ඉදිරිපත් කරනු ලබන දිවුරුම් ප්‍රකාශයක් මගින් සනාථ කරණු ලැබිය යුතු අතර, ඉල්ලීම කර ඇති දේපළ අපරාධයක් මගින් උත්පාදිත දෙයක් බව බැලූබැල්මට තහවුරු කිරීමට අවශ්‍ය විය හැකි එවැනි යම් ලේඛන හෝ වෙනත් සාක්ෂි ඉල්ලීමට අමුණනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ 68 වන වගන්තිය ප්‍රකාරව දැන්වීමක් භාර දී, සහ එකී දැන්වීම භාර දී ඇත්තේ යම් තැනැත්තකු වෙත ද එකී තැනැත්තා විසින් මේ පනතේ විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් පැහැදිලි කිරීමක් ඉදිරිපත් කිරීම පැහැර හැර ඇත්තේ නම් හෝ දැන්වීම භාර දී ඇත්තේ යම් තැනැත්තකු වෙත ද එකී තැනැත්තා විසින් ඉදිරිපත් කරන ලද පැහැදිලි කිරීම වාර්තා කරනු ලබන හේතු මත විමර්ශන නිලධරයා විසින් ප්‍රතික්ෂේප කර අනුරූපී නම් කරන ලද නිලධරයා විසින් එකී ප්‍රතික්ෂේප කිරීම අනුමත කර ඇත්තේ නම් මිස, අපරාධයකින් උත්පාදිත දෙයක් වරදකරු නොකිරීම මත පදනම් වූ රජය සතු කිරීමේ ආඥාවක් අපේක්ෂාවෙන් මේ විධිවිධාන යටතේ නඩු කටයුතු පැවරීමට නීතිපතිවරයා හිමිකම් නොලැබිය යුතු ය:

එසේ වුව ද, දැන්වීමේ ලැබුම්කරු විසින් සපයන ලද පැහැදිලි කිරීම විමර්ශන නිලධරයා විසින් කොටසක් වශයෙන් පිළිගනු ලබන්නේ නම්, වලංගු පැහැදිලි කිරීමක් සපයා නොමැති දේපළ කොටසේ වටිනාකමට අදාළව නඩු කටයුතු පැවරීමට නීතිපතිවරයා හිමිකම් ලැබිය යුතු ය.

(4) ඉල්ලීමක් ගොනු කිරීමෙන් පසුව, මහාධිකරණය විසින්, අධිකරණය විසින් විධාන කරන ආකාරයෙන් දැන්වීමක් පළ කරන ලෙස අදාළ නම් කරන ලද නිලධරයාට විධාන කළ යුතු ය.

(5) ඉල්ලීමක් ගොනු කිරීමට අදාළ දැන්වීම පහත දැක්වෙන පාර්ශ්වයන් වෙත සහ මහාධිකරණය විසින් අවශ්‍ය බවට සලකනු ලබන වෙනත් යම් පාර්ශ්වයක් වෙත නිකුත් කරනු ලැබිය යුතු ය:-

(අ) විමර්ශන නිලධරයකු විසින් අදාළ දේපළ තහනමට ගනු ලැබුවේ යම් තැනැත්තකුගේ භාරයේ තිබී ද එකී තැනැත්තා;

(ආ) දේපළ ලබා ගනු ලැබ ඇත්තේ යයි විශ්වාස කරනු ලබන්නේ යම් අපරාධ වින්දිතයකුගෙන් ද එකී අපරාධ වින්දිතයා;

(ඇ) දේපළ අධිකරණමය ක්‍රියා විරහිත කිරීමෙන් සෘජුව ම බලපෑමට ලක්ව ඇති යම් තැනැත්තකු; සහ

(ඈ) දේපළ සම්බන්ධයෙන් හිමිකමක් තිබිය හැකි යම් පාර්ශ්වයක්.

(6) ක්‍රියා විරහිත කරන ලද දේපළ ආපසු ගැනීම, එහි සන්තකය හෝ භාවිත කිරීම හෝ පාලනය සඳහා එහි හිමිකම ලබා ගැනීම අපේක්ෂා කරන යම් පාර්ශ්වයක් විසින් අධිකරණය වෙත හිමිකම් පෑමක් ඉදිරිපත් කළ යුත්තේ කවර දිනයකට පෙර ද යන්න මහාධිකරණය විසින් ඉල්ලීම ගොනු කිරීමට අදාළ දැන්වීමෙහි ප්‍රකාශ කළ යුතු ය. හිමිකම් පෑම් ඉදිරිපත් කිරීම සඳහා අධිකරණය විසින් ලබා දී ඇති කාලසීමාව එකී දැන්වීම පළ කිරීම හෝ භාර දීම සිදු වන දින දෙකෙන් පසුව එළඹෙන්නේ කවර දිනය ද එම දිනයේ සිට සති හයකට නොඅඩු විය යුතු ය.

(7) ඉල්ලීම ගොනු කිරීමට අදාළ දැන්වීම භාර දෙනු ලැබ නොමැති පාර්ශ්වයක් ඇතුළුව, ක්‍රියා විරහිත කරන ලද දේපළක් සන්තකය දැරීමට හෝ භාවිත කිරීමට ඇති යම් අයිතියක් හෝ සම්බන්ධතාවක් හෝ හිමිකමක් පිළිබඳ ප්‍රකාශයක් අපේක්ෂා කරන යම් පාර්ශ්වයකට, ඒ සම්බන්ධයෙන් මහාධිකරණය වෙත තම හිමිකම් පෑම ඉදිරිපත් කිරීමට හිමිකම් ලැබිය යුතු ය.

(8) මේ පනතේ මේ කොටස යටතේ මහාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද හිමිකම් පෑමක් හිමිකම් පෑමේ ප්‍රකාශයක ආකෘතියෙන් එයට අමුණා ඇති දිවුරුම් ප්‍රකාශයක් සහ අවශ්‍ය සාක්ෂිමය ලේඛන ද සමඟ තිබිය යුතු ය.

(9) යම් ස්වෛරී රාජ්‍යයක නිසි අධිකාරයක් විසින්, යම් ක්‍රියා විරහිත කරන ලද දේපළක්, එකී රටේ මහජන අරමුදල් හෝ වෙනත් වත්කම් සම්බන්ධයෙන් සිදු කරන ලද යම් නීතිවිරෝධී

ක්‍රියාකාරකමකින් ව්‍යුත්පන්න වී ඇත යන්න මත එකී දේපළට අදාළව හිමිකම් පෑමක් ඉදිරිපත් කිරීමට හිමිකම් ලැබිය යුතු ය:

එසේ වුව ද, අපරාධයකින් උත්පාදිත දේ ආපසු භාර දීමට අදාළ ජාත්‍යන්තර සහයෝගය සඳහා වන ද්විපාර්ශ්වික ගිවිසුමක්, බහුපාර්ශ්වික ගිවිසුමක්, හෝ වෙනත් යම් ආකාරයක සැකැස්මක්, පවතින බව සහ එකී ගිවිසුම බලාත්මකව පවතින බව සහතික කරමින්, විදේශ කටයුතු විෂය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිකුත් කරනු ලබන සහතිකයක් එකී හිමිකම්පාන්නා විසින් එකී හිමිකම්පෑමට අමුණන්නේ නම් මිස, යම් ස්වෛරී රාජ්‍යයක නිසි බලධරයකු විසින් ඉදිරිපත් කරනු ලබන එවැනි යම් හිමිකම්පෑමක් මහාධිකරණය විසින් භාර ගනු නොලැබිය යුතු ය.

(10) නීතිපතිවරයා විසින් යම් ස්වෛරී රාජ්‍යයක නිසි බලධරයා වෙනුවෙන් මේ වගන්තිය යටතේ ඉල්ලීමක් කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

(11) හිමිකම්පෑම් ගොනු කිරීමෙන් පසුව, අධිකරණය විසින්, සියලු පාර්ශ්වවලට අනෙකුත් එක් එක් පාර්ශ්වයන්ගේ හිමිකම්පෑම් අධ්‍යයනය කිරීම සඳහා අවස්ථාවක් ලබා දිය යුතු අතර, ඔවුන් අපේක්ෂා කරන්නේ නම්, හිමිකම්පෑම්වලට අදාළව විධිවිධාන සලස්වා ඇති ආකාරයට දිවුරුම් ප්‍රකාශයක් සහ තිබේ නම්, සනාථ කිරීමේ ලේඛන ද සමඟ විරෝධතා ප්‍රකාශන හෝ ප්‍රතිහිමිකම්පෑම් ඉදිරිපත් කිරීමට ද අවස්ථාව ලබා දිය යුතු ය.

(12) හිමිකම්පෑම්, ප්‍රතිහිමිකම්පෑම් සහ විරෝධතා ප්‍රකාශ ගොනු කිරීමෙන් පසුව, මහාධිකරණය විසින්, කාරණය පරීක්ෂණය කිරීම සඳහා නියම කළ යුතු අතර, එකී පරීක්ෂණය පැවැත්වීමෙන් පසුව, ඉල්ලීම ගොනු කර ඇත්තේ යම් දේපළකට අදාළව ද එකී දේපළ රජය සතු කරනු ලැබිය යුතු ද නැතහොත් නීතියෙන් දේපළෙහි සන්තකය හෝ භාවිතය සඳහා හිමිකම් කියන පාර්ශ්වයක් වෙත එම දේපළ මුදා හරිනු ලැබිය යුතු ද යන්න නිශ්චය කළ යුතු ය.

(13) මේ වගන්තිය යටතේ පවත්වනු ලබන පරීක්ෂණයක දී, කාරණය නිශ්චය කිරීම සඳහා වාචික සාක්ෂි අවශ්‍ය වන්නේ ය යන පදනම මත විශේෂ අවස්ථානුගත කරුණු යටතේ අධිකරණය විසින් ඒ සඳහා අවසර ලබා දී ඇත්නම් පමණක් වාචික සාක්ෂි ලබා ගත යුතු ය.

(14) නඩු කටයුතු පවරනු ලැබ ඇති දේපළ අපරාධයකින් උත්පාදිත දෙයක් වන්නේ ද යන්න නිශ්චය කිරීමේ සහ නඩු කටයුතු පවරනු ලැබ දේපළ මුදා හැරීම සඳහා යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කර ඇති හිමිකම්පෑමක නීත්‍යානුකූලභාවය නිශ්චය කිරීමේ කාර්ය සඳහා මේ වගන්තිය යටතේ නඩු කටයුතුවල දී, මහාධිකරණය විසින්, 34 වන වගන්තියේ අන්තර්ගත පූර්ව නිගමනය අදාළ කරගත යුතු ය.

(15) නඩු පවරනු ලැබ ඇති දේපළෙහි පාලනය හෝ සන්තකය ලබා ගැනීමට අපේක්ෂා කරන පාර්ශ්වයක් විසින් ශක්‍යතා වැඩි බරක් මත සහ වෙනත් යම් හිමිකම්පාන්නකු විසින් තහවුරු කර තිබිය හැකි සීමාව ඉක්මවන සීමාවක් දක්වා නීත්‍යානුකූල හිමිකම්පෑමක් තහවුරු කළ යුතු ය.

(16) පරීක්ෂණයෙන් පසුව, නඩු පවරනු ලැබ ඇති දේපළ යම් නිශ්චිත අපරාධ වින්දිතයකුගේ දේපළක් බවට මතයක් මහාධිකරණය විසින් දරන්නේ නම්, අධිකරණය විසින්, එකී දේපළ එකී අපරාධ වින්දිතයා වෙත ආපසු භාර දෙන ලෙස විධාන කරමින් ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(17) පරීක්ෂණයෙන් පසුව,

(අ) ශක්‍යතා වැඩිබරක් මත කිසිදු හිමිකම්පාන පාර්ශ්වයක් විසින් දේපළ මුදාහැරීම සඳහා නීත්‍යානුකූල හිමිකම්පෑමක් තහවුරු කර නොමැති බව; හෝ

(ආ) මේ පනත ප්‍රකාරව අනුරූපී නීතිවිරෝධී ක්‍රියාකාරකමේ වින්දිතයකු විසින් හෝ විදේශීය

රාජ්‍යයක නිසි බලධරයා විසින් කිසිදු වලංගු හිමිකම්පෑමක් අධිකරණය වෙත ඉදිරිපත් කර නොමැති බව; සහ

(ඈ) ඉල්ලීම ගොනු කරනු ලැබ ඇත්තේ යම් දේපළක් සම්බන්ධයෙන් ද එකී දේපළ ශක්‍යතා වැඩිබරක් මත අපරාධයකින් උත්පාදිත දෙයක් බව,

මහාධිකරණය විසින් නිශ්චය කරන්නේ නම්, මහාධිකරණය විසින් ඒ දේපළ රජය සතු කිරීමේ ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(18) පරීක්ෂණයෙන් පසුව, අපරාධයකින් උත්පාදිත දේ වරදකරු නොකිරීම මත පදනම් වූ රාජසන්තක කිරීමක් සඳහා මේ වගන්තිය යටතේ නඩු කටයුතු පවරා ඇත්තේ යම් දේපළක් සම්බන්ධයෙන් ද එම දේපළෙන් කොටසක් පමණක් අපරාධයකින් උත්පාදිත බව මහාධිකරණය විසින් නිශ්චය කරන්නේ නම්, අධිකරණය විසින්, අදාළ අපරාධයකින් උත්පාදිත දේ හි වටිනාකම නිශ්චය කිරීමෙන් පසුව, දේපළ රජය සතු කළ යුතු බවට සහ ඉතිරි කොටසට හිමිකම් කියන පාර්ශ්වය වෙත රජය විසින් එම වටිනාකම ගෙවන ලෙසට ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(19) ශක්‍යතා වැඩිබර මත එකී දේපළ සඳහා නීත්‍යනුකූල හිමිකම්පෑමක් හිමිකම්පාන්නා විසින් ඉදිරිපත් කර ඇති බව මහාධිකරණය විසින් විධාන කරන්නේ නම්, මහාධිකරණය විසින් එකී දේපළ එකී හිමිකම්පාන්නා වෙත මුදාහරින ලෙස විධාන කරමින් ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(20) නඩු කටයුතු පවරා ඇත්තේ යම් දේපළක් සම්බන්ධයෙන් ද එකී දේපළ අනුරූපී අපරාධයේ වින්දිතයකු වන හිමිකම්පාන්නාට අයත් බව මහාධිකරණය විසින් නිශ්චය කරන්නේ නම්, මහාධිකරණය විසින් දේපළ එකී අපරාධයේ වින්දිතයා වෙත මුදා හරිමින් ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(21) නඩු කටයුතු පවරා ඇත්තේ යම් දේපළක් සම්බන්ධයෙන් ද එකී දේපළ, සිය නිසි බලධරයා හරහා හිමිකම්පෑමක් ඉදිරිපත් කර ඇති ඉල්ලීම් කරන විදේශීය රාජ්‍යයක පොදු දේපළක් බව මහාධිකරණය විසින් නිශ්චය කරන්නේ නම්, මහාධිකරණය විසින් මේ පනතේ අන්තර්ගත විධිවිධානවලට යටත්ව, දේපළ හෝ ඉන් කොටසක් හෝ එහි වටිනාකම ඉල්ලීම් කරන විදේශීය රාජ්‍යය වෙත මුදාහැරීම සඳහා ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(22) අධිකරණය විසින්, දේපළ රජය සතු කිරීම සඳහා ආඥාවක් කරනු ලබන්නේ නම්, එය රජය සතු කරනු ලැබිය යුතු අතර, භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් එකී දේපළේ සන්තකය ලබා ගෙන මේ පනත ප්‍රකාරව ඒ දේපළ පිළිබඳ කටයුතු කළ යුතු ය.

(23) හිමිකම්පාන්නකු විසින් ශක්‍යතා වැඩිබරක් මත ඔහු එකී දේපළේ අයිතිකරු බව තහවුරු කර ඇති බව අධිකරණයේ මතය වන්නේ නම්, අධිකරණය විසින් අධිකරණමය ක්‍රියා විරහිත කිරීමේ ආඥාව ඉවත් කර, එකී දේපළ එකී හිමිකම්පාන්නා වෙත මුදා හරිනු ලැබිය යුතු ය.

(24) මේ පනතේ අන්තර්ගත අපරාධයකින් උත්පාදිත දේ වරදකරු නොකිරීම මත පදනම් වූ රජය සතු කිරීමේ කාර්යපටිපාටිය ප්‍රකාරව යම් දේපළක් රජය සතු කිරීම යම් තැනැත්තකු වෙත පනවන ලද දඬුවමක් හෝ යම් දණ්ඩනයක් ලෙස සලකනු නොලැබිය යුතු අතර, එකී රජය සතු කිරීම ප්‍රකාරව කිසිදු තැනැත්තකු යම් නුසුදුසුකමකට හෝ වෙනත් දණ්ඩනයකට යටත් නොකරනු ලැබිය යුතු ය.

(25) මේ වගන්තිය යටතේ නඩු කටයුතු අතරතුර, අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද සාක්ෂි සහ අධිකරණය විසින් කැඳවා පරීක්ෂා කරන ලද යම් වැඩිදුර සාක්ෂි තිබේ නම් එම සාක්ෂි මත, නඩු කටයුතු පවරනු ලැබ ඇති දේපළ, කොටසක් අපරාධයකින් උත්පාදිත දෙයින් ද, කොටසක් අපරාධයකින් උත්පාදිත නොවන දේපළකින් ද සමන්විත වන බවට අධිකරණය සෑහීමට පත් වන්නේ නම්, අධිකරණය විසින් එකී දේපළේ තක්සේරුවක් ලබාගෙන අපරාධයකින් උත්පාදිත දේ සමන්විත වන එකී දේපළේ ප්‍රතිශත වටිනාකම නිශ්චය කළ යුතු ය.

(26) එකී දේපළ සම්බන්ධයෙන් පාර්ශ්වයන් එකක් හෝ වැඩි ගණනක් විසින් හිමකම්පෑමක් ඉදිරිපත් කර ඇති සහ මේ පනතේ විධිවිධාන සලස්වා ඇති පරිදි ශක්‍යතා වැඩිබරක් මත එකී හිමිකම්පෑම තහවුරු කරන අවස්ථාවක, අධිකරණය විසින්, අපරාධයකින් උත්පාදිත දේට අදාළ නොවන්නා වූ ද, එකී තහවුරු කරන ලද හිමිකම්පෑමට අනුරූපී වන්නා වූ ද, එකී දේපළේ ප්‍රතිශත වටිනාකම එකී හිමිකම්පාන්නාගේ හිමිකම බවට විධාන කළ යුතු ය.

(27) අධිකරණය විසින්, මේ පනත මගින් විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් එකී දේපළ බැහැර කිරීමට විධාන කළ යුතු අතර, එහි වටිනාකම උපලබ්ධි කර ගැනීමෙන් පසුව අධිකරණය විසින් නිශ්චය කරනු ලබන මුදල හිමිකම්පාන්නා වෙත ගෙවන ලෙසට අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාට විධාන කර අපරාධයකින් උත්පාදිත දේ හි ප්‍රතිශත වටිනාකමට අනුරූපී වන්නා වූ ඉතිරි මුදල රජය සතු කිරීමට විධාන කළ යුතු ය.

රජය සතු කිරීමේ ආඥාවකින් පසුව, වරදකරු කිරීමෙන් පසුව රජය සතු කිරීමේ සහ වරදකරු නොකිරීම මත පදනම් වූ රජය සතු කිරීමේ කාර්ය පටිපාටිවලට පොදු විධිවිධාන

**128**. (1) අපරාධයකින් උත්පාදිත දේ සඳහා වන පරීක්ෂණයක් අවසන් කිරීමෙන් පසුව අධිකරණය විසින් දේපළ රජය සතු කිරීම සඳහා ආඥාවක් කරන්නේ නම්, දේපළ, අධිකරණය විසින් නියම කරනු ලබන පාර්ශ්වය වෙත මුදාහරින ලෙස, අධිකරණය විසින් අවස්ථාවෝචිත පරිදි, අධිකාරිය, ප්‍රතිග්‍රාහකයා හෝ විශේෂ කළමනාකරු වෙත විධාන කළ යුතු ය:

එසේ වුව ද, රජය සතු කිරීම නොතකා, එකී දේපළ, අධිකරණය විසින් සුදුසු යයි සලකන යම් වැඩිදුර කාලසීමාවක් සඳහා ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම කරනු ලැබිය යුතු බව අධිකරණයේ මතය වන්නේ නම්, වාර්තා කරනු ලැබිය යුතු හේතු මත, අධිකරණය විසින් සුදුසු යයි සලකන යම් නියම සහ කොන්දේසි මත දේපළ සඳහා ආරක්ෂාව, සංරක්ෂණය සහ කළමනාකරණය අඛණ්ඩව සැපයිය යුතු බවට, අධිකරණය විසින්, අවස්ථාවෝචිත පරිදි, අධිකාරිය, ප්‍රතිග්‍රාහකයා හෝ විශේෂ කළමනාකරු වෙත විධාන කළ යුතු ය.

(2) දේපළ රජය සතු කිරීමෙන් පසුව, මේ පනතේ නියමයන්ට සහ අධිකරණය විසින් පනවනු ලැබිය හැකි වෙනත් යම් කොන්දේසිවලට යටත්ව, ප්‍රසිද්ධ වෙන්දේසියක් හරහා හෝ අධිකාරිය විසින් නිර්දේශ කරනු ලබන සහ අධිකරණය විසින් අනුමත කරන වෙනත් යම් බැහැර කිරීමේ මාර්ගයකින් දේපළ බැහැර කරන ලෙස මහාධිකරණය විසින්, අවස්ථාවෝචිත පරිදි, අධිකාරිය, ප්‍රතිග්‍රාහකයා හෝ විශේෂ කළමනාකරු වෙත විධාන කළ යුතු ය:

එසේ වුව ද, රජය සතු කිරීමේ නඩු කටයුතු සිදු කරන තුරු දැනටමත් දේපළ බැහැර කරනු ලැබ ඇත්තේ නම්, අධිකරණය විසින් රජය සතු කිරීමෙන් පසු බැහැර කිරීමේ ආඥාවක් කිරීම අවශ්‍ය නොවන්නේ ය.

(3) වර්තමාන තත්ත්වය අනුව හෝ දේපළ සම්බන්ධයෙන් පවත්නා අවස්ථානුගත කරුණු අනුව එකී දේපළ බැහැර කිරීම සිදු කළ නොහැකි දෙයක් විය හැකි බව හෝ එකී දේපළේ සත්‍ය වටිනාකම උපලබ්ධි කර ගත නොහැකි විය හැකි බව අධිකාරිය, ප්‍රතිග්‍රාහකයා හෝ විශේෂ කළමනාකරු විසින් අධිකරණය වෙත වාර්තා කරන්නේ නම් සහ එකී හේතු සම්බන්ධයෙන් අධිකරණය සෑහීමට පත් වන්නේ නම්, එකී දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියක් මඟින් බැහැර කර එහි සත්‍ය වටිනාකම උපලබ්ධි කර ගැනීමට හැකියාව ලබා දෙන පරිදි අධිකරණය විසින් අදාළ රජයේ නිසි බලධරයන් වෙත දේපළට අදාළව අවශ්‍ය ආඥා කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, පවත්නා අවස්ථානුගත කරුණු අනුව දේපළ බැහැර කිරීම කිසිදු අවස්ථාවක දී සිදු කළ නොහැකි වන බව අධිකරණයේ මතය වන්නේ නම්, අධිකරණය විසින්, දේපළ ශ්‍රී ලංකාවේ රජයේ නිසි බලධරයකු වෙත පවරමින් යෝග්‍ය ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(4) අවස්ථාවෝචිත පරිදි, අධිකාරිය, ප්‍රතිග්‍රාහකායා හෝ විශේෂ කළමනාකරු විසින්, අධිකරණයේ විධානය මත, දේපළ බැහැර කර එහි වටිනාකම උපලබ්ධි වීමෙන් පසුව එකී මුදල අධිකාරියෙහි අපරාධයකින් උත්පාදිත දේ බැහැර කිරීමෙන් උත්පාදිත දේ නමින් වන ගිණුම වෙත බැර කරනු ලැබිය යුතු ය.

(5) රජය සතු කළ දේපළ බැහැර කිරීමෙන් උපලබ්ධි වූ මුදල් ලැබීමෙන් පසුව, අධිකාරිය විසින් එකී අරමුදල් මේ පනතේ විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් වැය කළ යුතු ය.

(6) රජය සතු කළ අපරාධයකින් උත්පාදිත දේ බැහැර කිරීමෙන් ලැබෙන මුදල් වියදම් කිරීම සඳහා අධිකරණය විසින් ආඥාවක් කිරීමට අවශ්‍ය කරන අවස්ථාවක දී, අධිකාරිය පිහිටුවා නොමැති නම් හෝ මේ පනත ප්‍රකාරව එහි කර්තව්‍ය ඉටු කිරීමට එයට නොහැකි වන්නේ නම්, අධිකරණය විසින්, බැහැර කිරීමෙන් උත්පාදිත දේ අධිකරණය විසින් පවත්වාගෙන යනු ලබන වෙනම ගිණුමකට ප්‍රේෂණය කරන ලෙස විධාන කළ යුතු අතර, ඉන්පසුව එකී අරමුදල්, මේ පනතේ අධිකාරිය විසින් එකී අරමුදල් වියදම් කළ යුතු බවට නියම කර ඇති ආකාරයෙන් වැය කරනු ලැබිය යුතු ය.

## VII වන කොටස

### අපරාධයක වින්දිතයන් සඳහා වන සිවිල් ප්‍රතිකර්මය

පාර්ශ්වයක් විසින් නීතිවිරෝධි ක්‍රියාකාරකමක් මගින් විඳිනු ලබන මූල්‍ය, මනෝභාවාත්මක හෝ වෙනත් පාඩු හෝ අලාභ අයකර ගැනීම සඳහා වන නඩු නිමිත්ත

**129.** (1) යම් තැනැත්තකු විසින් නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සිදු කර එකී ක්‍රියාකාරකම සෘජුව ම හෝ අන්‍යාකාරයකින් මූල්‍ය, මනෝභාවාත්මක හෝ වෙනත් අලාභයක් හෝ යම් ප්‍රතිලාභයක්, සේවාවක් හෝ වෙනත් හිමිකමක් අහිමි වීමට හේතු වී ඇති අවස්ථාවක දී, එකී නීතිවිරෝධී ක්‍රියාකාරකමෙන් අහිතකර ලෙස බලපෑමට ලක් වූ පාර්ශ්වය, රාජ්‍යය ඇතුළුව එසේ බලපෑමට ලක් වූ වෙනත් යම් තැනැත්තකු වෙත, එකී පාර්ශ්වය විසින් විඳින ලද මූල්‍ය, මනෝභාවාත්මක හෝ වෙනත් අලාභය හෝ හානිය අය කර ගැනීමට හිමිකම් ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද නඩු නිමිත්ත මත පදනම් ව හානි සහ වන්දි සඳහා හිමිකම්පාන පැමිණිලිකරුවකු විසින් අදාළ දිසා අධිකරණයේ සිවිල් නඩුවක් පවරනු ලැබිය යුතු අතර, ඔහු විසින් ශක්‍යතා වැඩිබරක් මත අදාළ නීතිවිරෝධී ක්‍රියාකාරකම සංයුක්ත කරන වරදේ අංග ඔප්පු කිරීමෙන් තම නඩුව තහවුරු කිරීමට අවශ්‍ය විය යුතු ය.

(3) ඉහත සඳහන් කරන ලද නඩු නිමිත්ත මත පදනම්ව සිවිල් නඩුවක් සාර්ථකව පැවරීමේ කාර්ය සඳහා, විත්තිකරු නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සිදු කිරීම සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබ ඇති බව හෝ නීතිවිරෝධී ක්‍රියාකාරකම මගින් උත්පාදිත දේ සොයාගෙන, හඳුනාගෙන හෝ අය කරගෙන ඇති බව පැමිණිලිකරු විසින් තහවුරු කිරීම අවශ්‍ය නොවන්නේ ය.

(4) ඉහත සඳහන් කරන ලද නඩු නිමිත්ත මත පදනම්ව සිවිල් නඩු පැවරීමේ හිමිකම, යම් අපරාධ විමර්ශනයකට, අපරාධ නඩු පැවරීමකට හෝ එහි ප්‍රතිඵලයකට ස්වාධීනව විය යුතු ය.

*නිදර්ශනය :*

(අ) සමාගමක ගණකාධිකාරිවරයකු වන x විසින් සාපරාධී විශ්වාසය කඩ කිරීමක් සිදු කර එකී නීතිවිරෝධී ක්‍රියාකාරකමින් උත්පාදිත දෙයින් මෝටර් වාහනයක් මිල දී ගනු ලැබේ. සමාගම විසින් පොලිසිය වෙත පැමිණිලි කරයි. පොලිසිය විසින් මේ පනත සහ නීතියේ වෙනත් විධිවිධාන ප්‍රකාරව x ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම ආරම්භ කිරීම හෝ නොකිරීම කළ හැකි ය. පොලීසිය විසින් x ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම හෝ නොගැනීම හෝ x ට එරෙහිව අපරාධ නඩු කටයුතු පැවරීම නොතකා, ඉහත කී නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් සමාගම විසින් විඳිනු ලබන මූල්‍ය පාඩුව අය කර ගැනීමේ කාර්යය සඳහා ඉහත කී නඩු නිමිත්ත අයදිමින් x ට එරෙහිව සිවිල් නඩුවක් පැවරීමට සමාගම හිමිකම් ලැබිය යුතු ය.

(ආ) නිශ්චිත පොදු කාර්යයක් සඳහා වෙන් කර තිබූ අරමුදල් සම්බන්ධව දූෂණය යන වරද x විසින් සිදු කරනු ලැබේ. මේ හේතුවෙන් නිශ්චිත ප්‍රමාණයකින් හෝ ප්‍රතිශතයකින්

ඉහත කී පොදු කාර්ය සඳහා පවතින අරමුදල් අඩු වීම සිදු වේ. එහි ප්‍රතිඵලයක් ලෙස, පොදු කාර්යය ක්‍රියාත්මක කිරීමට තිබූයේ යම් ප්‍රජාවක ප්‍රතිලාභය පිණිස ද එම ප්‍රජාවේ ප්‍රතිලාභය අඩු වීම මූල්‍ය පදනම අනුව හෝ නියමිත පොදු කාර්යයේ අඩු වීම ප්‍රමාණනය කිරීමක් මගින් හෝ ගණනය කරනු ලබයි. ඒ අනුව X විසින් සිදු කළ නීතිවිරෝධී ක්‍රියාකාරකමේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය හෝ මනෝභාවාත්මක හානියකින්, අපේක්ෂිත සේවාව, පහසුකම හෝ ප්‍රතිලාභය අහිමි වීමෙන් පීඩාවට පත් වූවන්, ඔවුන් පීඩා විඳි පාඩුවට හෝ හානියට සමානව අලාභ හෝ වන්දි ලබා ගැනීමේ කාර්ය සඳහා ඒකාබද්ධව හෝ වෙන් වෙන්ව X ට එරෙහිව නඩු පැවරීමට හිමිකම් ලැබිය යුතු ය.

(ඇ) තමන්ට කිසිදු පුද්ගලික මූල්‍යමය ප්‍රතිලාභයක් නොමැති දූෂණ ක්‍රියාවක් X විසින් සිදු කරනු ලැබේ. එකී නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කිරීමෙන් X විසින් පුද්ගලිකව කිසිවක් ලබා ගෙන නොමැති වීම නොතකා, එකී නීතිවිරෝධී ක්‍රියාකාරකමින් අහිතකර බලපෑමට ලක් වූ යම් පාර්ශ්වයක් විසින් ඍජුව ම හෝ අන්‍යාකාරයකින් තමා විඳි මූල්‍ය හෝ මනෝභාවාත්මක පාඩුව අය කර ගැනීම සඳහා X ට එරෙහිව නඩු පැවරීමට හිමිකම් ලැබිය යුතු ය.

(5) පාඩු හෝ හානි සඳහා මේ පනතේ මේ කොටස යටතේ වන නඩුවක්, සිවිල් නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධානවලට අනුකූලව පවරනු ලැබිය යුතු අතර, එකී නඩුව කාර්යපටිපාටික වශයෙන් එකී සංග්‍රහයේ විධිවිධාන මගින් පාලනය කරනු ලැබිය යුතු ය.

(6) (1) වන උපවගන්තියේ සඳහන් පරිදි වෙනත් තැනැත්තකු විසින් සිදු කරන ලද නීතිවිරෝධී ක්‍රියාකාරකමක් හේතුවෙන් එක් තැනැත්තකුට වැඩි තැනැත්තන් සංඛ්‍යාවක් අලාභ හෝ හානි

විඳ ඇති අවස්ථාවක, එකී නීතිවිරෝධී ක්‍රියාකාරකම හේතුවෙන් අලාභ හෝ හානි විඳ ඇති -

(අ) එකී තැනැත්තන්ගෙන් එක් තැනැත්තකු හෝ ඊට වැඩි ගණනක්; හෝ

(ආ) එකී තැනැත්තන් නියෝජනය කරන සංස්ථාගත හෝ සංස්ථාගත නොකරන ලද ආයතනයක්.

විසින්, අලාභ හෝ පාඩු විඳ ඇති තැනැත්තන් ලෙස නිරූපණය වන තැනැත්තන්ගේ කැමැත්ත ඇතිව, එකී නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කිරීම හේතුවෙන් එකී පාර්ශ්වකරුවන් විඳිනු ලැබූ අලාභ සඳහා හානි හෝ වන්දි අය කර ගැනීමේ කාර්යය සඳහා මේ කොටස ප්‍රකාර නඩු පවරනු ලැබිය හැකි ය.

(7) නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කිරීම හේතුවෙන් පැමිණිලිකරු විඳිනු ලැබූ මූල්‍ය සහ මනෝභාවාත්මක අලාභ සම්බන්ධයෙන් දැනුමැති සහ විශේෂ කුසලතාවයෙන් යුත් තැනැත්තකුගේ සාක්ෂි පැමිණිලිකරු විසින් අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන්නේ නම් මිස, අධිකරණය විසින්, ස්වකීය අභිමතය පරිදි, පැමිණිලිකරු හෝ එම පැමිණිලිකරු නියෝජනය කරන පාර්ශ්වකරුවන් විඳිනු ලැබූ අලාභ හෝ හානි නිශ්චය කිරීම සම්බන්ධයෙන් අධිකරණයට සහාය වීමේ කාර්යය සඳහා දැනුමැති සහ විශේෂ කුසලතාවයෙන් යුත් එක් තැනැත්තකු හෝ වැඩි සංඛ්‍යාවක් අධිකරණය වෙත කැඳවනු ලැබිය හැකි ය.

(8) (68 වන අධිකාරය වූ) කාලාවරෝධී ආඥාපනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ කොටස ප්‍රකාරව වන නඩුවක්, පැමිණිලිකරුට එම පැමිණිලිකරු විඳිනු ලැබූ අලාභය හෝ හානි ජනිත කළ නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කිරීම සම්බන්ධයෙන් දැනගැනීමට ලැබුණු දින සිට වසර තුනක් ඇතුළත පවරනු ලැබිය යුතු ය.

(9) මේ කොටසේ විධිවිධාන මේ පනතේ වෙනත් යම් කොටසකින් සහ වෙනත් යම් ලිඛිත හෝ ලිඛිත නොවන

නීතියකින් විධිවිධාන සලස්වා ඇති යම් අයිතිවාසිකමකට හෝ ප්‍රතිකර්මයකට අමතරව මිස හානියක් සිදු කරන පරිදි නොවිය යුතු ය.

(10) මේ කොටස යටතේ ගොනු කරනු ලබන නඩුවක දී, අධිකරණය විසින් වන්දි හෝ හානි ප්‍රදානය ගණනය කිරීමේ දී, පැමිණිලිකරුට හෝ පැමිණිලිකරු විසින් නඩුව ගොනු කර ඇත්තේ වෙනත් අගතියට පත් වූ පාර්ශ්වකරුවන් වෙනුවෙන් ද, එම පාර්ශ්වකරුවන්ට දැනටමත් ලැබී ඇති අතුරු හෝ අවසාන ගෙවීම් හෝ වෙනත් යම් සහන සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

වින්දිතයන්ගේ ප්‍රතිලාභය පිණිස සිවිල් නඩු ප්‍රතිකර්මයක් වෙනුවෙන් සිවිල් සමාජ සංවිධාන මගින් නඩු පැවරීම

**130.** (1) 129 වන වගන්තියේ (6) වන උපවගන්තියේ කුමක් සඳහන් වුව ද, සද්භාවයෙන් සහ රාජ්‍යය ඇතුළුව යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමක වින්දිතයන්ගේ ප්‍රතිලාභය පිණිස සඳහා පමණක් ම මේ කොටස අනුව නඩු කටයුතු පැවරීමට දේශපාලනිකව නොබැඳි, ලියාපදිංචි කරන ලද හෝ සංස්ථාගත කරන ලද සිවිල් සමාජ සංවිධානයක් වෙත හිමිකම තිබිය හැකි ය.

(2) එසේ නඩු පැවරීමෙන් දින දහහතරකට නොවැඩි කාලයක් ඇතුළත පැමිණිලිකාර දේශපාලනිකව නොබැඳි සිවිල් සංවිධානය විසින් එකී නඩු කටයුතු පැවරීම නිවේදනය කරමින් දැන්වීමක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන එක් එක් භාෂාවෙන් වන එක් එක් ජාතික පුවත්පතක ඇතුළු මාධ්‍යවල පළ කළ යුතු ය.

(3) නීතිවිරෝධී ක්‍රියාකාරකමක් වන්නේ යයි පැමිණිලි කරන්නා වූ විෂයගත කාරණාවෙහි යම් වින්දිතයකු විසින් ඒ නඩුව පිළිබඳ ඒ වින්දිතයාට සම්බන්ධතාවයක් ඇති බව බැලූබැල්මට පෙනෙන පදනමින් අධිකරණය සෑහීමට පත් කරනු ලැබීමෙන් පසු, ඒ නඩුවට මැදිහත් වීමට අයිතිවාසිකමක් තිබිය යුතු අතර, එසේ සෑහීමට පත් වීමෙන් පසු අධිකරණය විසින් එම වින්දිතයා ඒ නඩුවේ පාර්ශ්වයක් ලෙස එකතු කළ යුතු ය.

(4) මේ වගන්තිය යටතේ පවරනු ලබන නඩුවක තීන්දුව හා තීන්දු ප්‍රකාශය ඇතුළත් කිරීමේ දී අධිකරණය විසින් සිවිල් නඩු විධාන සංග්‍රහය පනතේ 184 වන වගන්තියේ අවශ්‍යතාවලට වැඩිමනත්ව අධිකරණය විසින් නියම කරනු ලබන හානි හෝ

වන්දි හිමිවිය යුතු තැනැත්තා නිශ්චිතව සඳහන් කළ යුතු අතර, පැමිණිලිකරු නීතිවිරෝධී ක්‍රියාකාරකමේ වින්දිතයකු නොවන්නේ නම් නඩු ගාස්තු අය කර ගැනීමට පමණක් පැමිණිලිකරුට හිමිකම තිබිය යුතු ය.

## VIII වන කොටස

## රජය සතු කරනු ලැබූ අපරාධයකින් උත්පාදිත දේ බැහැර කිරීම සහ ඉන් ව්‍යුත්පන්න වූ වටිනාකම උපයෝගී කර ගැනීම

රජය සතු කරනු ලැබූ අපරාධයකින් උත්පාදිත දේ බැහැර කිරීම

**131.** (1) ක්‍රියා විරහිත කරනු ලැබූ අපරාධයකින් උත්පාදිත දේ රජය සතු කිරීමේ ආඥාවකින් පසු, මහාධිකරණය විසින්, දේපළේ තක්සේරුවක් ලබා ගෙන ප්‍රසිද්ධ වෙන්දේසිය මාර්ගයෙන් හෝ දේපළේ වටිනාකම ව්‍යුත්පන්න කරගත හැකි අධිකාරිය විසින් නිර්දේශ කරන ලද්දා වූ ද, අධිකරණය විසින් අනුමත කරන ලද්දා වූ ද වෙනත් යම් බැහැර කිරීමේ මාර්ගයකින් එය බැහැර කරන ලෙස අධිකාරිය වෙත නියම කරනු ලැබිය යුතු ය. එකී බැහැර කිරීම අධිකරණය විසින් අධීක්ෂණය කරනු ලැබිය යුතු ය.

(2) අධිකරණය විසින් නියම කරනු ලබන ආකාරයෙන් දේපළ බැහැර කිරීමෙන් පසු, අධිකාරිය විසින්, අධිකාරියේ අපරාධයකින් උත්පාදිත දේ බැහැර කිරීමෙන් උත්පාදිත දේ යන ශීර්ෂැති ගිණුමකට එකී මුදල බැර කර, එකී මුදල වැය කළ යුතු ආකාරය නියම කරමින් ආඥාවක් කරන ලෙස අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.

(3) අධිකාරිය විසින් (2) වන උපවගන්තිය ප්‍රකාර ඉල්ලීමක් කිරීමෙන් පසු, අධිකරණය විසින්, අවශ්‍ය යයි සලකනු ලබන වෙනත් කරුණු අතර, පහත දැක්වෙන කරුණු සැලකිල්ලට ගෙන, රජය සතු කළ දේපළ බැහැර කිරීමෙන් ව්‍යුත්පන්න වූ වටිනාකම වැය කිරීම සඳහා ආඥාවක් කරනු ලැබිය යුතු ය:-

(අ) අදාළ අපරාධයකින් උත්පාදිත දේ උත්පාදනය වූ, සිදු කරන ලද නීතිවිරෝධී ක්‍රියාකාරකම හඳුනාගත

හැකි ද යන්න සහ එසේ නම්, එම නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කිරීම හේතුවෙන් පාඩු විඳිනු ලැබූ තැනැත්තන් ප්‍රභේදය;

(ආ) පහත දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, රජය සතු කරන ලද දේපළ බැහැර කිරීමෙන් ව්‍යුත්පන්න වූ වටිනාකම මුළුමනින්ම ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු ද යන්න -

(i) රජය සතු කරන ලද දේපළේ කොටසක අපරාධයකින් උත්පාදිත දෙයින් වෙන් කළ නොහැකි, නීත්‍යනුකූල ලෙස ලබා ගත් දේපළක් අන්තර්ගත වේ ද යන්න;

(ii) රජය සතු කරන ලද දේපළ බැහැර කිරීමෙන් ව්‍යුත්පන්න වූ වටිනාකම අදාළ නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කිරීම හේතුවෙන් තමා හෝ තම ජනතාව හෝ ආයතන විසින් පාඩුවක් විඳිනු ලැබූ ඉල්ලීමක් කරන රාජ්‍යයකට ප්‍රේෂණය කළ යුතු ද යන්න;

(ඇ) මහාධිකරණය විසින් අදාළ යයි සලකනු ලබන වෙනත් යම් කරුණක්.

(4) අදාළ අපරාධයකින් උත්පාදිත දේ උත්පාදනය කරන ලද නීතිවිරෝධී ක්‍රියාකාරකම හඳුනාගත හැකි බවට අධිකරණය විසින් තීරණය කරන ලද්දා වූ ද, එසේ නම්, එම නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කිරීම හේතුවෙන් පාඩු විඳිනු ලැබූ තැනැත්තන් හඳුනා ගනු ලැබ ඇත්තා වූ ද අවස්ථාවක, අධිකරණය විසින් -

(අ) දේපළ බැහැර කිරීමෙන් ව්‍යුත්පන්න වූ වටිනාකමෙන් සියයට අසූවක් අපරාධයක

වින්දිතයන් හානිපූරණය කිරීමේ භාර අරමුදලට මාරු කිරීම;

(ආ) දේපළ බැහැර කිරීමෙන් ව්‍යුත්පන්න වූ වටිනාකමෙන් සියයට දහයක් රඳවා තබා ගෙන එම මුදල අපරාධයකින් උත්පාදිත දේ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා වන අරමුදලට මාරු කිරීම;

(ඇ) දේපළ බැහැර කිරීමෙන් ව්‍යුත්පන්න වූ වටිනාකමෙන් සියයට දහයක් රඳවා තබා ගෙන එම මුදල, කලින් කල, පහත දැක්වෙන කාර්ය සඳහා නීතිපතිවරයාට, ශ්‍රී ලංකා පොලිසියට සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැවරීම:-

(i) නීති නිලධරයන් සහ නීතිය බලාත්මක කිරීමේ සේවක පිරිස පුහුණු කිරීම සහ ඔවුන්ගේ ශක්නුතාව වර්ධනය කිරීම;

(ii) අපරාධයකින් උත්පාදිත දේ විමර්ශනය කිරීම, සොයා ගැනීම සහ හඳුනා ගැනීම සඳහා අවශ්‍ය උපකරණ සපයා ගැනීම;

(iii) අපරාධයකින් උත්පාදිත දේ තහනමට ගැනීම, තාවකාලික ලෙස භාරයට ගැනීම සහ තහනම් ආඥාව බලාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්පත්;

(iv) නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කිරීම මගින් තැනැත්තන් විසින්, ප්‍රතිලාභ ලබා ගැනීම වැළැක්වීම සඳහා අවශ්‍ය කටයුතු;

(v) මුදල් සංසරණ විමර්ශන, මූල්‍ය විශ්ලේෂණය, චෝහාරික ගිණුම්කරණය, චෝහාරික

විගණනය, වාණිජ දත්ත සමුදායන් වෙත ප්‍රවේශය, අපරාධයකින් උත්පාදිත දෙයක් බවට සැක කරන හෝ අපරාධයකින් උත්පාදිත දෙයක් අන්තර්ගත දේපළ සොයා ගැනීම, හඳුනා ගැනීම, සෝදිසි කිරීම සහ පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් දේශීය හෝ විදේශීය නිසි දක්ෂතා ඇති තැනැත්තන්ගේ හෝ ආයතනවල සහ සංවිධානවල වෘත්තීමය සේවාවන් ලබා ගැනීමට හෝ සපයා ගැනීමට අදාළ අවශ්‍ය ගෙවීම් සිදු කිරීම; සහ

(vi) මේ පනතේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා වන වෙනත් යම් කාර්යයන්,

සඳහා අධිකාරිය වෙත විධාන කරනු ලැබිය යුතු ය.

(5) නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කිරීම හේතුවෙන් පාඩු විඳිනු ලැබූ තැනැත්තන් ප්‍රභේදය හඳුනාගත නොහැකි බවට හෝ නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කිරීම හේතුවෙන් යම් තැනැත්තකු විසින් සෘජුව ම යම් පාඩුවක් විඳ ඇති බවට කිසිදු සාක්ෂියක් නොමැති බවට අධිකරණය විසින් තීරණය කරනු ලැබූ අවස්ථාවක, අධිකරණය විසින්, පාර්ලිමේන්තුව විසින් විධාන කරනු ලබන පරිදි නීතිය ප්‍රකාර භාවිත කිරීම සඳහා, රජය සතු කරන ලද දේපළ බැහැර කිරීමෙන් ව්‍යුත්පන්න වූ වටිනාකමෙන් සියයට අසූවක් ඒකාබද්ධ අරමුදලට මාරු කරන ලෙස අධිකාරිය වෙත විධාන කරනු ලැබිය යුතු ය. ඉතිරි සියයට විස්ස මේ වගන්තියේ (4) වන උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේදවල දක්වා ඇති ආකාරයට භාවිත කරනු ලැබිය යුතු ය.

(6) රජය සතු කරන ලද දේපළෙහි කොටසක් ලෙස නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කිරීම මගින් ව්‍යුත්පන්න වූ අපරාධයකින් උත්පාදිත දෙයින් වෙන් කළ නොහැකි නීත්‍යානුකූල දේපළක් අන්තර්ගත වන බවට අධිකරණය විසින් තීරණය කරනු ලැබූ

අවස්ථාවක, අධිකරණය විසින්, රජය සතු කරන ලද අපරාධයකින් උත්පාදිත දෙයෙහි නීත්‍යානුකූල කොටසේ වටිනාකම ගණනය කර, එම දේපළ සඳහා නීත්‍යානුකූල හිමිකමක් ඇති බවට අධිකරණය විසින් හඳුනා ගනු ලැබූ පාර්ශ්වකරුට එම මුදල පවරන ලෙස අධිකාරිය වෙත විධාන කරනු ලැබිය යුතු ය.

(7) රජය සතු කරන ලද දේපළ බැහැර කිරීමෙන් ව්‍යුත්පන්න වූ වටිනාකම අදාළ නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කිරීම හේතුවෙන් තමා විසින් ම හෝ තම ජනතාව හෝ ආයතන විසින් පාඩු විඳිනු ලැබූ ඉල්ලීමක් කරන රාජ්‍යයක් වෙත ප්‍රේෂණය කළ යුතු බවට අධිකරණය විසින් තීරණය කරනු ලැබූ අවස්ථාවක, අධිකරණය විසින්, විදේශ කටයුතු විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විමසා මේ වගන්තියේ (4) වන උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේදවලට අනුකූලව කටයුතු කිරීමට යටත්ව, අදාළ මුදල එම ඉල්ලීම කරන රාජ්‍යයේ නිසි බලධරයා වෙත පවරන ලෙස අධිකාරියට නියම කරනු ලැබිය යුතු ය.

## IX වන කොටස

## අපරාධයක වින්දිතයන් හානිපූරණය කිරීමේ භාර අරමුදල

අපරාධයක වින්දිතයන් හානිපූරණය කිරීමේ භාර අරමුදල

**132.** (1) මේ පනත ක්‍රියාත්මක වීම මගින් (මේ පනතේ “භාර අරමුදල” යනුවෙන් සඳහන් කරනු ලබන) අපරාධයක වින්දිතයන් හානිපූරණය කිරීමේ භාර අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන භාරයක් විය යුතු ය.

(2) භාර අරමුදල ඒකාබද්ධ අරමුදලේ කොටසක් විය යුතු ය.

(3) භාර අරමුදලෙහි පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු ය:-

(අ) (i) හානිපූරණය කළ යුතු අපරාධයක වින්දිතයන් ප්‍රභේදය සම්බන්ධයෙන් මහාධිකරණය විසින් කරන ලද ආඥාව; සහ

(ii) රජය සතු කරන ලද අදාළ අපරාධයකින් උත්පාදිත දෙය ජනිත කළ නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කිරීම මගින් ඉහත කී අපරාධයක වින්දිතයන් ප්‍රභේදයට බලපෑමක් වී ඇති ආකාරය,

යන කරුණු සලකා බැලීමෙන් පසු එම අපරාධ වින්දිතයන්ගේ ප්‍රතිලාභය සඳහා ක්‍රියාත්මක කළ යුතු සුදුසු හානිපූර්ණ, සංවර්ධන හෝ සුබසාධන ක්‍රියාකාරකම් සකස් කිරීම;

*පැහැදිලි කිරීම:*

මෙය ඉහත සඳහන් නීතිවිරෝධී ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් වශයෙන් සිදු වූ මුල් සෘණාත්මක බලපෑම අවම කිරීමේ කාර්යය සඳහා වේ.

(ආ) බලපෑමට ලක් වූ අපරාධ වින්දිතයන් ප්‍රභේදය සම්බන්ධයෙන් අධිකරණය විසින් නියම කිරීමකින් තොරව භාර අරමුදල වෙත යම් මුදලක් ප්‍රේෂණය කර ඇත්නම් රජයේ ප්‍රතිපත්ති සලකා බලා භාර අරමුදලට ප්‍රේෂණය කරන ලද ඒ මුදල භාවිතයෙන් කළ හැකි මහජන සුභසෙත ක්‍රියාවට නංවන්නා වූ සුදුසු සංවර්ධන කටයුතු හඳුනා ගැනීම.

භාර අරමුදලෙහි අරමුදල්

**133.** භාර අරමුදලෙහි අරමුදල පහත දැක්වෙන මුදල්වලින් සමන්විත විය යුතු ය:-

(අ) 131 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (අ) වන ඡේදය ප්‍රකාරව මහාධිකරණයේ විධානයන් මත අධිකාරිය විසින් ප්‍රේෂණය කරන ලද මුදල්;

(ආ) භාර අරමුදල වෙත ප්‍රේෂණය කිරීමට පාර්ලිමේන්තුව විසින් වෙන් කර ලබා දෙන මුදල්;

(ඇ) ශ්‍රී ලංකාවට හිමිකමක් ඇති අපරාධයකින් උත්පාදිත දේ බැහැර කිරීමෙන් උපචිත වන මුදල් ලෙස විදේශ පරිපාලන, නීති බලාත්මක කිරීමේ සහ අධිකරණ අධිකාරීන් විසින් ශ්‍රී ලංකා රජයට ප්‍රේෂණය කරනු ලබන මුදල්.

භාර අරමුදලෙහි භාරකාර මණ්ඩලය

**134.** භාර අරමුදලෙහි භාරකාර මණ්ඩලය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය:-

(අ) සභාපති විය යුතු භාණ්ඩාගාර ලේකම්වරයා; සහ

(ආ) පහත දැක්වෙන සාමාජිකයන් හය දෙනා -

(i) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරන ලද අතිරේක ලේකම්වරයා (නීති);

(ii) සමාජ සේවා විෂයය පවරන ලද අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ ලේකම්වරයා විසින් නම් කරන ලද අතිරේක ලේකම්වරයකු;

(iii) මහ බැංකුවේ මූල්‍ය පද්ධති ස්ථායීතා භාර නියෝජ්‍ය අධිපතිවරයා;

(iv) ලංකා වාණිජ මණ්ඩලයේ සභාපතිවරයා හෝ ඔහුගේ නාමිකයකු;

(v) ඔවුන්ගේ තෝරා ගැනීම සම්බන්ධව හේතු වාර්තා කරමින්, අමාත්‍යවරයා සහ සමාජ සේවා විෂයය පවරන ලද අමාත්‍යවරයා විමසා මුදල් විෂයය පවරන ලද අමාත්‍යවරයා විසින් පත් කරන ලද පිළිගත් දේශපාලනිකව නොබැඳි සමාජ සේවා සංවිධානවලින් නම් කරන ලද දෝෂාරෝපණයට ලක්ව නොමැති අවංකත්වයක් සහ යහපත් චරිතයකින් යුත් තැනැත්තන් දෙදෙනකු.

භාරකරුවන්ගේ කාර්ය

**135.** භාර අරමුදලෙහි භාරකරුවන්ගේ කාර්ය පහත දැක්වෙන පරිදි විය යුතු ය:-

(අ) (i) සකස් කරන ලද ක්‍රියාකාරකම් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමේ හැකියාව ඇති රාජ්‍ය ආයතන සහ රාජ්‍ය නොවන ආයතන;

(ii) වඩාත් හිතකර කොන්දේසි මත ඒ ක්‍රියාත්මක කිරීමේ නියෝජ්‍යායතනයේ සේවා ලබා ගැනීම; සහ

(iii) පවරන ලද අරමුදල් තවදුරටත් යම් නීතිවිරෝධී ක්‍රියාකාරකම්වලට යටත් නොකරන බවටත්, පවරන ලද කටයුතු විනිවිධභාවයෙන් යුතුව ක්‍රියාත්මක කරන බවටත් සහතික වීම,

පිළිබඳ සැලකිල්ලට ගනිමින් ඒ සකස් කරන ලද ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට සුදුසු තැනැත්තන් හඳුනාගැනීම සහ පත් කිරීම;

(ආ) වඩාත් හිතකර කොන්දේසි මත පදනම්ව සුදුසු ක්‍රියාත්මක කිරීමේ නියෝජ්‍යායතනයක සේවාවන්

ලබා ගැනීමේ කාර්යය සඳහා කැමැත්ත ප්‍රකාශ කිරීම සඳහා හෝ ටෙන්ඩර් සඳහා හෝ කැඳවනු ලැබීම;

(ඇ) සකස් කරන ලද ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය නියෝජ්‍යායතන සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීම සහ එකී කාර්යය සම්බන්ධයෙන් රාජ්‍ය නොවන නියෝජ්‍යායතන සමඟ ගිවිසුම්වලට එළඹීම;

(ඈ) ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් වෙන් කිරීම, වැඩවල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සහ අධීක්ෂණය;

(ඉ) භාර අරමුදලෙහි අරමුණු බලාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන යම් වෙනත් කටයුතු කිරීම;

(ඊ) භාර අරමුදලෙහි අරමුණු සහ භාරකරුවන්ගේ කාර්යයන් බලාත්මක කිරීම සඳහා භාර අරමුදලට සහාය වීමට මහා භාණ්ඩාගාරයේ නිලධරයන්ගේ සේවාවන් ලබා ගැනීම;

(උ) ඒකාබද්ධ අරමුදල තුළ ගිණුමක් පිහිටුවීම සහ පවත්වාගෙන යාම සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශය පවත්වාගෙන යාම;

(ඌ) හානිපූර්ණ, සංවර්ධන සහ සුභසාධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම හා ඒවායේ ප්‍රගතිය පිළිබඳ සියලු තොරතුරු කාර්තුමය වශයෙන් භාර අරමුදලෙහි නිල වෙබ් අඩවියෙහි පළ කිරීම;

(එ) විගණකාධිපතිවරයා විසින් භාර අරමුදලෙහි වාර්ෂික විගණන ඇතුළුව ගිණුම් විගණනය කිරීමට කටයුතු කිරීම; සහ

(ඒ) පාර්ලිමේන්තුවට වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කිරීම සහ එම වාර්ෂික වාර්තාව සිය වෙබ් අඩවියේ පළ කිරීම.

භාර අරමුදලෙහි අර්ථලාභීන්

**136.** (අ) මහාධිකරණය විසින් කරන ලද ආඥාවකින් නිශ්චිත ලෙස සඳහන් නියම කරනු ලබන පරිදි නීතිවිරෝධී ක්‍රියාකාරකම් කිරීම හේතුවෙන් පාඩු විඳිනු ලැබූ තැනැත්තන්;

(ආ) භාරකාර මණ්ඩලය විසින් බලපෑමට ලක් වූ වින්දිතයන් වර්ගය ලෙස හඳුනාගත් තැනැත්තන්,

භාර අරමුදලෙහි අර්ථලාභීන් විය යුතු ය.

භාරකාර මණ්ඩලයේ රැස්වීම් සහ ගණපූරණය

**137.** (1) භාරකාර මණ්ඩලයේ රැස්වීම්, යටත් පිරිසෙයින් මසකට වරක්වත් පැවැත්විය යුතු ය.

(2) භාරකාර මණ්ඩලයේ රැස්වීමක් සඳහා වන ගණපූරණය සාමාජිකයන් පස් දෙනෙකු විය යුතු ය.

(3) සභාපතිවරයා භාරකාර මණ්ඩලයේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතු ය. භාරකාර මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි අවස්ථාවක, පැමිණ සිටින සාමාජිකයින් විසින් තෝරා පත් කරගත් සාමාජිකයකු එම රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

(4) භාරකාර මණ්ඩලයේ යම් රැස්වීමක දී තීරණය කරනු ලැබිය යුතු සියලුම ප්‍රශ්න, එම රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සමාන වන අවස්ථාවක, එවැනි රැස්වීමක මුලසුන දරන සභාපතිවරයාට හෝ එවැනි වෙනත් සාමාජිකයාට ස්වකීය ඡන්දයට අමතරව තීරක ඡන්දයක් හිමි විය යුතු ය.

(5) භාරකාර මණ්ඩලය විසින්, මෙම වගන්තියේ ඉහතින් වූ විධිවිධානවලට යටත්ව, භාරකාර මණ්ඩලයේ රැස්වීම් කටයුතු සම්බන්ධයෙන් වන කාර්ය පටිපාටිය සහ එවැනි රැස්වීම්වල කටයුතු නියාමනය කරනු ලැබිය හැකි ය.

**138.** (1) භාරකාර මණ්ඩය විසින්, කලින් කල, පූර්ණ කාලීන හෝ අර්ධ කාලීන පදනම මත භාරකාර මණ්ඩලයේ මණ්ඩල ලේකම් ලෙස කර්තව්‍ය කිරීම සඳහා නීතිඥවරයකු හෝ වරලත් ලේකම්වරයකු පත් කරනු ලැබිය යුතු අතර එම තැනැත්තාට ගෙවිය යුතු පාරිශ්‍රමික නිශ්චය කළ යුතු ය. භාරකාර මණ්ඩලයේ මණ්ඩල ලේකම්

(2) භාරකාර මණ්ඩලයේ සභාපතිවරයා විසින් විධානය කරනු ලබන පරිදි හෝ භාරකාර මණ්ඩලයේ යෝජනා සම්මතයක් මත පදනම්ව භාරකාර මණ්ඩලයේ රැස්වීම් කැඳවීම මණ්ඩල ලේකම්ගේ කාර්යය විය යුතු ය.

(3) භාරකාර මණ්ඩලයේ රැස්වීම්වල වාර්තා පවත්වාගෙන යාම සහ මණ්ඩලයේ භාරකාර රැස්වීම් පැවැත්වීම සඳහා අවශ්‍ය වැඩපිළිවෙල සඳහා පහසුකම් සැලැස්වීම මණ්ඩල ලේකම්ගේ වගකීම විය යුතු ය.

**139.** භාරකාර මණ්ඩලය විසින්, ස්වකීය සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබුන ද, එය නොතකා ක්‍රියා කරනු ලැබිය හැකි අතර, භාරකාර මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් ස්වකීය සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීම හෝ එහි සාමාජිකයකු පත්කිරීමේ යම් දෝෂයක් පැවතීමේ හේතුව මතම පමණක් අවලංගු වූ ලෙස සලකනු නොලැබිය යුතු ය. යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුව මත භාරකාර මණ්ඩලයේ ක්‍රියා හෝ කටයුතු අවලංගු වූ ලෙස සලකනු නොලැබිය යුතු බව

**140.** මුදල් විෂය පවරා ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයට සහ අනුප්‍රමාණ මත භාරකාර මණ්ඩලයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය. භාරකාර මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික

## X වන කොටස

### ජාත්‍යන්තර සහයෝගීතාව

අන්‍යෝන්‍ය නෛතික සහාය

**141.** (1) මේ පනතේ මේ කොටස යටතේ වන පටිපාටිය සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත අනුව සිදු කළ යුතු ය.

(2) සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත ප්‍රකාරව පත් කරන ලද මධ්‍යම බලධරයා වෙත ලැබුණු අන්‍යෝන්‍ය සහයෝගීතාව සඳහා වන අපරාධයකින් උත්පාදිත දේ සම්බන්ධයෙන් අදාළ වන යම් ඉල්ලීමක් පොලීසියේ නම් කරන ලද නිලධරයාට හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නම් කරන ලද නිලධරයාට මේ පනත ප්‍රකාරව ඔවුනට පවරා ඇති කර්තව්‍ය කෙරෙහි නිසි සැලකිල්ලක් දක්වමින් එම පොලීසියේ නම් කරන ලද නිලධරයා හෝ කොමිෂන් සභාවේ නම් කරන ලද නිලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

වෙනත් රටවල නිසි බලධාරීන් වෙත ශ්‍රී ලංකාව විසින් කරනු ලබන ඉල්ලීම්

**142.** පරිපාලනමය අවශ්‍යතාවලට යටත් ව, මේ පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්යය සඳහා නම් කරන ලද නිලධරයා විසින් පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් වෙනත් රටවල පරිපාලනමය, නීතිය බලාත්මක කිරීමේ සහ අධිකරණ නිසි බලධරයන්ගෙන් සහාය ඉල්ලා සිටීම සහ ලබා ගැනීම නීත්‍යානුකූල වන්නේ ය:-

(අ) අපරාධයකින් උත්පාදිත දේ වන බවට සැක සහිත දේපළ සොයාගැනීම, හඳුනාගැනීම, සෝදිසි කිරීම, අනාවරණය කර ගැනීම සහ පරීක්ෂා කිරීම සඳහා සහ වෙනත් විමර්ශන කාර්යයන් සඳහා සහාය ලබා ගැනීම;

(ආ) ලේඛන, සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ, වාර්තා සහ නියැදි හා ආදර්ශ ඇතුළු වෙනත් දේ ඇතුළුව සාක්ෂි එකතු කිරීම සඳහා සහාය ලබා ගැනීම;

(ඈ) සාක්ෂිකරුවන් සිටින ස්ථානය හෝ වාර්තා සහ අපරාධයකින් උත්පාදිත දේ යයි සැක සහිත දේ පිහිටන ස්ථානය සොයා ගැනීම සහ හඳුනා ගැනීම සඳහා සහාය ලබා ගැනීම;

(ඇ) පෞද්ගලිකව හෝ සමකාලීන ශ්‍රව්‍ය-දෘශ්‍ය සම්බන්ධකයන් හරහා හෝ සාක්ෂිකරුවන්ගෙන් ප්‍රශ්න කිරීම සහ ඔවුන්ගේ ප්‍රකාශ වාර්තා කිරීම සඳහා පහසුකම් සැලසීමට සහාය ලබා ගැනීම; අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, ඒ ප්‍රශ්න කිරීමේ දුරස්ථ ස්ථානය අදාළ පරිපාලනමය, නීතිය බලාත්මක කිරීමේ හෝ අධිකරණ නිසි බලධරයාගේ කාර්යාලයේ දී විය හැකි ය;

(ඉ) අපරාධයකින් උත්පාදිත දේ හෝ එහි වටිනාකම තහනමට ගැනීම, අධිකරණමය ක්‍රියා විරහිත කිරීම, රජය සතු කිරීම සහ ශ්‍රී ලංකාවට ආපසු ලබා දීම සඳහා ඉල්ලා සිටීම;

(ඊ) ශ්‍රී ලංකාවේ අධිකරණය විසින් කරන ලද අධිකරණ නියෝග විදේශ රටවලට සම්ප්‍රේෂණය කිරීම, භාර දීම සහ බලාත්මක කිරීම;

(උ) වරදකරු කිරීමෙන් පසුව සහ වරදකරු නොකිරීම මත පදනම් කරගත් රජය සතු කිරීමේ නඩු කටයුතු සහ අදාළ කාරණා සඳහා සහයෝගය දැක්වීම;

(ඌ) සිතාසි, අධිකරණයේ වෙනත් නියෝග භාර දීම සිදු කිරීම සහ ශ්‍රී ලංකාවේ දී පැවැත්වෙන අධිකරණමය නඩු කටයුතුවලට සාක්ෂිකරුවන්ගේ පැමිණීම සහතික කිරීමට සහාය වීම;

(එ) විදේශීය පරිපාලන අධිකාරීන්, නීතිය බලාත්මක කිරීමේ අධිකාරීන් සහ අදාළ සමාන පාර්ශ්වයන් සමඟ එකතු වී විමර්ශන පැවැත්වීම සම්බන්ධයෙන් සහාය ලබා ගැනීම;

(ඒ) පළමු ඉල්ලීම සඳහා පසුව කරනු ලබන සහ වැඩිදුරටත් වූ අදාළ සහාය ලබා දීම් ඇතුළුව මේ පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්යය සඳහා අවශ්‍ය සහයෝගය සම්බන්ධයෙන් වන වෙනත් කාරණා.

විදේශ පරිපාලන, නීතිය බලාත්මක කිරීමේ සහ අධිකරණ නිසි බලධාරීන් විසින් ශ්‍රී ලංකාවේ සමාන අධිකාරීන් වෙත කරනු ලබන ඉල්ලීම්

**143.** යම් වෙනත් රටක පරිපාලන, නීතිය බලාත්මක කිරීමේ සහ අධිකරණ නිසි බලධරයකුගෙන් සහාය ලබා ගැනීම සඳහා මේ පනත ප්‍රකාරව නම් කරන ලද නිලධරයකුට හිමිකම ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් නම් කරන ලද නිලධරයාගෙන් සහාය ඉල්ලා සිටීමට සහ සහාය ලබා ගැනීමට විදේශ පරිපාලන, නීතිය බලාත්මක කිරීමේ සහ අධිකරණ නිසි බලධරයකුට හිමිකම ඇත්තේ ය.

අන්‍යොන්‍ය සහයෝගීතාවය

**144.** (1) මේ පනතේ මේ කොටසේ විධිවිධාන -

(අ) අනුරූප රාජ්‍යය සමඟ ශ්‍රී ලංකාව පාර්ශ්වයක් වන ජාත්‍යන්තර, කලාපීය, බහුපාර්ශ්වීය සහ ද්විපාර්ශ්වීය ගිවිසුම්;

(ආ) ශ්‍රී ලංකාව සහ අනුරූප රාජ්‍යය විසින් අපරානුමත කරන ලද ජාත්‍යන්තර සම්මුති; සහ

(ඇ) ශ්‍රී ලංකාව සහ අනුරූප රාජ්‍යය විසින් තත්කාර්ය පිළිබඳව හෝ සිද්ධියෙන් සිද්ධියට ඇති කරගත් අවබෝධතාවය,

ප්‍රකාරව බලාත්මක විය යුතු ය.

(2) මේ කොටසේ කාර්යය සඳහා විදේශ කටයුතු විෂයය පවරන ලද අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා (1) වන උපවගන්තියේ සඳහන් කාරණා පැවතීම සහතික කිරීම කළ යුතු ශ්‍රී ලංකාවේ නිසි බලධරයා විය යුතු ය.

(3) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කරන ලද ඉල්ලීමක් මත විදේශ කටයුතු විෂයය පවරන ලද අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් යම් වෙනත් රටක බලයලත් අධිකාරියක් සමඟ සාකච්ඡා කර මේ පනතේ මේ කොටස යටතේ අන්‍යෝන්‍ය සහයෝගීතාවය ලබා ගැනීමේ කාර්යය සඳහා කලාපීය, බහුපාර්ශ්වීය සහ ද්විපාර්ශ්වීය ගිවිසුම්වලට එළඹීමට හෝ තත්කාර්යය පිළිබඳ හෝ සිද්ධියෙන් සිද්ධියට අවබෝධතාවයට එළඹීමට ඒ ලේකම්වරයාට බලය තිබිය යුතු ය.

(4) මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා 142 වන වගන්තියේ සඳහන් කාරණා සම්බන්ධයෙන් ඉල්ලීමක් කිරීමට නම් කළ නිලධරයාට හිමිකම තිබිය යුතු අතර, එය විදේශ කටයුතු විෂයය පවරන ලද අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හරහා ලැබුම්කාර රාජ්‍යයේ නිසි බලධරයා වෙත ලබා දිය යුතු ය.

(5) මේ පනතේ කාර්ය සඳහා අපරාධයකින් උත්පාදිත දේ සංරක්ෂණය කිරීම, තහනම් කිරීම, තහනමට ගැනීම, ක්‍රියා විරහිත කිරීම හෝ රජය සතු කිරීම සඳහා විදේශ පරිපාලන, නීතිය බලාත්මක කිරීමේ හෝ අධිකරණ අධිකාරීන් වෙත කරනු ලබන ඉල්ලීමක්, ඒ ඉල්ලීමට මහාධිකරණය විසින් අවසර දෙනු ලබන්නේ නම් මිස, විදේශ නිසි බලාධිකාරයක් වෙත ඉදිරිපත් නොකළ යුතු ය.

(6) අපරාධයකින් උත්පාදිත දේ උත්පාදනය වීමට හේතු වී ඇති බවට විශ්වාස කරන නීතිවිරෝධී ක්‍රියාකාරකම දූෂණ විරෝධී පනත යටතේ වරදක් සංස්ථාපනය කරන්නා වූ ක්‍රියා සිදු කිරීමෙන් හටගෙන ඇති නම්, ඒ අපරාධයකින් උත්පාදිත දේ සෙවීම, හඳුනා ගැනීම සහ අනාවරණය කර ගැනීම සම්බන්ධයෙන් විමර්ශන සහාය ලබා ගැනීම සඳහා හෝ මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි යම් වෙනත් කාරණයක් සඳහා විදේශීය පරිපාලන, නීතිය

බලාත්මක කිරීමේ හෝ අධිකරණ නිසි බලධරයකු විසින් කරනු ලබන ඉල්ලීමක් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නම් කරන ලද නිලධරයා අමතමින් ඉදිරිපත් කළ යුතු ය. යම් වෙනත් ඉල්ලීමක් පොලීසියේ නම් කරන ලද නිලධරයා අමතමින් ඉදිරිපත් කළ යුතු ය.

උදර්පණය කිරීම

**145.** ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පණ පනතේ කාර්යය සඳහා මේ පනතේ අන්තර්ගත වන වැරදි උදර්පණය කරනු ලැබිය හැකි වැරදි ලෙස සැලකිය යුතු ය.

## XI වන කොටස

## විවිධ විධිවිධාන

නියෝග

**146.** (1) මේ පනත මගින් නියම කළ යුතු යයි නියමිත සියලු කාරණා සම්බන්ධයෙන් හෝ මේ පනත යටතේ නියෝග සෑදීමට නියමිත හෝ බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් මේ පනත යටතේ අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය මගින් පවරන ලද බලතල ව්‍යාප්තියට විශේෂයෙන් සහ අගති විරහිතව, හවුල්ව එම නිර්දේශ කළ යුතු නම් කරන ලද නිලධරයින්ගේ සහ අධිකාරියේ නිර්දේශය මත සහ නීතිපතිවරයාගේ උපදෙස් මත අමාත්‍යවරයා වෙත පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් සම්මත ක්‍රියාත්මක කිරීමේ ප්‍රොටොකෝල ස්වරූපය ගත යුතු නියෝග සෑදීමට බලය තිබිය යුතු ය:-

(අ) අපරාධයකින් උත්පාදිත දේ යයි සැක කරනු ලබන දේ පිළිබඳව විමර්ශන පැවැත්විය හැකි ආකාරය;

(ආ) තහනම් කිරීමේ නියෝග නිකුත් කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්යපටිපාටිය සහ තහනම් කිරීමේ නියෝගයක ආකෘතිය;

(ඇ) තහනමට ගැනීමක් කළ යුතු ආකාරය සහ තහනමට ගැනීමේ දැන්වීමක ආකෘතිය;

(ඈ) පෙර තහනම් කිරීමේ සැලසුම් කිරීම සහ පෙර තහනමට ගැනීමේ සැලසුම් කිරීම ක්‍රියාත්මක කිරීම;

(ඉ) අපරාධයකින් උත්පාදිත දේ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම;

(ඊ) සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ විධිවිධාන අදාළ කරගත හැකි ආකාරය සහ විමර්ශන සඳහා විදේශීය පරිපාලන අධිකාරීන්ගෙන් සහාය ලබාගත හැකි ආකාරය;

(උ) අපරාධයකින් උත්පාදිත දේ යයි සැක කරනු ලබන දේ පිළිබඳව විමර්ශනය කිරීමේ දී සහාය සඳහා විදේශ නිසි බලධරයකුගේ ඉල්ලීමක් කළ යුතු ආකාරය;

(ඌ) විදේශ රටක දී කරන ලද යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ තිබෙන අපරාධයකින් උත්පාදිත දේ රජය සතු කිරීම සඳහා වන ඉල්ලීමක් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය;

(එ) විදේශ රටක පවත්වනු ලබන විමර්ශනයකට සහාය ලබා ගැනීම සඳහා වන ඉල්ලීමක් කළ යුතු ආකාරය;

(ඒ) විනාශකාරී සහ අන්තරායදායක, අපරාධයකින් උත්පාදිත දේ බැහැර කිරීම;

(ඔ) අධිකරණය විසින් දේපළ පිළිබඳ තක්සේරුව ලබාගත යුතු සහ ඒ දේපළෙහි වටිනාකම නිශ්චය කළ යුතු කාර්යපටිපාටිය; සහ

(ඕ) අපරාධයකින් උත්පාදිත දේ වෙන්දේසි කිරීම කරගෙන යා යුතු කාර්ය පටිපාටිය.

(3) සම්මත ක්‍රියාත්මක කිරීමේ ප්‍රොටොකෝලයක් නියෝගයක් ලෙස පළ කිරීමෙන් පසුව ඒ ප්‍රොටොකෝලයට නීතියේ බලය තිබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර එය පළ කරන දින සිට හෝ එහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක සිට බලාත්මක විය යුතු ය.

(5) (අ) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු මාස තුනක කාලයක් ඇතුළත පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

(ආ) එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක් ඒ යටතේ කලින් සිදු කරන ලද කිසිවකට අගතියක් නොමැතිව ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

වෙනත් නීතිවල විධිවිධාන අභිබවා මේ පනත බලපැවැත්විය යුතු බව

**147.** මේ පනතේ විධිවිධානයක් සහ යම් වෙනත් නීතියක විධිවිධානයක් අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, ඒ වෙනත් නීතියේ විධිවිධානය අභිබවා මේ පනතේ විධිවිධානය බලපැවැත්විය යුතු ය.

සද්භාවයෙන් කරන ලද ක්‍රියාවන් සඳහා වන ආරක්ෂාව

**148.** මේ පනතේ කාර්යය සඳහා සද්භාවයෙන් සහ කාර්යක්ෂමව කටයුතු කර ඇති කිසිදු නම් කරන ලද නිලධරයකු හෝ විමර්ශන නිලධරයකු හෝ නම් කරන ලද නිලධරයකුගේ

හෝ විමර්ශන නිලධරයකුගේ උපදෙස් මත කටයුතු කරන ලද යම් වෙනත් පොලිස් නිලධරයකු හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ යම් නිලධරයකු මේ පනත මගින් හෝ මේ පනත යටතේ පවරන ලද බලතල ප්‍රකාරව හෝ මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා ඒ නිලධරයා විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් නීත්‍යානුකූල ක්‍රියාවක් සඳහා කිසිම නඩුවක දී හෝ වෙනත් නීති කෘත්‍යයක දී වගකියනු නොලැබිය යුතු ය.

තොරතුරු දැනගැනීමේ පනතේ අදාළත්වය

**149.** (1) මේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනතේ ප්‍රතිපාදන අභිබවා තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත බලාත්මක විය යුතු අතර, තොරතුරු දැනගැනීමේ පනත යටතේ යම් තොරතුරකට හිමිකමක් ඇති යම් තැනැත්තකුට එම තොරතුරු පී.සී.අයි.ඩී, අල්ලස් හෝ දූෂණ චෝදනා පිළිබඳ විමර්ශන කොමිෂන් සභාව, අධිකාරිය සහ භාර අරමුදල වෙතින් ඒ තොරතුරු ලබා ගැනීමට හිමිකම තිබිය යුතු ය.

(2) පී.සී.අයි.ඩී, අධිකාරිය සහ භාර අරමුදල යන ආයතන පිහිටුවා මාස තුනක් ඇතුළත සහ අල්ලස් හෝ දූෂණ චෝදනා පිළිබඳ විමර්ශන කොමිෂන් සභාව විසින් ඒ ආයතන වෙත මේ පනත යටතේ කාර්යයන් සහ කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා, වෙනත් කාරණා අතරේ තොරතුරු දැන ගැනීමේ පනත යටතේ කර්තව්‍යයන් ඉටු කිරීම ඇතුළු කාර්යයන් ඉටු කළ යුතු තොරතුරු නිලධරයෙක් පත් කළ යුතු ය.

අර්ථ නිරූපණය

**150.** අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතේ -

"ගිණුම" යන්නෙන් -

(අ) ව්‍යවහාර මුදල් තැන්පත් කිරීම් පිළිගැනීම්;

(ආ) ව්‍යවහාර මුදල් ආපසු ගැනීම් සඳහා අවසර දීම්; හෝ

(ඇ) ආයතනය වෙනුවෙන් චෙක්පත් හෝ ගෙවීම් ඇනවුම් ගෙවනු ලබන නැතහොත්

මූල්‍ය ආයතනය නොවන යම් තැනැත්තකු වෙනුවෙන් චෙක්පත් හෝ ගෙවීම් ඇනවුම් එකතු කිරීම්,

සිදු කරන යම් මූල්‍ය ආයතනයක් විසින් ලබාදෙන යම් පහසුකමක් හෝ වැඩපිළිවෙළක් අදහස් වන අතර, ඊට ආරක්ෂක තැන්පතු පෙට්ටියක් සඳහා හෝ වෙනත් යම් ආකෘතියක වූ ආරක්ෂිත තැන්පතු සඳහා වූ යම් පහසුකමක් හෝ වැඩපිළිවෙළක් ඇතුළත් වේ;

“දූෂණ විරෝධී පනත” යන්නෙන්, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත අදහස් වේ;

“අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත” යන්නෙන්, 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත අදහස් වේ;

“අධිකාරිය” යන්නෙන්, මේ පනතේ 96 වන වගන්තිය යටතේ පිහිටුවනු ලද අපරාධයකින් උත්පාදිත දේ කළමනාකරණය කිරීමේ අධිකාරිය අදහස් වේ;

“ප්‍රතිලාභය” යන්නෙන්, වෙනත් යම් තැනැත්තකු -

(අ) පළමුව සඳහන් තැනැත්තාගේ පාලනයට යටත් නම්;

(ආ) පළමු තැනැත්තා විසින් නියම කරනු ලැබ හෝ ඉල්ලා සිටිනු ලැබ ඇත්තේ නම්; හෝ

(ඇ) පළමු තැනැත්තාට වෛවාහික හෝ පවුල් සබඳතාවක් හෝ සැලකිය යුතු වැදගත්කමකින් යුතු වේ නම්,

ඒ වෙනත් යම් තැනැත්තා විසින් ව්‍යුත්පන්න කරනු ලබන, ලබා ගන්නා හෝ වෙනත් ආකාරයකින් ඒ වෙනත් යම් තැනැත්තාට

ව්‍යුත්පන්න වනු ලබන වාසියක්, ඉපැයීමක්, සේවාවක්, ලාභයක් හෝ ඕනෑම ආකාරයක ගෙවීමක් සහ ප්‍රතිලාභ ඇතුළුව යම් තැනැත්තකුට ව්‍යුත්පන්න වන වාසියක්, ඉපැයීමක්, සේවාවක්, ලාභයක් හෝ ඕනෑම ආකාරයක ගෙවීමක් සහ ප්‍රතිලාභයක්, අදහස් වේ;

"මුදල්" යන්නෙන්, රටේ වලංගු මුදල් වශයෙන් නම් කරනු ලැබ ඇති යම් කාසියක් හෝ මුදල් නෝට්ටුවක් අදහස් වන අතර ඊට,

(අ) ධාරක බැඳුම්කර;

(ආ) සංචාරක චෙක්පත්;

(ඇ) තැපැල් නෝට්ටු; සහ

(ඈ) මුදල් ඇනවුම්,

ඇතුළත් වේ;

"සිවිල් නඩු විධාන සංග්‍රහය" යන්නෙන්, (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය අදහස් වේ;

"අපරාධ නඩු විධාන සංග්‍රහය පනත" යන්නෙන්, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත අදහස් වේ;

"කොළඹ වරාය නගරය ආර්ථික සභාව පනත" යන්නෙන්, 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත අදහස් වේ;

"කොමිෂන් සභාව" යන්නෙන්, දූෂණ විරෝධී පනතේ 3 වන වගන්තිය යටතේ පිහිටුවන ලද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව අදහස් වේ;

"පරිගණක පද්ධතිය" යන්නෙන්, පරිගණකයක් හෝ අන්තර්ජාලය හෝ යම් වෙනත් සම්බන්ධ කිරීමේ ආකාරයක් ඇතුළුව එකිනෙකට සම්බන්ධ කරන ලද පරිගණක සමූහයක් අදහස් වේ;

"පාලනය කරන ලද භාරදීම" යන්නෙන් -

(අ) අපරාධයකින් උත්පාදිත දේ උපයාදෙන ලද බවට සැක කරනු ලබන වරද සහ මේ පනත යටතේ වැරදි සිදු කිරීම වැඩිදුර විමර්ශන කිරීමට සලස්වමින්;

(ආ) ඉහත සඳහන් කරන ලද වැරදි සිදු කිරීමෙහි නිරත වූ සියලු තැනැත්තන් හඳුනාගැනීම;

(ඇ) දේපළ අත්කර ගැනීමට සැලැස් වූ මුදල් මූලාශ්‍රය සහ ඒ දේපළ සම්බන්ධයෙන් හෝ ඒ දේපළෙන් හටගත් මුදල් ගනුදෙනු සහ ඉහත සඳහන් දේපළ අපරාධයකින් උත්පාදිත දෙයක් ද යන්න තීරණය කිරීම සම්බන්ධයෙන් වන සාක්ෂි ඇතුළුව ඉහත සඳහන් දේපළ සම්බන්ධයෙන් වන සාක්ෂි රැස් කිරීම; හෝ

(ඈ) ඒ දේපළ සම්බන්ධයෙන් බලය ඇති සහ ඒ දේපළ සම්බන්ධයෙන් ප්‍රතිලාභමය අයිතියක් ඇති තැනැත්තන් කවුරුන්ද යන්න සොයා ගැනීම සහ හඳුනා ගැනීම,

යන කාරණා ඇතුළත් නමුත් ඒවාට පමණක් සීමා නොවිය යුතු මේ පනතේ අරමුණු ඉටු කර ගැනීමේ කාර්යය සඳහා අපරාධයකින් උත්පාදිත දේ ලෙස සැකකරනු ලබන දේපළක් විමර්ශන නිලධරයකුගේ ඍජු හෝ වක්‍ර අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකාවෙන් පිටතට, ශ්‍රී ලංකාව හරහා හෝ ශ්‍රී ලංකාවට හෝ ශ්‍රී ලංකා දේශ සීමාව තුළ එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට යැවීමට අවසර ලබා දීමේ විමර්ශනය කිරීමේ තාක්ෂණික ක්‍රමවේදය අදහස් වේ;

"ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත" යන්නෙන්, 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත අදහස් වේ;

"අධිකරණය" යන්නෙන්, ජනරජයේ මහාධිකරණය අදහස් වේ;

"ව්‍යවහාර මුදල" යන්නෙන්, ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක වලංගු මුදල් වශයෙන් නම් කරනු ලැබ ඇත්තා වූ හා නිකුත් කරන ලද රටේ හුවමාරු මාධ්‍යයක් ලෙස ව්‍යවහාරිකව භාවිත කරනු ලබන්නා වූ සහ පිළිගනු ලැබ ඇත්තා වූ ද ව්‍යවහාර මුදල් අදහස් වේ;

"දේපළ පිළිබඳ ගනුදෙනු කිරීම" යන්නෙන්-

(අ) දේපළ පැවරීමක් හෝ බැහැර කිරීමක්;

(ආ) දේපළ ත්‍යාගයක් ලෙස ලබා දීම හෝ ලබා ගැනීම;

(ඇ) දේපළ ශ්‍රී ලංකාවෙන් බැහැර කිරීම;

(ඈ) දේපළ ඒ තැනැත්තාට හිමි ණයක් වන අවස්ථාවක දී ණය මුදලෙන් අඩු කරමින් හෝ ණය මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරමින් යම් තැනැත්තකුට ගෙවීමක් සිදු කිරීම;

(ඉ) ණය ලබා ගැනීමට හෝ දීර්ඝ කිරීමට දේපළ භාවිත කිරීම හෝ දේපළෙන් සුරක්ෂිත කරන ලද ණය භාවිත කිරීම; හෝ

(ඊ) දේපළ හවුල් ව්‍යාපාරයක පොලියක් වන අවස්ථාවක දී, හවුල් ව්‍යාපාරයේ වටිනාකම අඩු කිරීමට ඕනෑම දෙයක් සිදු කිරීම,

අදහස් වේ;

"නම් කළ මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන්" යන්නට -

(අ) අන්තර්ජාලය හරහා කැසිනෝ ව්‍යාපාර පවත්වාගෙන යන තැනැත්තකු සහ නැව් ආශ්‍රිතව හෝ යාත්‍රා ආශ්‍රිතව පවත්වාගෙන යනු ලබන කැසිනෝ ඇතුළු කැසිනෝ ව්‍යාපාර;

(ආ) දේපළ සංවර්ධකයක් ඇතුළු නිශ්චල දේපළ අනුයෝජිතයන්;

(ඇ) 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වාර්ණාභරණ අධිකාරිය පනත මගින් ආවරණය වන ලෝහ හා ගල් ඇතුළුව එහෙත් ඒවාට සීමා නොවූ, වටිනා ලෝහ සහ පාෂාණ ඇතුළුව වටිනා ලෝහ වෙළෙන්දන් සහ මැණික් ගල් හා අඩ මැණික් ගල් වෙළෙන්දන්;

(ඈ) පහත දැක්වෙන යම් ක්‍රියාකාරකමක් සම්බන්ධයෙන් තම සේවාදායකයන් වෙනුවෙන් ගනුදෙනු සඳහා සූදානම් වන විට හෝ ඒවා කරගෙන යන විට නීතිඥවරුන්, නොතාරිස්වරුන්, වෙනත් ස්වාධීන නීති වෘත්තිකයන් සහ ගණකාධිකාරීවරුන් -

(i) නිශ්චල දේපළ මිල දී ගැනීම සහ විකිණීම;

(ii) සේවාදායක මුදල්, සුරැකුම් හෝ වෙනත් දේපළ කළමනාකරණය කිරීම;

(iii) බැංකු, ඉතිරි කිරීම් හෝ සුරැකුම් ගිණුම් කළමනාකරණය කිරීම;

(iv) සමාගම් නිර්මාණය කිරීම, මෙහෙයුම් සිදු කිරීම හෝ කළමනාකරණය සඳහා දායක මුදල් සංවිධානය කිරීම; සහ

(v) නෛතික තැනැත්තන් හෝ නෛතික වැඩ පිළිවෙළ නිර්මාණය කිරීම, මෙහෙයවීම කිරීම හෝ කළමනාකරණය සහ ව්‍යාපාර අස්ථිත්ව මිල දී ගැනීම සහ විකිණීම;

(ඉ) ව්‍යාපාරයක් ලෙස තුන්වන පාර්ශ්වයක් වෙත පහත දැක්වෙන සේවාවන් එකක් හෝ වැඩි ගණනක් සපයන්නා වූ, මේ අර්ථ නිරූපණය මගින් අන්‍යාකාරයකින් ආවරණය නොවන භාරයක් හෝ සමාගම් සේවා සපයන්නකු -

(i) නෛතික පුද්ගලයන් හෝ නෛතික වැඩපිළිවෙළ සකස් කිරීම හෝ කළමනාකරණය කිරීම;

(ii) සමාගමක අධ්‍යක්ෂවරයකු හෝ ලේකම්වරයකු ලෙස, හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකු ලෙස හෝ වෙනත් නෛතික තැනැත්තන් සම්බන්ධයෙන් සමාන තනතුරක කටයුතු කිරීම හෝ කටයුතු කිරීමට වෙනත් තැනැත්තකු යෙදවීම;

(iii) සමාගමක්, හවුල් ව්‍යාපාරයක් හෝ වෙනත් යම් නෛතික තැනැත්තකු හෝ නෛතික වැඩපිළිවෙළක් සඳහා ලියාපදිංචි කාර්යාලයක්, ව්‍යාපාර ලිපිනයක් හෝ පහසුකමක්,

ලිපිගනුදෙනු කරන හෝ පරිපාලන ලිපිනයක් ලබාදීම;

(iv) ප්‍රකාශිත භාරයක භාරකරුවකු ලෙස කටයුතු කිරීම හෝ එසේ කටයුතු කිරීමට වෙනත් තැනැත්තකු යෙදවීම; හෝ

(v) වෙනත් තැනැත්තකු සඳහා නාමික කොටස්කරුවකු ලෙස කටයුතු කිරීම හෝ එසේ කටයුතු කිරීමට වෙනත් තැනැත්තකු යෙදවීම;

(ඊ) වෙනත් ලිඛිත නීතිවල අක්වෙරළ ඒකක සඳහා දී ඇති අර්ථ නිරූපණවලට අනුව අක්වෙරළ ඒකක;

(උ) කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ ලියාපදිංචි කරන ලද හෝ බලපත්‍රලාභී ව්‍යාපාරයක් වන මේ අර්ථ නිරූපණයේ (අ) සිට (ඊ) දක්වා ඡේදවල නිශ්චිතව දක්වා ඇති යම් ව්‍යාපාරවල නිරත යම් තැනැත්තකු; සහ

(ඌ) මුදල් ගනුදෙනු වාර්තා කිරීම පනතේ 29 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කලින් කලට නියම කරනු ලබන වෙනත් යම් ව්‍යාපාරයක්,

ඇතුළත් වන්නේ ය;

"ඩිජිටල් ව්‍යාවහාර මුදල්" යන්නට -

(අ) (i) හුවමාරු මාධ්‍යයක් ලෙස භාවිත කරනු ලබන යම් ගනුදෙනුවක් කිරීම සඳහා

වන වටිනා ප්‍රතිෂ්ඨාවක් ලෙස හෝ ගිණුම් ඒකකයක් ලෙස හෝ අගය ගබඩාවක්; සහ

(ii) වලංගු මුදල් ලෙස පිළිගත නොහැකි,

මූල්‍ය වටිනාකමක ඩිජිටල් නියෝජනය කිරීමක් ඇතුළත් විය යුතු අතර;

(ආ) (i) යම් සබඳතාවයක් හෝ ත්‍යාග වැඩසටහනක කොටසක් වශයෙන් වලංගු මුදල්, බැංකු ණය හෝ ඩිජිටල් ව්‍යවහාර මුදල් සඳහා වෙළෙන්දෙකුගෙන් ලබාගැනීමට හෝ වෙළෙන්දෙකු සමඟ හුවමාරු කිරීමට හෝ නොහැකි අගයක් ව්‍යාපාරිකයකු ප්‍රදානය කරනු ලබන්නේ කවර ගනුදෙනුවක දී ද, එවැනි ගනුදෙනුවක්; හෝ

(ii) ප්‍රකාශකයකු විසින් හෝ ප්‍රකාශකයකු වෙන් වෙන්ව නිකුත් කරන ලද සහ ඒ ප්‍රකාශකයා විසින් විකුණන ලද හෝ සමාන ක්‍රීඩා වේදිකාවේදී ම අර්පණය කරන ලද මාර්ගගත ක්‍රීඩාවක්, ක්‍රීඩා වේදිකාවක් හෝ ක්‍රීඩා පවුලක් තුළ මුළුමනින්ම භාවිත කරන ලද වටිනාකමක් පිළිබඳව වන යම් ඩිජිටල් නියෝජනයක්,

ඇතුළත් නොවිය යුතු ය;

“ලේඛනය” යන්නෙන්, යම් තොරතුරු වාර්තාවක් අදහස් වන අතර, ඊට-

(අ) ලිවීමක් ඇති යම් දෙයක්;

(ආ) අර්ථ නිරූපණය කිරීමට සුදුසුකම් සහිත තැනැත්තකුට අර්ථ නිරූපණය කළ හැකි අර්ථයක් සහිත සලකුණු, ඉලක්කම්, සංකේත හෝ සිදුරු වන යම් දෙයක්;

(ඇ) වෙනත් යම් දෙයක ආධාරයක් ඇතිව හෝ නැතිව ශබ්ද, ප්‍රතිරූප හෝ ලියවිලි නිපදවිය හැකි යම් දෙයක්;

(ඈ) සිතියමක්, සැලැස්මක්, සිත්තමක්, ඡායාරූපයක් හෝ සමාන දෙයක්; සහ

(ඉ) ඩිජිටල් ලේඛනයක් ඇතුළුව ඉලෙක්ට්‍රොනික ආකෘතියකින් තබා ඇති හෝ පවත්වාගනු ලබන, ඉහත සඳහන් යම් දෙයක්,

ඇතුළත් වේ;

“ඉලෙක්ට්‍රොනික” යන්නට 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත මගින් ඊට ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය;

‘‘සාක්ෂි ආඥාපනත’’ යන්නෙන් (14 වන අධිකාරය වූ) සාක්ෂි ආඥාපනත අදහස් වේ;

“මූල්‍ය ව්‍යාපාරය” යන්නට, පහත දැක්වෙන ව්‍යාපාර හෝ කටයුතුවලින් යම් ව්‍යාපාරයක් හෝ කටයුත්තක් ඇතුළත් වන්නේ ය:-

(අ) 1988 අංක 30 දරන බැංකු පනතේ හෝ ඒ වෙනුවට බලාත්මක කර ඇති යම් පනතක අර්ථ නිරූපණය කර ඇති බැංකු ව්‍යාපාරයක්;

(ආ) 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ හෝ ඒ වෙනුවට බලාත්මක කර ඇති යම් පනතක අර්ථ නිරූපණය කර ඇති මූල්‍ය ව්‍යාපාරයක්;

(ඇ) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමූපකාර සමිති පනත හෝ ඒ වෙනුවට බලාත්මක කර ඇති යම් පනතක් යටතේ ලියාපදිංචි කරන ලද යම් සමිතියක් විසින් කරගෙන යන ලද යම් මුදල් ව්‍යාපාරයක්;

(ඈ) 2013 අංක 1 දරන සමෘද්ධි පනත මගින් හෝ ඒ වෙනුවට බලාත්මක කර ඇති යම් පනතක් මගින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කරගෙන යනු ලබන යම් මුදල් ව්‍යාපාරයක්;

(ඉ) (90 වන අධිකාරය වූ) උකස් බඩු ගන්නන්ගේ ආඥා පනත හෝ ඒ වෙනුවට බලාත්මක කර ඇති යම් පනතක් යටතේ උකසට ගැනීම;

(ඊ) පාරිභෝගික ණය, උකස් ණය (වගකීම් සහිතව හෝ රහිත) සාධනවලට බෙදීම ඇතුළුව ණය දීම සහ වාණිජ ගනුදෙනු මූල්‍යකරණය;

(උ) පාරිභෝගික නිෂ්පාදන පිළිබඳ ගනුදෙනු නොවන මූල්‍ය කල්බදුකරණය;

(ඌ) මුදල් හෝ මුදලේ අගය මාරු කිරීමේ සේවා;

(එ) මුදල් හා ව්‍යවහාර මුදල් මාරු කිරීමේ සේවා;

(ඒ) ගෙවීම් කිරීමේ ක්‍රමෝපාය එනම් ක්‍රෙඩිට් කාඩ් (ණයපත්), ඩෙබිට් කාඩ්, සංචාරක චෙක්පත්, මුදල් ඇණවුම් හා බැංකු අයිරා හා ඉලෙක්ට්‍රොනික මුදල් වැනි ගෙවීම් විධි නිකුත් කිරීම සහ කළමනාකරණය;

(ඔ) පාරිභෝගික බැර, වගකීම සහිතව හෝ රහිතව සාධනවලට බෙදීම ඇතුළුව එහෙත් එයට සීමා නොවී මුදල් ඇපවීම් සහ වැයකිරීම් නිකුත් කිරීම සහ අහිමි කිරීම් ද ඇතුළත්ව වාණිජ ගනුදෙනු මූල්‍යකරණය;

(ඕ) තමා වෙනුවෙන් හෝ ගනුදෙනුකරුවන් වෙනුවෙන් මුදල් වෙළඳපළ සාධන පත්‍ර (එනම් චෙක්පත්, විනිමය බිල්පත්, තැන්පතු සහතික සහ ව්‍යුත්පන්න) මගින් විදේශ විනිමය, විනිමය පොළී අනුපාතික සහ සුචි සාධන පත්‍ර, අනාගත වෙළෙඳ ද්‍රව්‍ය වෙළෙඳාම් සහ පැවරිය හැකි ඇප මගින් වෙළෙඳාම් කිරීම;

(ක) සුරැකුම්පත් නිකුතුවලට සහභාගී වීම සහ එම නිකුතු හා සම්බන්ධ මූල්‍ය සේවා සැපයීම;

(ග) තනි පුද්ගල සහ සාමූහික ප්‍රෝටෆෝලියෝ කළමනාකරණය;

(ච) වෙනත් තැනැත්තන් වෙනුවෙන් අරමුදල් හෝ මුදල් ආයෝජනය, පරිපාලනය හෝ කළමනාකරණය;

(ජ) වෙනත් තැනැත්තන් වෙනුවෙන් මුදල් හෝ ද්‍රවශීල සුරැකුම්පත් ආරක්ෂණය සහ පරිපාලනය;

(ට) ආරක්ෂක සුරැකුම් සේවා;

(ඔ) ජීවිත රක්ෂණ සහ වෙනත් ආයෝජන සම්බන්ධ රක්ෂණ ප්‍රාරක්ෂණය කිරීම සහ ස්ථානගත කිරීම මෙන්ම රක්ෂණ නියෝජිතයන් සහ තැරැව්කරුවන් මගින් රක්ෂණයේ අතරමැදි කටයුතු;

(ණ) භාරකාරත්ව පරිපාලනය හෝ ආයෝජන කළමනාකරණය හෝ අධිවෛශ්‍රාමික යෝජනා ක්‍රම;

(ත) 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත හෝ ඒ වෙනුවට පනවන ලද යම් පනතක් යටතේ කරගෙන යන ලද යම් මූල්‍ය ව්‍යාපාරයක්;

(ද) (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත හෝ ඒ වෙනුවට බලාත්මක කර ඇති යම් පනතක් යටතේ කරගෙන යන ලද යම් මූල්‍ය ව්‍යාපාරයක්;

(න) මූල්‍ය ආයතනවල අක්වෙරළ ඒකක යන්නට වෙනත් ලිඛිත නීතිවල විධිවිධාන ඇතුළත් අර්ථ නිරූපණයට අනුකූලව මූල්‍ය ආයතනවල අක්වෙරළ ඒකක;

(ප) කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ ලියාපදිංචි කළ යුතු හෝ බලපත්‍ර ලබාගත යුතු මේ අර්ථනිරූපණයේ (අ) වන ඡේදයේ සිට (ද) වන ඡේදය දක්වා වන ඡේදවල නිශ්චිතව සඳහන් කරන ලද යම් ව්‍යාපාරයක යෙදී සිටි යම් තැනැත්තකු;

(බ) අතථ්‍ය වත්කම් සේවා සැපයීම; සහ

(ම) මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 29 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කලින් කලට නියම කරනු ලබන වෙනත් යම් ව්‍යාපාර;

“මූල්‍ය ආයතනය” යන්නෙන්, මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත අර්ථානුකූලව යම් මූල්‍ය ව්‍යාපාරයක් හෝ නම්කළ මූල්‍යමය නොවන ව්‍යාපාරයක් සහ වෘත්තියක හෝ අතථ්‍ය වත්කම් සපයන්නා වූ ව්‍යාපාරයක යෙදී සිටින හෝ කරගෙන යනු ලබන යම් තැනැත්තකු අදහස් වේ;

“මූල්‍ය බුද්ධි ඒකකය” යන්නෙන්, මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය අදහස් වේ;

“මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත” යන්නෙන්, 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත අදහස් වේ;

“රජය සතු කිරීම” යන්නෙන්, මේ පනත මගින් විධිවිධාන සලසා ඇති ආකාරයෙන් අධිකරණමය ආඥාවක් හරහා රජය සතු අපරාධයකින් උත්පාදිත දෙයක් සඳහා වන තීරණාත්මක අයිතිය, හිමිකම සහ යම් අයිතිවාසිකම රජය සතු කර පවරා දීම අදහස් වේ.

*පැහැදිලි කිරීම:*

රජය සතු කිරීම අදාළ නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කිරීමට යම් තැනැත්තකු සම්බන්ධයෙන් වරදකරු කර තිබීම මත බැඳී පැවතිය යුතු නොවේ;

“ත්‍යාගය” යන්නෙන්, එක් තැනැත්තකු විසින් වෙනත් තැනැත්තකුට දෙන ලද දේපළක් අදහස් වන අතර ඊට-

(අ) පළමු තැනැත්තා විසින් නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සිදු කිරීමෙන් පසුව;

(ආ) දේපළ පවරන අවස්ථාවේ දී ඒ දේපළේ වෙළඳපළ වටිනාකම -

(i) පැවරුම්ලාභියා, විසින් සපයන ලද ප්‍රතිෂ්ඨාව; හෝ

(ii) පැවරුම්කරුවකු විසින් ගෙවන ලද ප්‍රතිෂ්ඨාව යන දෙකෙන් විශාල වටිනාකම අතර පවතින වෙනස තරමට,

සෘජුව හෝ වක්‍රව යම් දේපළ පැවරීමක් ඇතුළත් වේ;

"තොරතුරු" යන්නට, යම් ලිපියක, වාක්‍යයක හෝ එහි කොටසක්, සලකුණක්, රූප, රූපමය, චිත්‍ර, වීඩියෝ, ශබ්ද, කේත හෝ යම් වෙනත් සන්නිවේදන මාර්ගයක ආකාරයෙන් විස්තර දක්වන සහ යම් භෞතික හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයක අන්තර්ගත යම් කරුණක් හෝ පණිවිඩයක් අදහස් වන අතර සන්නිවේදනය ලැබීමෙන් පසු ලබන්නා විසින් ලේඛන ගත කරනු ලබන වාචිකව සන්නිවේදනය කරන ලද යමක් ද ඇතුළත් විය හැකි ය;

"උපකරණත්වය" යන්නෙන්, යම් තැනැත්තකු විසින් යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සිදු කිරීම සඳහා මුළුමනින්ම හෝ කොටසක් වශයෙන් භාවිත කර ඇති සහ අදාළ අවස්ථානුගත කරුණුවල දී නීති විරෝධී ක්‍රියාකාරකමක් සිදු කිරීම සඳහා ඒ දේපළ භාවිත කිරීම අවශ්‍ය වී ඇති යම් දේපළක්, අදහස් වන අතර ඒ දේපළට යම් -

(i) තැනැත්තන් හෝ භාණ්ඩ ගෙනයාම සඳහා වන වාහනයක් හෝ වෙනත් ප්‍රවාහන මාධ්‍යයක්;

(ii) පරිගණකයක්;

(iii) මෘදුකාංග යෙදවුමක් හෝ වැඩසටහනක්;

(iv) භෞතික හෝ ඩිජිටල් ගබඩා කිරීමේ පහසුකමක්;

(v) යන්ත්‍රයක්;

(vi) උපකරණයක්; සහ

(vii) මෙවලමක්,

එහි වටිනාකම නීතිවිරෝධී ක්‍රියාකාරකමෙන් උත්පාදිත දේ හි වටිනාකමට වඩා වැඩිවීම, සහ ඒ උපකරණත්වයේ හිමිකරු නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කිරීමේ දී සහභාගී වී නොතිබීම හෝ ඒ නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කිරීමට චේතාන්විතව උපකාරී නොවී තිබීම නොසළකා ඇතුළත් විය යුතු ය;

“අයිතිවාසිකම” යන්නෙන්, දේපළ සම්බන්ධයෙන් වන විට දී,

(අ) දේපළ පිළිබඳව වන නෛතික හෝ සාධාරණ බූදලයක් හෝ අයිතිවාසිකමක්; හෝ

(ආ) දේපළ සම්බන්ධ යම් අයිතියක්, බලයක් හෝ වරප්‍රසාදයක්,

අදහස් වේ;

"අධිකරණ සංවිධාන පනත" යන්නෙන්, 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත අදහස් වේ;

"අධිකරණමය ක්‍රියාවිරහිත කිරීමේ ආඥාව" යන්නෙන්, අධිකරණමය ආඥාවක් කිරීමට අධිකරණ බලය සහිත අධිකරණයක් විසින් කරනු ලබන අධිකරණමය ආඥාවක් මගින් අපරාධයකින් උත්පාදිත දේ වන බවට බැලූ බැල්මට පෙනෙන දේපළක්, ඒ දේපළ රජයට රජය සතු කළ යුතු ද යන වග නිශ්චය කිරීම සඳහා වන අධිකරණමය නඩු කටයුතු සිදු කරන තුරු සහ අවසන් කරන තුරු ඒ දේපළ තාවකාලිකව භාවිත කිරීම සහ උපයෝජනය කිරීම ඇතුළත් විය හැකි ඒ දෙපළේ ආරක්ෂාව, සංරක්ෂණය සහ කළමනාකාරීත්වය සඳහා ඒ දේපළෙහි සන්තකය, භාරකාරත්වය, පාලනය, ආධිපත්‍ය ඒ අධිකරණය විසින් පත් කරන ලද තැනැත්තකු සතු කරන්නේ ද, එවැනි අධිකරණමය ආඥාවක් අදහස් වේ;

"නීතිය බලාත්මක කිරීමේ අධිකාරය" යන්නට, රේගු දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන ජීවී දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව සහ යම් වරදක් සිදු කිරීම විමර්ශනය කිරීමට බලය ඇති ව්‍යවස්ථාපිතව නිර්මාණය කරන ලද වෙනත් යම් මණ්ඩලයක් අදහස් වේ;

"නෛතික වැඩපිළිවෙළ" යන්නට, ප්‍රකාශිත භාරයක්, පීත කොමිස් ගිණුමක් හෝ නාමිකයකු ඇතුළත් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ අධිකරණ විෂයය පවරන ලද අමාත්‍යවරයා අදහස් වේ;

"සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත" යන්නෙන්, 2002 අංක 25 දරන

සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත අදහස් වේ;

“පොදු දේපළ විෂයයෙහිලා සිදු කරනු ලබන වැරදි පිළිබඳ පනත” යන්නෙන්, 1982 අංක 12 දරන පොදු දේපළ විෂයයෙහිලා සිදු කරනු ලබන වැරදි පිළිබඳ පනත අදහස් වේ;

“සාම නිලධරයා” යන්නට, අපරාධ නඩුවිධාන සංග්‍රහ පනතේ ඊට දී ඇති සමාන අර්ථයම තිබිය යුතු ය;

“දණ්ඩ නීති සංග්‍රහය” යන්නෙන්, (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය අදහස් වේ;

“තැනැත්තා” යන්නෙන්, නෛතික පුද්ගලභාවයක් ඇති හෝ නොමැති, පුද්ගල මණ්ඩලයක් ද ඇතුළු යම් ස්වභාවික හෝ නෛතික තැනැත්තෙක් හෝ යම් නෛතික වැඩපිළිවෙළක් අදහස් වන අතර, එවැනි යම් තැනැත්තකුගේ හෝ පුද්ගල මණ්ඩලයක ශ්‍රී ලංකාව ඇතුළත හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද, ලියාපදිංචි කරන ලද හෝ වෙනත් යම් ආකාරයකින් පිහිටුවන ලද හෝ ශාඛාවක්, කාර්යාලයක් හෝ ව්‍යාපාරික ස්ථානයක් ඇතුළත් වේ;

“මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත” යන්නෙන්, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත අදහස් වේ;

“නියම කරන ලද” යන්නෙන්, මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියම කිරීම අදහස් වේ;

"අපරාධයකින් උත්පාදිත දේ" යන්නට,

(අ) නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කළේ කවරෙක් ද යන බව;

(ආ) නීතිවිරෝධී ක්‍රියාකාරකමෙන් ප්‍රතිලාභ ලබාගත්තේ කවරෙක් ද යන බව;

(ඇ) නීතිවිරෝධී ක්‍රියාකාරකම කරන ලද්දේ මේ පනත ක්‍රියාත්මක වීමට පෙර ද නැතිනම් පසුව ද යන බව;

(ඈ) නීතිවිරෝධී ක්‍රියාකාරකම කරන ලද්දේ ශ්‍රී ලංකාව තුළ ද නැතිනම් ශ්‍රී ලංකාවෙන් පිටත ද යන බව,

නොසළකා, යම් තැනැත්තකු විසින් නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සිදු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් හෝ එසේ සිදු කිරීම සම්බන්ධයෙන් සෘජුව හෝ වක්‍රව සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් අත්කරගත්, ව්‍යුත්පන්න වූ හෝ උපලබ්ධි වූ යම් දේපළක්, ප්‍රතිලාභයක්, සේවාවක් හෝ ඉතුරුම් ඇතුළත් වන අතර වෙනත් අරමුදල් හෝ දේපළ බවට සම්පූර්ණයෙන් හෝ කොටසක් ලෙස මාරු කරන ලද හෝ පරිවර්තනය කරන ලද ආර්ථික හෝ මූල්‍ය ලැබීම්, ඉතුරුම් සහ අරමුදල් හෝ දේපළ ඇතුළත් වේ. තව ද, උපකරණත්වය සහ ඒ අපරාධයකින් උත්පාදිත දේ හි වටිනාකම ද ඇතුළත් වේ:

එසේ වුව ද, අපරාධයකින් උත්පාදිත දේ අගනා ප්‍රතිෂ්ඨාවක් සඳහා සද්භාවයෙන් සහ ඒ දේපළ අපරාධයකින් උත්පාදිත දේ ලෙස විශ්වාස කිරීමට දැනුමකින් හෝ සාධාරණ පදනමකින් තොරව මිල දී ගෙන ඇති, අන්‍යාකාරයෙන් ගෙන ඇති හෝ යම් ආකාරයකින් ගනුදෙනු කර ඇති විට එය යම් අපරාධයකින් උත්පාදිත දේ වීම නතර විය යුතු

අතර, එවැනි අවස්ථාවක දී, මේ පනතේ කාර්ය සඳහා අගනා ප්‍රතිෂ්ඨාවක් අපරාධයකින් උත්පාදිත දේ ලෙස පිළිගෙන ඒ ආකාරයෙන් කටයුතු කළ යුතු ය;

*පැහැදිලි කිරීම:*

නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සිදු කිරීමෙහි ප්‍රතිඵලයක් ලෙස හෝ එසේ සිදු කිරීම සම්බන්ධයෙන් සෘජුව හෝ වක්‍රව සම්පූර්ණයෙන්ම හෝ කොටසක් ලෙස අත්කරගත්, හටගත් හෝ ලබාගත් යම් දේපළක්, ප්‍රතිලාභයක්, සේවාවක් හෝ ඉතුරුම්,

(අ) නීතිවිරෝධී ක්‍රියාව සිදු කළ තැනැත්තා වෙත අපරාධයකින් උත්පාදිත දේ නොලැබීම; සහ

(ආ) අපරාධයකින් උත්පාදිත දේ තෙවන පාර්ශ්වයකට ලබා දීම, තෙවන පාර්ශ්වය වෙත ලැබීම හෝ තෙවන පාර්ශ්වයක් විසින් ලබා ගැනීම,

නොසළකා අපරාධයකින් උත්පාදිත දෙයක් විය යුතු ය;

"දේපළ" යන්නෙන්, මූල්‍යමය හෝ ආර්ථිකමය වටිනාකමක් සහිත ශ්‍රී ලංකාවේ හෝ අන් තැනක පිහිටි ද්‍රව්‍යමය හෝ ද්‍රව්‍යමය නොවන, චංචල හෝ නිශ්චල, ස්පර්ශ කළ හැකි හෝ ස්පර්ශ කළ නොහැකි සෑම ආකාරයේ ම වත්කමක් අදහස් වන අතර ඊට පහත සඳහන් දේ ඇතුළත් වේ:-

(අ) ව්‍යවහාර මුදල්, ඩිජිටල් ව්‍යවහාර මුදල්, අතථ්‍ය වත්කම්, ගිණුම්, ආයෝජනය;

(ආ) යම් බුද්ධිමය දේපළක්;

(ඇ) බැංකු බැර, සංචාරක චෙක්පත්, තැන්පතු, බැංකු චෙක්පත්, මුදල් ඇණවුම්, කොටස්, සුරැකුම්, බැඳුම්කර, අණකර, ණයවර ලිපි මෙන්ම ඒ අරමුදල් හෝ වෙනත් වත්කම් වලින් උපචය වූ හෝ ජනනය වූ යම් පොළියක්, ලාභාංශ හෝ වෙනත් ආදායමක් හෝ වටිනාකමක් සහ ආදායම්, භාණ්ඩ හෝ සේවා ලබා ගැනීමට භාවිත කළ හැකි වෙනත් යම් වත්කම් ඇතුළත් වන නමුත් ඒවාට සීමා නොවිය යුතු ඒ වත්කම්වලට ඇති හිමිකම හෝ බැඳියාව පිළිබඳ සාක්ෂි වන ඉලෙක්ට්‍රොනික හෝ ඩිජිටල් ලේඛන ඇතුළු කවර හෝ යම් ආකාරයක නෛතික ලේඛන හෝ සාධන පත්‍ර;

(ඈ) එවැනි යම් දේපළක් පිළිබඳව යම් නීත්‍යනුකූල හෝ සාධාරණ අයිතිවාසිකමක්; සහ

(ඉ) මූල්‍ය ප්‍රතිෂ්ඨාවක් භාවිතයෙන් ලබාගත් සහ මූල්‍යමය හෝ වාණිජමය වටිනාකමක් සහිත වෙනත් යම් ස්පර්ශ කළ හැකි හෝ නොහැකි දෙයක්;

"අපරාධ නඩු පැවරීම" යන්නෙන්, අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 136(1) වන වගන්තියේ විධිවිධාන යටතේ කරන ලද පැමිණිල්ලක් ප්‍රකාරව නිසි අධිකරණයක ඇති නඩුවක්, අපරාධ නඩු විධාන සංග්‍රහය පනත යටතේ ඉදිරිපත් කරන ලද චෝදනා පත්‍රයක් සහ දූෂණ විරෝධී පනත යටතේ පවරන ලද නඩුවක් අදහස් වේ;

"පොදු දේපළ" යන්නට, 1982 අංක 12 දරන පොදු දේපළ විෂයයෙහි ලා සිදු කරනු ලබන වැරදි පිළිබඳ පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"වාර්තාව" යන්නෙන්, එය මත දත්ත වාර්තාගත කර හෝ සටහන් කරනු ලැබ ඇති දත්ත සහ යම් තැනැත්තකු විසින්, පරිගණක පද්ධතියක් හෝ වෙනත් උපකරණයක් මගින් කියවීමේ හා තේරුම් ගැනීමේ හැකියාව ඇත්තා වූ ද යම් දෙයක් අදහස් වේ;

"පදිංචිකරු" යන්නෙන්, ශ්‍රී ලංකාවේ යම් පුරවැසියකු හෝ විදේශ රටක යම් පුරවැසියකු පෙර මාස දොළහ ඇතුළත එකතුව දින එකසිය අසූ තුනක් වන හෝ ඊට වැඩි කාලසීමාවක් සඳහා අඛණ්ඩව හෝ අන්‍යාකාරයෙන් ශ්‍රී ලංකාවේ සිට ඇති නම් එවැනි විදේශ රටක පුරවැසියකු හෝ සේවා නියුක්ත වීමට හෝ ව්‍යාපාරයක් කිරීම සඳහා අවසර ලබා දෙමින් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වීසා බලපත්‍රයක් යටතේ ශ්‍රී ලංකාවේ පදිංචි හෝ සේවා නියුක්ත විදේශ රටක පුරවැසියකු අදහස් වේ;

"තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත" යන්නෙන්, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත අදහස් වේ;

"සේවා සැපයුම්කරු" යන්නෙන්-

(අ) පරිගණක පද්ධතියක් හෝ ඉලෙක්ට්‍රොනික පද්ධතියක් හෝ වෙනත් යම් ආකාරකින් එහි ග්‍රාහකයන්ට සන්නිවේදනය කිරීමේ හැකියාව සපයන්නා වූ යම් රාජ්‍ය හෝ පෞද්ගලික අස්ථිත්වයක්; සහ

(ආ) ඒ අස්ථිත්වය හෝ එහි ගනුදෙනුකරුවන් වෙනුවෙන් පරිගණක දත්ත හෝ තොරතුරු සකස්කරනු ලබන හෝ ගබඩා කරනු ලබන හෝ වෙනත් යම් අස්ථිත්වයක්,

අදහස් වේ;

"ශ්‍රී ලංකාව" යන්නට, ශ්‍රී ලංකාවේ දේශීය ජලතීරය සහ ගුවන් තීරය ඇතුළත් වේ;

"ග්‍රාහක තොරතුරු" යන්නෙන්, යම් සේවා සපයන්නකු විසින් එහි සේවාවන්හි ග්‍රාහකයන්ට අදාළව දරනු ලබන පරිගණක දත්ත හෝ වෙනත් යම් ආකාරයකින් වන යම් තොරතුරු අදහස් වේ;

"හුවමාරු දත්ත" යන්නෙන්-

(අ) පරිගණක පද්ධතියක් මගින් සිදුකරන සන්නිවේදනයක ස්වභාවයන්ට අදාළ වන දත්ත;

(ආ) සේවා සපයන්නකුගේ කොටසක් වන පරිගණක පද්ධතියක් මගින් ජනනය වන දත්ත;

(ඇ) සන්නිවේදන ප්‍රභවය පෙන්වන්නා වූ දත්ත;

(ඈ) ඉලෙක්ට්‍රොනික සන්නිවේදන ජාලයක් භාවිත කරමින් සන්නිවේදනයක් සම්ප්‍රේෂණය කිරීමේ කාර්යය සඳහා හෝ ඒ සන්නිවේදනය සම්බන්ධයෙන් බිල්පත සැකසීම සඳහා සකස් කරන ලද දත්ත සහ මාර්ග යොමුවට අදාළ දත්ත, රවුටරය හඳුනාගැනීමට අදාළ දත්ත,

සන්නිවේදනයක කාලසීමාව හෝ කාලය හඳුනාගැනීමට අදාළ දත්ත ද ඇතුළත් දත්ත,

අදහස් වේ;

"උගුල" යන්නෙන්,

(අ) වරදක් සිදු කිරීම සොයා ගැනීමට;

(ආ) යම් වරදක් සිදු කරන ලද තැනැත්තකු එකී වරද සිදු කිරීමෙන් ඉක්බිතිව ම හඳුනාගැනීමට සහ අත්අඩංගුවට ගැනීමට;

(ඇ) වරදක් සිදු කිරීම පිළිබඳ සාක්ෂි එකතු කිරීමට;

(ඈ) එකී වරද මගින් උත්පාදිත දේ සහ එහි උපකරණත්වය එකතු කිරීමට හැකි කරවන,

සංවිධානාත්මක විමර්ශනාත්මක ශිල්ප ක්‍රමවේදයක් අදහස් වේ;

"ආවරණ මෙහෙයුම" යන්නෙන්, විමර්ශන නිලධරයකු හෝ විමර්ශන නිලධරයකුගේ විධානයට යටත්, විමර්ශන නිලධරයකුට පහළ නිලධරයකු විසින් මේ පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්යය සඳහා, ඇතැම්විට වරදක් සංස්ථාපනය වන ක්‍රියාවන් විය හැකි හැසිරීම්වල නිරතවීම් ඇතුළත් විමර්ශනයක් තුළ වන ක්‍රියාවලියක් අදහස් වන අතර, ඊට -

(අ) අපරාධයකින් උත්පාදිත බවට සැක කරන දේ සොයා ගැනීම, පිහිටි ස්ථානය සොයා ගැනීම, හඳුනාගැනීම සහ සෝදිසි කිරීම;

(ආ) වැරදි සිදුකරන ලද තැනැත්තන් හඳුනා ගැනීම; සහ

(ඇ) එකී තැනැත්තන් සහ වැරදි සිදු කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සහ සාක්ෂි රැස් කිරීම ද,

ඇතුළත් වන නමුත් එය ඊට සීමා නොවේ;

"නීතිවිරෝධී ක්‍රියාකාරකම" යන්නෙන්, ශ්‍රී ලංකාවේ නීති යටතේ වරදක් සංස්ථාපනය වන යම් හැසිරීමක් අදහස් වන අතර, ඊට -

(අ) එය සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකාව තුළ දී සිදු කරනු ලැබුවේ නම් ශ්‍රී ලංකාවේ නීති යටතේ වරදක් සංස්ථාපනය වන්නා වූ සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිදුකරන ලද යම් ක්‍රියාකාරකමක්;

(ආ) එකී ක්‍රියාකාරකම සිදු කරන ලද අවස්ථාවේ දී එමගින් ශ්‍රී ලංකාවේ නීතිය යටතේ වරදක් සංස්ථාපනය වූයේ නම්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙරාතුව සිදුකරන ලද යම් ක්‍රියාකාරකමක්,

ඇතුළත් වේ;

"අතථ්‍ය වත්කම" යන්නෙන්, ඩිජිටල් ආකාරයෙන් වෙළඳාම් කළ හැකි හෝ මාරු කළ හැකි සහ ගෙවීමේ හෝ ආයෝජන කාර්ය සඳහා භාවිත කළ හැකි ඩිජිටල් වටිනාකම් නිරූපණයක් අදහස් වන

නමුත් ඊට ව්‍යවහාර මුදල්, සුරැකුම්පත් සහ වෙනත් මූල්‍ය වත්කම් පිළිබඳ වූ යම් ඩිජිටල් නිරූපණයක් ඇතුළත් නොවේ;

"අතථ්‍ය වත්කම් සේවා සපයන්නා" යන්නෙන්, වෙනත් ස්වාභාවික පුද්ගලයකු හෝ නෛතික පුද්ගලයකු සඳහා හෝ වෙනුවෙන් පහත දැක්වෙන කටයුතු හෝ මෙහෙයුම් එකක් හෝ කිහිපයක් කරනු ලබන යම් ස්වාභාවික පුද්ගලයකු හෝ නෛතික පුද්ගලයකු අදහස් වේ:-

(අ) අතථ්‍ය වත්කම් සහ ව්‍යවහාර මුදල් අතර හුවමාරු කිරීම;

(ආ) අතථ්‍ය වත්කම් ආකාර එකක් හෝ කිහිපයක් අතර හුවමාරු කිරීම;

(ඇ) අතථ්‍ය වත්කම් පැවරීම;

(ඈ) අතථ්‍ය වත්කම් මත පාලනය ලබාදෙමින් අතථ්‍ය වත්කම් හෝ සාධනපත්‍ර ආරක්ෂිතව තබාගැනීම හෝ පරිපාලනය කිරීම;

(ඉ) නිකුත් කරන්නාගේ අර්පනයකට හෝ වාස්තවික වත්කමක් විකිණීමකට සහභාගී වීම සහ ඊට අදාළ මූල්‍ය සේවා සැපයීම;

"අකටයුතුකම් දැනුම් දෙන්නා" යන්නෙන්, නම් කරන ලද නිලධරයකුට, විමර්ශන නිලධරයකුට, මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 14 වන වගන්තිය ප්‍රකාර පත් කරන ලද අනුකූලතා නිලධරයකුට, මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතින් පිළිගත් අධීක්ෂණ බලධරයකුට හෝ ඔහුගේ සේවායෝජකයාගේ ප්‍රධාන විධායක නිලධරයාට එම නම් කරන

ලද නිලධරයා, විමර්ශන නිලධරයා, අනුකූලතා නිලධරයා, අධීක්ෂණ බලධරයා හෝ ඔහුගේ සේවායෝජකයාගේ ප්‍රධාන විධායක නිලධරයා නොදැන සිටි -

(අ) යම් අපරාධයකින් උත්පාදිත දේ, මේ පනත යටතේ වරදක් සිදු කිරීම, මේ පනත යටතේ වරදක් සිදුකර ඇති තැනැත්තකුගේ අනන්‍යතාව සම්බන්ධයෙන් තොරතුරක් හෝ කරුණක් ලබා දී ඇති, පැමිණිල්ලක් කර ඇති හෝ ප්‍රකාශයක් කර ඇති; හෝ

(ආ) මේ පනත ප්‍රකාර විමර්ශනය කිරීමේ හැකියාවක් ඇති තොරතුරක් හෝ කරුණක් හෙළිදරව් කර ඇති,

යම් තැනැත්තකු අදහස් වන අතර, ඊට එම තොරතුරු හෝ කරුණු එක් රැස් කිරීම හෝ ඉදිරිපත් කිරීම සඳහා එම අකටයුතුකම් දැනුම් දෙන්නාට සහාය වූ හෝ ආධාර කළ යම් තැනැත්තකු සහ අකටයුතුකම් දැනුම් දෙන්නාගේ පවුලේ සාමාජිකයන් ද, ඔහුගේ යැපෙන්නන් ද, අකටයුතුකම් දැනුම් දෙන්නාට සැලකිය යුතු වැදගත්කමක් ඇති වෙනත් යම් තැනැත්තකු ද ඇතුළත් වේ.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**151.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**I වන උපලේඛනය**

**[68 වන වගන්තිය]**

**පැහැදිලි කිරීම් කැඳවීමේ දැන්වීම**

1. තොරතුරු අවශ්‍ය දේපළේ විස්තරය (විමර්ශන නිලධරයා විසින් පිරවිය යුතු ය) :

2. දැන්වීම අමතා යවනු ලබන්නේ යම් තැනැත්තකු වෙත ද, එම තැනැත්තා (විමර්ශන නිලධරයා විසින් පිරවිය යුතු ය):

3. තොරතුරු සපයනු ලැබිය යුත්තේ යම් තැනැත්තකු වෙත ද, එම තැනැත්තා (විමර්ශන නිලධරයා විසින් පිරවිය යුතු ය):

4. තොරතුරු සැපයිය යුත්තේ යම් දිනයකට පෙර ද, එම දිනය (විමර්ශන නිලධරයා විසින් පිරවිය යුතු ය):

5. විමර්ශන නිලධරයාගේ නම :

6. විමර්ශන නිලධරයාගේ ආයතනය :

7. අත්සන:

8. මුද්‍රාව:

9. නිකුත් කළ දිනය:

**අවශ්‍ය තොරතුරුවල ස්වභාවය**

(අ) ඉහත කී දේපළ අත්කරගත්, සන්තකය දරන, හිමිකාරීත්වය දරන හෝ පාලනය වන හෝ ආධිපත්‍ය දරන සහ වර්තමානයේ දී භාවිත කරන ආකාරය.

(ආ) ඉහත කී දේපළ අත්කර ගැනීමට, සන්තකය දැරීමට, හිමිකාරිත්වය දැරීමට, පාලනය කිරීමට, ආධිපත්‍යය දැරීමට භාවිත කළ මූල්‍ය සම්පත්වල හෝ වෙනත් සම්පත්වල ස්වභාවය.

(ඇ) ඉහත කී මූල්‍ය හෝ වෙනත් සම්පත් උපයාගත්, ලබාගත් හෝ අන්‍යාකාරයකින් අත්කරගත් ආකාරය.

(ඈ) ඉහත කී දේපළ ලබාගන්නේ යම් තැනැත්තකුගෙන් ද, එම තැනැත්තාගේ අනන්‍යතාව සහ එම ලබා ගැනීමට අදාළ සම්බන්ධිත අවස්ථානුගත කරුණු.

(ඉ) ඉහත කී දේපළ වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් භාරයක් ලෙස දරන්නේ නම්, එම තැනැත්තාගේ නම සහ එම තැනැත්තා හඳුනාගැනීමට සහ එම තැනැත්තා වෙත ප්‍රවේශ වීමට අවශ්‍ය විස්තර.

(ඊ) වෙනත් යම් තැනැත්තකු විසින් දේපළෙන් යම් ප්‍රතිලාභයක් ලබා ගන්නේ නම් හෝ ලබා ගැනීමට නියමිත නම්, එම තැනැත්තා හඳුනාගැනීමට සහ එම තැනැත්තා වෙත ප්‍රවේශ වීමට අවශ්‍ය විස්තර.

(උ) ඉහත ප්‍රශ්න එකක හෝ වැඩි සංඛ්‍යාවක පිළිතුරු වෙනත් යම් තැනැත්තකු සමග තිබේ යැයි විශ්වාස කරන්නේ නම්, එම තැනැත්තාගේ නම සහ එම තැනැත්තා හඳුනාගැනීමට සහ එම තැනැත්තා වෙත ප්‍රවේශවීමට අවශ්‍ය විස්තර.

සම්පූර්ණ නම:-

ජාතික හැඳුනුම්පත් අංකය:-

විදේශ ගමන් බලපත්‍ර අංකය:-

රැකියාව හෝ ව්‍යාපාරය:-

සාමාන්‍ය මාසික ආදායම:-

වත්මන් රැකියාව:-

ස්ථිර ලිපිනය:-

සාමාදාන විනිශ්චයකාරවරයා/ නීතිඥවරයා/
දිවුරුම් කොමසාරිස් විසින් සහතික කළ අත්සන

...............................................................................................
.................. (ලිපිනය) පදිංචි අංක .............................දරන ජාතික හැඳුනුම්පත්/අංක .................................... දරන විදේශ ගමන් බලපත්‍රය දරන්නා ........................................... වන මා විසින් ඉහත කී දැන්වීමේ මුල් පිටපත ............................................................... විසින් මා හට ................................(දිනය) ............................................................... .......................(ස්ථානය) ................................ (වේලාව) භාරදුන් බව මෙයින් පිළිගනු ලැබේ.

අත්සන

II වන උපලේඛනය

[71 වන වගන්තිය]

**තහනම් කිරීමේ නියෝගය**

**(තහනම් කිරීමේ නියෝගය අමතා යවන්නේ යම් තැනැත්තකු වෙත ද, එම තැනැත්තාගේ නම) .................................... වෙත**

2025 අංක 5 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනතේ කාර්ය සඳහා විමර්ශන නිලධරයකු වන ...................... ............... ................................................................... මා විසින්, ඉහත කී පනතේ 71 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ක්‍රියා කරමින්, පහත දැක්වෙන ක්‍රියාකාරකම් එකක හෝ වැඩි සංඛ්‍යාවක එනම්, පහත නිශ්චිතව දක්වා ඇති දේපළ බැහැර කිරීම, ඊට අදාළ යම් ගනුදෙනුවක යෙදීම, එම දේපළ විනාශ කිරීම හෝ එහි වටිනාකම අඩු කිරීම සඳහා යම් දෙයක් කිරීම, එහි වර්තමාන තත්ත්වය සැඟවීම හෝ පරිවර්තනය කිරීම හෝ එය ශ්‍රී ලංකාවෙන් පිටතට මාරු කිරීම මෙයින් තහනම් කරනු ලබන අතර, එකී ක්‍රියාකාරකම්වල නොයෙදීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට මෙයින් විධාන කරනු ලැබේ.

ඉහත සඳහන් දේපළ ..........................................................................
..............................................................................................................
..............................................................................................................
...............................................

කලින් අහෝසි කරනු ලැබුවහොත් මිස, මේ තහනම් කිරීමේ නියෝගය අද දින, එනම්, ........................... දින සිට දින තිහක කාලසීමාවක් සඳහා වලංගු විය යුතු ය.

මෙම නියෝගය උල්ලංඝනය කරමින් ක්‍රියා කිරීම 2025 අංක 5 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනතේ 71 වන වගන්තිය යටතේ වරදක් වන බවට අවධානය යොමු කරන ලෙස ඔබට මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඉහත සඳහන් විධාන එකකට හෝ වැඩි සංඛ්‍යාවට අනුකූලව කටයුතු කිරීමට ඔබට නොහැකි නම් ඒ සඳහා හේතු දක්වා, මෙම නියෝගයට අනුකූලව කටයුතු කිරීමේ හැකියාව ඇති තැනැත්තාගේ අනන්‍යතාව පහත අත්සන් කරන ලද තැනැත්තාට දැනුම් දෙන ලෙස ඔබට විධාන කරනු ලැබේ.

1. විමර්ශන නිලධරයාගේ නම :
2. විමර්ශන නිලධරයාගේ ආයතනය :
3. අත්සන :
4. මුද්‍රාව :
5. නිකුත් කළ දිනය :

.............................................................................................................. ............................. (ලිපිනය) පදිංචි අංක .............................................. ............. දරන ජාතික හැඳුනුම්පත්/.....................................අංක දරන විදේශ ගමන් බලපත්‍රය දරන්නා වන ....................................................... ............................. මා විසින්, ඉහත කී තහනම් කිරීමේ නියෝගයේ මුල් පිටපත ..........................................................................විසින් මා හට ............................................. (දිනය) ................................(ස්ථානය) .................................................. (වේලාව) භාරදුන් බව, මෙයින් පිළිගනු ලැබේ.

අත්සන

## III වන උපලේඛනය

[71 වන වගන්තිය]

### සංරක්ෂණ නියෝගය

(සංරක්ෂණ නියෝගය අමතා යවන්නේ යම් තැනැත්තකු වෙත ද, එම තැනැත්තාගේ නම) ...................................................................................................................................................... වෙත, 2025 අංක 5 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනතේ කාර්යය සඳහා විමර්ශන නිලධරයකු වන ...................................................................................... මා විසින්, ඉහත කී පනතේ 71 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ක්‍රියා කරමින්, පහත නිශ්චිතව දක්වා ඇති දේපළේ වර්තමාන තත්ත්වය, වටිනාකම, පිහිටි ස්ථානය සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස, මෙයින් විධාන කරනු ලැබේ.

ඉහත සඳහන් දේපළ : ........................................................................................................................................................................................................................................................................................

1. විමර්ශන නිලධරයාගේ නම :
2. විමර්ශන නිලධරයාගේ ආයතනය :
3. අත්සන :
4. මුද්‍රාව :
5. නිකුත් කළ දිනය :

...................................................................................................... (ලිපිනය) පදිංචි අංක .......................................... දරන ජාතික හැඳුනුම්පත්/අංක ................................................... දරන විදේශ ගමන් බලපත්‍රය දරන්නා වන ............................................................................................... මා විසින්, ඉහත කී සංරක්ෂණ නියෝගයේ මුල් පිටපත ........................................................................ විසින් මා වෙත ................................................................ (දිනය) .................................................................... (ස්ථානය) ............................................................ (වේලාව) භාරදුන් බව මෙයින් පිළිගනු ලැබේ.

අත්සන

## IV වන උපලේඛනය

[72 වන වගන්තිය]

### තහනමට ගැනීමේ දැන්වීම

(තහනමට ගැනීමේ දැන්වීම අමතා යවන්නේ යම් තැනැත්තකු වෙත ද, එම තැනැත්තාගේ නම) ...................................................................... ....................................... වෙතට අනුයුක්ත විමර්ශන නිලධරයකු වන .................................................................... මා විසින්, 2025 අංක 5 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනතේ 72 වන වගන්තිය ප්‍රකාර ක්‍රියාකරමින් පහත නිශ්චිතව දක්වා ඇති දේපළ තහනමට ගෙන ඇති බව ද රජය වෙනුවෙන් මා විසින් දැන් එම දේපළේ සන්තකය දරන බව ද ඔබට දැනුම් දෙනු ලැබේ. ඒ අනුව, සන්තකයට අමතරව, දැන් එම දේපළේ නීත්‍යානුකූල පාලනය, භාරය සහ ආධිපත්‍යය මා සතු වේ.

තහනමට ගනු ලැබූ දේපළේ විස්තරය: ............................................... ......................................................................................................... .....................................

1. විමර්ශන නිලධරයාගේ නම :
2. විමර්ශන නිලධරයාගේ ආයතනය :
3. අත්සන :
4. මුද්‍රාව :
5. නිකුත් කළ දිනය :

......................................................................................................... ............................ (ලිපිනය) පදිංචි අංක ................................ දරන ජාතික හැඳුනුම්පත්/ අංක ......................................................... දරන විදේශ ගමන් බලපත්‍රය දරන්නා වන .................................................... .........................මා විසින්, ඉහත කී දැන්වීමේ මුල් පිටපත .................. .........................................................විසින් මා වෙත ........................ ...........(දිනය) .................................... (ස්ථානය)................................ (වේලාව) භාරදුන් බව මෙයින් පිළිගනු ලැබේ.

අත්සන

## V වන උපලේඛනය

[75 වන වගන්තිය]

### ක්‍රියාවිරහිත කිරීම පිළිබඳ දැන්වීම

(ක්‍රියාවිරහිත කිරීම පිළිබඳ දැන්වීම අමතා යවන්නේ යම් තැනැත්තකු වෙත ද, එම තැනැත්තාගේ නම) වෙත

........................................................................ ට අනුයුක්ත විමර්ශන නිලධරයකු වන .......................................................... ......................... මා විසින්, පහත විස්තර කර ඇති දේපළ අදාළ මහාධිකරණ විනිශ්චයකාරවරයා විසින් කරන ලද අධිකරණ ආඥාවක් මගින් ක්‍රියාවිරහිත කිරීම සඳහා 2025 අංක 5 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනතේ 75 වන වගන්තිය ප්‍රකාර .............................................දින හෝ ඊට ආසන්න දිනයක මා විසින්, මහාධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලබන බවට ඉහත කී පනතේ 75 වන වගන්තිය ප්‍රකාර දැන්වීමක් ඔබට මෙයින් ලබා දෙනු ලැබේ.

දේපළේ විස්තරය: ..........................................................................
....................................................................................................
....................................................................................................
..................................................................

1. විමර්ශන නිලධරයාගේ නම :
2. විමර්ශන නිලධරයාගේ ආයතනය :
3. අත්සන :
4. මුද්‍රාව :
5. නිකුත් කළ දිනය :

........................................................................................... (ලිපිනය) පදිංචි අංක ................ දරන ජාතික හැඳුනුම්පත්/ අංක ...................... ................ දරන විදේශ ගමන් බලපත්‍රය දරන වන.............................. ........................................................... මා විසින්, ඉහත කී දැන්වීමේ මුල් පිටපත ..................................... විසින් මා වෙත .......................... (දිනය) ............................(ස්ථානය) ........................ (වේලාව) භාරදුන් බව මෙයින් පිළිගනු ලැබේ.

අත්සන

## VI වන උපලේඛනය

[75 වන වගන්තිය]

### ක්‍රියාවිරහිත කිරීමේ ආඥාව

................................................................ කලාපයේ පිහිටි ශ්‍රී ලංකාවේ මහාධිකරණයේ මහාධිකරණ විනිශ්වයකාරවරයා වන මා විසින්, 2025 අංක 5 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනතේ 75 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ක්‍රියා කරමින් නීතිපතිවරයා/ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මා වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් සලකා බැලීමෙන් පසු පහත සඳහන් දේපළ අධිකරණමය ක්‍රියාවිරහිත කිරීම සඳහා මෙයින් ආඥාවක් කරනු ලැබේ.

ඉහත විස්තර කරන ලද දේපළ ...........................................................
..........................................................................................................
..........................................................................................................
..................................................